National Water Supply & Drainage Board

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය



# 2019
# වාර්ෂික වාර්තාව

නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය

## දැක්ම :

තාක්ෂණ හා සේවා විශිෂ්ඨත්වය තුලින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගීතා සැපයීමේ ආයතනය බවට පත්වීම.

## මෙහෙවර:

පාරිභෝගික තෘප්තිමත්භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුලින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම.

## ඉලක්ක:

- ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම.
- ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
- වැඩි වගවීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.
- ග්‍රාමීය හා ඌණසේවිත ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණ පහසුකම් සැලැස්වීම.

# අන්තර්ගතය


නගර සැලසුම් හා ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය iii
වාර්තාව පිළිබඳ දැනුම් දීම 01
සභාපතිවරයාගේ ප්‍රකාශය 02

**සංස්ථානික පාලනය හා සංබ්‍යා ලේඛනාත්මක සමාලෝචනය**

ප්‍රධාන භූමිකාධාරීන් 07
පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම 09
සාමූහික සැලසුම් 10
ජල සම්පාදනයේ හා මලාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය 13
මෙහෙයුම් සාරාංශය 16
ආයෝජන සාරාංශය 20
කාර්ය මණ්ඩලය 22

**තිරසාර භාවය පිළිබඳ වාර්තාව**

තොරතුරු තාක්‍ෂණය 28
වාණිජ කටයුතු 29
ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්‍ෂණය 30
ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන 30
බලශක්ති කළමනාකරණය 31
මධ්‍යම රසායනාගාරය 31
ආදායම් රහිත ජලය අඩු කිරීම 32
භූගත ජලය 32
සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය 32
හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩ සටහන 33
සංවර්ධනය 33
පර්යේෂණය හා සංවර්ධනය 34
භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය 34
ජල සුරක්ෂිතතා සැලැසුම් 35

**යටිතල පහසුකම් සංවර්ධනය**

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන 38

**ජල සම්පාදනය**

විදේශීය/දේශීය බැංකු මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින ජල සම්පාදන ව්‍යාපෘතීන් 49
ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාන ජල සම්පාදන ව්‍යාපෘතීන් 63
ඉදිරි ව්‍යාපෘතීන් (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 64
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 65

**මලාපවහනය**

පවත්නා මලාපවහන යෝජනා ක්‍රම 66
මලාපවහන ක්‍රියාකාරකම්
ක්‍රියාත්මක කෙරෙමින් පවතින මලාපවහන ව්‍යාපෘති 67
විදේශීය අරමුදල් යටතේ වූ මලාපවහන ව්‍යාපෘතීන් 68
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (මලාපවහන) 69
අපේක්ෂිත ප්‍රධාන කාර්ය සාධනය 70
තිරසාර භාවය හා හදිසි අවස්ථා ප්‍රතිචාරය 70

**මූල්‍ය හා විගණන වාර්තා**

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 72
මූල්‍ය ප්‍රකාශන 76
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 102
කෙටි යෙදුම් 120
සංස්ථානික තොරතුරු - පසු කවරය ඇතුල් පැත්තේ 122

# නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශයේ ලේකම්වරයාගේ පණිවුඩය



ජාතිය වෙත නල මාර්ගික පානීය ජල සේවාවන් සම්පාදනය කර දීම සඳහා සහ නල මාර්ගික මලාපවහන පහසුකම් සේවාවන් සම්පාදනය කර දීම සඳහා ද නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වී අප්‍රතිහත ව්‍යායාමයක යෙදී සිටිනු ලැබේ. මේ වන තෙක් දරන ලද සියළු දෑඪ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 2019 වර්ෂයේ අවසානය වන විට රට තුළ වාසය කරන මුළු ජන ගහණයෙන් අර්ධයකට අධික සංඛ්‍යාවක් වෙත නල මාර්ගික පානීය ජල සම්පාදන පහසුකම් සම්පාදනය කර දීමේ හැකියාව ලැබිණි. 2020 වර්ෂය වන විට රටේ මුළු ජන ගහණයෙන් 55% ක් වෙත නල මාර්ගික පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම හා ජන ගහණයෙන් 2.25% ක් වෙත නල මාර්ගික මළ අපවහන පහසුකම් සම්පාදනය කර දීම අරමුණු කර ගනිමින් දැනටමත් පිහිටුවා ගනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ අභිප්‍රාය සහිතව අමාත්‍යංශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග සමීප ලෙස වැඩ කටයුතු කරනු ලබමින් සිටී.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය සඳහා සර්ව ව්‍යාපී ක්‍රමෝපායික ආයෝජන වැඩ සටහනක් පිළියෙල කිරීමෙහිදී හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ප්‍රධාන සැලැසුමක් සකස් කිරීමෙහිදී ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග ඒකාබද්ධ වී වැඩ කටයුතු කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව අමාත්‍යංශය ප්‍රීතියට පත් වෙයි. මෙම වැඩ සටහන ජල සම්පාදනය හා සනීපාරක්ෂණය පිළිබඳව වූ රජයේ ප්‍රතිපත්තීන් සමග හා ජල සම්පාදනය හා සනීපාරක්ෂණය පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ තිරසාර සංවර්ධන ඉලක්කයන් සමග සාම්‍ය තත්ත්වයකට ගෙන ඒම සඳහා නැවත පෙළ ගස්වනු ලැබිණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් හා වෙනත් සංවිධානයන් විසින් වෙන් වෙන් වශයෙන් නල මාර්ගික ජල සම්පාදන සේවා පහසුකම් සපයා දෙනු ලැබිය යුතු ප්‍රදේශයන් හා සාරන ලද ළිං හා වර්ෂා ජලය රැස් කිරීමේ පද්ධතීන් වැනි වෙනත් ආරක්ෂිත ජල ප්‍රභවයන් සඳහා අවශ්‍ය කරන වැඩි දියුණු කිරීම් හඳුනා ගනු ලැබ ඇත. එසේම නල මාර්ගික මළ අපවහන සේවා පහසුකම් අවශ්‍ය වන්නා වූ ප්‍රදේශයන් හා ස්ථානික සනීපාරක්ෂණය සඳහා අවශ්‍ය වන්නා වූ වැඩි දියුණු කිරීම් ද හඳුනා ගනු ලැබ ඇත. නල මාර්ගික ජල සම්පාදන ව්‍යාපෘතීන් හා නල මාර්ගික මළ අපවහන ව්‍යාපෘතීන් දියත් කිරීමේ අපේක්ෂාවෙන් සූදානම් වීම සඳහා අවශ්‍ය ප්‍රමුඛතා නිර්නායකයන් ගොඩ නගනු ලැබ ඇත. දැනට සේවාවන් ලබන පාරිභෝගික ජනතාව වෙනුවෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක සේවාවක් සහතික කිරීම තුළින් දැනට පවත්නා සේවා මට්ටම වැඩි දියුණු කිරීම හා සේවා ආවරණය නංවා ලීමේ අරමුණින් යුතුව දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවත්නා හා සම්පූර්ණයෙන් වැඩ කටයුතු නිම කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්ගේ හිඩැස් පිරවීම හා බෙදා හැරීමේ ප්‍රදේශයන් විස්තාරණය කිරීම ප්‍රමුඛ ආයෝජනයන් වශයෙන් හඳුනා ගනු ලැබ ඇත.

එසේම ක්‍රමෝපායික ආයෝජන වැඩ සටහන සමග සමගාමී වීමට හැකි වන පරිදි 2020 - 25 වෙනුවෙන් ත්‍රමෝපායික ව්‍යාපාරික සැලැසුම් ස්ථාපිත කිරීම සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත මග පෙන්වා දෙනු ලැබ ඇත. ඒ ආකාරයෙන්ම මෙම සන්දර්භය තුළ අමාත්‍යංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපාරික කාර්යක්ෂමතා පැති කඩයන් වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව එම ආයතනය සමග සමීප ලෙස කටයුතු කරමින් සිටිනු ලබයි. සංවිධානය ප්‍රති ව්‍යුහගත කිරීමට අමතර වශයෙන් මේ දින වල සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීම ද, ආදායම් රහිත ජල පරිමාව අඩු කර ගැනීම හා කාර්යක්ෂම තොග කළමනාකරණය ද හරහා පිරිවැය අඩු කර ගැනීම සහ නවතම වැඩ කිරීමේ තාක්ෂණ ශිල්පීය ක්‍රමයන් භාවිතා කිරීම මගින් ඵලදායිතාවය නංවා ලීම ද විවේචනාත්මක අධ්‍යයනයට බඳුන් කරනු ලබමින් තිබේ.

අපගේ ජල සම්පාදන හා සනීපාරක්ෂණ සංවර්ධන ප්‍රයත්නයන් සඳහා අපට සහයෝගය ලබා දුන් අපගේ බොහෝ අරමුදල් දායක හවුල් කරුවන් වෙත අමාත්‍යංශය සිය කෘතඥතාවය පිරිනමා සිටියි.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අප වෙත ලබා දෙන ලද නායකත්වය හා මග පෙන්වීම් සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති තුමන් වෙත හා ගරු අග්‍රාමාත්‍ය හා නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් පිළිබඳ ගරු අමාත්‍ය තුමන් වෙත මාගේ අවංක කෘතඥතාවය පිරිනැමීම පිණිස මම මේ අවස්ථාව යොදා ගන්නෙමි. අප සියළුම දෙනා වෙත දෙන ලද මග පෙන්වීම වෙනුවෙන් ජල සම්පාදනය පිළිබඳ ගරු රාජ්‍ය ඇමති තුමන් වෙත මාගේ ස්තුතිය පිරිනමා සිටින්නෙමි. එ සේම අපගේ සියළුම වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අප වෙත දෙන ලද ඔවුන්ගේ අඛන්ඩ සහයෝගය පිළිබඳව මහා භාණ්ඩාග ාරයේ ලේකම් වරයා වෙත හා මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ද මාගේ ස්තුතිය පිරිනමා සිටින්නෙමි.

මහ ජනතාව වෙත ඉහළ ගුණාත්මයේ හා කාර්යක්ෂම ජල සම්පාදන සේවාවක් හා මළ අපවහන සේවාවක් සම්පාදනය කර දීමට මෙන්ම සිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව 2020 වර්ෂය සඳහා පෙළ ගස්වනු ලැබ ඇති සංවර්ධන වැඩ සටහන් කිහිපය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රයත්නයන් සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.



**ආචාර්ය (ඉංජිනේරු) ප්‍රියත් බන්දු වික්‍රම**
**ලේකම්**
**නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය**







## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පානීය ජලය සැපයීමේ වගකීම මුලින්ම පැවරී තිබුනේ පොදු වැඩ දෙපාර්තමේන්තුවට වන අතර පසුව එය 1965 දී ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදි. ඉන් පසුව 1975 දී සම්මත කළ පාර්ලිමේන්තු පණත මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබමින් පවතියි.

## වාර්තාව පිළිබඳ දැනුම් දීම.

නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් පිළිබඳ ගරු ඇමතිතුමා
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය
ලක්දිය මැදුර
අංක 35, සුනිල් මාවත
පැලවත්ත - බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2019**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**

1971 අංක 38 දරණ මූල්‍ය පණතේ 14 (2) වගන්තිය අනුව 2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබ තුමන් වෙත මෙයින් ගෞරවයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

මෙයට, ඔබේ විශ්වාසී



**නිශාන්ත රණතුංග**
**සභාපති**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**

## 2019 වාර්ෂික වාර්තාව - සභාපති වරයාගේ ප්‍රකාශය.



> **"ප්‍රස්තුත වර්ෂය තුළදී මණ්ඩලය විසින් පානීය නල ජලය සම්පාදනය කර දෙනු ලබන මුළු ජන ගහණය 2,437,504 ක් හෙවත් රටේ මුළු ජන ගහණයෙන් 41.5% ක් බවට ඉහළ නංවමින් නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 108,850 ක් ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රටේ පානීය නල ජල සේවා ආවරණය රටේ මුළු ජන ගහණයෙන් 51.8% ක් දක්වා ඉහළ නැංගේය."**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් මාගේ ප්‍රමුඛතම වගකීම වන්නේ අපගේ ගෞරවාන්විත සංවිධානය කෙරෙහි ඉමහත් විශ්වාසය තබනු ලැබ ඇති අපගේ දැනට සිටින පාරිභෝගිකයින් වෙත වඩාත් ඉහළ මට්ටමේ හා ඉහළ ගුණාත්මයේ ජල සම්පාදන හා මළ අපවහන සේවාවන් සම්පාදනය කර දීමේ කර්තව්‍යය ඉටු කිරීම පිණිස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නායකත්වය ලබා දීම වේ.

2019 වර්ෂය මුළුල්ලේම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2016 - 2020 සංයුක්ත සැලැස්ම මගින් පිහිටුවනු ලැබ ඇති ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රයත්න දරමින් සිටින ලදී. ප්‍රස්තුත වර්ෂය තුළදී මණ්ඩලය විසින් පානීය නල ජලය සම්පාදනය කර දෙනු ලබන මුළු ජන ගහණය 2,437,504 ක් හෙවත් රටේ මුළු ජන ගහණයෙන් 41.5% ක් බවට ඉහළ නංවමින් නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 108,850 ක් ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රටේ පානීය නල ජල සේවා ආවරණය රටේ මුළු ජන ගහණයෙන් 51.8% ක් දක්වා ඉහළ නැංගේය. 2019 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජලය ඝණ මීටර මිලියන 746 ක පරිමාවක් නිෂ්පාදනය කරන ලද අතර 2018 වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද පානීය ජලය ඝණ මීටර මිලියන 707 ක පරිමාව හා සසඳා බලන විට එය 5.52% ක වර්ධනයකි. මීට අමතර ලෙස මුළු නල මළ අපවහන සම්බන්ධතා සංඛ්‍යාව 24,494 ක් දක්වා ඉහළ නංවමින් ප්‍රස්තුත වර්ෂය තුළදී නව නල මළ අපවහන සම්බන්ධතා 2047 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දෙන ලද අතර ඒ සමග දිනකට ප්‍රතිකාරිත කරනු ලබන අපජල පරිමාව ඝණ මීටර 70,500 ක් විය.

2019 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සම්පාදන හා මළ අපවහන අංශයන් තුළ රුපියල් බිලියන 77.44 ක මුදලක් ආයෝජනය කරන ලද අතර 2018 වර්ෂය හා සාපේක්ෂක ලෙස බලන විට එය 16.38% ක වර්ධනයක් වේ. රජය විසින් කරන ලද රුපියල් බිලියන 43.58 ක ඍජු වෙන් කිරීමට අමතර වශයෙන් ක්‍රියාත්මක කරන ලද මූල්‍යකරණ ක්‍රමෝපායයන් තුළට විදේශීය/ දේශීය බැංකු වලින් ණය වශයෙන් ලබාගෙන ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ආයෝජනය කරන ලද රුපියල් බිලියන 25.09 ක මුදල හා දේශීය බැංකු වලින් ණය වශයෙන් ලබාගෙන ආයෝජනය කරන ලද රුපියල් බිලියන 3.06 ක මුදල ද ඇතුලත් වේ. මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 23 ක සංඛ්‍යාවක් ද, මළ අපවහන ව්‍යාපෘතීන් 04 ක සංඛ්‍යාවක් ද, දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 14 ක සංඛ්‍යාවක් ද, සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් හා ජල අංශයේ ප්‍රජා පහසුකාරක ව්‍යාපෘතීන් 06 ක සංඛ්‍යාවක් ද ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ආයෝජනයන් කරන ලදි. 2019 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතීන් අතුරින් එක් මහා පරිමාණ මළ අපවහන ව්‍යාපෘතියක් හා දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් විය. මීට අමතර වශයෙන් ප්‍රජා පහසුකාරක ව්‍යාපෘතීන් හරහා රුපියල් මිලියන 173.47 ක මුදලක් වැය කරමින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශ තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි.

සිය ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ එක් කොටසක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ ක්‍රියාකාරකම් වේගවත් කරන ලද අතර 2019 වර්ෂය අවසාන වන විට දක්නට ලැබුන ආදායම් රහිත ජල පරිමාව නිෂ්පාදනයෙන් 24.95% ක් විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එහි ව්‍යාපාර කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් තොරතුරු තාක්ෂණ සංවර්ධනය හා බල ශක්ති කළමනාකරණය කිරීමේ වැඩ සටහන් කෙරෙහි ද 2019 වර්ෂය තුළදී සිය අවධානය දිගින් දිගටම යොමු කරන ලදි.

පානීය ජලයේ ගුණාත්මය සම්බන්ධයෙන් වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මග පෙන්වීම් හා නිර්දේශයන් අනුගමනය කරමින් මුළු රට පුරා ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රම 264 ක් තුළ ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රියාත්මක කරන ලදි. ඊට අමතර වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිරන්තරයෙන් ජල නියැදි පරීක්ෂණයට භාජනය කිරීමේ කටයුතු වේගවත් කරන ලද අතර 2019 වර්ෂය තුළදී ලබා ගන්නා ලද විශ්ලේෂණාත්මක දත්තයන් මගින් හෙළිදරව් වී ඇත්තේ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණයන් අතුරින් 99.3% ක් සතුටුදායක ප්‍රතිඵල පෙන්වනු ලැබ ඇති බවය.

නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය විසින් හා මුදල් අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත සිය සංස්ථානික හා ජාතික ඉලක්කයන් සපුරා ගනු පිණිස තම සහාය හා මග පෙන්වීම් අඛණ්ඩ ලෙස ලබා දෙමින් සිටිති. 2012 වර්ෂයේ සිට ගාස්තු ප්‍රමාණයන්ගේ කිසිදු වැඩි කිරීමකින් තොරව පිරිවැය පියවා ගැනීමේ ගැටළු වලට මුහුණ දෙමින් මෙම සියළුම ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගනිමින් එහි සේවාවන් දිගින් දිගටම කරගෙන යාමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි වීම සැලකිය යුතු කාරණයකි. ඒ කෙසේ වුව ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති වරයා වශයෙන් මා විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇත්තේ ගණුදෙනු කරුවන් වෙත සපයනු ලබන සේවාවන් නංවා ලීම පිණිස ඵලදායි තාවය සාක්ෂාත් කර ගැනීම සඳහා හා කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ ව්‍යුහාත්මක වෙනස් කම් සිදු කිරීම අවශ්‍ය වී ඇති බවයි. වග වීම හා වැඩි දියුණු වූ ගණුදෙනුකාර තෘප්තිය සහතික කිරීම සඳහා වාණිජ, අලෙවි කිරීම් හා මහජන සම්බන්ධතා වැනි නව කෘත්‍යාත්මක අංශයන් පැහැදිළි ලෙස වෙන් කොට දැක්වීම අවශ්‍ය වී ඇත. ගත වූ වර්ෂ 5 ක කාලය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නව ව්‍යාපෘතීන් වෙනුවෙන් අති විශාල ආයෝජනයන් සිදු කරනු ලැබ ඇති හෙයින් දැනට ප්‍රමුඛ අවධානය යොමු කළ යුතුව ඇත්තේ සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ වැඩ සටහනක් දියත් කිරීම හරහා එකී ආයෝජනය ආදායම බවට පරිවර්තනය කිරීම කෙරෙහි වේ. නිෂ්පාදනය හා ධාරිතා නංවා ලීම මගින් ද, බෙදා හැරීමේ හිඩැස් පිරවීම හා ව්‍යාප්ති වැඩ සටහන් මගින් ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා යෝජනා ක්‍රමයන් උපරිම ප්‍රයෝජ්‍යකරණ තත්ත්වයට පත් කරනු ලැබීමට පියවර ගනු ලබනවා ඇත.

මෙම ප්‍රයත්නයෙහි ලා මී ළග වර්ෂ 5 සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් හොඳින් උද්දේශනය කරන ලද හා හොඳින් දිශානත කරන ලද සංයුක්ත සැලැස්මක්/ ව්‍යාපාරික සැලැස්මක් සංවර්ධනය කිරීම අතිශයින්ම වැදගත් වේ. මගේ ප්‍රමුඛතම රාජකාරීන් අතුරින් එකක් වන්නේ සිය අපේක්ෂාවන් ඉක්මවා යන සේ පාරිභෝගිකයින් තෘප්තිමත් කිරීම අරමුණු කර ගනිමින් ඔවුන් වෙත උත්කෘෂ්ඨ සේවාවක් සම්පාදනය කර දීම ඉලක්ක කර ගනිමින් ඉතා විස්තීර්ණ සංයුක්ත හා ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් මෙහෙයවීම වේ.

රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් ගත් කල, සෞභාග්‍යයේ දැක්ම ඉතා පැහැදිළි ලෙස දක්වනු ලැබ ඇති අතර ඒ අනුව 2024 වර්ෂයේ අවසානය වන විට ශ්‍රී ලංකාවේ ජීවත් වන සියළුම ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම ඉලක්ක කර ගත් ක්‍රමෝපායයන් සංවර්ධනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉටු කරනු ලබනවා ඇත.

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින පහසුකම් වල ප්‍රයෝජ්‍යකරණය ආවර්ධනය කිරීම හා ප්‍රශස්තිකරණය කිරීම මගින් සේවා සම්බන්ධතාවයන් උපරිම සංඛ්‍යාව සම්පාදනය කර දීමෙන් උපරිම ප්‍රතිලාභ ලබා දීම අරමුණු කර ගනිමින් ඒ සඳහා අවශ්‍ය මූලික පියවර දැනටමත් ගනු ලැබ ඇත. ජල සම්පාදන යෝජනා ක්‍රම 331 ක සංඛ්‍යාවක් දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මෙම යන්ත්‍රාග ාරයන් අතුරින් ඇතැම් ඒවා ජලය වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට හැකි වන පරිදි පහසුවෙන් ආවර්ධනය කළ හැකි බව නිරීක්ෂණය වී ඇති අතර ඒවා අතුරින් ඇතැම් යෝජනා ක්‍රමයන් අපේක්ෂිත ප්‍රමිති මට්ටමට ගෙන ඒම සඳහා ඒවායේ ගුණාත්මක තත්ත්වය නංවා ලීම හා ඒවා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගත යුතු පළමු වැනි පියවර වූයේ එ වැනි ව්‍යාපෘතීන් හඳුනා ගැනීම වන අතර පසුව මැදිහත් වීම් හා ආයෝජනයන් ඉතාම සුළු ප්‍රමාණයකින් ඒවායේ ගුණාත්මය නංවා ලීම හා ඒවා ප්‍රමාණාත්මක ලෙස නංවා ලීම / ඒවා වැඩි දියුණු කිරීම සිදු කරනු ලබනවා ඇත.

ඉතා ඉක්මනින් හා වේගයෙන් ඉහළ ගුණාත්මයේ ප්‍රමිතීන් දක්වා පරිවර්තනය කළ හැකි මෙම යෝජනා ක්‍රමයන් හඳුනා ගැනීම සඳහා අපගේ මෙහෙයවීම යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් වෙහෙස මහන්සිය නොබලා වැඩ කටයුතු කරන ලද බව පැවසීමට මා ආඩම්බර වන අතර නව ප්‍රදේශයන් හා පාරිභෝගිකයින් ආවරණය කිරීමේ අරමුණ සහිතව බෙදා හැරීම් ව්‍යාප්ත කිරීම් ද දියත් කරනු ලබනවා ඇත.

පානීය ජල අංශය සම්බන්ධයෙන් රජය තුළ ඇති අනාගත අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් බැඳීම හා කැප වීම සහිතව අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමේ සාර්ථකත්වය වෙනුවෙන් හොඳින් උද්දේශනය කරන ලද සංයුක්ත සැලැස්මක් / ව්‍යාපාර සැලැස්මක් ගොඩ නැගීම මගින් ඉතා ශක්තිමත් පදනමක් හා පැහැදිළි මාර්ග සිතියමක් සපයා දෙනු ලබන බවට මම ඉතා දැඩි ලෙස විශ්වාස කරමි.

මෙම වෙනස් වීම් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ස්වයං පෝෂිත ආයතනයක් වශයෙන් ස්වාධීන ලෙස නැගී සිටීමේ හැකියාව ඇති වන බවට මම විශ්වාස කරමි. මෙම වෙනස සාක්ෂාත් කර ගනිමින් රට වෙත මිළ කළ නොහැකි සේවාවක් සපයන ශක්තිමත් හා ස්වයංපෝෂිත සංවිධානයක් බවට පත් වීම සඳහා යන මෙම ගමනේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙතින් බැඳීම, කැප වීම හා අවධානය මම අපේක්ෂා කරන්නෙමි.



**නිශාන්ත රණතුංග**
**සභාපති**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**



“ ජලය යනු පොදු උරුමයක් වන අතර එහි අගය සියළු දෙනා විසින්ම හඳුනාගත යුතු වන්නේය. ජලය පරිස්සමින් හා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමේ යුතුකම සියළුම දෙනා සතු වේ.”

යුරෝපීය ජල ප්‍රඥප්තිය

# සංස්ථානික පාලනය හා සංඛ්‍යා ලේඛනාත්මක සමාලෝචනය



දැදුරුඔය වේල්ල

## සංවිධාන ව්‍යුහය




**අධ්‍යක්ෂ මණ්ඩලය**

1. සභාපති
2. උප සභාපති
3. ක්‍රියාකාරී අධ්‍යක්ෂ
4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

7- 9. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය**

10. සාමාන්‍යාධිකාරී
11. අතිරේක සාමාන්‍යාධිකාරීන්
12. කොට්ඨාස භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
13. පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
14. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

## අධ්‍යක්ෂ මණ්ඩලය

**01. ඉංජිනේරු කේ. ඒ. අන්සාර්**
Chartered Civil Engineer / Lead Auditor (QMS)
B Sc Eng. (Hons), MSc. (Delft))
Dip. H.E. (Delft) MIE (SL)
සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2015.02.05 සිට 2019.11.28 දක්වා)

**02. එම්. එච්.එම්. සල්මන් මහතා**
නීතිඥ
උප සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2018 01 24 සිට 2019.11.26 දක්වා)

**03. පී. අයි. ටී. මහිලාල් සිල්වා මහතා**
BA MA.M.S.Sc
ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 02 05 සිට 2019.11.25 දක්වා)

**04. ශාන්ත රත්නායක මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015. 02. 12 සිට 2019.11.25 දක්වා)

**05. කේ.ඒ.එස්.වල්පොල මහත්මිය**
BSc, MA (Economics)
PG Diploma (Business Administration)
(2015.02.13 සිට 2019 නොවැම්බර් දක්වා)

**06. වෛද්‍ය ටී. බී. ආනන්ද ජයලාල්**
MBBS, MSc, MD, PG cert in Paed Nutrition, .
පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර ආරක්ෂාව පිළිබඳ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, යොවුන්, වියපත් හා ආබාධිත පුද්ගලයින් පිළිබඳ අධ්‍යක්ෂ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2017 01 20 සිට 2019 06 03 දක්වා)

**07. වෛද්‍ය එල්.ටී.ගමලත්**
MBBS, MSc (Medical Administration)
පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යංශය, කොළඹ
(2019 06 04 සිට 2019 නොවැම්බර් දක්වා)

**08. ජේ. එම්. යූ. පී. ජයමහ මහතා**
DPFM, PGD (A&F), APFASL ආශ්‍රිත සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මහජන ව්‍යවසාය දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015. 04. 02 සිට 2019 04 04 දක්වා)

**09. පී.කේ.ඒ.ඩී. ද සිල්වා මහත්මිය**
B Com (SP) , MA (International Development)
PGD (Demography), SLEA (Line Member), SLPA (Line Member)
අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා මන්තු කිරීම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යංශය
(2019. 06. 13 සිට 2019 නොවැම්බර් දක්වා)

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
**ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය**
B Sc Special (Hons), Master of Public Management, IMSL (Member)
2019 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වන ලදී.

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

**10. සාමාන්‍යාධිකාරී**
**ඉංජිනේරු ඩී. යූ. සුමනසේකර (2019 09 01 දිනය දක්වා)**
B Sc Eng. (Hons), MSc (Netherlands), C Eng. FIE (SL)

**ඉංජිනේරු ආර්. එච්. රුවිනිස් (2019 09 05 සිට අද දක්වා)**
B Sc Eng. (Hons), M Sc in Sanitary Engineering, MBA,
C Eng. FIE (SL), MIE (Aust), CP Eng.,

**11. අතිරේක සාමාන්‍යාධිකාරී වරුන්**
**(2019 දෙසැම්බර් 31 දින වන විට)**
**ඉංජිනේරු එස්. ජී. ජේ. රාජ්කුමාර් (උතුර/ මධ්‍යම)**
M Sc in Sanitary Engineering,
M Sc in Environmental Engineering and Management. C. Eng FIE (SL)

**ඉංජිනේරු එන්. එච්.ආර්. කුලනාථ (මළ අපවහන)**
B.Sc Eng., PG Dip (Const.Mgmt), PG Dip (Env. Engineering) C. Eng. FIE (SL)

**ඉංජිනේරු ටී. එස්. විජේතුංග (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)**
B Sc Eng, C Eng., FIE (SL), MBA, M Sc (Planning),
MA (Financial Economics), MIM (SL), PG Dip. (Finance),
ICA (SL), Dip. (Mgt) - DK

**ඉංජිනේරු ජේ. කේ. එස්. පතිරණ (දකුණු / නැගෙනහිර)**
B Sc Eng (Hons), M Sc (Sanitary) Delft, C Eng, MIE (SL)

**ඉංජිනේරු ටී ඩබ්ලිව් එස් පෙරේරා (ජල සම්පාදන ව්‍යාපෘති)**
B Sc Eng (Hons), M Sc (Development Science), C Eng, MIE (SL)
**ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බස්නාහිර)**
B Sc Eng, MPM PG Dip. (OSLO University)
C. Eng, FIE (SL), MIM (SL)

**ඉංජිනේරු ආචාර්ය වසන්තා ඉලංගසිංහ මහත්මිය (සාමුහික සේවා)**
B Sc (Eng), M Eng (Japan), Ph D,C Eng, MIE (SL)

**ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණය)**
B Sc. (B Admin), Dip in Per Mgmt.
MA (Mgmt & Admin) London

**ආර් ඒ එම් එස් වීරසේන මහතා (මුදල්)**
B Com (Sp), PGDBM (Col), ACA

**12. අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
**(2019 දෙසැම්බර් 31 වන විට)**

**එන්. වයි. එස් . අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)**
BA, PG, Dip. in Management (PIM), Member (IMSL)

**ඩබ්ලිව් ඒ එස් සුමනසූරිය මහතා (මානව සම්පත්)**
BB Mgt – HR (Special), MBS, PgdLS NDIPM, MCIPM MISL

**ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය)**
B Sc (Business Administration – Spl)
Diploma in Purchasing & Materials Mgt)

**එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මුදල්)**
B Sc (Accountancy & Finance Mgmt), ACA (SL)

**ඒ. පී. එස්. කුමාර මහතා (පිරිවැයකරණය)**
B Com (Sp), MSc (Management), FCA

ඉංජිනේරු එස්. පී. පී. රාජ්කුමාර් (වාණිජ)
B Sc Eng. (Hons), C Eng, FIE (SL), M Sc (Denmark), MBA (PIM – US), M Eng (Moratuwa)

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (සාමූහික සැලසුම්)
M Sc (Env. Eng) Denmark, PG Dip (Const. Mgt) Moratuwa, C Eng , FIE (SL),

ඉංජිනේරු අයි. වී. ඩබ්ලිව්. එදිරිවීර (කුඩා නගර/ ග්‍රාමීය ජල සම්පාදන)
B Sc Eng. M Sc (Water Resources Management), M Sc (Development Studies), C Eng., FIE (SL), MIWA (UK)

ඉංජිනේරු ඩී එම් එල් සී පිටවල (මහත්මිය) - (සංවර්ධන)
BSc Eng. (Hons), MSc Env Eng. DK, C Eng, MIE (SL)

ඉංජිනේරු ජාලිය ලලිත් සීක්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
BSc Eng. (Hons.) MBA (PIM – SRJ), PG Diploma (Const. Mgt), PG Dip in Drinking Water Mgmt (Germany), C. Eng, MIE (SL)

ඉංජිනේරු ටී එම් ඩබ්ලිව් සුනිල් බණ්ඩාර (යාන්ත්‍රික හා විදුලිත්) - වැඩබලන
PG Dip (B Admin), PG Dip (Disaster Mgt), C Eng. MIE (SL)

ඉංජිනේරු ඩබ්ලිව් ජී සී එල් වීරසේකර (ක්‍රම සම්පාදන හා සැලසුම්)
B Sc Eng, MBA, PG Dip (Const. Project Mgmt) SL, C Eng, MIE (SL)

ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණ වේදය) වැඩබලන
B Sc Eng, PG Dip (e Gov), M Sc (GIS/RS) , MPA (e Gov), C Eng, MIE (SL) , MBSC, MIEEE

ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (මළ අපවහන)
BSc Eng. Hons. PG Dip. Env Eng. & Mgmt (Moratuwa)
Msc Sanitary Eng. (UNESCO-IHE-Delf), FIE (SL), MCIWEM (UK), C.Eng. Intp.Eng

ඉංජිනේරු එස් එස් එස් විපුලානන්දන් (ව්‍යාපෘති සම්බන්ධීකරණය)
B Sc Eng. M Sc (Construction ProjectMgmt), MBA (University of Colombo), Dip in (Commercial Arbitration), Dip (Adjudication) C.Eng.FIE (SL)

ඒ ශ්‍රියාලතා මහත්මිය (අභ්‍යන්තර විගණන) - ආවරණ කටයුතු
B Sc (Busi. Adm), University of SJP, MBA - University of Colombo, PG Dip in (Busi & Fin. Mgmt), CUSM (UK), Ex Dip (Acc & Fin), CA (SL), Int CA (SL), Member of IMSL.

**13.** **පලාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් (2019 දෙසැම්බර් 31 වැනි දිනට)**

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (බටහිර - මධ්‍යම)
M Sc (Water Supply Eng) – The Netherlands,
M Sc (Env Eng) Moratuwa, C Eng, FIE SL, AM (OACETT) Canada

ඉංජිනේරු එම් ටී එම් රසිල් (බටහිර - දකුණ)
B Sc Eng (Hons), PG Dip (Structural Engineering Design), PG Dip (Const.Mgmt), PG Dip (Project Mgmt), C Eng. MIE SL

ඉංජිනේරු පී රාමවික්‍රම (බටහිර - උතුර)
PG Dip (Construction Project Mgmt), PG Dip (Environ. Eng. & Mgmt), Moratuwa, C Eng. MIE SL

ඉංජිනේරු ඩබ්ලිව් එන් ප්‍රේමසිරි (නිෂ්පාදන)
B Sc (Eng), PGD (Water Resources Engineering & Mgmt), C Eng, MIE SL

ඉංජිනේරු ආචාර්ය වසන්තා ඉලංගසිංහ මහත්මිය (වයඹ)
B Sc (Eng), M Eng (Japan), Ph D, C Eng. MIE (SL)

ඉංජිනේරු ජී. වී. විජේරත්න (උතුරු මැද)
B Sc (Eng), M Sc (Water Resources Eng. & Mgmt), C Eng, MIE (SL)

ඉංජිනේරු එම්. කේ. ඩී. ජේ. එච්. මීගොඩ (මධ්‍යම)
B Sc Eng. M Sc (Water Management), FIE (SL), C. Eng.

ඉංජිනේරු ටී බාරතිදාසන් (උතුර)
B Eng (India), M. Eng (Moratuwa), M Sc Eng (UNESCO IHE), PGD (Rajarata), C Eng., MIE (SL)

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (ඌව)
B Sc (Eng), PG D (Management), M Sc. Eng (Water and Environmental Resources Management), MBA,
M Sc (Water Resources Management, Holland), C.Eng. FIC (SL),MIM

ඉංජිනේරු එස් එස් දේවරාජා (සබරගමුව)
B.Tech.(Eng) PG Dip (Environ. Mgmt), M.Sc in Environmental Eng. & Mgmt
MDS in Development Studies
C.Eng MIE (SL)

ඉංජිනේරු එම් කේ ඒ ජේ එම් විජේසිංහ මහත්මිය (දකුණ)
B Sc Eng., M Sc (Sanitary Engineering) Delft, C Eng, MIE (SL)

ඉංජිනේරු එන් සුදේසන් (නැගෙනහිර)
B Sc Eng. M Sc (Const. Mgmt), M Sc (Structural Engineering Design), C Eng, Intl P Eng.,FIE (SL)

**14.** **ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්**

ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් (කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය)
B Sc Eng, M Sc (Sanitary Engineering) – The Netherlands,
PG Dip (Structural Engineering Design) Sri Lanka
C. Eng. MIE (SL)

ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක
B. Sc (Eng) Hons. PG Dip. (Env. Eng & Man) . C Eng., FIE (SL).

ඉංජිනේරු එම්. එම්. උමා ලෙබ්බේ (අනුරාධපුර 11 වැනි අදියර)
PG Dip (Str. Eng. Design)
PG Dip (Water & Waste Water Treatment) , C Eng, MIE (SL)

ඉංජිනේරු එන් එච් ඩී පී ධර්මපාල (ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc Eng, M Sc (Const Project Mgmt), PG Dip (Environ. Eng & Mgmt), C Eng. FIE (SL)

# පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම



| පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය | ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව. |
|---|---|
| මධ්‍යම | 45 |
| නැගෙනහිර | 52 |
| උතුරු මධ්‍යම | 28 |
| වයඹ | 30 |
| උතුර | 36 |
| සබරගමුව | 22 |
| දකුණ | 53 |
| ඌව | 36 |
| බටහිර මධ්‍යම | 11 |
| බටහිර උතුර | 21 |
| බටහිර දකුණ | 14 |
| එකතුව | 348 |

"ජල සම්පාදන හා සනීපාරක්‍ෂණ ආවරණය කිරීමේ ඉලක්කය සාක්‍ෂාත් කර ගැනීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම් සමස්ත දේශය පුරාම ක්‍රියාත්මක කරන ලදි ."

## 2016 - 2020 සාමූහික සැලැසුම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

සමාලෝචනයට බඳුන් වන වර්ෂය 2016-2020 සංස්ථාපිත සැලැසුම ක්‍රියාත්මක කිරීමේ සිවු වැනි වර්ෂය විය. උක්ත සංස්ථාපිත සැලැසුම විසින් ඉලක්ක කරන ලද පරමාර්ථයන් හා අරමුණු සාක්‍ෂාත් කර ගැනීම සඳහා වර්ෂය මුළුල්ලේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඛන්ඩ ලෙස කටයුතු සිදු කරන ලදි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණ ඉලක්ක සංක්ෂාත් කර ගැනීමේ අරමුණින් දියත් කරන ලද වැඩසටහන් සියලුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හා අනුබද්ධිත ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති අංශයන් විසින් මුළු රට පුරාම ක්‍රියාත්මක කරන ලදී. ආරක්ෂිත පානීය ජලය ලබාගැනීමේ හැකියාව ආසන්න වශයෙන් ජන ගහණයෙන් 91.9% ක් සතුව පවත්නා අතර ඒ අතුරින් 51.8% ක් ආරක්ෂිත පානීය ජලය ලබා ගන්නේ රට පුරා ක්‍රියාත්මක වන නල මාර්ගික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් මඟින් වේ.

ජන ගහණයෙන් 2.07 ක ප්‍රතිශතයක් වෙත නල මළ අපවහන පහසුකම් සපයා දෙනු ලැබ ඇත. ප්‍රස්තුත වර්ෂය තුළදී ව්‍යාපාරික කාර්යක්‍ෂමතාවය සාක්‍ෂාත් කර ගැනීමේදී ගණුදෙනු කරුවන් වෙත සපයනු ලබන සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලබන අතර 2019 වර්ෂය තුළ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම හා බල ශක්ති පිරිවැය අඩු කිරීමට දරන ලද විශේෂ ප්‍රයත්නයන් සැලැකිල්ලට ගැනීම වටී. තොරතුරු තාක්‍ෂණ ක්‍රම වේදයන් වැඩි දියුණු කිරීමේ ආරම්භක ක්‍රියාවන්, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, ආයතනික සංවර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම් ද මෙම ඉලක්කය සාක්‍ෂාත් කර ගැනීම කෙරෙහි දායක විය. "වඩාත් ඉහළ වග වීමේ තත්ත්වයක් හා පාරදෘෂ්‍ය භාවයක්" යන ඉලක්කය සාක්‍ෂාත් කර ගැනීමෙහි ලා අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන ශාඛාව යන අංශ දෙකම විසින් වග වීම හා පාරදෘෂ්‍ය භාවය පිළිබඳව පැන නැගුන ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමෙහි නියැලෙන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණුදෙනු කරුවන් නොවන ජන ගහණය විසින් පරිභෝජනය කරනු ලබන පානීය ජලයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීමේ හා එම ජනතාවගේ සනීපාරක්‍ෂණ තත්ත්වය නංවා ලීමේ සමාජ වගකීම පිළිබඳ ඉලක්කය ගත් කල්හි නොදන්නා හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත හා ආරක්ෂිත පානීය ජල සැපයුම් පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රජාවන් වෙත ලබා ගත හැකි සම්පත් තුළ ප්‍රමුඛත්වය දෙන ලදි. මෙහි ලා ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් මගින් අවශ්‍ය තාක්‍ෂණික සහාය ලබා දෙන ලදි.

2019 වර්ෂය තුළදී ද ලෝක සෞඛ්‍ය සංවිධානයේ මග පෙන්වීම හා ක්‍රියාත්මක කිරීමේ සහාය යටතේ ශ්‍රී ලංකාවේ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම අඛන්ඩ ලෙස කරගෙන යන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යත්න දරන්නේ ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සියළු පානීය ජලය සුරක්ෂිත බව සහතික කිරීමටය. ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම සන්දර්භය යටතේය. 2019 වර්ෂයේ අවසානය වන විට මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකයේ සහාය ලබා ගනිමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් විසින් දීප ව්‍යාප්ත ලෙස විවිධ අදියරයන් තුළ ක්‍රියාත්මක කරනු ලබමින් තිබුණ නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 264 ක සංඛ්‍යාවක් තිබිණි.

පිහිටුවා ගනු ලැබ ඇති අභිමතාර්ථයන්, අරමුණු හා ඉලක්කයන් සාර්ථක ලෙස සාක්‍ෂාත් කර ගැනීම පිණිස කාලීන සමාලෝචනයන් පැවැත්වීම වැදගත් වන බව සැලැකිල්ලට ගන්නා ලදි. ඒ අනුව 2018 වර්ෂයේ 4 වැනි කාර්තුවට හා 2019 වර්ෂයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කාර්තු වලට අදාල සංස්ථාපිත ක්‍රියාත්මක සැලැසුම් හා සම්බන්ධ ප්‍රගති වාර්තාවන් 2019 වර්ෂය තුළ පවත්වන්නට යෙදුන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සමාලෝචනයට භාජනය කරන ලද්දේය.

ජාත්‍යන්තර ජල සංගමය - ජලය හා සංවර්ධනය පිළිබඳ සම්මේලනය හා ප්‍රදර්ශනය 2019 වර්ෂයේ දෙසැම්බර් මස 1 වැනි දින සිට 5 වැනි දින දක්වා රටවල් 78 ක සහභාගිත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර මෙම අවස්ථාවේ ප්‍රධාන සංවිධායක වූයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයයි. මෙම අවස්ථාවට සමාන්තර ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පස් වැනි වාර්ෂික පර්යේෂණ හා සංවර්ධන සම්මන්ත්‍රණය ද 2019 දෙසැම්බර් මස 02 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන්නට යෙදුනි.

2019 වර්ෂය සඳහා පිහිටුවා ගන්නා ලද ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ තොරතුරු ඇතුළු වැඩි විස්තර මෙම වාර්තාවේ 11 වැනි පිටුව තුළ ඉදිරිපත් කරනු ලැබ ඇත.

## ප්‍රකාශිත ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය

| ඉලක්කය | | ප්‍රධාන අරමුණු | 2019 අවසානයට ඉලක්කය | 2019 අවසානයට සාක්ෂාත් වීම |
|---|---|---|---|---|
| 1. ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම. | 1.1. | මුළු නල ජල සම්පාදන ආවරණය | 53.2%* | 51.81% |
| | 1.2. | නල මළ අපවහන ආවරණය | 2.24%* | 2.07% |
| | 1.3. | සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය | 89.8% | 91.9% |
| 2. ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම. | 2.1 | ආදායම් රහිත ජලය (දීප ව්‍යාප්ත) | 26.0% | 24.95% |
| | 2.2 | සම්බන්ධතා 1000 කට මුළු සේවක සංඛ්‍යාව | 4.9% | 3.99% |
| | 2.3 | මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස බල ශක්ති මත වියදම | 15.45% | 14.52% |
| | 2.4 | මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස නඩත්තු වියදම් | 6.47% | 6.11% |
| | 2.5 | මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස ආයතනික වියදම් | 11.54% | 11.00% |
| | 2.6 | මුළු බිල් සංඛ්‍යාවට සාපේක්ෂක ලෙස ඇස්තමේන්තුගත බිල් | 1.0% | 1.26% |
| | 2.7 | අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය | 100% | 110% |
| | 2.8 | ලැබිය යුතු මුදල් : | | |
| | | (අ) ගෘහස්තයන්ගෙන් හා වාණිජ ආයතනයන්ගෙන් | දින 30 | දින 29 |
| | | (ආ) රාජ්‍ය ආයතනයන්ගෙන් | දින 40 | දින 07 |
| | 2.9 | මානව සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම | | |
| | | (අ) අභ්‍යන්තරික පුහුණුව (සහභාගි වූ සංඛ්‍යාව) | 7800 | 11560 |
| | | (ආ) රට තුළ බාහිර පුහුණු (පුද්ගලයින්ගේ සංඛ්‍යාව) | 250 | 247 |
| | | (ඇ) විදේශීය පුහුණුව (පුද්ගලයින්ගේ සංඛ්‍යාව) | 80 | 88 |
| | 2.10 | ගණුදෙනු කරුවන් වෙත සපයන සේවා වැඩි දියුණු කිරීම හා මහජන පැමිණිළි සම්බන්ධයෙන් ක්ෂණිකව කටයුතු කිරීම - දිවයින පුරා පැවැත්වීමට නියමිත ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් (පාසැල් හා වෙනත්) | 229 ක සංඛ්‍යාවක් | 237 ක සංඛ්‍යාවක් |
| | 2.11 | බල ශක්ති කාර්යක්ෂම ව්‍යාපෘතීන් නිසා වාර්ෂිකව ඉතිරි වන මුදල් | මිලියන 30.0 | මිලියන 40.6 |
| | 2.12 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්‍රමවත්, විමර්ශණාත්මක හා පරීක්ෂණාත්මක කටයුතු අඛන්ඩ ලෙස ඉටු කරමින් සිටින අතර එම කටයුතු කරනු ලබන්නේ ව්‍යාපාරික කටයුතු වල හා මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් නව දැනුම ලබා ගැනීම සඳහා වන්නේය. | | |
| | 2.13 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගණුදෙනු කරුවන් හා මණ්ඩලය අතර ඇති සංස්ථානික සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම වාසියට හරවා ගැනීමට සූදානම් අතර, ඊට පෘථුල තොරතුරු හා සංනිවේදන සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයෙන් එහි ව්‍යාපාරික කටයුතු දියුණු කිරීම පිණිස වන වේදිකාවක් වශයෙන් වෙබ් ද්වාරයක් ඇතුලත් වනු ඇත | | |

| | | | |
|---|---|---|---|
| 3. වඩාත් පුළුල් වග වීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම. | මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ව්‍යාපාරික සැලසුම මත පදනම් වූ කළමනාකරණ හා ව්‍යාපාරික මෙවලම් පූර්ණ පරාසයක් සංවර්ධනය කිරීම සඳහා ආරම්භක කටයුතු දියත් කරනු ලැබ ඇත. | | |
| | ■ මූල්‍ය අධිකාරී බලය පැවරීම. | | |
| | ■ අය වැය පාලනය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව | | |
| | ■ වත්කම් ආගණනය කිරීම | | |
| | ■ වැඩි දියුණු කළ කළමනාකරණ තොරතුරු හා සම්බන්ධීකරණය | | |
| | ■ වාණිජ මෙහෙයුම් විගණනයට භාජනය කිරීම | 25 ක සංඛ්‍යාවක් | 25 ක සංඛ්‍යාවක් |
| | ■ ගබඩා හා සැපයුම් විගණනයට භාජනය කිරීම | 15 ක සංඛ්‍යාවක් | 23 ක සංඛ්‍යාවක් |
| | ■ මුදලින් හා චෙක් පත් මගින් කරන ගෙවීම් විගණනයට භාජනය කිරීම | 25 ක සංඛ්‍යාවක් | 41 ක සංඛ්‍යාවක් |
| | ■ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු විගණනයට භාජනය කිරීම | 25 ක සංඛ්‍යාවක් | 16 ක සංඛ්‍යාවක් |
| | ■ ක්ෂෙත්‍රයන් 14 ක් තුළ සිදු කරන ලද විගණන සංඛ්‍යාව | 190 ක සංඛ්‍යාවක් | 224 ක සංඛ්‍යාවක් |
| 4. ග්‍රාමීය හා ඌණ සේවිත ප්‍රජාවන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීම පහසුකරණය කිරීම. | 4.1 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තාක්ෂණික සහාය සහිතව ප්‍රජා මූල සංවිධානයන්, පලාත් පාලන අධිකාරීන් හා වෙනත් පාර්ශවයන් විසින් නඩත්තු කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් සේවාවන් ලබන ජන ගහණ ප්‍රතිශතය | 10.3% | 10.3 % |

* 2018 වර්ෂයේ අවසාන භාගයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඉලක්ක සංශෝධනය කරන ලදි.

# ජල සම්පාදනයේ හා මලාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය

**"ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ සපයන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව සමග දීප ව්‍යාප්ත ලෙස මුළු ජන ගහණයෙන් 51.8% ක ජනතාවක් වෙත පානීය නල ජලය සම්පාදනය කර දීම සිදු වේ."**

**ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය කිරීම**




- නල ජල සම්පාදනය
- ආරක්ෂිත සාදන ලද ළිං
- නල ළිං / අත් පොම්ප
- වැසි ජලය රැස් කිරීම හා වෙනත් ක්‍රම
- ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාවක් නැති

**සනීපාරක්ෂණ ආවරණය**




- ස්ථානීය සනීපාරක්ෂණය
- අඥාත සනීපාරක්ෂණය (වැසිකිලි භාවිතා නොකිරීම)
- නල මාර්ග මලාපවහනය
- වෙනත් සනීපාරක්ෂණ ආකාරයන් (හවුල්/පොදු හා මහජන වැසිකිළි)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විෂය පාත්‍රතාව යටතේ මෙහෙයවනු ලබන ප්‍රධාන, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම 348 ක් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

ප්‍රස්තුත වර්ෂය තුළදී නව සේවා සම්බන්ධතාවයන් 108,850 ක් සැපයීම හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පමණක් පානීය නල ජලය සම්පාදනය කිරීම මගින් ආවරණය කරනු ලබන ජන ගහණය 41.5% ක් දක්වා ඉහළ නැංවීම කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ සපයන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව සමග දීප ව්‍යාප්ත ලෙස මුළු ජන ගහණයෙන් 51.8% ක ජනතාවක් වෙත පානීය නල ජලය සම්පාදනය කර දීම සිදු වේ.

මහා භාණ්ඩාගාරය විසින් ලබා ගන්නා ලද විදේශ ණය මුදල් භාවිතා කරමින් ප්‍රස්තුත වර්ෂය තුළ විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක සංඛ්‍යාවක් දියත් කරන ලදි. මේ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දේශීය හා විදේශීය බැංකු වලින් සෘජු ලෙසම ලබා ගන්නා ලද ණය මුදල් උපයෝගී කර ගනිමින් විදේශ අරමුදල් යොදා ගනිමින් දියත් කරන ලද තවත් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 8 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි. මීට අමතර වශයෙන් රට තුළ නල මාර්ග ජල සම්පාදන ආවරණය වැඩි කිරීමේ අරමුණ සහිතව දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ජල සම්පාදන ව්‍යාපෘතීන් 14 ක සංඛ්‍යාවක් ද, සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් හා ජල අංශයේ ප්‍රජා පහසුකරණ ව්‍යාපෘතීන් 06 ක සංඛ්‍යාවක් ද ක්‍රියාත්මක කරන ලදි. මේවා අතුරින් ප්‍රස්තුත වර්ෂය තුලදී දේශීය බැංකු අරමුදල් උපයෝගී කර ගනිමින් රටේ විවිධ ප්‍රදේශයන් තුළ දියත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 03 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ හරහා නව ජල සම්පාදන සම්බන්ධතාවයන් ලබා දීමේ හෝ දැනට සිටින පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීමේ හැකියාව ලැබිණි.

තවද නල මළ අපවහන සේවා ආවරණය වැඩි කිරීමේ හා සනීපාරක්ෂණ පහසුකම් නංවා ලීමේ පරමාර්ථය සහිතව විදේශීය අරමුදල් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන මළ අපවහන ව්‍යාපෘතීන් 04 ක සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදී දියත් කරන ලද අතර ඉන් එකක වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ජල සුරක්ෂිත භාවය සහතික කිරීමේ අරමුණින් සිය කලාපීය රසායනාගාරයන්ගේ සහාය ද ලබා ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය විසින් මෙහෙයුම් පසු විපරම හා සත්‍යායන පසු විපරම කරගෙන යනු ලැබේ. 2019 වර්ෂයේ විශ්ලේෂණීය දත්තයන් මාර්ගයෙන් හෙළිදරව් වූ පරිදි ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණයන් අනුව 99.3% ක තෘප්තිකර තත්ත්වයක් හා භෞතික සහ රසායනික පරීක්ෂණයන් අනුව 87.8% ක තෘප්තිකර තත්ත්වයක් ද සාක්ෂාත් කරගනු ලැබ ඇත.

ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලද්දේය. කොළඹ නගරය තුළ මෙම ගැටළුවට උග්‍ර ලෙස පාත්‍ර වී ඇති ප්‍රදේශයන් තෝරාගෙන සංවෘත සීමාවන් ඇති කිරීමෙන් අනතුරුව එම ප්‍රදේශයන්හි තුළ ගැලීම් මිණුම් ගන්නා ලදි. ඇසට පෙනෙන කාන්දු වීම් හඳුනා ගැනීම සඳහා රාත්‍රී සමීක්ෂණ, සොරොව් සමීක්ෂණ හා ගෙන් ගෙට කරනු ලබන සමීක්ෂණ පවත්වන ලද්දේය. එම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අවසන් වන විට බස්නාහිර පලාතේ හා දීප ව්‍යාප්ත මට්ටමේ ආදායම් රහිත ජල පරිමාවන්ගේ ප්‍රතිශතයන් පිළිවෙලින් 26.14% ක් හා 24.95% ක් වශයෙන් දැක ගත හැකි විය.

ගාස්තු සංශෝධනය 2012 වර්ෂයේ සිට සිදු වෙමින් පැවැති මෙහෙයුම් වියදම් වැඩි වීම සමග ගැලපුනේ නැත. මේ හේතුව නිසා මෑත වර්ෂයන් තුළ සිය මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයට දුෂ්කරතා අත් විඳීමට සිදු විය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් මුළු හිඟ ණය සම කොටස් බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය තිබියදී වුවද අළුත් ණය මුදල් වලට අදාල ණය බැඳීම් නිසා සැලසුම් කරන ලද පරිදි මේ තත්ත්වයෙහි සාර්ථක වෙනසක් දක්නට ලැබුණේ නැත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා රුපියල් 1,816,772,395 ක ලාභයක් වාර්තා කරන ලද නමුත් ප්‍රධාන වශයෙන්ම 2012 වර්ෂයෙන් පසුව ගාස්තු සංශෝධනයක් නොකිරීම හේතුවෙන් ඉන් පසුව පැමිණි 2018 හා 2019 යන වර්ෂ දෙක තුළ පිළිවෙලින් රුපියල් 568,695,429 ක හා රුපියල් 1,176,834,646 ක පාඩු ලබන්නට සිදු විය.

## ප්‍රධාන සංඛ්‍යා ලේඛන : ජල සම්පාදනය

| | | 2018 | 2019 | විචලනය % |
|---|---|---|---|---|
| ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව | | 348 | **348** | - |
| නල ජල නිෂ්පාදනය (ඝණ මීටර මිලියන) | | 707 | **746** | 5.52 |
| නල ජල පරිභෝජනය (ඝණ මීටර මිලියන) | | 531 | **560** | 5.46 |
| ගෘහස්ත සම්බන්ධතා (සංඛ්‍යා) | (අ) බස්නාහිර පලාත | 936,927 | **967,594** | 3.27 |
| | (ආ) වෙනත් පලාත් | 1,206,349 | **1,273,049** | 5.53 |
| **මුළු ගෘහස්ත සම්බන්ධතා සංඛ්‍යාව** | | 2,143,276 | **2,240,643** | 4.54 |
| පොදු ජල කණු (සංඛ්‍යා) | (අ) බස්නාහිර පලාත | 483 | **480** | 0.63 |
| | (ආ) වෙනත් පලාත් | 1,057 | **865** | 22.2 |
| **මුළු පොදු ජල කණු සංඛ්‍යාව** | | 1540 | **1,345** | 14.5 |
| ගෘහස්ත නොවන සම්බන්ධතා (සංඛ්‍යා) | (අ) බස්නාහිර පලාත | 89,925 | **94,895** | 5.53 |
| | (ආ) වෙනත් පලාත් | 95,453 | **101,966** | 6.82 |
| **මුළු ගෘහස්ත නොවන සම්බන්ධතා සංඛ්‍යාව** | | 185,378 | **196,861** | 6.19 |
| (මුළු පොදු ජල කණු සංඛ්‍යාවද ඇතුළුව) | | | | |
| සේවා සම්බන්ධතා මුළු සංඛ්‍යාව | | 2,328,654 | **2,437,504** | 4.67 |
| සාමාන්‍ය ගෘහස්ත මාසික පරිභෝජනය | | | | |
| (එක් ගෘහස්ත සම්බන්ධතාවයක් තුළ ඝණ මීටර) | | | | |
| | (අ) බස්නාහිර පලාත | 17.62 | **17.63** | - |
| | (ආ) වෙනත් පලාත් | 13.30 | **13.60** | - |
| **ජල නිෂ්පාදනයේ ප්‍රවර්තන පිරිවැය සාමාන්‍යය** | | | | |
| (ඝණ මීටරයකට රුපියල්) | | 39.60 | **41.20** | (3.88) |
| අලෙවි කළ ඒකකයක මුළු පිරිවැය සාමාන්‍යය | | | | |
| (ඝණ මීටරයකට රුපියල්) | | 50.54 | **51.52** | (1.90) |
| ඒකකයකට ලැබුණ ආදායම් සාමාන්‍යය | | | | |
| (අයපත් නිකුත් කිරීම /පරිභෝජනය) | | | | |
| (ඝණ මීටරයකට රුපියල්) | | 42.88 | **42.86** | (0.05) |
| මසකට සාමාන්‍ය ගෘහස්ත අයපත් වටිනාකම (රුපියල්) | | | | |
| | (අ) බස්නාහිර පලාත | 804.37 | **801.57** | (0.35) |
| | (ආ)වෙනත් පලාත් | 468.38 | **491.32** | 4.90 |
| අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය | | 1.05 | **1.10** | 4.76 |
| ගැඹුරු ළිං (සංඛ්‍යා) | (අ) සාරන ලද | 335 | **201** | - |
| | (ආ) සාර්ථක වූ | 282 | **178** | - |
| ආදායම් රහිත ජලය (%) | (අ) බස්නාහිර පලාත | 26.16 | **26.14** | 0.08 |
| | (ආ) වෙනත් පලාත් | 23.50 | **23.62** | (0.51) |
| | (ඇ) දීප ව්‍යාප්ත | 24.93 | **24.95** | (0.08) |

**සැලකිය යුතුයි : " + " ලකුණින් පෙන්වන්නේ විචලනය ගණනය කර ප්‍රතිශතය දැක්වීම අර්ථ විරහිත බවයි.**
**" - " ලකුණින් පෙන්වන්නේ අගය එකතු කළ බද්ද රහිතව බවයි.**

## ප්‍රධාන සංඛ්‍යා ලේඛන : මළ අපවහනය

| | | | | |
|---|---|---|---|---|
| ගෘහස්ත සම්බන්ධතා | බස්නාහිර පලාත | 16531 | **16,849** | 1.92 |
| | වෙනත් පලාත් | 660 | **2,168** | 228.48 |
| ගෘහස්ත නොවන සම්බන්ධතා | බස්නාහිර පලාත | | | |
| | වෙනත් පලාත් | 1365 | **1,401** | 2.6 |
| | | 225 | **410** | 8.22 |
| නිවාස යෝජනා ක්‍රම සම්බන්ධතා (තොග) | බස්නාහිර පලාත | 3666 | **3,666** | - |
| | වෙනත් පලාත් | - | **-** | - |
| **මුළු මල අපවහන සම්බන්ධතා සංඛ්‍යාව** | දීප ව්‍යාප්ත | | | |
| | බස්නාහිර පලාත | 22447 | **24,494** | 9.12 |
| | වෙනත් පලාත් | 21562 | **21,916** | 1.64 |
| | | 885 | **2,578** | 191 |

## වෙනත් ප්‍රධාන සංඛ්‍යා ලේඛන

| | | | |
|---|---|---|---|
| මුළු ආදායම (රු. මිලියන - අගය එකතු කළ බද්ද රහිතව) | 22,769 | **24,002** | 5.42 |
| මුළු ප්‍රවර්තන වියදම (රු. මිලියන) | 28,012 | **30,909** | (9.37) |
| මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 | 3.61 | **3.36** | 7.44 |
| මුළු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 | 4.31 | **3.99** | 8.02 |
| මුළු සංවර්ධන වියදම (රු. බිලියන) | 66.54 | **77.44** | 16.38 |

> **"2018 වර්ෂයේ නිෂ්පාදන පරිමාව හා සසඳා බලන විට දක්නට ලැබෙන 5.52% ක ඉහළ යාම සමග 2019 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද පානීය ජලයේ මුළු පරිමාව ඝණ මීටර මිලියන 746 ක් විය.."**

## ජල සම්පාදනය

### පානීය ජල නිෂ්පාදනය

2018 වර්ෂයේ නිෂ්පාදන පරිමාව හා සසඳා බලන විට දක්නට ලැබෙන 5.52% ක ඉහළ යාම සමග 2019 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද පානීය ජලයේ මුළු පරිමාව ඝණ මීටර මිලියන 746 ක් විය. පසු ගිය 10 වසර තුළ පානීය ජල නිෂ්පාදනයේ දක්නට ලැබෙන ප්‍රවණතාවය පහත දැක්වෙන ප්‍රස්තාර සටහනින් පෙන්නුම් කරනු ලබයි. ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන පරිමාව පදනම් කොට ගෙන නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එම පද්ධතිය මගින් නිෂ්පාදනය කරනු ලබන ජල පරිමාව ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු ජල පරිමාවෙන් 52.85% ක් වේ.




### 2019 වර්ෂය තුළදී පලාත් අනුව ජල නිෂ්පාදනය



## නිෂ්පාදන පිරිවැය

2018 වර්ෂය හා සාපේක්ෂකව මුළු නිෂ්පාදන පිරිවැය (රුපියල් මිලියන) ප්‍රභේදනය මෙහි පහත දක්වනු ලැබ ඇත:

**නිෂ්පාදන පිරිවැය**




නිෂ්පාදන පිරිවැය ඝණ මීටරයකට රුපියල්

| **2018** | **2019** |
|---|---|
| 50.54 | 51.52 |

**නිෂ්පාදන පිරිවැය** = මුළු පිරිවැය / අලෙවි කළ ඒකක

## සේවා සම්බන්ධතාවයන් සංසන්දනය කිරීම

| පලාත / කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය | පලාත / කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය අනුව සම්බන්ධතා සංඛ්‍යාව | | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාප අනුව සම්බන්ධතා සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2018 දෙසැම්බර් අවසානයට | **2019 දෙසැම්බර් අවසානයට** | වෙනස % | **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය** | 2018 දෙසැම්බර් අවසානයට | 2019 දෙසැම්බර් අවසානයට | වෙනස % |
| බස්නාහිර / මධ්‍යම | 478,438 | **494,037** | 3.26 | ප්‍රමුඛතා ** | 1,874 | **1,879** | 0.27 |
| | | | | කොළඹ නගරය | 144,712 | **145,607** | 0.62 |
| | | | | කෝට්ටේ | 171,952 | **177,054** | 2.97 |
| | | | | මහරගම | 159,900 | **169,497** | 6.00 |
| බස්නාහිර / උතුරු | 284,106 | **293,704** | 3.38 | කැළණිය | 203,924 | **210,942** | 3.44 |
| | | | | ගම්පහ | 80,182 | **82,762** | 3.22 |
| බස්නාහිර / දකුණු | 264,308 | **274,748** | 3.95 | දෙහිවල | 109,321 | **111,302** | 1.81 |
| | | | | කළුතර | 70,074 | **72,903** | 4.04 |
| | | | | පානදුර | 84,913 | **90,543** | 6.63 |
| මධ්‍යම | 272,559 | **282,214** | 3.54 | මහනුවර උතුර | 104,222 | **108,741** | 4.34 |
| | | | | මහනුවර දකුණ | 88,838 | **91,498** | 2.99 |
| | | | | මහනුවර නැගෙනහිර | 79,499 | **81,975** | 3.11 |
| වයඹ | 82,548 | **87,855** | 6.43 | කුරුණෑගල | 82,548 | **87,855** | 6.43 |
| උතුරු මැද | 121,541 | **131,995** | 8.60 | අනුරාධපුර | 121,541 | **131,995** | 8.60 |
| සබරගමුව | 112,466 | **118,854** | 5.68 | රත්නපුර | 55,264 | **59,182** | 7.09 |
| | | | | කෑගල්ල | 57,202 | **59,672** | 4.32 |
| දකුණු | 320,351 | **330,915** | 3.30 | හම්බන්තොට | 109,766 | **113,066** | 3.01 |
| | | | | මාතර | 99,446 | **101,954** | 2.52 |
| | | | | ගාල්ල | 111,139 | **115,895** | 4.28 |
| ඌව | 103,307 | **109,115** | 5.62 | බණ්ඩාරවෙල | 59,316 | **63,010** | 6.23 |
| | | | | මොනරාගල | 43,991 | **46,105** | 4.81 |
| උතුරු | 24,199 | **28,064** | 15.97 | යාපනය<br>මන්නාරම<br>වවුනියාව | 24,199 | **28,064** | 15.97 |
| නැගෙනහිර | 264,831 | **286,003** | 7.99 | අම්පාර | 62,744 | **67,459** | 7.51 |
| | | | | ත්‍රිකුණාමලය | 73,018 | **81,560** | 11.70 |
| | | | | අක්කරෙයිපත්තුව | 78,271 | **81,752** | 4.45 |
| | | | | මඩකලපුව | 50,798 | **55,232** | 8.73 |
| එකතුව | 2,328,654 | **2,437,504** | **4.67** | **එකතුව** | 2,328,654 | **2,437,504** | **4.67** |

** 2019 වර්ෂය තුළදී ප්‍රමුඛතා සම්බන්ධතාවයන්ට ඇතුලත්ව ඇත්තේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය පමණකි.













## බිල් කිරීමට අදාල සංඛ්‍යා ලේඛන

| විස්තරය | 2018 (රුපියල් මිලියන) | 2019 (රුපියල් මිලියන) |
|---|---|---|
| බිල් කිරීමේ ඉලක්කය (අගය එකතු කළ බද්ද රහිතව) | 23,189 | **23,830** |
| සැබෑ බිල් කිරීම (අගය එකතු කළ බද්ද රහිතව) | 22,769 | **24,002** |
| මුදල් අය කර ගැනීමේ ඉලක්කය (අගය එකතු කළ බද්ද රහිතව) | 27,809 | **28,437** |
| සැබැවින්ම එකතු කළ මුදල (අගය එකතු කළ බද්ද රහිතව) | 27,385 | **28,397** |

## පාරිභෝගික වර්ගය අනුව අලෙවි කරන ලද ජල පරිමාව හා ලැබුණ ආදායම (2019)

| පාරිභෝගික වර්ගය | අලෙවි කළ පරිමාව | | ආදායම | |
|---|---|---|---|---|
| | ඝණ මීටර 000 | % | රුපියල් මිලියන | % |
| සෘජු බිල් කිරීම # | 410,628 | 73.04 | 16.721 | 60.99 |
| පාඨශාලා | 6,320 | 1.12 | 148 | 0.54 |
| කුලී නිවාස වතු | 2,181 | 0.39 | 89 | 0.32 |
| පොදු ජල කණු හරහා සැපැයුම | 455 | 0.08 | 7 | 0.03 |
| රජයේ ආයතන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පරිශ්‍රයන් | 35,994 | 6.40 | 2,542 | 9.27 |
| වාණිජ හා කාර්මික | 63,107 | 11.23 | 6,313 | 23.03 |
| සංචාරක හෝටල් | 3,321 | 0.59 | 314 | 1.15 |
| නැව් කටයුතු | 120 | 0.02 | 67 | 0.24 |
| ආයෝජන මණ්ඩලය | 9,574 | 1.70 | 680 | 2.48 |
| ආගමික පරිශ්‍රයන් | 7,206 | 1.28 | 153 | 0.56 |
| උප එකතුව | 538,906 | 95.86 | 27.035 | 98.61 |
| තොග බිල් කිරීම් | 19,421 | 3.45 | 362 | 1.32 |
| වෙනත් * | 3,861 | 0.69 | 19 | 0.07 |
| **මුළු එකතුව** | **562,188** | **100.00** | **27,416** | **100.00** |

\# ගෘහස්ත, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල නිවාස, රජයේ නිල නිවාස, තට්ටු නිවාස, අගය එකතු කළ බද්ද රහිත ගෘහස්ත සමෘද්ධි හා සමෘද්ධි කුලී නිවාස

* සෘජු බිල් කිරීමට ඇතුලත් නොවන හෝ මෙහි ඉහත විශේෂයෙන් සඳහන් කර නොමැති අනිකුත් සියළුම බිල් කිරීම් වර්ගයන් "වෙනත්" යන වර්ගය යටතේ පෙන්වනු ලැබ ඇත. ප්‍රතිදාන හිලවු කරනු ලබන බිල්පත් ද මෙම වර්ගයට ඇතුළු කරනු ලැබ ඇත.

### පාරිභෝගික වර්ගයන් අනුව ජලය පරිභෝජනය කිරීමේ ප්‍රතිශතය




### පාරිභෝගික වර්ගයන් අනුව ආදායම් ප්‍රතිශතය



## ආයෝජන සාරාංශය

**"මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන්ගේ එකතුව මගින් ජල සම්පාදන හා මල අපවහන අංශයන්හි සංවර්ධන ක්‍රියාකාරකම් මත රුපියල් බිලියන 77.44 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලබා දෙන ලදි."**

### මූල්‍ය ප්‍රභවයන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුළු 2019 වර්ෂය පුරාම මණ්ඩලය වෙත විවිධ මාර්ගයන්ගෙන් ලැබුණ අරමුදල් ආයෝජනය කරමින් ජල සම්පාදන හා මළ අපවහන අංශයන්ට අදාල සංවර්ධන කටයුතු අඛන්ඩ ලෙසින් ක්‍රියාත්මක කරන ලදි.

මහා පරිමාණ ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා විදේශ ණය මුදල් වලින් 2019 වර්ෂය සඳහා රුපියල් බිලියන 28.04 ක වෙන් කිරීමක් ලැබුණ අතර ඊට රුපියල් මිලියන 538 ක අතිරේක වෙන් කිරීමක් ද ඇතුලත් විය. මෙම ව්‍යාපෘති වලට අදාල දේශීය අනුරූපිත අරමුදල් කළමනාකරණය කරන ලද්දේ අගය එකතු කළ බද්ද හා රේගු බදු වියදම් පියවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද රුපියල් මිලියන 4,268 ක දේශීය අරමුදල් උපයෝගි කර ගනිමින් වන අතර ඉතිරි දේශීය සංඝටකය කළමනාකරණය කර ගන්නා ලද්දේ මහා භාණ්ඩාගාරය විසින් පොලී ගෙවීමේ පදනම මත මහජන බැංකුව වෙතින් ලබා ගන්නා ලද රුපියල් බිලියන 2.57 ක ණය මුදල හා රුපියල් මිලියන 1,229.86 ක් වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයටම අයත් අරමුදල් උපයෝගී කර ගනිමින් වේ. තෝරා ගනු ලැබූ මහා පරිමාණ ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් දෙකක් වෙනුවෙන් රුපියල් මිලියන 138.6 ක දේශීය ඒකාබද්ධ අරමුදල් ද සපයන ලද අතර තවත් තෝරා ගනු ලැබූ මහා පරිමාණ මල අපවහන ව්‍යාපෘතීන් දෙකක් වෙනුවෙන් රුපියල් මිලියන 93.4 ක විදේශ ප්‍රදාන හෙවත් ප්‍රතිපූරණය කළ හැකි විදේශ ප්‍රදානයන් ද වෙන් කරන ලදි. ඊට අමතර ලෙස ජල සම්පාදන ව්‍යාපෘති වලට අදාල ණය පොලී ගෙවීම් කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 9,183.38 ක මුදල් ප්‍රමාණයක් ද සම්පාදනය කර දෙන ලදි.

මතු වෙමින් පවතින කුඩා නගර වෙනුවෙන් වූ (කුඩා හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් දියත් කිරීමේ වැඩ කටයුතු යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීම පිණිස සහ දිවයින පුරා උපයෝගිතා විතැන් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 590 ක දේශීය අරමුදල් සම්පාදනය කර දෙන ලද අතර අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 170 ක මුදලක් වෙන් කර දෙන ලද්දේය. මීට අමතර වශයෙන් ජල සම්පාදන අංශයේ ප්‍රජා පහසුකරණ කටයුතු යටතේ වූ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 915 ක දේශීය අරමුදල් හා රුපියල් මිලියන 50.0 ක විදේශීය ප්‍රදානයන් ද සම්පාදනය කර දෙන ලද්දේය.

ශ්‍රී ලංකා රජය විසින් කරන ලද සෘජු වෙන් කිරීම් වලට වැඩිමනත් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සහතිකය මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදේශීය හා දේශීය බැංකු වෙතින් සෘජුවම ලබාගන්නට යෙදුන ණය මුදල් මගින් රුපියල් බිලියන 25.09 ක වැයක් ජල සම්පාදන ව්‍යාපෘතීන් මත වියදම් කරන ලදි. ඊට අමතර වශයෙන් 2019 වර්ෂය තුළදී දේශීය බැංකු වෙතින් ලබාගත් රුපියල් බිලියන 3.06 ක ණය මුදල් භාවිතා කරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් දියත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 14 ක් ක්‍රියාත්මක කරන ලද අතර ඊට 2019 වර්ෂය තුළදී දියත් කරන ලද නව ව්‍යාපෘතීන් දෙකක් ද ඇතුලත් විය.

මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන් එකතුව මගින් ජල සම්පාදන හා මළ අපවහන අංශයෙහි සංවර්ධන ක්‍රියාකාරකම් මත රුපියල් බිලියන 77.44 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දෙන ලදි.

**2015 - 2019 කාලය තුළදී ජල සම්පාදන අංශය හා මල අපවහන අංශය මත කරන ලද මුළු ආයෝජනය**



### 2018 / 2019 ප්‍රාග්ධන අය වැය ලේඛනය යටතේ ලැබුණ ප්‍රාග්ධන අරමුදල් යොදා ගැනීම.

| විස්තරය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| විදේශීය සහභාගය (රුපියල් මිලියන) | 30,619 | 154% | **31,551** | **112%** |
| විදේශීය ආධාර හා බැඳි දේශීය සහභාගය (රුපියල් මිලියන) | 6,157 | 100% | **3,962** | **90%** |
| දේශීය ව්‍යාපෘති සඳහා වූ ඒකාබද්ධ අරමුදල් (රුපියල් මිලියන) | 1,003 | 69% | **795** | **46%** |
| ණය පොලී ගෙවීම් | | | **9,183** | **100%** |
| එකතුව | 37,779 | 137% | **45,491** | **104%** |

ඉහත සඳහන් කරනු ලැබ ඇති සංවර්ධන ක්‍රියාකාරකම් වලට අමතර ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළදී සිය ආදායම් මුදල් යොදා ගනිමින් පුනරුත්ථාපන ක්‍රියාකාරකම් මත රුපියල් මිලියන 1,156.54 ක මුදලක් ද, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ කටයුතු මත රුපියල් මිලියන 616.47 ක මුදලක් ද, බල ශක්ති සංරක්ෂණය කිරීමේ කටයුතු මත රුපියල් මිලියන 189.10 ක මුදලක් ද, ප්‍රාග්ධන අයිතමයන් මිළ දී ගැනීම මත රුපියල් මිලියන 100.65 ක මුදලක් හා මළ අපවහන යෝජනා ක්‍රමයන් නඩත්තු කිරීම මත රුපියල් මිලියන 22.6 ක මුදලක් ද ආයෝජනය කරනු ලැබ ඇත. පුනරුත්ථාපන ක්‍රියාකාරකම් යටතේ ප්‍රමුඛත්වය දෙන ලද්දේ අනුග්‍රාහක සහායක් නොලැබෙන්නා වූ හෝ යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා විශේෂ අරමුදල් වෙන් කරනු ලැබ නොමැති යෝජනා ක්‍රමයන් වෙත වේ.

### අරමුදල් සපයන නියෝජිත ආයතනයන් හා අදාල ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා ලැබුණ විදේශ ආධාර දායකත්වය




### 2019 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර

| කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය | ව්‍යාපෘතියේ නම | නියෝජිත ආයතනය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බස්නාහිර | සම්පාදනය පදනම් වූ ආධාර ව්‍යාපෘති පිළිබඳ ගෝලීය හවුල | ලෝක බැංකුව | 1,876.00 | 44,000 |
| | අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ලංකා බැංකුව | 1,382.00 | 21,650 |
| නැගෙනහිර | අම්පාර බෙදා හැරීම් ජාලය | ජාතික සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, DFCC | 6,848.00 | 200,000 |
| වයඹ | ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය | DFCC | 3,126.00 | 22,500 |

# කාර්ය මණ්ඩලය

> “ සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2018 වර්ෂයේ පැවැති 4.31 සිට 2019 වර්ෂයේදී 3.99 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි. ”

**කාර්ය මණ්ඩල සංඛ්‍යා**

| කාර්ය මණ්ඩලය | 2018 | 2019 |
|---|---|---|
| (අ). ස්ථිර | 9,901 | 9,564 |
| (ආ). අනියම් | 0 | 0 |
| (ඇ). කොන්ත්‍රාත් | 121 | 137 |
| (ඈ). ආධුනික යන්ත්‍රාගාර තාක්‍ෂණ ශිල්පීන් හා උපාධිධාරී පුහුණුලාභීන් | 24 | 24 |
| **එකතුව** | **10,046** | **9,725** |

2019 වර්ෂයේ අවසානය වන විට ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 9,564 ක සංඛ්‍යාවක් ද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 137 ක සංඛ්‍යාවක් හා ආධුනික යන්ත්‍රාගාර කාර්මික ශිල්පීන් හා උපාධිධාරී පුහුණුලාභීන් 24 ක සංඛ්‍යාවක් ද සිටියහ. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයින් වැඩි පිරිසක් බඳවා ගන්නා ලද්දේ විදේශීය අරමුදල් යොදාගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙනි.

2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 437 ක සංඛ්‍යාවක් ද, කොන්ත්‍රාත් පදනම මත වූ කාර්ය මණ්ඩල සාමාජිකයින් 41 ක සංඛ්‍යාවක් හා එක් ආධුනික යන්ත්‍රාගාර තාක්‍ෂණික ශිල්පියකු ද විවිධ කාර්ය මණ්ඩල වර්ගයන් යටතේ බඳවා ගැනීම සිදු කරන ලදි. එම කාලය තුළදීම විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, නිලය අත හැර යාම් හා අභාවයන් හේතුකොට ගෙන විවිධ කාර්ය මණ්ඩල වර්ගයන්ට අයත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 810 කගේ ද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 25 කගේ හා යන්ත්‍රාගාර තාක්‍ෂණික ආධුනික කාර්මික ශිල්පීන් එක් අයකුගේ ද සේවය අවසන් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 වර්ෂයේ දෙසැම්බර් අවසානයට සාපේක්‍ෂක ලෙස සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 321 කින් අඩු විය.

සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2018 වර්ෂයේ පැවැති 4.31 සිට 2019 වර්ෂයේදී 3.99 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි

## ප්‍රධාන කාර්ය කාණ්ඩයන් අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම



## ස්ථානය අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම




### කාර්ය මණ්ඩල ප්‍රතිලාභ.

- වර්ෂය තුළදී ඵලදායිත්ව දිරි ගැන්වීමක් ඇතුළුව රුපියල් 42,000.00 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවන ලදි.
- පෙර වසර වලදී මෙන්ම ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ලබා දීම දිගටම කරන ලදි.
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් නොකැලැල් සේවාවක් ඉටු කළ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ලෝක ජල දිනය සමරමින් 2019 මාර්තු මාසයේදී පවත්වන ලද උත්සව අවස්ථාවේදී සතුට ප්‍රකාශ කොට සිටින ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහන මිළ ගණන් වලට අනුව ප්‍රවාහන පහසුකම් සපයන ලදි.
- සේවයේ යෙදී සිටින කාලය අතරතුර මිය ගිය ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් මරණ ප්‍රදානයන් ගෙවීම සිදු කරන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දේශීය හා විදේශීය පුහුණු පහසුකම් ලබා දෙන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රුපියල් 650.00 ක මාසික තේ දීමනාවක් ප්‍රදානය කරන ලදි.
- (මහජන බැංකුව හා ලංකා බැංකුව වෙතින් පිළිවෙලින් නිවාස ණය හා වාහන ණය ආදී වශයෙන්) රාජ්‍ය බැංකු හරහා කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ණය පහසුකම් සලස්වා දෙන ලදි.
- ඊට අමතර ලෙස (4.2% ක පොලී අනුපාතයක් මත) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය වෙත දස මාසයක ණය පහසුකම් හා එක් වර්ෂයක ණය පහසුකම් සලස්වා දෙන ලදි.
- එක් කාර්ය මණ්ඩල සාමාජිකයකුට රුපියල් 10,000.00 බැගින් කාර්ය මණ්ඩලය වෙත උත්සව අත්තිකාරම් ලබා දෙන ලදි.
- 2019 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින් 99 දෙනෙකු අතර මාස 12 ණය වශයෙන් රුපියල් 50,601,721.00 ක මුදලක් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර මාස 10 ණය වශයෙන් රුපියල් 8,665,106,188.00 ක මුදලක් සහන අනුපාතිකයක් මත බෙදා දෙනු ලැබිණි.
- ඉතා බරපතල රෝගයන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ වියදම් දැරීමට අමතර ලෙස (පවුලේ සාමාජිකයින්ද ඇතුළු) කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා (දල වශයෙන්) රුපියල් මිලියන 95 ක මුදලක් වැය කරන ලදි.

### කාර්ය මණ්ඩලයේ පඩිනඩි හා ප්‍රතිලාභ

**2018 හා 2019 වර්ෂයන්හි කාර්ය මණ්ඩල පඩිනඩි සසඳා බැලීම**

| විස්තරය | 2018 රු.මිලි. | 2019 රු.මිලි. |
|---|---|---|
| වැටුප් | 11,976 | 11,985 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 1,014 | 994 |
| සේවක භාර අරමුදලට දායකත්වය | 254 | 248 |
| **එකතුව** | **13,244** | **13,227** |

## මිනිස් බල සංවර්ධනය හා පුහුණුව

2019 වර්ෂය තුළ සිදු කරන ලද පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය හා විවිධ අංශයන්ගෙන් ලැබුණ විශේෂ පුහුණු කිරීම් අවශ්‍යතා ද පදනම් කර ගනිමින් මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2019 වර්ෂය තුළදී විවිධ වර්ගයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අභ්‍යන්තර පුහුණු කිරීම් වැඩ සටහන් 293 ක් පවත්වන ලද අතර ඒවායේ සහභාගිත්වය (කළමනාකරණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 1015 කින් ද, වෙනත් විධායක මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 3757 කින් ද, අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 2692 කින් ද, ලිපිකාර සහ ඒ හා අදාල වෙනත් ශ්‍රේණීන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 3096 කින් හා මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින් 1000 කින් ද සමන්විත වූ) කාර්ය මණ්ඩල සාමාජිකයින් 11560 ක් විය.

එසේම මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2019 වර්ෂය තුළදී රට තුළ ක්‍රියාත්මක වන වෙනත් පුහුණු කිරීම් ආයතනයන් මගින් පුහුණු කිරීම් දින 5450 ක මුළු සංඛ්‍යාවක් ආවරණය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 247 ක සංඛ්‍යාවක් වෙනුවෙන් බාහිර පුහුණු වැඩ සටහන් පැවැත්වීමට කටයුතු පිළියෙල කරන ලදි. එකී බාහිර පුහුණු කිරීම් වලට දේශීය විශ්ව විද්‍යාලයයන් විසින් මෙහෙයවන ලද කලා ගුරු හා පශ්චාත් උපාධි වැඩ සටහන් ද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය (NIBM), සේවා මණ්ඩල කළමනාකරණ වරලත් ආයතනය (CIPM), ඉදි කිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), ඉදි කිරීම් පුහුණුව හා සංවර්ධනය සඳහා වූ ආයතනය (1CTAD), ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය (1ESL), නිවාස සැලසුම් කිරීම හා ඉදි කිරීම සඳහා වූ ආයතනය (CHPB) හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) වැනි පිළිගත් ආයතනයන් විසින් මෙහෙයවන ලද ඩිප්ලෝමා හා සහතික පාඨ මාලාවන් ඇතුලත් විය.

දිවයිනෙන් බැහැර පුහුණු හා නිල චාරිකා වැඩසටහන් යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාරයෙන් හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, ඔරේන්ජ් දැනුම වැඩ සටහන, ඉන්දියානු තාක්ෂණික ආර්ථික සහයෝගිතාවය, මහජන චීන රජය හා ව්‍යාපෘති ප්‍රදාන යනාදී ආයතනයන් විසින් පිරිනමන ලද ද්වි පාර්ශවික කෙටි කාලීන අධි ශිෂ්‍යත්වයන් හරහා මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 88 දෙනෙකුන් වෙත කෙටි කාලීන විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දෙන ලදි. මේ අතර ප්‍රස්තුත වර්ෂය තුළදී දියත් කර ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘතීන් මගින් නැව්ගත කිරීමට පෙර පරීක්ෂණ, කර්මාන්ත ශාලා කොන්ත්‍රාත්තු ප්‍රමන්ත්‍රණ හා ඒකාබද්ධ වීමේ වැඩ සටහන් ආදිය සඳහා නිල විදේශ සංචාරයන්හි යෙදීමට නිලධාරීන් 152 ක සංඛ්‍යාවක් වෙත පහසුකම් සලස්වා දෙන ලදි. මීට අමතර වශයෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී දිවයිනෙන් බැහැරව පූර්ණ කාලීන ලෙස ශාස්ත්‍රපති අධ්‍යයනයන්හි යෙදීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අනුයුක්ත ඉංජිනේරු වරුන් 07 ක සංඛ්‍යාවක් වෙත දීර්ඝ කාලීන අධි ශිෂ්‍යත්වයන් ලැබී ඇත.

මීට අමතර වශයෙන් උපාධි අපේක්ෂකයින් 288 ක සංඛ්‍යාවක්, තාක්ෂණික පුහුණු ලාභීන් 167 ක සංඛ්‍යාවක් හා ගිණුම් / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේද පුහුණු ලාභීන් 92 ක සංඛ්‍යාවක් ඇතුළු වෘත්තීය ආධුනිකයින් 547 ක සංඛ්‍යාවක් වෙත රට තුළ පිහිටි විවිධ ආයතනයන් විසින් කාර්මික පුහුණුව ලබා දෙන ලදි.

තවද 198 ක සේවක සංඛ්‍යාවක් වෙත බාහිර ආයතනයන් විසින් පවත්වන ලද වැඩ මුළු හා තාක්ෂණික ඉදිරිපත් කිරීම් තුළදී පුහුණුව ලබා දෙන ලද අතර ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් 146 ක සංඛ්‍යාවක් වෙනුවෙන් හඳුන්වා දීමේ වැඩ සටහනක් ද ඉදිරිපත් කරන ලදි.

## 2019 ප්‍රගතිය - සහභාගිවුවන්ගේ සංඛ්‍යාව




| | සැලැසුම් කළ | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| බාහිර පුහුණුව | 250 | 247 |
| විතෙර පුහුණුව/චාරිකා | 80 | 88 |
| තාක්ෂණික ඉදිරිපත් කිරීම් | 320 | 198 |
| අභ්‍යන්තර පුහුණුව | 7800 | 11560 |

## මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය මගින් පවත්වන ලද පුහුණු වැඩ සටහන් සාරාංශය




## (2018/2019) පුහුණු සහභාගිත්වය සංසන්දනය කිරීම

| | 2018 | 2019 |
|---|---|---|
| අභ්‍යන්තර පුහුණුව | 11,259 | 11,560 |
| බාහිර පුහුණුව | 220 | 247 |
| විදේශ පුහුණුව | 62 | 88 |
| තාක්ෂණික ඉදිරිපත් කිරීම් | 551 | 198 |
| කාර්මික පුහුණුව | 305 | 547 |



“ ආදරය නොමැතිව මිනිසුන් දහස් සංඛ්‍යාවක් ජීවත් වී ඇති නමුත් ජලය නොමැතිව එක් මිනිසකු හෝ ජීවත් වී නැත.”
අඥාතයි

# තිරසාර භාවය පිළිබඳ වාර්තාව



හලාවත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

# සේවාවේ උත්කෘෂ්ඨ භාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම්.

### තොරතුරු තාක්ෂණය - සාර්ථකත්වයට හා අනාගත වර්ධනයට ද්වාරය හැර දෙන යතුර

සිය අනාගත ගමන සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදයෙහි ඇති වැදගත් භාවය අවබෝධ කරගෙන ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සංවිධානයේ තොරතුරු තාක්ෂණවේද ප්‍රාගුණ්‍ය තත්ත්වයන් ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවය නංවා ලීමේ අරමුණින් යුතුව ඒ හරහා විසඳුම් ක්‍රියාත්මක කිරීමේ වැදගත් පියවර ගනිමින් සිටී. දැනට ක්‍රියාත්මක වන කාර්ය ක්‍රියාවලීන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ගත යුතු වැදගත් පියවරක් වශයෙන් සංවිධානය සිය ප්‍රධාන අවධානය යොමු කරනුයේ ස්වයංක්‍රියකරණය කෙරෙහි වේ. තවද සේවා මට්ටම හා ගණුදෙනු කරුවන්ගේ තෘප්තිය නංවා ලීමේ අරමුණ ඇතිව විවිධ නව විසඳුම් ද ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

### වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය

සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද ඉතාමත්ම වැදගත් මෘදුකාංග විසඳුම වන්නේ වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය වන අතර එය 2016 ජනවාරි මාසයේ සිට සිය ජාලගත මෙහෙයුම් ආරම්භ කළේය. වාණිජ මෙහෙයුම් හා සම්බන්ධ වැදගත් ක්‍රියාකාරිත්ව අංශයන් සහ පැමිණිළි කළමනාකරණය, නව සම්බන්ධතාවයන් ක්‍රියාත්මක කිරීම, බවුසර් මගින් සපයනු ලබන ජලය සඳහා බිල් පත් සකස් කිරීම, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ ක්‍රියාකාරකම්, වැඩ ඇණවුම් පිළිබඳව ක්‍රියා කිරීම, ගෙවීම් වවුචර සම්බන්ධයෙන් කටයුතු කිරීම හා ජාලය හරහා, නියමිත කාලය තුළදී ගෙවීම් දත්ත ලබා දීම ආදිය හරහා මුදල් රැස් කරන නියෝජිතයින් සමග ඒකාබද්ධ වීම වැනි මෙහෙයුම් හා නඩත්තු ක්ෂේත්‍රය හා සම්බන්ධ වැදගත් ක්‍රියාකාරිත්ව අංශයන් ද ඇතුලත් කිරීමට හැකි වන පරිදි මෙම පද්ධතිය වැඩි දියුණු කරනු ලැබ ඇත.

මධ්‍යගත විසඳුම් වල විෂය පථය හා ලබා ගැනීමේ හැකියාව නංවා ලීම සඳහා සහ දීර්ඝ කිරීම සඳහා ජංගම උපයෝගයන් කිහිපයක් සංවර්ධනය කරන ලදි. ක්ෂේත්‍ර සේවා ජංගම උපයෝගය සැලැසුම් කරන ලද්දේ වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වෙත දීර්ඝ කිරීමට වන අතර මණු කියවීම් උපයෝගය ක්‍රියාත්මක කරන ලද්දේ ක්ෂේත්‍රය තුළදී මනු කියවීම් රැ ස් කරන අතර ගණුදෙනු කරුවන් වෙනුවෙන් බිල් පත් පිළියෙල කිරීම මනු කියවන්නන් හට පහසුකරණය කිරීම සඳහා වේ.

### වෙනත් මෘදුකාංග පද්ධතීන්

වෙනස් වෙමින් පවත්නා ව්‍යාපාරික අවශ්‍යතාවයන්ට සමගාමී ලෙස ඉදිරියට යාම සඳහා මෘදුකාංග පද්ධතීන් විවිධ වැඩි දියුණු කිරීම් හා වෙනස් කිරීම් වලට භාජනය කිරීම අවශ්‍ය වන අතර මෙය මෘදුකාංග පද්ධතීන්ගේ ජීවන චක්‍රයේ නඩත්තු අදියර සමන්විත වන ප්‍රධාන කොටසකි. පරිහරණය කරන්නන්ගේ ඉල්ලීම් මත පදනම් වෙමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් ඒ වැනි අවශ්‍යතාවයන් සපුරා ලීමේ කාර්යයෙහි නියැළුනේය. වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියට වැඩිමනත් වශයෙන් ප්‍රමුඛතා ක්‍රියාකාර කමක් වශයෙන් මානව සම්පත් කළමනාකරණ / සේවක වැටුප් ලැයිස්තු හා ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය වැනි මෘදුකාංග පද්ධතීන් නඩත්තු කිරීමේ කාර්යයෙහි ද තොරතුරු තාක්ෂණ අංශය යෙදුනේය. සංවිධානයේ නිල වෙබ් අඩවිය නඩත්තු කරමින් පවත්වාගෙන යාමේ කර්තව්‍යයට අමතර වශයෙන් තොරතුරු තාක්ෂණ අංශය විසින් ගණුදෙනු කරුවන් වෙත සපයනු ලබන ජාලගත සේවාවන් පහසුකරණය කිරීම සඳහා ගණුදෙනු කරුවන් වෙනුවෙන් වෙබ් ද්වාරයන් ද නඩත්තු කරමින් පවත්වාගෙන යනු ලබයි.

### දෘඩාංග හා යටිතල ව්‍යුහ පහසුකම් නඩත්තු කිරීම

තොරතුරු තාක්ෂණ අංශයට අයත් එක් ප්‍රධාන කාර්යයක් වන්නේ ප්‍රධාන දත්ත මධ්‍යස්ථානය, සේවා දායක, පරිගණක යන්ත්‍ර, පර්යන්ත උපකරණයන් හා සම්බන්ධකතා විසඳුම් ඇතුලත් තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහ පහසුකම් නඩත්තු කරමින් පවත්වාගෙන යාම වේ. පහසු කම් ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා සහ එසේම කඩවත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ ආපදා ප්‍රතිසාධන පහසුකම ස්ථාපිත කිරීම ද අරමුණු කර ගනිමින් පියවර කිහිපයක් ගන්නා ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කලාපීය කාර්යාල ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ කිරීම සඳහා අතත්‍යරූපී පෞද්ගලික ජාලයක් උපයෝගී කර ගනු ලබන අතර මේ වන විට ෂජ අතත්‍යරූපී පෞද්ගලික ජාල සම්බන්ධතා සංඛ්‍යාව 150 ක් ඉක්මවා ගොස් ඇත. කැප වූ සම්බන්ධතාවයන්ට අමතර වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තරික පද්ධතීන් හා සම්බන්ධ වීම පිණිස අන්තර් ජාලය උපයෝගී කර ගනු ලබන දුරස්ත අතත්‍යරූපී පෞද්ගලික ජාලය පරිහරණය කරන්නන් විශාල සංඛ්‍යාවක් වෙත සපයා දෙනු ලැබ ඇත. ජාල කණ්ඩායම විසින් කරනු ලබන එක් ප්‍රධාන ක්‍රියාකාරකමක් වන්නේ ෂජ අතත්‍යරූපී පෞද්ගලික ජාල සම්බන්ධතාවයන් නඩත්තු කරමින් පවත්වාගෙන යාම වේ.

### 2019 වර්ෂය තුළදී ලබා ගන්නා ලද සැලකිය යුතු ජයග්‍රහණයන්

භූගෝලීය තොරතුරු පද්ධතිය, ආදායම් රහිත ජල පරිමාව පසු විපරම් කිරීම, SMART මානනය හා වත්කම් කළමණාකරණ ක්‍රියාකාරකම් ආදියට අදාල තොරතුරු තාක්ෂණ විකාශනයන් වෙනුවෙන් අවශ්‍ය සේවාවන් සැපැයිය හැකි වන සේ දත්ත මධ්‍යස්ථානය ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා මෙන්ම ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය කඩවත ස්ථාපිත කිරීම ද අරමුණු කර ගනිමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. මෙම විසඳුම් සංවර්ධනය කිරීම සැලකිය යුතු ප්‍රගතියක් සාක්ෂාත් කර ගනිමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කර්තව්‍යයන් අතර විය. සිය ගණුදෙනුකාර සේවාවන් හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් නංවා ලීමේ අරමුණ සහිතව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී නව ජංගම උපයෝගයන් කිහිපයක් ද හඳුන්වා දෙන ලදි.

## වාණිජ ක්‍රියාකාරකම්

ගනුදෙණු කරුවන්ගේ මනු කියවීම් මගින් ඔවුන් විසින් පරිභෝජනය කරනු ලැබ ඇති ජල පරිමාව ප්‍රමාණනය කිරීම, සැබෑ කාල පදනම මත මාසික බිල් පත් නිකුත් කිරීම හා ජලය අලෙවි කිරීම මගින් ලැබෙන ආදායම රැස් කිරීම පිළිබඳව කටයුතු කරනු ලබන්නේ වාණිජ අංශය විසිනි. සාර්ථකත්වය සම්බන්ධව සලකා බැලීමේදී මෙම ප්‍රස්තුත වර්ෂය සිත් ගන්නාසුලු වර්ෂයක් විය. බිල් කිරීමේ ඉලක්කයන් ඉක්මවා ගොස් ඇති අතර ආදායම් රැස් කිරීමේ තත්ත්වය ද එසේම විය. කාල වේලාව නොඉක්මවමින් බිල් පත් නිකුත් කිරීම අවධාරණය කරන ලද අතර ඒ හරහා එකී ක්‍රියාවලිය කෙරෙහි ගනුදෙණු කරුවන් තුළ ඇති විශ්වාසය ඉහළ නැංවී ඇත. ගනුදෙණු කරුවන් වෙත නියමිත කාලය තුළ බිල් පත් ලැබීමේ තත්ත්වය 2019 වර්ෂය තුළදී ආසන්න වශයෙන් 83% ක් දක්වා ඉහළ ගොස් ඇත. මනුව වෙත ළඟා වීම සඳහා ගනුදෙණු කරුවාගේ මැදිහත් වීම අවශ්‍ය වන ස්ථානයන් සම්බන්ධයෙන් කල් තබා ගනුදෙණු කරුවන් සමග සම්බන්ධීකරණය වීම මගින් පරිශ්‍රයන් වසා තැබීම හේතුවෙන් ඇස්තමේන්තු කරන ලද බිල් පත් නිකුත් කිරීමේ අවශ්‍යතාවය හැකි තාක් දුරට වලක්වාගත හැකි විය. මෙම ප්‍රවේශය ගනුදෙණු කරුවන්ගේ තෘප්ති මට්ටම නංවා ලීමට ද උපකාරී විය.

### ගනුදෙණුකරුවන් වෙත කලට වේලාවට බිල් පත් ලැබීම




### බිල් කිරීම හා ගාස්තු රැස් කිරීම

ගනුදෙණු කරුවන්ට පහසු ආකාරයට මාසික බිල් පත් පියවීමට හැකි වන පරිදි පහසු ක්‍රම බොහෝ සංඛ්‍යාවක් ආරම්භ කරනු ලැබ ඇති අතර ගනුදෙණු කරුවන් එවැනි ක්‍රමයන් වෙත මාරු වන අයුරු දැක ගත හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මාසික බිල් පත් පියවන ගනුදෙණු කරුවන්ගේ සංඛ්‍යාවෙහි වර්ධනයක් දක්නට ලැබේ. සිය මාසික බිල් පත් කලට වේලාවට පියවීමට ගනුදෙණු කරුවන් පෙළඹවීම සඳහා විවිධ ප්‍රවේශයන් යොදා ගනු ලැබ ඇති අතර එසේ යොදා ගනු ලැබ ඇති එක් ප්‍රධාන ක්‍රමෝපායයක් වන්නේ නිරන්තරයෙන් සම්බන්ධතා විසන්ධි කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමයි. තවද බිල් පත ලැබී දින 14 ක් ඇතුලත බිල් පත පියවීම හරහා ලබා ගත හැකි ප්‍රතිලාභයන් පිළිබඳව හා බිල් පත් පියවීම දින 30 කට වඩා ප්‍රමාද කිරීම නිසා පනවනු ලබන දඩ පිළිබඳව ද ගනුදෙණු කරුවන් දැනුවත් කරනු ලැබ ඇත. හිඟ මුදල් එකතු කර ගැනීමේ තත්ත්වය ද කිසියම් දියුණුවක් පෙන්නුම් කරයි.




### ණය කාලය අඩු කිරීම

මාසික බිල් පත හා අදාල ලෙස ණය මැණ බලන ණය කාලය ද 2016 වර්ෂයේ පැවැති 0.67 සිට 2019 වර්ෂයේදී 0.40 දක්වා පහත බැස ඇත.




### අභ්‍යන්තර හා බාහිර ගනුදෙණුකාර තෘප්තිය

වඩාත් හොඳින් සේවාවන් සැපැයීමට හැකි වන පරිදි ගනුදෙණු කරුවන්ගේ අවශ්‍යතාවයන් සමාලෝචනය කොට විශ්ලේෂණය කිරීම අඛන්ඩ ලෙස සිදු කරන ලදි. ගනුදෙණු කරුවන් සතුටට පත් කිරීමේ අරමුණ සහිතව නිෂ්පාදන සංවර්ධනය කරන ලදි. එ වැනි පියවරයන්ට ඇතුලත් වන්නේ ස්වයං සේවා උපයෝග හා කෙටි පණිවුඩ සේවය මගින් සංනිවේදනය කිරීම වැනි ජංගම උපයෝගයන් හඳුන්වා දීම ද, මාසික බිල් පත් කලට වේලාවට ලබා දීම ද, කාර්ය මණ්ඩලයේ හැකියා මට්ටම වැඩි දියුණු කිරීම හා ගනුදෙණු කරුවන් වෙත සපයනු ලබන සේවාවන්ගේ මට්ටම නංවා ලීමේ අරමුණ ඇතිව සියළුම මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයින් තුළ දැනුවත් භාවය ඇති කිරීම ආදිය යන පියවරයන් වේ. අභ්‍යන්තර හා බාහිර ගනුදෙණුකාර තෘප්තිය අඛන්ඩ ලෙස නංවා ලීමේ අරමුණින් නිරන්තරයෙන්ම කාර්යසාධන සමාලෝචනයන් සිදු කරනු ලැබේ.

## ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය

කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් මූලික වශයෙන් කටයුතු කරන ලද්දේ ග්‍රාමීය හා ඌණ සේවිත ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම හා සනීපාරක්ෂණ පහසු කම් සපයා දීම සම්බන්ධයෙනි. දේශගුණ ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියෙහි (CRIWMP) දෙවැනි සංරචකය යටතේ පුත්තලම, අනුරාධපුර, වවුනියා හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් තුළ අධීක්ෂණය හා භූ ගත ජල ප්‍රභව සමීක්ෂණ පසුවිපරම් කිරීම්, සැලැසුම් කිරීම් හා ඉදි කිරීම් කටයුතු වලින් සමන්විත ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් හා ප්‍රජා මූල සංවිධානයන් පිහිටුවීමේ වැඩ කටයුතු කරන ලදි.  කුරුණෑගල හා පුත්තලම ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා අනුබද්ධිත තෝරා ගනු ලැබූ ජල ප්‍රතිකාරක හා පවිත්‍රකාරක පද්ධතීන් වෙත ක්‍ෂෙත්‍ර චාරිකා කරනු ලැබූ අතර ගෘහස්තයන් 2000 ක සංඛ්‍යාවක් තුළ වැසි ජලය රැස් කිරීමේ ටැංකි ස්ථාපිත කිරීමේ කටයුතු ද නිම කරන ලදි.

පරදු ධාරීන් සඳහා පවත්වනු ලබන පුහුණු කිරීම් හා හැකියා සංවර්ධන වැඩ සටහන් අවසන් කිරීම සඳහා වැඩ මුළුවක් පවත්වන ලදි. දේශගුණ ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) යටතේ ග්‍රාමීය සහභාගිත්ව ක්‍රම සම්පාදනය සම්බන්ධයෙන් වූ පුහුණු කරන්නන් පුහුණුකිරීමේ වැඩ සටහනක් කුරුණෑගලදී පවත්වන ලදි. දේශගුණ ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ අනු ව්‍යාපෘති ප්‍රදේශයන් තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම්, ප්‍රජා මූල සංවිධානයන් වෙනුවෙන් මූල්‍ය පුහුණු වැඩ සටහන් හා ප්‍රජා ක්‍රියාකාරී සැලැසුම් අංක 1 හා 2 ක්‍රියාත්මක කරන ලදි. 5 S සංකල්පය  හා ඵලදායිතාව නංවා ලීමේ ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් ද පවත්වන ලදි.

ව්‍යාපෘති තොරතුරු රැස් කරමින් හා ආවරණ සිතියම් පිළියෙල කරමින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියට (RIDEP) අදාල සමායෝජන කටයුතු උතුරු, නැගෙනහිර, ඌව හා උතුරු මැද පලාත් වල ක්‍රියාත්මක කරන ලදි. අතිරේක මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජිත ලෝක බැංකු ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තු ආකෘතිය පිළියෙල කිරීමේ කටයුත්ත ද නිම කරන ලදි.

කුරුණෑගල තලකොලවැව ප්‍රදේශය තුළ ආදර්ශ ගම්මානයක් නිර්මාණය කිරීමේ පියවර ආරම්භ කරන ලදි. එකී ආදර්ශ ගම්මානයේ අංගයක් වූ ළමා පුස්තකාලය විවෘත කරන ලද අතර රුක් සිටුවීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.

දැනට කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගත කිරීම සහ අංශය තුළ හඳුනා ගැනීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ජල සම්පාදන අංශය ප්‍රතිසංවිධානය කරන ලදි. නව පොත් පත් ලබා ගැනීම මගින් පුස්තකාලය ද ප්‍රතිසංවිධානය කරන ලදි. දැනට පවත්නා ග්‍රාමීය ජල සම්පාදන අංශයේ වෙබ් අඩවිය

හා අදාල ක්‍රම සම්පාදන හා සැලැසුම් කටයුතු ක්‍රියාත්මක කරන ලදි. 5 S සහතිකය ලබා ගැනීමේ අපේක්ෂාවෙන්  5 S ප්‍රමිතිකරණ අත් පොත පිළියෙල කිරීමේ ආරම්භක පියවර ගන්නා ලදි.  ජාත්‍යන්තර ජල සමුළුව හා සම්බන්ධ ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

## ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන

මහජන සම්බන්ධතා ඒකකය විසින් ගණුදෙනුකාර කණ්ඩායම්, පාසැල් දරුවන් හා පාරිභෝගික සමිති ඉලක්ක කර ගනිමින් විවිධ අධ්‍යාපනික හා දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් මෙහෙයවීම ක්‍රියාත්මක කරන ලදි. මෙහි ලා ප්‍රධාන අවධානය යොමු කරන ලද්දේ ජල සංරක්ෂණය, පාරිසරික පැතිකඩයන් හා ජලාශයන් ආරක්ෂා කිරීම කෙරෙහි වේ. මෙම වැඩ කටයුතු දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරන ලද අතර පාසැල් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 40 ක් හා රජයේ ආයතනයන් හා පුද්ගලික අංශයේ ආයතනයන් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 12 ක් විය.

ජගත් ජල දිනය සැමැරීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. පාසැල් දරුවන් වෙනුවෙන් මෙහෙයවන ලද නාට්‍ය, චිත්‍ර හා රචනා තරඟ මෙම සිද්ධීන් අතුරින් ඇතැම් ඒවා විය.

ජල සම්පාදන සේවාවට අදාල බොහෝ විවිධ පැතිකඩයන් සම්බන්ධයෙන් ඉලක්ක කණ්ඩායම දැනුවත් කිරීමේ පරමාර්ථයෙන් 2019 වර්ෂයේ මාර්තු, ජුනි හා සැප්තැම්බර් යන මාසයන්හිදි "ජලය" සඟරාව මුද්‍රණය කොට බෙදාහරින ලදි.

මහජන සම්බන්ධතා ඒකකය විසින් ජන මාධ්‍ය ප්‍රචාරක කටයුතු වල ද නියැලෙන ලදි. ජල සැපැයුම කපා හැරීම පිළිබඳ පණිවුඩ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විවෘත කිරීමේ උත්සව ආදිය පිළිබඳ විශේෂ වාර්තාවන් ආදී තොරතුරු මාධ්‍ය මගින් සපයන ලදි. මාධ්‍යයන්හි පළ වුන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිරූපයට හානිකර ලිපි ආදිය සම්බන්ධයෙන් ඒවා නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ගයන් ද ගන්නා ලදි.



නාට්‍ය තරඟය - ජගත් ජල දිනය - 2019.

## බල ශක්ති කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බල ශක්ති භාවිතය විශ්ලේෂණය කිරීමේ කටයුතු කරනු ලබන්නේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් වන අතර බල ශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා හඳුනා ගනු ලැබ ඇති උචිත ව්‍යාපෘතීන් සූදානම් කොට ක්‍රියාත්මක කරනු ලබන අතර එසේ කරනු ලබන්නේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ලබා ගනිමින් විශේෂිත බල ශක්ති පරිභෝජනය අවම කිරීම මගිනි.

2019 වර්ෂය තුළදී විදුලි බල පරිභෝජනය වෙනුවෙන් වැය වූ වාර්ෂික පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 4,506 ක් වූ අතර මෙම මුළු පරිභෝජන පිරිවැයෙන් 95.3% ක් හෙවත් රුපියල් මිලියන 4,296 ක් වැය වී ඇත්තේ ජල නිෂ්පාදනය හා පොම්ප කිරීම සඳහා වේ. ඒ අතර මළ අපවහන ප්‍රතිකාරිත කිරීම හා පොම්ප කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 70 ක් වැය වී ඇත. මේ අතර ආසන්න වශයෙන් රුපියල් මිලියන 141 ක මුදලක් කාර්යාල ඉඩ කඩ වෙනුවෙන් වැය කරනු ලැබ ඇත. බල ශක්ති සංරක්ෂණ වැඩ සටහන 2004 වර්ෂයේදී හඳුන්වා දෙන ලද අතර එය ක්‍රම ක්‍රමයෙන් සැලකිය යුතු ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇත. ගත වූ දශකයන් තුළදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් ක්‍රියාකාරකම් ඉහළ මට්ටමකට ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ගාස්තු වගු වර්ග නිවැරදි කිරීම්, විද්‍යුත් හා යාන්ත්‍රික වැඩි දියුණු කිරීම් කටයුතු හා වර්ෂ 2004 සිට වර්ෂ 2019 දක්වා පවත්වා සම්පූර්ණ කරන ලද බල ශක්ති සංරක්ෂණ වැඩ සටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් බල ශක්තිය හා ඒ වෙනුවෙන් වැය වන පිරිවැය බොහෝ සෙයින් ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

2019 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් අංශයන්හි සහයෝගය ලබා ගනිමින් බල ශක්ති විගණනයන් හා අධ්‍යයනයන් දහයක සංඛ්‍යාවක් පවත්වන ලදි. 2019 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 21 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරන ලදි. මෙම සම්පූර්ණයෙන් නිම කරන ලද හා ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් 2019 වර්ෂය තුළදී වැය කරන ලද මුළු මුදල ආසන්න වශයෙන් රුපියල් මිලියන 190 ක් විය. මෙම ව්‍යාපෘතීන් වල ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වාර්ෂික පිරිවැය ඉතිරි කිරීම් රුපියල් මිලියන 41 ක් විය. 2020 වර්ෂය තුළදී දැනට ක්‍රියාත්මක කරගෙන යමින් පවතින හා නව ව්‍යාපෘතීන් 49 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබ ඇති අතර ඒ සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂිත පිරිවැය ආයෝජනය ආසන්න වශයෙන් රුපියල් මිලියන 400 ක් වේ.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ අපේක්ෂිත සමස්ත කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් කිසිදු බිඳ වැටීමකින් තොරව මෙහෙයුම් කටයුතු කර ගෙන යාම සහතික කිරීමේ අරමුණින් එක් එක් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් අංශයෙහි කාර්ය මණ්ඩල සාමාජිකයින් හරහා කලාපයන්හි ඇති සියළුම යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණයන්ට අදාලව සැලසුම් කරන ලද නිවාරණ නඩත්තු වැඩ සටහන පසු විපරමට භාජනය කරන ලදි.

සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින් යොදා ගනිමින් මට්ටම් පසු විපරම් හා දුරස්ථ මෙහෙයුම් පද්ධතීන් (SCADA) සැලසුම් කොට දේශීයව නිපදවන ලද අතර ඒවා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ලබා ගනිමින් තෝරාගත් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ස්ථාපිත කරන ලදි.

වාහන, ජල මනු හා වෙනත් යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ මිළ දී ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් ලිපි ලේඛන හා පිරිවිතර පිළියෙල කරන ලදි. යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වලට අදාල සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, නඩත්තු කිරීම හා වෙනත් ක්‍රියාකාරකම් හා සම්බන්ධ සහාය දීමේ විධි විධානයන් අවශ්‍යතාවය පැන නැගී ඇති විට කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත හා ව්‍යාපෘතීන් වෙත සපයා දෙන ලදි.

ඉහතින් දක්වනු ලැබ ඇති කටයුතු වලට වැඩිමනත් වශයෙන් ප්‍රවාහන අංශය, මධ්‍යම වැඩ පොල හා ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය යනාදී අංශයන් ද පරිපාලනය කරනු ලබන්නේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසිනි.

යාන්ත්‍රික හා විද්‍යුත් අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන අංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් සියළුම වාහන හා උපකරණ වලට අදාල බල පත්‍ර, රක්ෂණ කටයුතු, නව ලියා පදිංචි කිරීම් පිළියෙල කිරීම, කාර්යාලයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහන ලබා දීම හා අදාල කටයුතු කිරීම, සුභ සාධන කටයුතු හා හදිසි අවස්ථාවන්හිදී වාහන සැපයීම, පරිගණක දත්ත ගබඩාව නඩත්තු කිරීම, වැය විස්තර හා හදිසි අනතුරු විස්තර ඇතුලත් වාර්තා නඩත්තු කිරීම ආදී කටයුතු කරනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික හා විද්‍යුත්) යටතේ ක්‍රියාත්මක වන ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල සංකීර්ණයට හා සොයිසා පුර, බඩෝවිට හා රාවතාවත්තේ පිහිටි මණ්ඩලීය නිල නිවාසයන්ට අදාල සියළුම නඩත්තු කටයුතු ඉටු කරනු ලබයි.

මධ්‍යම වැඩ පොල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන වැඩ පොල වන අතර එම වැඩ පොල විසින් ජල හා මළ අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි පොම්ප හා උපාංග ඇතුළු සියළුම යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වලට අදාල මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට අදාල සහාය කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත සපයා දෙනු ලබයි.

## මධ්‍යම රසායනාගාරය

2019 වර්ෂය තුළදී පරීක්ෂණයන්ට අදාල කර ගන්නා ලද මුළු නියැදීන්ට අදාල විශ්ලේෂණාත්මක දත්තයන් මගින් හෙලිදරව් වන ලද්දේ පරීක්ෂණ අනුව බැක්ටීරියා විද්‍යාත්මක ජල ගුණාත්මය 99.3% ක සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරනු ලබන බව හා භෞතික විද්‍යාත්මක හා රසායන විද්‍යාත්මක පරීක්ෂණ අනුව 87.8% ක සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරනු ලබන බවයි.

(ඇළුමිනියම් සල්ෆේට් හා සජල කරන ලද හුණු ආදී) ජලය ප්‍රතිකාරිත කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන රසායන ද්‍රව්‍යයන් රසායනික පරීක්ෂණයට භාජනය කිරීම සම්බන්ධයෙන් මධ්‍යම රසායනාගාරය වෙත 2017 වර්ෂයේදී හා බටහිර නිෂ්පාදන හා අඹතලේ රසායනාග ාරය වෙත 2014 වර්ෂය තුළදී ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන / IES 17025 : 2005 රසායනාගාර පිළිගැනීමේ තත්ත්වය පිරිනමන ලද අතර එම ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන ප්‍රමිතිය 2019 වර්ෂය මුළුල්ලේම සාර්ථක ලෙස ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව ලැබිණි. මීට අමතර වශයෙන් බටහිර දකුණ රසායනාගාරය වෙත හා (දෙහිවල හා පානදුර ආදී) කලාපීය රසායනාගාරයන් වෙත භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් පරීක්ෂණයට භාජනය කිරීම සම්බන්ධයෙන් හා ජලයේ භෞතික හා රසායනික පරාමිතීන් පරීක්ෂණයට භාජනය කිරීම සම්බන්ධයෙන් යාපනයේ හා වවුනියාවේ රසායනාගාරයන් වෙත ද 2019 වර්ෂයේදී ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන /IES 17025 රසායනාගාර පිළිගැනීමේ තත්ත්වය පිරිනමන ලදි. මේ අතර, එම රසායනාගාරයන් විසින් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන /IES 17025 : 2018 රසායනාගාර පිළිගැනීමේ නව සංශෝධිත තත්ත්වය ලබා ගැනීමට සූදානම් වෙමින් සිටිනු ලැබේ.

ජල ගුණාත්ම පරාමිතීන් හා සම්බන්ධ පිළිගැනීම් ලබා ගැනීම සඳහා කඳාන හා බියගම ක්‍රියාත්මක වන රසායනාගාරයන් විසින් ඉදිරි කටයුතු කරගෙන යනු ලබමින් පවතී. ජල ගුණාත්මයේ සත්‍යාපන මන්තු කිරීම් සඳහා බස්නාහිර මධ්‍යම කලාපය තුළ රසායනාගාරයන් දෙකක් ස්ථාපිත කරන ලදි.

මධ්‍යම රසායනාගාරය විසින් හරිත ප්‍රද සහිත සරල ශාඛ (ඇල්ගී) හා හරිත ප්‍රද සහිත සරල ශාඛ විෂ ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම, ජෛව ස්කන්ධ ප්‍රමාණ කරණය, ඉක්මනින් වෙනස් වන කාබනික සංයෝග යන් හා ජල ප්‍රතිකාරක රසායනික ද්‍රව්‍යයන් - කුඩු මගින් ක්‍රියාත්මක වන අංගාර විශ්ලේෂණය කිරීම සඳහා විශ්ලේෂණාත්මක විෂය පථයක් සංවර්ධනය කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති 614 මගින් යොමු කරනු ලැබ ඇති ආකාරයට හා ශ්‍රී ලංකා ප්‍රමිති 1461 මගින් පෙන්වා දෙනු ලැබ ඇති ආකාරයට අපජල විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට හැකි වන පරිදි ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක අංශය වැඩි දියුණු කරනු ලැබ ඇත.

## ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම

බස්නාහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අංශය විසින් කලාපීය සහාය සේවා ප්‍රදේශය තුළ පමණක් නොව ඉන් බාහිර ප්‍රදේශයන් තුළ පවා කාන්දු සොයා ගැනීම, කපාට හඳුනා ගැනීම, නල මාර්ග හඳුනා ගැනීම, ප්‍රවාහ හා පීඩන මිණුම් ගැනීම, නීති විරෝධී භාවිතය සොයා ගැනීම, කාන්දු සමීක්ෂණ, අභ්‍යන්තරික කාන්දු සොයා ගැනීම, දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම, කාන්දු අළුත්වැඩියා කිරීම හා දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් හුදෙකලා කිරීම වැනි බොහෝ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ක්‍රියාකාරකම් 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඊට අමතර වශයෙන් එම අංශය විසින් මහ කොළඹ ජල හා අපජල වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන (GCWWMIIP) විසින් කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය පසු විපරම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ද සිදු කරනු ලැබ ඇත. මෙම තත්ත්වයන් යටතේ කොළඹ නගරය තුළ ආදායම් රහිත ජල පරිමාව 40.2% ක් දක්වා අඩු කර ගැනීමේ හැකියාව ලැබී ඇති අතර එය ගත වූ වර්ෂය හා සංසන්දනය කරන විට 1.0% ක අඩු වීමකි. ප්‍රස්තුත වර්ෂය තුළදී බස්නාහිර මධ්‍යම කලාපයේ ආදායම් රහිත ජල පරිමාව 30.7% ක් වූ අතර එය ගත වූ වර්ෂය සමග සාපේක්ෂකව බලන විට 0.9% ක අඩු වීමකි. ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ ක්‍රියාකාරකම් වලට අමතර වශයෙන් ආදායම් රහිත ජල පරිමාව කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් ද මෙහෙයවන ලදි.

## භූගත ජලය

භූ ගත ජල අංශය ප්‍රධාන වශයෙන්ම නියැලී සිටින්නේ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම අරමුණු කර ගත් භූ ගත ජලය හා සම්බන්ධ වැඩ කටයුතු වල වන්නේය. 2019 වර්ෂය තුළදී භූ ගත ජල අංශය විසින් භූ ගත ජලය හා සම්බන්ධ වැඩ කටයුතු විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද්දේය.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජල භූ විද්‍යාත්මක විමර්ෂණ කටයුතු, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම හා දිගු කාලීන ලෙස භූගත ජලය උකහා ගැනීම සඳහා ඇති විභව හැකියාව මැණ බැලීම පිණිස ළිං හා ජලධරයන් සතු විභව හැකියාවන් තක්සේරු කිරීම වැනි භූගත ජලය සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා සම්බන්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ක්‍රියාත්මක කරන ලදි. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ගැඹුරු හා නොගැඹුරු නල ළිං සංවර්ධනය කිරීම, ළිං ශීර්ෂ ආරක්ෂා කිරීම, භූ ගත ජලය ප්‍රති ආරෝපණ අධ්‍යයනයන්, ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන හා සහන නියෝජිත ආයතනයේ (ADRA) හා නොදන්නා හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝග අරමුදල් යටතේ අත් පොම්ප අළුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම හා භූ ගත ජලය හා සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් අධ්‍යයනයන් කිරීම ද ප්‍රස්තුත වර්ෂය තුළදී සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි. මුළු සංඛ්‍යාවන් වශයෙන් ගත් කල ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 441 ක් ද, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම් 201 ක් ද, ළිං සෝදා හැරීම් හා සංවර්ධනය කිරීම් 190 ක් ද, නව අත් පොම්ප ස්ථාපිත කිරීම් 34 ක් ද, අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් 484 ක් ද, පොම්ප කිරීමේ පරීක්ෂණයන් 161 ක් ද 2019 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා හා නව ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ප්‍රභව ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 8000 කින් වර්ධනය වී තිබේ.

භූ ගත ජල අංශයේ හැකියා වර්ධන කටයුතු වශයෙන් භූ ගත ජල ප්‍රභව සංවර්ධනය සහ විදමන් ඉදි කිරීම හා නඩත්තු කිරීම වැනි විෂයයන් ඇතුලත් පුහුණු වැඩ සටහන් භූ ගත ජල අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා තවත් අය වෙනුවෙන් මෙහෙයවන ලදි. භූ ගත ජල අංශයේ නව අනාගත අවධානයන් යොමු වන්නේ පිටාර ගලන ළිං පිළිබඳ අඛණ්ඩ අධ්‍යයනයන්, අත්තනගලු ඔය ද්‍රෝණිය වෙනුවෙන් කරනු ලබන ආකෘතිකරණය, ළිං ශීර්ෂ ආරක්ෂා කිරීම, භූ ගත ජලය දූෂිත වීම, භූ ගත ජල සිතියම්කරණය හා භූ ගත ජල ගතිකයන් සඳහා සමස්ථානික අධ්‍යයනයන් කිරීම කෙරෙහි ද වන්නේය.

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය අපහසුවකින් තොරව ලබා ගත හැකි තත්ත්වයක තිබිය යුතු අතර එය සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් නිවැරදි මිළ දී ගැණුම් ප්‍රතිපත්තින් පවත්වාගෙන යා යුතු වන අතර ප්‍රතිසම්පාදන හා භාණ්ඩ ගබඩා කිරීමේ නිවැරදි ක්‍රියා පටිපාටීන් ද අනුගමනය කළ යුතු වේ. ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේම කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය රසායන ද්‍රව්‍ය සම්පාදනය කර දීමෙහි හා ඕනෑම අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දීමට හැකි වන පරිදි ස්වාරක්ෂක තොග පවත්වාගෙන යන අතර ප්‍රස්තුත වර්ෂය තුළ සියළුම නව සේවා සම්බන්ධතාවයන්ට අවශ්‍ය ද්‍රව්‍ය බාධාවකින් තොරව ලබා දීම ද ඉතා සාර්ථක ලෙස ඉටු කිරීමට සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය සමත් විය. නැව් භාණ්ඩ තොග 650 ක සංඛ්‍යාවකට අධික සංඛ්‍යාවක් නිෂ්කාශනය කර ගැනීමේදී නගර සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යංශය, රජයේ මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා රේගුව, බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, නැව් සමාගම්, රක්ෂණ සමාගම් හා නිෂ්කාශන නියෝජිත ආයතන වැනි ආයතනයන් සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් හා කාර්යක්ෂමතාවය සහතික කරමින් නැව් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවය වලක්වා ලමින් අදාල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය නැව් බඩු තොග නිෂ්කාශනය කර ගැනීමේ ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යන ලදි. මීට අමතර වශයෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී දේශීය මිළ දී ගැණුම් සඳහා මිළ දී ගැණුම් ඇණවුම් 983 ක් හා ප්‍රදාන ලිපි ආසන්න වශයෙන් 100 ක් නිකුත් කරනු ලැබ ඇති අතර ඒවායේ වටිනාකම රුපියල් මිලියන

264 ක් විය. ව්‍යාපෘතීන් වෙනුවෙන් ගෙන්වනු ලබන නැව් භාණ්ඩ සඳහා ගෙවිය යුතු රේගු බදු ගෙවීම පිණිස අරමුදල් වෙන් කිරීම් නොතිබුණ හෙයින් ඒවා සඳහා ප්‍රමාද නැව් ගාස්තු ගෙවීමට සිදු විය.

තොග අඩු කිරීම සඳහා මෙම අංශය විසින් ක්‍රම කිහිපයක් අනුගමනය කරන ලදි. මෙම වර්ෂය තුළදී අළුතින් ද්‍රව්‍ය මිළයට නොගෙන අතිරික්ත වශයෙන් තිබෙන ද්‍රව්‍ය දිවයින පුරා පිහිටි කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත නැවත බෙදා දීම මගින් රුපියල් මිලියන 125 කට වැඩි මුදලක් ඉතිරි කර ගැනීමේ හැකියාව ලැබිණි.

ඉන්වෙන්ටරි කළමනාකරණ මෘදුකාංගයක් හඳුන්වා දීම මගින් මුළු දිවයින පුරාම පිහිටි 342 ක සංඛ්‍යාවක් වූ ගබඩාවන් සියල්ල සම්බන්ධ කිරීමේ අරමුණින් දියත් කරන ලද ක්‍රියාවලියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එය පියවරෙන් පියවර ක්‍රියාත්මක කරනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත. දීප ව්‍යාප්ත ලෙස පිහිටුවනු ලැබ ඇති ගබඩාවන් වෙත පරිගණක යන්ත්‍ර 143 ක සංඛ්‍යාවක් බෙදා දෙනු ලැබීමට සැලසුම් සකස් කරන ලද අතර දැනට එම කර්තව්‍යය සම්පූර්ණ වශයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇත. මෙම සැලසුම සම්පූර්ණ ක්‍රියාත්මක තත්ත්වයට පත් වන තෙක් ගබඩාවන් තුළ ඇති අතිරික්ත හා භාවිතයට ගනු නොලබන අයිතමයන් හඳුනා ගෙන අවශ්‍යතාවය පරිදි කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත නිකුත් කිරීමට හැකි වීම සඳහා එවැනි අතිරික්ත හා භාවිතයට ගනු නොලබන අයිතමයන් පිළිබඳව තොරතුරු සොයා ගැනීම පිණිස තොග කෙටි පණිවුඩ සේවා ක්‍රමයක් අඛන්ඩ ලෙස භාවිතා කරනු ලබමින් පවතී. වග කීම් කාල සීමාව ඉක්ම ගොස් නොමැති දෝෂ සහිත ජල මණු සම්බන්ධයෙන් වන්දි හිමිකම් පෑමේ කටයුත්ත පරිගණක මෘදුකාංගයක් හරහා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට මේ වසර තුළදී හැකි විය. මේ අතර දීප ව්‍යාප්ත ලෙස පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලයන් හා ගබඩා සඳහා රුපියල් මිලියන 300 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ මිළ දී ගැනීමට ද ප්‍රස්තුත වර්ෂය තුළදී හැකි විය.

මෙම වර්ෂය තුළදී රුපියල් මිලියන 1,108.47 ක් වටිනා කොන්ත්‍රාත්තු ප්‍රලේඛන 18 ක සංඛ්‍යාවක් පිළියෙල කරන ලදි. ඒ අතර ආසන්න වශයෙන් රුපියල් මිලියන 42 ක් වටිනා අතිරික්ත හා ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය හා අයිතමයන් තොග 68 ක් අලෙවි කිරීම සඳහා 2019 වර්ෂය අවසානයේ ටෙන්ඩර් කැඳවන ලදි. තමන් වෙත වෙන් කර දෙන ලද අය වැය වෙන් කිරීම් තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම අංශයට හැකි වූ අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ සමස්ත කාර්ය සාධනය අපේක්ෂා කරන ලද මට්ටමට තිබුණ බව කිව හැකි වේ.

## හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩ සටහන

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සෞඛ්‍ය ගැටළුවක් බවට පත් වී තිබේ. ආරම්භක අවස්ථාවන්හිදී එම ගැටළුව සීමා වී තිබුනේ උතුරු මැද හා ඌව පලාත් වලටය. එහෙත් දැනට එය වයඹ, උතුරු, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව හා දකුණු යන පලාත් වල ද බහුල ලෙස ව්‍යාප්ත වී තිබේ.

ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වෛද්‍ය වෘත්තිකයින්ගේ නිර්දේශයන් පරිදි හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමේ අරමුණින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායයන් හා කාර්ය සැලසුම් සකස් කරනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ සහයෝගිතාවය සහිතව 2019 වර්ෂය තුළදී රුපියල් මිලියන 173.47 ක මුදලක් ආයෝජනය කරමින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය නිවාරණය කිරීමේ අරමුණ සහිතව බොහෝ නිවාරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සපයා ස්ථාපිත කිරීම, නල මාර්ග දීර්ඝ කිරීම්, නව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් දියත් කිරීම හෝ ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම, මිහි විදමන් ඉදි කිරීම, කුඩා පරිමාණ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර සපයා ස්ථාපිත කිරීම, වැසි ජලය රැස් කිරීම සඳහා ටැංකි ස්ථාපිත කිරීම, බවුසර මගින් ජලය සම්පාදනය කර ලීම, ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම, විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර හා අත් පොම්ප අළුත්වැඩියා කිරීම හා 2018 වර්ෂයට අදාල බැර කම් ගෙවීම මෙම වෙන් කිරීම මගින් ප්‍රධාන වශයෙන් ආවරණය කරන ලදි.

## සංවර්ධනය

2019 වර්ෂය තුළදී සංවර්ධන අංශය විසින් ප්‍රධාන වශයෙන්ම නිරත වන ලද්දේ ජල සුරක්ෂිතතා සැලසුම් කිරීමේ ක්‍රියාකාරකම් හා ජල ප්‍රභවයන් සැලසුම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාකාරකම් යන වැඩ කටයුතු වල වේ.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හතක සංඛ්‍යාවක් වෙත ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මග පෙන්වීම් ලබා දීමේ කටයුතු, ජල සුරක්ෂිතතා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම, ජල සුරක්ෂිතතා උපදේශක ඒකකය සමග එක් වී බුද්ධි කළම්බන සැසියක් මෙහෙයවීම, ඉහතින් සඳහන් කලාපයන් වෙනුවෙන් අවිධිමත් අභ්‍යන්තර විගණන විගණන පැවැත්වීම හා විධිමත් අභ්‍යන්තර විගණන පැවැත්වීම සහ ජල සුරක්ෂිතතා සැලසුම් පුහුණු වැඩ සටහන් පැවැත්වීම ද සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන ජල සුරක්ෂිතතා සැලසුම් ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද්දේය.

මුහුණ දුන් හා අත් විඳින්නට සිදු වුන ජලය උකහා ගැනීමේ ගැටළු සම්බන්ධයෙන් මෙන්ම අදාල සංවිධානයන් වෙතින් ජලය උකහා ගැනීමේ හිමිකම් ලබා ගැනීමකින් තොරව නව ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට තැත් කිරීමේදී හමු වන දුෂ්කරතාවයන් සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කළ හැකි වන පරිදි පරදු ධාරීන් අතර ජලය බෙදා හදා ගැනීම සඳහා 2019 වර්ෂයේදී ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් පිහිටුවා ගන්නා ලදි. ඒ අනුව අදාල පරදු ධාරීන් අතර සුහද ශීලී සම්බන්ධතාවයක් ගොඩ නගා ගනිමින් මෙම ගැටළු සම්බන්ධයෙන් අදාල ආයතනයන් අතර වඩාත් හොඳ අවබෝධයක් ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරි මාර්ග දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වීමේ වැදගත් කම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලදි.

තවද විශේෂයෙන්ම ගෘහස්ත හා කර්මාන්ත අංශයන් තුළ අධික වේගයෙන් වර්ධනය වන ජල භාවිතය හේතුකොට ගෙන මෙන්ම දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ද නුදුරු අනාගතයේදී වර්ෂය පුරාම ජල හිඟය වඩාත් උග්‍ර විය හැකි බව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අවබෝධ කරගනු ලැබ තිබේ. එම නිසා එම තත්ත්වය සඳහා විසඳුමක් වශයෙන් පානීය ජලය උකහා ගැනීමේ පරමාර්ථය සඳහා රැස්කුරු ජලාශයන් හඳුන්වා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇති අතර ඒ අනුව යටිමහන, වී ඔය හා වඳුරාපිනුඇල්ල යෝජිත රැස්කුරු ජලාශයන්ට අදාල සක්‍යතා අධ්‍යයනයන් ආරම්භ කරනු ලැබ ඇත.

## පර්යේෂණය හා සංවර්ධනය

ප්‍රස්තුත වර්ෂය තුළදී පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු බොහෝ සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි. ජල නල හා සවි කිරීම් ක්‍රමවත් බවට පැමිණවීම සඳහා සහ සහතික ලත් ජල නල කාර්මිකයින් හඳුන්වා දීම සඳහා මොරටුව ප්‍රාදේශීය ඉංජිනේරු කොට්ඨාශය තුළ පාරිභෝගිකයින්ගේ පාර්ශවයේ ජල කාන්දු පිරිඅග උයුමට භාජනය කරන ලදි. ව්‍ය අගය හා මූලික ෆ්ලුඕරයිඩ් සාන්ද්‍රණය සමග ෆ්ලුඕරයිඩ් ඉවත් කිරීමේ කාර්යක්ෂමතාවය ප්‍රසස්ත මට්ටමට ගෙන වීම සඳහා සක්‍රිය කළ කාබන් හා සක්‍රිය කළ ඇලුමිනා භාවිතා කරමින් අවශෝෂණය සිදු කරන ලදි. පලංජිය ආරක්ෂක මාස්ටික් ද්‍රව්‍ය සම්බන්ධයෙන් සපයන්නන් 5 දෙනෙකුගෙන් ලබාගත් මාස්ටික් ද්‍රව්‍ය භාවිතා කරමින් මොරටුව විශ්ව විද්‍යාලයේ පවත්වන්නට යෙදුන නියමු අධ්‍යයනයක් මගින් පර්යේෂණයක් පවත්වන ලදි. තවද ස්ථායිකරණ පොකුණු තුළ ක්ෂුද්‍ර හරිතප්‍රද සහිත සරල ශාඛ හෙවත් ඇල්ගේ යොදා ගනිමින් අපජලය අංගාරිකාම්ල ජෛව ප්‍රයෝජ්‍ය කිරීම පිළිබඳ පර්යේෂණය හ සුරක්ෂිත ජලය නොලැබෙන ප්‍රදේශයන් වෙත ආහාර පිළියෙල කිරීම හා පානය කිරීම සඳහා සුරක්ෂිත ජලය සපයා දීමේ යෝජනාව හා භූ ගත ජලය, ස්වයංක්‍රියකරණ පද්ධතීන්, මෙන්ම ජලය ප්‍රතිකාරිත කිරීම ආදිය පිළිබඳ පර්යේෂණයන් ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනාගත ජලය ප්‍රතිකාරිත කිරීමේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය හරහා ලැබුණ ප්‍රදානය යටතේ දින දෙකක වැඩ මුළුවක් පවත්වන ලද අතර භූ ගත ජලය ප්‍රතිකාරිත කිරීම සම්බන්ධයෙන් සහයෝගිත්ව අධ්‍යයනයක් පැවැත්වීම සඳහා සීමා සහිත ඉයොන් එක්ස්චේන්ජ් ඉන්දියා සමාගම සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. වාර්ෂික පර්යේෂණ හා සංවර්ධන සම්මන්ත්‍රණය වෙත ඉදිරිපත් කරන ලද පත්‍රිකාවක අන්තර්ගත යෝජනා ක්‍රියාත්මක කිරීමක් වශයෙන් යාන්ත්‍රික හා විද්‍යුත් අංශය හා ඒකාබද්ධ වී කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත බල ශක්ති කළමනාකරණ ක්‍රම හඳුන්වා දීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

ජාත්‍යන්තර ජල සංගමයේ හා 2019 ජලය හා සංවර්ධනය සම්මේලනය හා ප්‍රදර්ශනයේ සහයෝගිත්වය සහිතව පස් වැනි පර්යේෂණ හා සංවර්ධන සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් 02 වැනි දින පවත්වන ලද අතර එහිදී ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා සබරගමුව විශ්ව විද්‍යාලයය යන ආයතනයන් හා සම්බන්ධ බාහිර කතු වරුන් තිදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පත්‍රිකා 03 ක් ඇතුළු පත්‍රිකා 09 ක් ඉදිරිපත් කරන ලදි. එසේම පෝස්ටර් ඉදිරිපත් කිරීම් 4 ක් ද එහිදී ඉදිරිපත් කරන ලදි. එහිදී මුඛ්‍යාර්ථ දේශනය පවත්වන ලද්දේ ජාත්‍යන්තර ජල සංගමයේ ප්‍රධාන විධායක මහාචාර්ය කලානිදි වයිරවමූර්ති විසිනි. විවිධ අංශයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වය හා පත්‍රිකා පිළියෙල කිරීම වැඩි දියුණු කිරීම, ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා පත්‍රිකා ඉදිරිපත් කිරීමේ කුසලතා නංවා ලීමේ පරමාර්ථයෙන් කර්තෘ වරුන් වෙනුවෙන් මෙහෙයවන ලද පුහුණු කිරීම් සැසි හේතුකොට ගෙන එකී සිද්ධිය සාර්ථක එකක් විය.



**මහාචාර්ය කලානිදි වයිරවමූර්ති විසින් මුඛ්‍යාර්ථ දේශනය පැවැත්වීම**

## භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන (GCWWMIIP) විසින් වෙබ් අඩවිය පදනම් වූ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබ ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් භූගෝලීය තොරතුරු පද්ධතිය පදනම් වූ වත්කම් කළමනාකරණය මගින් ආදායම් රහිත ජල පරිමාව නිවැරදි ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව ලැබෙනු ඇත. එම ප්‍රතිඵලය විසින් සිතියම් දෘෂ්ඨි කල්පනය, දැනට පවත්නා කළමනාකරණ තොරතුරු පද්ධතිය සමග භූගෙ ෝලීය තොරතුරු පද්ධතිය ඒකාබද්ධ වීම හා ඒ ඇසුරින් වත්කම් වල තත්ත්වය, ස්ථාපනය හා පිහිටි ස්ථානය ගැන පසු විපරම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ හැකියාව මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර මෙහෙයුම් පහසුකරණය කරනු ලබනවා ඇත.

මෙම වෙබ් අඩවිය පදනම් වූ භූගෝලීය තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා භූගෝලීය තොරතුරු පද්ධති හා සිතියම්කරණ අංශය විසින් ප්‍රධාන භූමිකාවක් ක්‍රියාත්මක කරනු ලබන අතර එය ප්‍රධාන කාර්යාලය තුළ ස්ථාපිත කරනු ලැබ ඇති ප්‍රධාන සේවා දායකය හා සම්බන්ධ කරනු ලබනවා ඇත. සියළුම භූ අවකාශීය ක්‍රියාකාරකම් මෙම සේවා දායකය තුළ සටහන් වනු ලබනවා ඇත. මෙම අංශය ප්‍රධාන පසු විපරම් හා සම්බන්ධීකරණ අංගය වන අතර එය තෝරාගත් කලාපීය කාර්යාලයන් තුළ අතථ්‍ය පෞද්ගලික ජාල :ඩ්ඡහ* සම්බන්ධතාවයන් ස්ථාපිත කිරීම හා සම්බන්ධ වෙයි. මෙම කාර්යය සැලැසුම් කරන ලද පරිදි සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලද අතර පද්ධතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලබා ගත හැකි සංඛ්‍යාංක දත්තයන් ඒ මගින් සම්පාදනය කර දෙනු ලැබිණි.

2019 වර්ෂය තුළදී භූගෝලීය තොරතුරු පද්ධති හා සිතියම්කරණ අංශය විසින් වෙබ් අඩවිය පදනම් වූ භූගෝලීය තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය ආර්ක් භූගෝලීය තොරතුරු පද්ධති පුහුණුව සැලසුම් කිරීමෙහි හා සම්බන්ධීකරණය කිරීමෙහි යෙදෙන ලදි. මේ යටතේ සේවක මණ්ඩල සාමාජිකයින් 165 දෙනෙකු වෙනුවෙන් මූලික සිතියම් සකස් කිරීම පිළිබඳ පුහුණුව හා වෙබ් අඩවිය පදනම් වූ භූගෝලීය තොරතුරු පද්ධති පුහුණුව (ඉහළ මට්ටමේ පුහුණුව) ලබා දෙන ලද අතර ඒ සඳහා පුහුණු ලාභීන් තෝරාගන්නා ලද්දේ සෑම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයකින් හා කළමනාකාර කාර්යාලයකින්ම සහභාගි වන්නන් දෙදෙනෙකු බැගින් නම් කරන ලෙස කරන ලද දැනුම් දීමක් අනුව වේ.

මෙයට අමතර වශයෙන් සංඛ්‍යාංක ජල උපයෝගිතා දත්ත සම්පූර්ණ කිරීම හා යාවත්කාලීන කිරීම ද, දත්ත ඉල්ලීම් ඉටු කිරීම ද, දත්ත සංඛ්‍යාංක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්හි භූගෝලීය තොරතුරු පද්ධති ක්‍රියාකාරකම් සඳහා සහාය දීම ද අඛණ්ඩ ලෙස සිදු කරන ලදි.

## ජල සුරක්ෂිතතා සැලැසුම්

ලෝක සෞඛ්‍ය සංවිධානයේ පානීය ජලයේ ගුණාත්මය සම්බන්ධයෙන් වූ මග පෙන්වීම් මගින් පානීය ජල සම්පාදනයක සුරක්ෂිතතාවය ස්ථාවර ලෙස සහතික කිරීමේ ඉතාම කාර්ය සාධක මාර්ගය වශයෙන් නිර්දේශ කරන ලද්දේ ජල සුරක්ෂිතතා සැලැසුම් වේ.

ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය යටතේ සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙනුවෙන් නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් පුහුණු කිරීම් වැඩ සටහන් එකොළහක් පවත්වන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කැප වීමත් සමග (2019 දෙසැම්බර් මස 31 වැනි දිනය වන විට) නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම 264 ක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කළ හැකි වූ අතර ප්‍රතිශතයක් වශයෙන් ගත් කල එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රම මුළු සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 77% ක් වන අතර ඊට රට තුළ ක්‍රියාත්මක වන සියළුම ප්‍රධාන නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඇතුලත් වේ.

තවද අද වන විට මහනුවර පිහිටි ජල සුරක්ෂිතතා උපදේශක ඒකකය විසින් අවිධිමත් අභ්‍යන්තර විගණන 17 ක සංඛ්‍යාවක් හා විධිමත් අභ්‍යන්තර විගණන 17 ක සංඛ්‍යාවක් පවත්වනු ලැබ ඇත. මීට වැඩිමනත් වශයෙන් අග්නි දිග ආසියානු හා දකුණු ආසියානු කලාපයන් තුළ ප්‍රථම වරට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වරුන්ගේ ආයතනයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට පිහිටි කාර්යාලයේ සහයෝගිතාවය ලබා ගනිමින් විධිමත් බාහිර විගණනයන් 14 ක සංඛ්‍යාවක් සිදු කරනු ලැබ ඇත.

මේ හැරුණ විට දිස්ත්‍රික්ක 7 ක ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ලෝක බැංකු සහායෙන් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) ද අප හා අත්වැල් බැඳගෙන ඇත.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ජල සුරක්ෂිතතා සැලැසුම් සංකල්පයෙහි වැදගත් සන්ධිස්ථානයක් සළකුණු කරමින් ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (WASSIP) හා ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ (DONCWS) ද සහයෝගිතාවය ලබා ගනිමින් ග්‍රාමීය ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ද මේ වන විට ආරම්භ කරනු ලැබ ඇත. මීට වැඩිමනත් වශයෙන් ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (WASSIP) හා ලෝක දැක්ම (World Vision) වැනි රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ද දායකත්වය ලබා ගනිමින් වතු අංශය තුළ ද ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම දැනට සිදු කරනු ලබමින් පවතී. ගලිගමුව නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සැලැසුම් අදියර තුළදී ජල සුරක්ෂිතතා සැලැසුම් සංකල්පය ඊට ඇතුළු කරන ලද අතර ඒ සම්බන්ධ වැඩි දියුණු කිරීම් කිහිපයක් ද කරනු ලැබ ඇත. ඒ ආකාරයටම සියළුම නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ හා තෝරා ගනු ලැබූ ග්‍රාමීය හා වතු ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ද ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) යටතේ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී. ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකය (WSPAU) විසින් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම සඳහා එම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත කලින් කල උපදෙස් දීමේ හා සහාය දීමේ චාරිකා සිදු කරනු ලබයි. ඒ නිසා 2020 ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රමෝපායික සැලැසුමේ අන්තර්ගත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමෙහි ලා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය නිවැරදි මාර්ගය වෙත අවතීර්ණ වී ඇත - එනම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සුරක්ෂිතතා කමිටුවේ දැක්ම වූ "පොහොසත් ජීවිතයක් සඳහා සුරක්ෂිත ජලය" යන්න සාක්ෂාත් කර ගනිමින් රටේ සෑම පුරවැසියකු වෙතම සුරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා සාකල්‍ය ප්‍රවේශයකින් යුතුව ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම වන්නේය.



" ජලය නොමැතිව පැවැත්මක් ඇති විය නොහැක."

# යටිතල පහසුකම් සංවර්ධනය



යාපනයේ තුළුමුව

# කලාපීය සභාය සේවා මධ්‍යස්ථාන.

| පළාත/ කලාපීය සේවා මධ්‍යස්ථානය | සම්බන්ධතා සංඛ්‍යාව |
|---|---|
| ● මධ්‍යම | 282,214 |
| ● නැගෙනහිර | 286,003 |
| ● උතුරු මැද | 131,995 |
| ● වයඹ | 87,855 |
| ● උතුර | 28,064 |
| ● සබරගමුව | 118,854 |
| ● දකුණ | 330,915 |
| ● ඌව | 109,115 |
| ● බටහිර මධ්‍යම | 494,037 |
| ● බටහිර උතුර | 293,704 |
| ● බටහිර දකුණ | 274,748 |
| එකතුව | 2,437,504 |



# කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන

## බටහිර - මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය කොළඹ නගරයේ උතුර, කොළඹ නගරයේ දකුණ, කෝට්ටේ හා මහරගම කළමනාකරණ ප්‍රදේශයන්ගෙන් සමන්විත වේ. කොළඹ නගරයේ උතුර කළමනාකරණ කොට්ඨාශයේ නිලධාරීහු 2018 වර්ෂයේ ජාතික ඵලදායිතා ත්‍යාගය ලබා ගැනීමට සමත් වූහ.

බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අංශය විසින් ජල කාන්දු සොයා ගැනීම්, නීති විරෝධී භාවිතයන් සොයා ගැනීම්, දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම්, ජල කාන්දු අළුත්වැඩියා කිරීම් හා දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශයන් හුදෙකලා කිරීම් වැනි ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම හා සම්බන්ධ බොහෝ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එසේම මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන (GCWWMIIP) මගින් ද ආදායම් රහිත ජල පරිමාව පසු විපරම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාව 40.2% දක්වා අඩු කර ගැනීමට හැකි වූ අතර ගත වූ වසර හා සසඳා බලන විට එය 1.0% ක අඩු වීමකි. බටහිර මධ්‍යම කලාපයේ ආදායම් රහිත ජල පරිමාව 30.7% ක් වන අතර ගත වූ වර්ෂයට සාපේක්ෂකව එය 0.9% ක අඩු වීමකි.

ආදායම් රහිත ජල පරිමාව අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන බල ශක්ති ඉතිරි වීම මගින් පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට මග පාදනු ලබයි. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන (GCWWMIIP) විසින් දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශ (DMA) සංකල්පය උපයෝගී කර ගනිමින් බෙදා හැරීමේ ජාලයක් සැලැසුම් කරනු ලැබ ඇත (පොම්ප කිරීමේ පැය ගණන අඩු කරනු ලැබ ඇත). වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අනිකුත් බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් වන්නේ ස්වයං පොම්ප කිරීමේ ක්‍රමය යොදා ගැනීම, පොම්පාගාරයන්හි පොම්ප ක්‍රියාත්මක කිරීමේ කාල වේලාවන් වැඩි වශයෙන් ඉල්ලුම අඩු කාල වේලාවන් වෙත විතැන් කිරීම, සියළුම බල ශක්ති පරිභෝජනය කරන ස්ථානයන් තුළ ක්ෂණික නිවාරණ නඩත්තු කටයුතු සිදු කිරීම සහ සූර්ය පැනේල ස්ථාපිත කිරීම ආදිය වේ. තවද E & M අංශය විසින් පොම්පාගාරයන් වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන 50001 (ISO 50001) බල ශක්ති කළමනාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබ ඇත.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ තොග මට්ටම් පවත්වාගෙන යාම සඳහා ගබඩා මොඩියුලය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලදි. ද්‍රව්‍ය ඉල්ලුම් කිරීම් පිළියෙල කරන ලද්දේ දැනට තිබෙන තොග ප්‍රමාණයන් හා හඳුනාගත් අවම අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් වන අතර අතිරික්ත භාණ්ඩ අනිකුත් කලාපයන් වෙත යැවීමට කටයුතු කරන ලදි.

ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් වශයෙන් මාලිගාකන්දේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයක් ස්ථාපිත කිරීම ද, මට්ටක්කුලියේ, කොටහේනේ හා ගලගෙදර ස්ථාන භාර නිලධාරී කාර්යාලයන් තුනක් ස්ථාපිත කිරීම හා මාලිගාකන්දේ හා ගලගෙදර කලාපීය රසායනාග ාරයන් දෙකක් ස්ථාපිත කිරීම ද අළුතින් සිදු කරන ලදි, පෞද්ගලික ජල නියැදි පරීක්ෂා කිරීමෙන් උපයන ලද මාසික ආදායම ආසන්න වශයෙන් රුපියල් 2,00,000. 00 ක් පමණ විය.

මාලිගාගන්ද ජලාශ වැඩ බිම පරිශ්‍රය තුළ ආලෝක විමෝචන ඩයෝඩ (LED) විදුලි බුබුළු සවි කිරීම හා සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) කැමරාවක් ස්ථාපිත කිරීම මගින් හා පාමන්කඩ හා තිඹිරිග ස්යාය ස්ථාන භාර නිලධාරී කාර්යාල පරිශ්‍රයන් තුළ සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) කැමරා ස්ථාපිත කිරීම මගින් එම ස්ථානයන් වෙත අනවසර පුද්ගලයින්ගේ පැමිණීම වලක්වමින් ආරක්ෂක විධි විධාන යොදන ලදි. පාරිභෝගික දුක් ගැනවිලි සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම පිණිස මහරගම හා කැස්බෑවේ ජංගම සේවාවන් පවත්වන ලදි. කෝට්ටේ, මහරගම හා කොළඹ නගරය තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරන ලදි.

ජංගම උපයෝග මෘදුකාංගය මනු කියවන්නන් හට හඳුන්වා දී ඔවුන් අතර ක්‍රියාත්මක කරන ලද අතර නව සම්බන්ධතා ලබා දීම වෙනුවෙන් වූ මෘදුකාංගය කොළඹ නගරයේ දකුණු කොට්ඨාශය තුළ භාවිතා කරන ලදි.

මිලි මීටර 63 නල යොදා ගනිමින් කිලෝ මීටර 55.3 ක ද, මිලි මීටර 90 නල යොදා ගනිමින් කිලෝ මීටර 6.98 ක හා මිලි මීටර 110 නල යොදා ගනිමින් කිලෝ මීටර 2.81 ක ද බෙදා හැරීම් දීර්ඝ කිරීම් කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් මිලියන 170,229 ක් වූ පුනරුත්ථාපන අය වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 138.42 ක මුදලක් වැය කරමින් කලාපය තුළ පුනරුත්ථාපන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 15,666 ක මුළු සංඛ්‍යාවක් සපයා දෙන ලද අතර එම සංඛ්‍යාව ඉලක්ක කරන ලද නව සම්බන්ධතා සංඛ්‍යාව වූ 16,580 ට එරෙහිව 95% ක සාක්ෂාත් වීමකි. බිල් කිරීමේ ඉලක්කය රුපියල් මිලියන 8,822 ක් වූ අතර ඇත්ත වශයෙන්ම බිල් කරන ලද මුදල රුපියල් මිලියන 8,861 ක් විය. එය 100% ක සාක්ෂාත් කර ගැනීමක් වේ. ඒ අතර මුදල් එකතු කිරීමේ ඉලක්කය රුපියල් මිලියන 9,164 ක් වූ අතර ඇත්ත වශයෙන්ම එකතු කර ගැනීමට හැකි වූ මුදල රුපියල් මිලියන 8,968 ක් විය. ඉලක්කයට එරෙහිව ගත් කල එය 98% ක සාක්ෂාත් කර ගැනීමකි. මුළු බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ගාස්තු එකතු කිරීමේ කාර්යක්ෂමතාවය 101% ක් වූ අතර ණය කාලය මාස 0.6 ක් විය.

ගං වතුර වැනි ආපදා තත්ත්වයන්ට හා මෙම ප්‍රදේශය තුළ උද්ගත විය හැකි අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීමට හැකි වන පරිදි කොළඹ හා කෝට්ටේ - කොලොන්නාව ප්‍රදේශයන් වෙනුවෙන් හදිසි අවස්ථා ප්‍රතිචාර සැලැසුමක් පිළියෙල කරන ලදි. කොලොන්නාව, ගොතටුව, කෝට්ටේ හා බත්තරමුල්ල ප්‍රදේශයන් තුළ ජල සම්පාදනය හා සේවාවේ ගුණාත්මය වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව ජල සම්පාදන පහසුකම් ඉහළ ශ්‍රේණිගත කිරීම ද, කලල්ගොඩ පාරේ හා වානගුරු මාවතේ තිබුණ ජල නල වෙනුවට අළුත් ජල නල යෙදීම හා බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වන භූගෝලීය තොරතුරු පද්ධති දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම ද වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අනිකුත් සංවර්ධන වැඩ කටයුතු විය. එසේම පාසැල් දරුවන්, රජයේ ආයතන හා පෞද්ගලික ආයතනයන් වෙනුවෙන් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් ද මෙහෙයවන ලදි.

## බටහිර - දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය බටහිර - දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්යාලයෙන් හා දෙහිවල කලාප කළමනාකාර කාර්යාලය, පානදුර-හොරණ කලාප කළමනාකාර කාර්යාලය හා කළුතර කලාප කළමනාකාර කාර්යාලය යන කලාප කළමනාකාර කාර්යාල 3 න් ද සමන්විත වේ.

බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය හා කළමනාකාර කලාප තුන විසින් ධනාත්මක චින්තනය, ආකල්ප වෙනස් කිරීම හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා වූ තත්ත්ව පාලන කව මෙවලම් පිළිබඳ විශේෂ වැඩ සටහන් මෙහෙයවන ලදි. බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය විසින් 2020 වර්ෂයේ ජාතික ඵලදායිතා තරඟයට සහභාගී වීමේ අරමුණින් වැඩ සටහන් සැලැසුම් කොට සිය ඵලදායිතා මට්ටම වැඩි දුරටත් දියුණු කිරීමට වැඩ කටයුතු කරන ලද අතර ඊට අමතර ලෙස ප්‍රාදේශීය කාර්යාලයන්ගේ ද ඵලදායිතාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගනිමින් එම කාර්යාල මට්ටමින් ද පුහුණු කිරීමේ වැඩ සටහන් හා හඳුන්වා දීමේ වැඩ සටහන් සංවිධානය කොට මෙහෙයවන ලදි.

ශ්‍රී ලංකා සම්මාන පිරිනැමීමේ මණ්ඩලය (Sri Lanka Accreditation Board) විසින් පිරිනමන ලද ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ/ජාත්‍යන්තර විද්‍යුත්තාක්ෂණික කොමිසම (ISO/1EC) 17025:2005 – රසායනික හා ජෛව විද්‍යාත්මක පරීක්ෂණ වෙනුවෙන් වූ රසායනාගාර සම්මාන සහතිකය නම් වූ සම්මාන සහතිකය දෙහිවල / පානදුර කලාපීය රසායනාගාරය විසින් දිනා ගැනීම විශේෂ ජයග්‍රහණයක් වශයෙන් පෙන්වා දිය හැකිය.

කලාපය තුළ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අරමුණ සහිතව බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ පිහිටි බේරුවල හා වාද්දුව ප්‍රදේශයන් තුළ එලනු ලැබ තිබී නල මාර්ග වෙනුවට විශේෂයෙන් කිලෝ මීටර 2.2 ක් දිග ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ග අළුතින් එලීම වැනි ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. විශේෂිත වශයෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) ප්‍රදානයක් මත ක්‍රියාත්මක වන "ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බටහිර දකුණ සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා වත්කම් කළමනාකරණ හැකියාව නංවා ලීමේ ව්‍යාපෘතිය" පානදුර ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා අතර එහි අවධානය යොමු වී ඇත්තේ පානදුර ප්‍රදේශයේ පිහිටා ඇති තෝරාගත් නියමු කලාපය තුළ සිදු වෙමින් පවතින ජල කාන්දු පාලනය කිරීම කෙරෙහිය.

ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් කිහිපයක් ඇතුළු ප්‍රදේශ කිහිපයක් තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු හා ජල ආරක්ෂක ක්‍රියාකාරකම් සිදු කරන ලදි. ප්‍රතිලාභීන් 64,865 ක සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සම්බන්ධතාවයන් 12,839 ක සංඛ්‍යාවක් සපයා දෙමින් කලාපය තුළ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 120 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබමින් තිබිණි. කලාපය තුළ වූ ජල සුරක්ෂිතතා සැලැසුම් දොළහක සංඛ්‍යාව අතරින් ජල සුරක්ෂිතතා සැලැසුම් නවයක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද අතර ඉතිරි තුන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. තවද රසායනික ආපදාවන්, ගං වතුර හා නාය යාම් ආදී ආපදාවන්ට මුහුණ දීමට හැකි වන පරිදි ආපදා කළමනාකරණ සැලැසුම් පිළියෙල කරන ලදි. නවයක සංඛ්‍යාවක් අතරින් කලාපය සඳහා සිද්ධි කළමනාකරණ සැලැසුම් හයක සංඛ්‍යාවක් පිළියෙල කරන ලදි.

මීට වැඩිමනත් වශයෙන් කලාපය තුළ කිලෝ මීටර් 89.25 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර එය සමන්විත වන්නේ කළුතර ප්‍රදේශය තුළ සිදු කරන ලද කිලෝ මීටර් 16.1 ක නල මාර්ග දීර්ඝ කිරීම් වලින් ද, පානදුර - හොරණ ප්‍රදේශය තුළ සිදු කරන ලද කිලෝ මීටර් 65.6 ක නල මාර්ග දීර්ඝ කිරීම් වලින් හා දෙහිවල ප්‍රදේශය තුළ සිදු කරන ලද කිලෝ මීටර් 7.5 ක නල මාර්ග දීර්ඝ කිරීම් වලින් වේ. කලාපයේ සියළුම ප්‍රදේශයන් තුළ ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේම බොහෝ නැවත ආරෝපණය කළ හැකි හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් රාශියක් සිදු කරන ලදි.

වියලි කාලගුණික තත්ත්වය නිසා කළුතර කළමනාකාර ප්‍රදේශය අර්බුදකාරී ලවණතා ආක්‍රාන්ති ගැටළුවකට මුහුණ දුන්නේය. මෙම ගැටළුවට තාවකාලික විසඳුමක් වශයෙන් මුළු කළුතර කළමනාකාර ප්‍රදේශයම ආවරණය වන සේ බවුසර මගින් ජලය සැපයීමට කටයුතු පිළියෙල කරන ලදි. කළුතර කළමනාකාර ප්‍රදේශය මුහුණ පාන ලවණතා ආක්‍රාන්ති ගැටළුවට මධ්‍ය කාලීන විසඳුමක් වශයෙන් වියලි කාල ගුණය බල පවත්නා කාලය තුළ කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය සම්ප්‍රේෂණය කිරීම ඉලක්ක කරමින් කොලේමෝදර තුළු මුව ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ඊට වැඩිමනත් වශයෙන් කළු ගඟෙහි පුහීල මෝයට ආසන්න ලෙස ලවණතා බාධකයක් ඉදි කිරීම සම්බන්ධයෙන් වාරි මාර්ග දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ වී දැනට සාධ්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලබමින් පවතී.

මග්ගොන කුළුණ හා බේරුවල ජලාශය තුළ සිදු වන ජලය නැති වීමේ හානිය හඳුනාගන්නා ලද අතර ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ අරමුදල් උපයෝගී කර ගනිමින් එම තත්ත්වයට පිළියම් යෙදීමට පියවර ගන්නා ලදි. ප්‍රමුඛතාවය දිය යුතු ව්‍යාපෘතීන් හයක සංඛ්‍යාවක් හඳුනාගෙන අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතීන් වන්නේ කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව වැඩි දියුණු කිරීම, ඉන්ගිරිය - හඳපාන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය, කෙත්හේන වැඩි දියුණු කිරීමේ හා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, ඉන්ගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය, (කෙත්හේන) තෙබුවන තුළු මුව තුළට ලවණතා ආක්‍රාන්තිය සිදු වීම වැලැක්වීම සඳහා ලවණතා බාධකයක් ඉදි කිරීම හා කළු ගඟ ජලාධාරය ආරක්ෂා කර ගැනීම අරමුණු කර ගත් බහු - පරදුධාරී හවුල්කාරිත්ව ප්‍රවේශ ව්‍යාපෘතිය ද වේ.

සියළුම කලාප තුනම තුළ තමන්ගේ මනු කියවීම් 100% ක් ම මනු කියවීමේ යෙදවුම් මෘදුකාංගය භාවිතා කරමින් සිදු කරනු ලැබ ඇත. පානදුර කලාපය තුළ කඩිනම් කලාප විසඳුමක් (smart zone solution) ඉදි කරනු ලැබ ඇති අතර දවසේ පැය 24 මුළුල්ලේම ගෙවීම් කළ හැකි වන පරිදි පහසු ගෙවීම් ක්‍රමයක් ද ආරම්භ කරනු ලැබ ඇත.



**පානදුර - හොරණ කඩිනම් කලාප විසඳුම (Smart Zone Solution)**

මීට අමතර වශයෙන් වාහනය තුළ සිට බිල්පත් ගෙවීමේ පහසුකම් පද්ධතිය බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ ඉදි කිරීමේ කටයුතු දැනට සම්පූර්ණයෙන්ම මෙන් නිම වී ඇති අතර එම කටයුත්තෙහි අදට ප්‍රගතිය 97 % ඉක්මවා ගොස් ඇත.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශේෂ විමර්ශණ ඒකකය විසින් නීති විරෝධී සම්බන්ධතාවයන් 1562 ක සංඛ්‍යාවක් පරීක්ෂණයට භාජනය කරනු ලැබ ඇති අතර ඒ අතුරින් සම්බන්ධතා 102 ක සංඛ්‍යාවක් නියත වශයෙන්ම නීති විරෝධී සම්බන්ධතාවයන් බවට තහවුරු කර ගැනීමට හැකි වී ඇත. මෙම සංඛ්‍යාවෙන් 57 ක සංඛ්‍යාවක් බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපයට අයත් වේ.

## බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කලාපය එම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයෙන් හා කළමනාකරු (කැළණිය) කලාප කාර්යාලයෙන් හා කළමණාකරු (ගම්පහ) කලාප කාර්යාලයෙන් ද සමන්විත වේ.

බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධ පුහුණු අංශය විසින් විවිධ වර්ගයන්ට අයත් සේවක මණ්ඩල සාමාජිකයින් ආවරණය කරමින් පුහුණු වැඩ සටහන් 21 ක සංඛ්‍යාවක් මෙහෙයවනු ලැබ ඇත.

ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණයෙන් 98% ක්, එනම් රුපියල් මිලියන 60.02 ක මුදලක් ආයෝජනය කරමින් දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම, ජල කාන්දු අළුත්වැඩියා කිරීම, තිබෙන නල මාර්ග විතැන් කරමින් නැවත එලීම හා අතිධ්වනික ප්‍රවාහ මනු, වෑල්ව හා සම්බන්ධකයන් ස්ථාපිත කිරීම ද ක්‍රියාත්මක කරන ලදි. 2019 වර්ෂය තුළදී බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ ආදායම් රහිත ජල පරිමාවේ අගය 19.27% ක් විය. මේ අතර

පුනරුත්ථාපන කටයුතු සඳහා වූ වෙන් කිරීමෙන් 93% ක ප්‍රතිශතයක්, එනම් රුපියල් මිලියන 98.14 ක මුදලක් ආයෝජනය කරමින් යාන්ත්‍රික හා විද්‍යුත් ක්‍රියාකාරකම් කිහිපයක් ද, බෙදා හැරීම් වැඩි දියුණු කිරීම් ද, ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් හා පිළිසකර කිරීම් වැඩ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන්නට යෙදුන බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ කටයුතු වූයේ මීරිගම ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ දෙ කොන චූෂණ තිරස් විභේදිත වාත්තු ආකාරයේ කේන්ද්‍රාපසාරී පෝම්ප කට්ටල ස්ථාපනය කිරීම හා කැළණිය කළමනාකාර කාර්යාලය තුළ කිලෝ වොට් 30 ක සූර්ය බල ශක්තියෙන් ක්‍රියා කරනු ලබන ජාල මනු පද්ධතිය ස්ථාපනය කිරීම ද විය.

භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ගුණාත්මක භාවය හඳුනා ගැනීම සඳහා කඩවත හා මීගමුවේ පිහිටි රසායනාගාර ද්විත්වය තුළ මාසිකව ජල නියැදි 250 ක් බැගින් පරීක්ෂණයට භාජනය කරන ලදි. ඊට අමතර ලෙස කලින් කලට THM හා බැර ලෝහ විශ්ලේෂණයන් ද ක්‍රියාත්මක කරන ලදි. රාජ්‍ය පාර්ශවය, ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම, පෞද්ගලික සංවිධාන හා පොදු ළිං වෙනුවෙන් ජල ගුණාත්මය පරීක්ෂා කිරීමේ සේවාවන් හා අවශ්‍ය උපදේශක සේවාවන් සපයා දෙන ලදි. මේ අතර කලාපය තුළ ක්‍රියාත්මක වන සියළුම යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලසුම් ද ස්ථාපිත කරනු ලැබ ඇති අතර ජා ඇල, රද්දොළුගම හා කැළණිය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් විධිමත් විගණනයන් පැවැත්වීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව හා ගම්පහ පලාත් සභාව යන ආයතනයන් සමග සම්බන්ධ වී අත්තනගල්ල ඔය, මා ඔය හා කැළණි ගඟ හා සම්බන්ධිත ජලාධර ආරක්ෂා කිරීමේ වැඩ සටහන් ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

ග්‍රාමීය ජල සම්පාදන ක්‍රියාකාරකම් වශයෙන් නල එලීම්, වැර ගැන්වූ සිමෙන්ති ජල කුළුණු ඉදි කිරීම, පොම්පාගාර ඉදි කිරීම්, සාරන ලද ළිං ඉදි කිරීම්, පෝම්ප, ක්ලෝරිනීකරණයන් හා පනේල පුවරු ස්ථාපනය කිරීම හා විදුලි බලය සපයා දීමද ක්‍රියාත්මක කරන ලදි.



නල විතැන් කිරීම

2019 වර්ෂය තුළදී බොහෝ වත්කම් කළමනාකරණ ක්‍රියාකාරකම් ද සිදු කරන ලදි. ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ටරි හරි වැරදි බැලීම් සම්පූර්ණයෙන් නිම කොට රජයේ විගණන අංශය වෙත භාර දෙන ලදි. ආරම්භ කිරීමට නියමිත වත්කම් ප්‍රති අගයුමට භාජනය කර ලෙජරය අනුව වත්කම් ලේඛනය යාවත්කාලීන කොට අත් හැර දමනු ලැබ ඇති වත්කම් වත්කම් ලේඛනයෙන් ඉවත් කරන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ට හා තුළු මුව වලට අදාල වර්ධනය කිරීම්, වානේ කාප්ප පාලම් ඉදි කිරීම හා නල මාර්ග විතැන් කිරීම (ඡායා රූපය බලන්න), මීගමුවේ රසායනාගාරය සඳහා දෙ මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා කටුනායක දකුණු කටාන වෙනුවෙන් භූමි ජලාශයක් හා පොම්පාගාරයක් ඉදිකිරීමට ද අදාල සවිස්තරාත්මක සැලසුම්, රූප සටහන්, ඇස්තමේන්තු හා මිළ ගණන් කැඳවීමේ (ටෙන්ඩර) ලිය කියවිලි පිළියෙල කිරීමේ කටයුතු කිරීම පිණිස ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය සම්බන්ධ විය. එසේම දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ආවරණය නොකරන ලද ප්‍රදේශය වෙත නල මාර්ග ජල සැපයුම් සේවාව ව්‍යාප්ත කිරීම හා අදාල පෙර සාධ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමෙහි හා මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ කාර්යයන්හි ද එම අංශය නිරත විය. ඊට අමතර වශයෙන් 2018 වර්ෂයේ අවසානයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වරුන්ගේ ආයතනය විසින් පවත්වන ලද ඉංජිනේරු වරුන්ගේ වෘත්තීය සමාලෝචන විභාගයේ ප්‍රතිඵල අනුව ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් සැලසුම් පළපුරුද්ද පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වරුන්ගේ ආයතනයේ පිළිගැනීම දිනාගනු ලැබ ඇත.

බොහෝ මාර්ග කොටස් දිගට මෙලෙක් නොකරන ලද පොලිවිනිල් ක්ලෝරයිඩ් :මජඩක* නල එලීම ද, පාලම් කිහිපයක් තුළ හා මාර්ග අළුත්වැඩියා කිරීම් ස්ථානයන් තුළ තාවකාලික හා ස්ථිර වශයෙන් නල ප්‍රති ස්ථානගත කිරීම හා බියගම ආයෝජන මණ්ඩලයේ ජල සම්පාදන පහසුකම වැඩි දියුණු කිරීම ද ඉදි කිරීම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලදි.

කැළණිය දකුණු ඉවුර ජල නිෂ්පාදන ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 185,000 සිට දිනකට ජලය ඝණ මීටර 193,000 ක් දක්වා වැඩි දියුණු කරනු ලැබ ඇති අතර ලබුගම කලටුවාව සිට බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත සපයනු ලබන ජල පරිමාව දිනකට ජලය ඝණ මීටර 10,000 සිට දිනකට ජලය ඝණ මීටර 12,000 ක් දක්වා නංවා ලනු ලැබ ඇත.

බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සම්පාදනය කර දෙනු ලැබ ඇති මුළු ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව 293,704 ක් බවට පත් කරමින් ප්‍රස්තුත වර්ෂය තුළදී නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 9,598 ක සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත. ප්‍රමාණවත් ජල පරිමාවක් ලබා ගත නොහැකි හේතුව නිසා කලාපයන් දෙක තුළම ඇති බරපතල ගැටළුකාරී තත්ත්වයන් යටතේ වුවද මෙය ඉලක්ක කරන ලද නව ජල සම්පාදන සංඛ්‍යාවට එරෙහිව 64.1% ක සාක්ෂාත් කර ගැනීමක් වේ. ප්‍රධාන ගැටළුව වී ඇත්තේ ඉල්ලුම සපුරා ලීමට තරම් නිෂ්පාදනය කරනු ලබන ජල පරිමාව ප්‍රමාණවත් නොවීමයි.

## දකුණු පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

සීමිත සම්පත් පවත්නා තත්ත්වයක් යටතේ වුවද දකුණු පලාත් කළමනාකරණය විසින් සිය කාර්ය මණ්ඩලය හා එක්ව පාරිභෝගිකයින් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වෙනුවෙන් කැප වන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බාහිර විධිමත් විගණනයේදී මහ ගාල්ල ජල සුරක්ෂිතතා සැලසුම වෙත "ඉතා හොඳයි" ශ්‍රේණිය ලැබුණ අතර අම්බලන්තොට හා හපුගල ජල සුරක්ෂිතතා සැලසුම් විසින් "හොඳයි" ශ්‍රේණිය දිනා ගන්නා ලදි. මෙයට අමතර වශයෙන් තංගල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට, කිරින්ද - පුහුල්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට, මාතර කණ්ඩායම ජල සම්පාදන යෝජනා ක්‍රමයට හා පිටිගල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල ජල සුරක්ෂිතතා සැලසුම් ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. හම්බන්තොට කළමනාකාර කාර්යාලය විසින් ද මධ්‍යම පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායිතාවය සඳහා වූ විශේෂ ත්‍යාගය දිනා ගන්නා ලදි.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ අරමුදල යටතේ වකමුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා කේන්ද්‍රාපසාරී පෝම්ප කිරීමේ කට්ටලයක් ද, බද්දේගම සඳහා සිරස් වා රෝද පෝම්පයක් හා උපාංගයන් හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ කිලෝ වොට් 65 ක සූර්ය බල ශක්තියෙන් ක්‍රියා කරන ජාල මැණීමේ පද්ධතියක් ද ස්ථාපනය කරන ලදි.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා ජල කුළුණු පුනරුත්ථාපනය කිරීම ද, නිල නිවාස අළුත්වැඩියා කිරීම ද, රසායනික මාත්‍රා පෝම්ප මිළයට ගැනීම හා නල එලීමේ කටයුතු ද පුනරුත්ථාපන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 2019 වර්ෂය තුළදී දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම හා කලාපීයකරණය සඳහා වූ වැල්ව කුටීර වෙනුවෙන් අළුත් කුටීර ඉදි කිරීම ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අරමුදල් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කරන ලදි. පුනරුත්ථාපන කටයුතු හා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ කටයුතු වෙනුවෙන් කරනු ලැබ තිබුණ මුළු වෙන් කිරීම් 2019 වර්ෂය තුළදී උපයෝගී කර ගන්නා ලදි.

බෙදා හැරීම් කටයුතු වැඩි දියුණු කිරීම්, නීති විරෝධී සම්බන්ධතාවයන් පරීක්ෂාවට ලක් කිරීම්, දෝෂ සහිත මනු ඉවත් කොට ඒවා වෙනුවට අළුත් මනු සවි කිරීම්, ශූන්‍ය බිල් පත් හා ඇස්තමේන්තු කරන ලද බිල් පත් පරීක්ෂාවට බඳුන් කිරීම්, නිවාරණ නඩත්තු ක්‍රියාකාරකම් හා ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ක්‍රියාකාරකම් නිරන්තරයෙන්ම සිදු කරන ලදි. සියළුම කලාපයන් තුළ කිලෝ මීටර 33 ක නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලදි. දැනට පවත්නා නිෂ්පාදන සීමාවන් හේතුකොට ගෙන ඇතැම් ඇතැම් යෝජනා ක්‍රමයන්ට අදාල නල මාර්ග දීර්ඝ කිරීම් සීමා කරනු ලැබ ඇත. 2019 වර්ෂය තුළදී නව සේවා සම්බන්ධතාවයන් 10,564 ක සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත.

ආරක්ෂිත ජල සම්පාදනයක් සහතික කිරීම සඳහා මාතර ජල නියැදි 7,702 ක සංඛ්‍යාවක් ද, හම්බන්තොට ජල නියැදි 5,703 ක සංඛ්‍යාවක් හා ගාල්ලේ ජල නියැදි 4.114 ක සංඛ්‍යාවක් ද ජලයේ ගුණාත්මය සොයා ගැනීම සඳහා පරීක්ෂාවට භාජනය කරන ලදි. තුළ මුව තුළ හා ජල ප්‍රභවයන් තුළ නිරන්තරයෙන් ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු සිදු කරන ලදි. භූගෝලීය තොරතුරු පද්ධති සිතියම් යාවත්කාලීන කිරීම හම්බන්තොට හා මාතර ප්‍රදේශයන් තුළ 100% ක් හා ගාල්ල ප්‍රදේශය තුළ 70% ක් සිදු කරනු ලැබ ඇත.

පොලි එතිලීන් නල, වාණිජ කටයුතු, ක්ලෝරීන් ආරක්ෂිත ලෙස පරිහරණය කිරීම, පසු විපරම් කිරීමේ හා මිණුම් කටයුතු කිරීමේ උපකරණ ක්‍රමාංකනය කිරීම, අකුණු සැරයන්ගෙන් හා සර්ජනයන්ගෙ න් ආරක්ෂා වීම, ධනාත්මක චින්තනය, මනු කියවන්නන් සඳහා දියුණු කරන ලද ජංගම උපයෝග නව සංස්කරණය හා පරිගණක හා මයික්‍රෝ සොෆ්ට් කුසලතාවයන් යන මාතෘකා යටතේ වූ පුහුණු වැඩ සටහන් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. ගාල්ලේ වාණිජ අංශය, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය හා වක්වැල්ල කලාපීය රසායනාගාරය පිහිටි ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

ඉමදුව, හම්බන්තොට කර්මාන්ත කලාපය හා මොරවක ජල සම්පාදන ව්‍යාපෘතීන්ට මෙන්ම කතරගම දීර්ඝ කාලීන යෝජනාවට ද අදාල සාධ්‍යතා අධ්‍යයනයන් 2019 වර්ෂය තුළදී සිදු කරන ලදි. ඊට අමතර වශයෙන් ලුනුගම්වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට හා කතරගම කෙටි කාලීන යෝජනාවට අදාල සැලසුම් කටයුතු ද ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. හල්ලල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ 1 වැනි අදියර ඉහළ ශ්‍රේණිගත කිරීමට (රුපියල් මිලියන 177) හා දෙනියාය ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ප්‍රතිසම්පාදන වැඩ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.



**බන්දගිරියේ මහා මාර්ගයට යටින් නල එලීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම**

කිරම කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය, මහ ගාල්ල 111 වැනි පියවර, මාතර කෙටි කාලීන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය, අඟුනකොලපැලැස්ස බන්ධනාගාරය වෙත ජලය සම්පාදනය කර දීමේ ව්‍යාපෘතිය හා ලුනුගම්වෙහෙර කෙටි කාලීන යෝජනාව යන ව්‍යාපෘතීන් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙතින් ලැබුන ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ අඟුනකොලපැලැස්ස ප්‍රධාන පොම්ප කිරීමේ නල මාර්ගය එලීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. 2019 වර්ෂය අවසන් වන විට මෘදු යකඩ නල හා සවි කිරීම් සැපයුම 85% ක් සම්පූර්ණ කරන ලදුව තිබුණ අතර නල එලීමේ කටයුතු 45% ක් නිම කරනු ලැබ තිබිණි. මූල්‍ය ප්‍රගතිය 36% ක් විය.

## උතුරු මැද පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

2019 වර්ෂය තුළදී රුපියල් 222,732.00 ක මුදලක් ආයෝජනය කරමින් සේවක මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් 30 ක සංඛ්‍යාවක් මෙහෙයවන ලදි.

අනුරාධපුර හා පොලොන්නරුව යෝජිත ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය ඉඩම් (කැබලි 65 ක්) අත් පත් කර ගැනීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. උතුරු මැද පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ඇති වත්කම් වල මුළු වටිනාකම රුපියල් මිලියන 14,052 ක් වේ. වාර්ෂික වත්කම් හරි වැරදි බැලීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. දැයට කිරුළ, මින්නේරිය, මැදිරිගිරිය, කලා වැව හා රණවිරුගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල ප්‍රාග්ධනායන කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ප්‍රාග්ධනායනය කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1,133 ක් වේ.

අනුරාධපුර කලාපය තුළ ජල සම්පාදන සම්බන්ධතාවයන් 90,636 ක සංඛ්‍යාවක් ලබා දෙමින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව 19 ක් වේ. 2019 වර්ෂය තුළදී නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 5,409 ක සංඛ්‍යාවක් ලබා දෙන ලදි. 2019 වර්ෂය අවසන් වන විට බිල් කිරීමේ ඉලක්කය හා එය සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 784.64 ක් හා රුපියල් මිලියන 891.59 ක් වූ අතර ඒ අනුව ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය 114% ක් විය. 2019 වර්ෂය අවසන් වන විට ගාස්තු රැස්කිරීමේ ඉලක්කය හා එම ඉලක්කයට එරෙහිව සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 834.26 ක් හා රුපියල් මිලියන 933.33 ක් වූ අතර ඒ අනුව ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය 112% ක් විය.

පොලොන්නරුව කලාපය තුළ ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 41,359 ක සංඛ්‍යාවක් ලබා දෙමින් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 9 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන අතර 2019 වර්ෂය තුළදී ඒ තුළින් නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 5,004 ක සංඛ්‍යාවක් ලබා දෙන ලදි. 2019 වර්ෂය අවසන් වන විට බිල් කිරීමේ ඉලක්කය හා එය සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 361.99 ක් හා රුපියල් මිලියන 425.68 ක් වූ අතර ඒ අනුව ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය 117.6% ක් විය. ඒ අතර 2019 වර්ෂය අවසන් වන විට ගාස්තු රැස් කිරීමේ ඉලක්කය හා එම ඉලක්කයට එරෙහිව සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 388.70 ක් හා රුපියල් මිලියන 443.29 ක් වූ අතර ඒ අනුව ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය 114% ක් විය.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් දහයක සංඛ්‍යාවක් විසින් ජල සුරක්ෂිතතා සැලසුම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අවිධිමත් අභ්‍යන්තර ජල සුරක්ෂිතතා සැලසුම් විගණනයන් දෙකක සංඛ්‍යාවක් නිම කරනු ලැබ ඇත. අනුරාධපුර තිසා වැව හා සම්බන්ධ ජලාධර ආරක්ෂක වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ප්‍රජා මූල සංවිධානයන් 50 ක සංඛ්‍යාවක් වෙනුවෙන් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් විස්සක සංඛ්‍යාවක් පවත්වා තාක්ෂණික සහාය ලබා දෙනු ලැබ ඇත. ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් ද දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් 04 ක සංඛ්‍යාවක් පවත්වනු ලැබ ඇත.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ අය වැය වෙන් කිරීම, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීම හා ජලාධර ආරක්ෂා කිරීමේ අය වැය වෙන් කිරීමට අදාල මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 69% ක්, 65% ක්, 91% ක් හා 88% ක් වූ අතර පිබිදෙමු පොලොන්නරුව සංවර්ධන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 90% ක් විය.

2019 වර්ෂය තුළදී හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වූ අරමුදල් යටතේ අත් පෝම්ප නල ළිං 203 ක සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කරන ලද අතර පවුල් 5,075 ක සංඛ්‍යාවක් වෙත භූ ගත ජල පහසුකම් සම්පාදනය කර දීමට ද පියවර ගන්නා ලදි. 2019 වර්ෂය තුළදී එලදායී ළිං 4 ක සංඛ්‍යාවක් අළුතින් සාරන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ පිහිටා ඇති නිෂ්පාදන ළිං 28 ක සංඛ්‍යාවක් සංවර්ධනය කරන ලදි.

පිබිදෙමු පොලොන්නරුව, උපයෝජ්‍යතා විතැන් කිරීම, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධයෙන් කටයුතු කිරීම, පුනරුත්ථාපන, ප්‍රති ආරෝපනය කළ හැකි, මෙහෙයුම් හා නඩත්තු, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම, ග්‍රාමීය ජල සම්පාදන හා දේශීය බැංකු අරමුදල යන අරමුදල් යටතේ කොන්ත්‍රාත්තු ප්‍රලේඛන 32 ක සංඛ්‍යාවක් පිළියෙල කරන ලද අතර ඒ සඳහා අදාල වන මුළු පිරිවැය රුපියල් මිලියන 144.44 ක් වේ.

එප්පාවල, රාජාංගනය, නොච්චියාගම හා ගිරිබාව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල තාක්ෂණික අගැයීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මූල්‍ය අගැයීම් කටයුතු ද මේ වන විට සම්පූර්ණයෙන් අවසන් කරනු ලැබ ඇත. මහ අනුරාධපුර හා මහ ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල තාක්ෂණික අගැයීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මූල්‍ය අගැයීම් කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 පිළිගැනීම ලබා ගැනීමේ අපේක්ෂාවෙන් රසායනාගාර පහසුකම් හා ජල ගුණාත්මය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි දියුණු කරන ලදි. Physikalisch Technische Bundesansdalt (PTB) ව්‍යාපෘතිය වෙතින් අවශ්‍ය පුහුණු වීම් ලැබිණි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන්, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා තුළු මුව ආශ්‍රිතව එලදායිතාව වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ජල කාන්දු වීම් 4,646 ක සංඛ්‍යාවක් හඳුනාගෙන අළුත්වැඩියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් නොලබන ජල පරිමාව 23.15% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. ඒ අතර දෝෂ සහිත මනු 5,606 ක සංඛ්‍යාවක් හඳුනාගෙන ඒ අතුරින් 5,396 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීමට ද කටයුතු කරන ලදි.

## වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා කළමනාකරු (මෙහෙයුම් හා නඩත්තු) කාර්යාලයන් විසින් 2019.11.01 දින සිට 2022.10.30 දිනය දක්වා බල පවත්වනු ලබන පරිදි ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශයේ (ISO) 9001 : 2015 පද්ධති සහතික කිරීම ලබා ගැනීමට සමත් වන ලදි.

විද්‍යුත් චුම්බක ප්‍රවාහ මනු ස්ථාපිත කිරීම සඳහා ද, වැල්ව කුටි ඉදි කිරීම සඳහා සහ කුරුණෑගල, පුත්තලම, ගිරිඋල්ල හා ඉබ්බාග මුව ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ බෙදා හැරීමේ පද්ධතීන් වැඩි දියුණු කිරීම සඳහා ද ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීමෙන් 60% ක ප්‍රතිශතයක්, එනම් රුපියල් මිලියන 41.94 ක මුදලක් ආයෝජනය කරන ලදි. ඒ අතර වාරියපොල හා දංකොටුව ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ප්‍රමාණාත්මක ලෙස හා ගුණාත්මක ලෙස වැඩි වර්ධනය කිරීම සඳහා සහ ස්ථාන භාර නිලධාරි කාර්යාල 2 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීම සඳහා ද ගබඩාව පුනරුත්ථාපනය කිරීම සඳහා ද පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද අය වැය වෙන් කිරීමෙන් 73% ක ප්‍රතිශතයක්, එනම් රුපියල් මිලියන 79.58 ක මුදලක් ආයෝජනය කරන ලදි.

කලාපය තුළ ක්‍රියාත්මක වන ගබඩා සංඛ්‍යාව අඩු කිරීම ඉලක්ක කර ගනිමින් ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමයට අනුව නිවැරදි ලෙස ක්‍රියාත්මක වන කලාපීය ගබඩා 6 ක සංඛ්‍යාවක් සාර්ථක ලෙස ස්ථාපිත කරන ලදි. රුපියල් මිලියන 11.27 ක අගයකින් යුත් ඉල්ලුමක් නොමැති හා භාවිතයට ගත නොහැකි භාණ්ඩ තොගයක් වෙන්දේසියේ විකිණීම සඳහා අයින් කර තබන ලදි.

බල ශක්ති සංරක්ෂණය කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 32.5 ක මුදලක් වාරියපොල පෝම්ප ප්‍රති ස්ථාපනය කිරීම සඳහා සහ රම්බඩගල්ල, නිකවැරටිය හා නෙළුම්පොකුන මට්ටම් පසු විපරම් ව්‍යාපෘතීන් වෙනුවෙන් ආයෝජනය කරන ලද අතර ඒ හරහා වාර්ෂිකව රුපියල් මිලියන 7 ක මුදලක් ඉතිරි කර ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. වාර්ෂිකව රුපියල් මිලියන 21 ක මුදලක් ඉතිරි කර ගත හැකි වනු ඇතැයි යන අපේක්ෂාවෙන් යුතුව ස්ථාන 6 ක සංඛ්‍යාවක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ ගාස්තු වගු වර්ග නිවැරදි කරවා ගන්නා ලදි. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ (AIWSP) අරමුදල් යටතේ ඉදි කරගෙන යනු ලබන නව වැඩ පොල ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම වීමට ආසන්න වෙමින් පවතී.

අබුක්කගම (සම්පූර්ණ කරනු ලැබ ඇත) හා හෙට්ටිආරච්චිගම (50% ක් නිම කරනු ලැබ ඇත) සහ ජල ගුණාත්මය පරීක්ෂා කර බැලීමේ වැඩ කටයුතු වෙනුවෙන් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග අරමුදලින් රුපියල් මිලියන 24.24 ක මුදලක් වැය කරනු ලැබ ඇත. මාරගම, දිද්දෙනියවත්ත හා මඩවක්කුලම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් වූ අය වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 26.44 ක මුදලක් වැය කරන ලද අතර එම ව්‍යාපෘතීන් විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය 90% ක් වේ.

ආංශික ක්‍රම සම්පාදන අංශය විසින් සැලැසුම් කරන ලද ව්‍යාපෘතීන් කිහිපයක් දැනට ප්‍රතිසම්පාදන තත්ත්වයේ පවතින අතර ඒවා නම් බිංගිරිය උඩුබද්දාව ජල සම්පාදන යෝජනා ක්‍රමය (හන්ගේරියානු අරමුදල්), කලා ඔය ජල ශේෂ අධ්‍යයනය (ආසියානු සංවර්ධන බැංකු අරමුදල්), කටුපොත බමුණාකොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය (කොරියානු අරමුදල්) හා කුරුණෑගලට උතුරු දෙසින් පිහිටි නගර සඳහා වූ ජල සම්පාදන යෝජනා ක්‍රමය පිළිබඳ සාධ්‍යතා අධ්‍යයනය (TATA ගෝලීය අරමුදල්) ද වේ.

ජලය බෙදා හැරීමේ පද්ධතියෙන් උකහා ගන්නා ලද ජල නියැදීන් 250 ක සංඛ්‍යාවක් මාසිකව රසායනික,භෞතික හා ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක ගුණාත්ම තත්ත්වය හඳුනා ගැනීම සඳහා පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. මුළු කලාපයම ආවරණය කරමින් ජල සුරක්ෂිතතා සැලැසුම් 11 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. අලව්ව, නෙළුම්පොකුණ හා වාරියපොල වෙනුවෙන් වූ සියළුම ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර අනිකුත් මොඩියුල අඩ වශයෙන් නිම කරනු ලැබ ඇත.

වයඹ සංවර්ධන අරමුදල උපයෝගී කර ගනිමින් ඉදි කරනු ලබන ජල යෝජනා ක්‍රම 20 න් 13 ක සංඛ්‍යාවක හා දිස්ත්‍රික් ලේකම් අරමුදල් උපයෝගී කර ගනිමින් ඉදි කරනු ලබන ජල යෝජනා ක්‍රම 6 න් 2 ක සංඛ්‍යාවක ද වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

මිලි මීටර 63 නල යොදා ගනිමින් කිලෝ මීටර 19.89 ක දිගුවක් ද, මිලි මීටර 90 නල යොදා ගනිමින් මීටර 490 ක දිගුවක් හා මිලි මීටර 160 නල යොදා ගනිමින් මීටර 320 ක දිගුවක් ද යනාදී වශයෙන් කලාපය තුළ කිලෝ මීටර 20.7 ක බෙදා හැරීම් මාර්ග දීර්ඝ කිරීම් සිදු කරනු ලැබ ඇත.

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා හා යෝජිත තුළු මුව පිහිටි ස්ථානයන් 52 ක් ද, අමු ජල ප්‍රධාන නල මාර්ග ද, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 16 ක් ද, ගබඩා ටැංකි 43 ක් ද, බෙදා හැරීමේ නල මාර්ග කිලෝ මීටර 2,300 ක් ද, තොග මනු ද, ගිරිඋල්ල, පුත්තලම හා වාරියපොල වැල්ව පිහිටි ස්ථානයන් හා ආනමඩුවේ පාරිභෝගික සම්බන්ධතාවයන් ද භූගෝලීය තොරතුරු පද්ධතිය පදනම් කර ගත්

වත්කම් කළමනාකරණ ක්‍රමය යටතේ සළකුණු කරනු ලැබ ඇත.

ආපදා කළමනාකරණය කිරීමේ පියවරක් වශයෙන් රුපියල් 1,50,000 ක මුළු පිරිවැයක් දරමින් අමු ජලයේ ගුණාත්මය පසු විපරම් කිරීම පිණිස සියළුම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ මාළු ටැංකි ස්ථාපිත කරන ලදි. දරුණු නියං තත්ත්වයට ගොදුරු වූ ප්‍රදේශයේ ජීවත් වන පාරිභෝගිකයින් වෙත සේවා සැපයීම සඳහා රුපියල් 5,00,000 ක පිරිවැයක් දරමින් 3 න් මසක කාලයක් මුළුල්ලේ බවුසර මගින් ජලය සම්පාදනය කර දීමට කටයුතු පිළියෙල කරන ලදි.

දැනට ක්‍රියාත්මක වන තුළු මුවයන්හි ප්‍රමාණවත් නොවන ජල පරිමාව හා ඉහළ යකඩ සහ මැන්ගනීස අන්තර්ගත වීම හා කඨිනත්වය පිළිබඳ ගැටළු, බොහෝ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ට ධාරිතාව ඉක්මවා කටයුතු කරන්නට සිදු වී තිබීම, නල එලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීමේදී සිදු වන දුෂ්කරතා, මනා සංනිවේදනයකින් තොරව මාර්ග නිර්මාණය කිරීම නිසා නල මාර්ග යන්ට හානි සිදු වීම හා මනු බිල් වැසී යාම වැනි ගැටළු සඳහා විසඳුම් සොයාගත යුතුව තිබේ.

භූ ගත ජලය ප්‍රති ආරෝපණය වීම පිළිබඳව අධ්‍යයනය කිරීම පිණිස වාරියපොල භූ ගත ජල අංශය විසින් නියමු භූ ගත ජල ප්‍රති ආරෝපණ කලාපයක් ඉදි කරනු ලැබ ඇත.



**ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ අභිනන්දන උත්සවයේදී සම්ප්‍රදායික පොල් තෙල් පහන දැල්වීම**

## මධ්‍යම පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

2019 වර්ෂය තුළදී මධ්‍යම පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලද ජයග්‍රහණ අතුරින් එකක් වූයේ ප්‍රදේශය තුළ ජල සම්පාදන සම්බන්ධතා මුළු සංඛ්‍යාව ප්‍රස්තුත වර්ෂය තුළදී 282,214 ක මට්ටම දක්වා ගෙන ඒමට හැකි වීම හා ඒ අනුව මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 1.3 ක් බවට පත් වීම විය. ඒ අනුව මධ්‍යම පලාත තුළ ජල සම්පාදන සේවාවන්ගේ ආවරණය ලබන ප්‍රතිලාභී ජන ගහණය 42% ක් බවට පත් විය. ප්‍රස්තුත වර්ෂය තුළදී ජලය ඝණ මීටර මිලියන හැටක ප්‍රමාණයක් අලෙවි කරන ලද අතර ඒ අනුව උපයාගන්නා ලද ආදායම රුපියල් මිලියන 1,985 ක් විය. එය පිහිටුවා ගන්නා ලද ඉලක්කය 100% ක් සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීමක් වේ. ඒ මෙන්ම ණය කාලය සැලැකිය යුතු අන්දමින් දින 7 ක් විය.

ආදායම් රහිත ජල පරිමාව අවම කර ගැනීමේ අරමුණින් යුතුව 2019 වර්ෂයේ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ අය වැය වෙන් කිරීම යටතේ කරන ලද වැඩ කටයුතු වම වෙන් කිරීම වූ රුපියල් මිලියන 80 ක මුදලින් රුපියල් මිලියන 73 ක මුදලක් උපයෝගී කර ගෙන සම්පූර්ණයෙන් අවසන් කරන ලදි. බෙදා හැරීම් දුර කිලෝ මීටර 78.4 ක් තුළ රාත්‍රී ජල කාන්දු වීම් සමීක්ෂණයට බඳුන් කරන ලදි. සේවා මට්ටම වැඩි දියුණු කිරීමේ අරමුණින් මධ්‍යම නැගෙනහිර කලාපයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 120 ක පිරිවැයක් දරන ලදි. සූර්ය බල ශක්ති පද්ධතියක් කාර්යාලය තුළ ස්ථාපිත කරන ලද අතර අරත්තන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදි කරන ලදි. හිප්පොල ප්‍රදේශය තුළ කිලෝ මීටර 5.3 ක නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලදි.

මධ්‍යම දකුණු ප්‍රදේශය, නාවලපිටිය, පාර දෙක, රිකිල්ලගස්කඩ හා විසල් මහනුවර යන ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වන සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල ජල සුරක්ෂිතතා මොඩියුල සියල්ල සම්පූර්ණයෙන් නිම කරන ලදි. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මධ්‍යම රසායනාගාරය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ජල නියැදි 6,178 ක සංඛ්‍යාවක් හා බාහිර ආයතන වෙනුවෙන් ජල නියැදි 4,150 ක සංඛ්‍යාවක් රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි. එසේම මධ්‍යම රසායනාගාරය විසින් ජල සම්පාදන මණ්ඩලය වෙනුවෙන් ජල නියැදි 5465 ක සංඛ්‍යාවක් හා බාහිර ආයතන වෙනුවෙන් ජල නියැදි 5213 ක සංඛ්‍යාවක් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණයන්ට භාජනය කරන ලදි. ඊට අමතර වශයෙන් ජල නියැදි 404 ක සංඛ්‍යාවක් ප්‍රජා මූල සංවිධානයන් වෙනුවෙන් අය කිරීමකින් තොරව ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණයට බඳුන් කරන ලදි.

ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ අරමුදල් යටතේ රුපියල් මිලියන 14.38 ක මුදලක් ආයෝජනය කරමින් මධ්‍යම උතුර ප්‍රදේශය තුළ නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම හා නව වෑල්ව කුටි 52 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ක්‍රියාත්මක කරන ලදි. ඒ අතර විල්ගමුව හා දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් විසින් ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රමයන් 10 ක සංඛ්‍යාවක් සිය භාරයට ගන්නා ලදි.

ප්‍රති ආරෝපණය කළ හැකි ක්‍රියාකාරකම් යටතේ මධ්‍යම දකුණ ප්‍රදේශය තුළ මිලි මීටර 63 හා 225 නල යොදා ගනිමින් කිලෝ මීටර 20.63 ක දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලදි. එසේම රුපියල් මිලියන 7.93 ක මුදලක් වැය කරමින් පුනරුත්ථාපන වැඩ කටයුතු හා රුපියල් මිලියන 7.09 ක මුදලක් වැය කරමින් ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු ද 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබිණි.

මහනුවර දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 63% සිට 75% ක් දක්වා ද, මාතලේ දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 30% සිට 85% දක්වා හා නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 10% සිට 14% ක් දක්වා ද ඉහළ නැංවීමේ අරමුණ සහිතව සංවර්ධන අංශය විසින් අධ්‍යයනයන් දියත් කරන ලදි. ඉහත සඳහන් අරමුණු ඉලක්ක කර ගනිමින් නානුඔය හා දෙල්තොට ජල සම්පාදන ව්‍යාපෘතීන් විසින් නව සම්බන්ධතා දීමට සූදානමින් සිටිති. මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති ව්‍යාපෘති යෝජනාවන් 6 ක සංඛ්‍යාවක් අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර වෙනත් ව්‍යාපෘති 3 ක සංඛ්‍යාවක් ව්‍යාපෘති අගැයුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබීමට සූදානම් කරනු ලැබ තිබේ. ජල විද්‍යාත්මක විමර්ශණයන් තිස් හයක සංඛ්‍යාවක් ද, මිහි විදමන් ළිං 18 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, මිහි විදමන් ළිං 9 වතාවක් සෝදා හැරීම ද, අත් පෝම්ප අළුත්වැඩියා කිරීම් / පුනරුත්ථාපනය කිරීම් 7 වතාවක් කිරීම හා නව අත් පෝම්ප 21 ක සංඛ්‍යාවක් ස්ථාපනය කිරීම ද සිදු කරන ලද අතර ජල විද්‍යාත්මක අංශය විසින් රුපියල් මිලියන 13.77 ක මුදලක් රැස් කර ගන්නා ලදි. ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් කිලෝ මීටර 21 ක් දිගට නල නැවත එලීමේ කටයුතු සිදු කරන ලද අතර ඒ සමග මහනුවර - කිරිමැටිය මාර්ගයේ සම්බන්ධතා මාරු කිරීම් 1100 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම හා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල පුනරුත්ථාපන කටයුතු හා වර්ධනය කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ඉලක්ක කරන ලද සංඛ්‍යාවට එරෙහිව 72% ක ප්‍රතිශතයක් සාක්ෂාත් කර ගනිමින් නව සම්බන්ධතාවයන් 7962 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දෙන ලදි. ඒ අතර ඉලක්කය 100% ක් සාක්ෂාත් කර ගනිමින් ජලය ඝණ මීටර මිලියන 60 ක ප්‍රමාණයක් අලෙවි කරන ලදි. මධ්‍යම නැගෙනහිර ප්‍රදේශය තුළ රුපියල් මිලියන 32.93 ක අගයකින් යුත් වත්කම් ප්‍රමාණයක් ද, මධ්‍යම දකුණු ප්‍රදේශය තුළ රුපියල් මිලියන 47.05 ක අගයකින් යුත් වත්කම් ප්‍රමාණයක් හා මධ්‍යම උතුර ප්‍රදේශය තුළ රුපියල් මිලියන 36.29 ක අගයකින්

යුත් වත්කම් ප්‍රමාණයක් ද වත්කම් ප්‍රාග්ධනායනය කරන ලදි. විසල් මහනුවර අදියර 11 ව්‍යාපෘතියේ ප්‍රාග්ධනායනය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. විසල් දඹුල්ල ප්‍රාග්ධනීකරණය 90% ක් නිම වී ඇති අතර බිලියන 3.5 අය වැය වෙන් කිරීම් යටතේ හා දේශීය බැංකු අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියට අදාල ප්‍රාග්ධනීකරණ කටයුතු 50% ක් නිම කරනු ලැබ ඇත.

පුහුණු කිරීම් වැඩ සටහන් විසි හතරක සංඛ්‍යාවක් මෙහෙයවන ලද අතර 5 සංකල්පය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබමින් පවතී. සමාජ, ආගමික හා ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද අතර සහාය සේවා මධ්‍යස්ථානයට අනුබද්ධ සේවකයින් තිදෙනෙකු වන බී. ජී. ඊ. ධනසේන, වයි. එච්. එල්. පීරිස් හා ඩී. එස්. කේ. කුමාර යන අය විසින් ජාතික මට්ටමේ ජන සතු සේවා ක්‍රීඩා තරගයන්ට සහභාගි වී පදක්කම් දිනාගනු ලැබ ඇත.

## සබරගමුව පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

මේ වන විට සබරගමුව පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සබරගමුව පලාතේ ජීවත් වන ප්‍රජාවන් වෙත ජල සම්පාදන සම්බන්ධතා 100000 කට අධික සංඛ්‍යාවක් ඔස්සේ නල ජලය සම්පාදනය කර දෙනු ලබන අතර සේවා ආවරණය නංවා ලීමේ හා මෙහෙයුම් පිරිවැය අඩු කිරීමේ අරමුණින් යුතුව තව දුරටත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 31.5 ක මුදල් ප්‍රමාණයක් හා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ නව වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 12.10 ක මුදල් ප්‍රමාණයක් ද වැය කරන ලදි.

නැවත පදිංචි කරවීමේ හා උපයෝජ්‍යතා විතැන් කිරීමේ අරමුදල් යටතේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කෑගල්ල ප්‍රදේශය තුළ ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින ලදි. ජල සම්පාදන හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) මගින් එම ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල සාමාජිකයින් යොදවා සබරගමුව පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 5 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන 6312 ක පුද්ගලයින් සංඛ්‍යාවකට හා සබරගමුව විශ්ව විද්‍යාලය වෙත සේවය සැපයෙන පරිදි බොහෝ ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ :ˆීෂඡ* හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය මර්දනය කිරීමේ අරමුදල් යටතේ ඇඹිලිපිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට පදලන්ගල දක්වා දිනකට ජලය ඝණ මීටර 5000 ක පානීය ජල ප්‍රමාණයක් සම්පාදනය කර දීම යෝජනා කරනු ලැබ ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය මර්දනය කිරීමේ අරමුදල් යටතේ රුපියල් මිලියන 92.97 ක මුදලක් ආයෝජනය කරමින් කිලෝ මීටර 4.5 ක දිග ප්‍රමාණයකින් යුත් පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයක් සපයා එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ප්‍රතිකාරිත ජලය පෝම්ප කිරීම සඳහා වූ පොම්පාගාරයක් ඇඹිලිපිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ඉදි කිරීමේ කටයුතු හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය මර්දනය කිරීමේ අරමුදල් යටතේ රුපියල් මිලියන 35 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැයක් දරමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

උඩවලව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු පුනරුත්ථාපන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිතව ඇත. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය රුපියල් මිලියන 9.0 ක් වන අතර ව්‍යාපෘතිය දැනට මිළ ගණන් (ටෙන්ඩර) කැඳවීමේ අදියර තුළ ඇත.

කහවත්ත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට පැල්මඩුල්ලේ බටලන්ද හන්දිය දක්වා මිලි මීටර 280 ක විෂ්කම්භයෙන් යුත් පොලිවිනිල් ක්ලෝරයිඩ් නල යොදා ගනිමින් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් ඉදි කිරීමේ ඉලක්කය ඇතිව දියත් කරන ලද කහවත්ත - පැල්මඩුල්ල ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග ව්‍යාපෘතිය ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ ප්‍රස්තුත වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි. එකී නල මාර්ගය කිලෝ මීටර 7 ක දිග ප්‍රමාණයකින් යුක්ත වන අතර ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 160 ක් වනු ඇත.

ඇහැලියගොඩ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ප්‍රාග්ධන අය වැය ලේඛනය මගින් වෙන් කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන අරමුදල් යටතේ රුපියල් මිලියන 19.0 ක පිරිවැයක් දරමින් පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු සබරග මුව පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර අදාල වැඩ කටයුතු 2019 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම 2019 වර්ෂය තුළදී රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ අඛන්ඩ ලෙස සිදු කරන ලද අතර ඒ අනුව එකී කලාපයන් දෙකම තුළ පරදු ධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවන ලදි. රත්නපුර කලාපය තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල සම්පූර්ණ කිරීම 50% ක තත්ත්වයේ තිබෙන අතර කෑගල්ල කලාපයේ එහි තත්ත්වය ආසන්න වශයෙන් 40% ක් වේ. ප්‍රස්තුත වර්ෂය තුළදී පාසැල් දරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 6 ක සංඛ්‍යාවක් රත්නපුර කලාපය තුළ ද, පාසැල් දරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 12 ක සංඛ්‍යාවක් කෑගල්ල කලාපය තුළ ද පවත්වන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හා ප්‍රජා මූල සංවිධානයන්හි යන්ත්‍රාගාර ක්‍රියා කරුවන් වෙනුවෙන් ද යථෝක්ත කලාප දෙක තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි. මීට අමතර වශයෙන් ආසන්න වශයෙන් රුපියල් මිලියන 3 ක පිරිවැයක් දරමින් උඩවලව තුළු මුව වටා දම්වැල් පුරුක් වැටවල් ඉදි කිරීම හා බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රම පරිශ්‍රය තුළ පීඩන කැඩීමේ ටැංකි ඉදි කිරීම ද ක්‍රියාත්මක කරන ලදි.

2019 වර්ෂය තුළදී කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ආසන්න වශයෙන් පැල 7500 ක සංඛ්‍යාවක් බෙදා දෙන ලද අතර රත්නපුර දිස්ත්‍රික්කය තුළ පැල 10000 කට අධික සංඛ්‍යාවක් ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා බෙදා හරිනු ලැබීමට කටයුතු කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හා එක්ව ප්‍රජා මූල සංවිධාන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල ජලාධරයන් තුළ තවත් පැල 1000 ක සංඛ්‍යාවක් සිටුවීමට කටයුතු කරන ලද්දේය.

## ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බදුල්ලේ පිහිටි ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත 2019 වාර්ෂික හරිත නිර්මාණ තිළින ප්‍රදාන (Annual Green Building Awards) උත්සවයේදී GREENSL අගැයුම් ක්‍රමය යටතේ ස්වර්ණ අගැයුම් සහතිකකරණය ප්‍රදානය කරන ලදි. ඊට අමතර වශයෙන් 2019 වර්ෂයේදී බණ්ඩාරවෙල කලාපීය රසායනාගාරය වෙත ජාතික ඵලදායිතා මහ ලේකම් කාර්යාලය විසින් පිරිනමනු ලබන 5S සහතිකකරණය ද ප්‍රදානය කරන ලදි.

බණ්ඩාරවෙල හා මොනරාගල යන කලාපයන් දෙක තුළ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ පසු විපරම් කටයුතු කිරීම සඳහා සහ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ අංශය පිහිටුවන ලදි. රාත්‍රී ජල කාන්දු සමීක්ෂණ හා විසන්ධි කිරීම් සහ නීති විරෝධී සම්බන්ධතාවයන් පසු විපරම් කිරීම එම අංශය විසින් සිදු කරන ලදි. ක්‍රියාත්මක වන සේවා සම්බන්ධතාවයන්ගේ වැරදි නිවැරදි කිරීම, අඩු පීඩන නල හා පැරණි නල වෙනුවට අළුත් නල යෙදීම සහ අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීමේ (SCADA) ක්‍රම බුත්තල, වැල්ලවාය, දිවිතොටවල හා වැලිමඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත හඳුන්වා දීම 2019 වර්ෂය තුළදී ආදායම් රහිත

ජල පරිමාව අවම කිරීමේ අය වැය වෙන් කිරීම යටතේ ක්‍රියාත්මක කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාව 28% ක ප්‍රතිශතයේ සිට 27% ක ප්‍රතිශතය දක්වා අඩු කර ගැනීමට හැකි විය.

ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද බල ශක්ති සංරක්ෂණය කිරීමේ ඇතැම් ක්‍රියාකාරකම් වන්නේ අකාර්යක්ෂම පොම්ප වෙනුවට අළුත් පොම්ප යෙදීම හා ඉල්ලුම අධික කාල වේලාවන් තුළ පෝම්ප කිරීමෙන් වැලකී සිටීමත් වේ. සියළුම පොම්පාගාරයන් තුළ නිවාරණ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදුලි බලය සඳහා වැය කරනු ලබන පිරිවැය අඩු වීමට අමතර වශයෙන් පොම්පාගාරයන් නඩත්තු කිරීමේ පිරිවැය මෙන්ම පොම්ප ක්‍රියා විරහිත තත්ත්වයේ තිබෙන කාලය ද අඩු වී ඇත. එසේම බණ්ඩාරවෙල හා මොනරාගල පිහිටි ප්‍රාදේශීය කළමනාකාර කාර්යාල ගොඩනැගිලි වල සූර්ය බල ශක්ති පනේලයන් ද සවි කරනු ලැබ ඇත.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ඇති භාණ්ඩ තොග මට්ටම් අඩු කිරීමේ අරමුණ සහිතව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව තිබුණ නල හා සවි කිරීම් භාවිතා කරමින් ආසන්න වශයෙන් කිලෝ මීටර 21 ක දිගින් යුත් නල එළීම් සිදු කරන ලදි.එසේම ප්‍රදේශය තුළ තිබුණ නල හා සවි කිරීම් භාවිතා කරමින් දෙමෝදර ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ඇති ඇල්ල හා හල්පේ ප්‍රදේශයන් තුළ ප්‍රජා නල එළීම් කටයුතු සිදු කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී නිලධාරීන් වෙනුවෙන් පුහුණු කිරීම් වැඩ සටහන් 23 ක් ද, වෙනත් වර්ගයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් පුහුණු කිරීම් වැඩ සටහන් 11 ක් ද, සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් පුහුණු කිරීම් වැඩ සටහන් 3 ක් හා ප්‍රජා මූල සංවිධානයන් වෙනුවෙන් පුහුණු කිරීම් වැඩ සටහන් 2 ක් ද වශයෙන් පුහුණු කිරීම් වැඩ සටහන් 39 ක සංඛ්‍යාවක් පවත්වන ලද අතර ඒ සඳහා භාවිතා කරන ලද්දේ පුහුණු කිරීම් වෙනුවෙන් ඇති අය වැය වෙන් කිරීම මෙන්ම වෙනත් ඇතැම් අනුග්‍රාහකත්වයන් ද වේ.

පලාත් ජල කමිටුව (ඌව) යලිත් ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර ජල ප්‍රභවයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කිරීම හා ජලාධර ආරක්ෂා කර ගැනීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් ඉලක්ක කර ගනිමින් එහි ප්‍රථම පරදු ධාරී රැස්වීම පවත්වන ලදි. බෝමුරුඇල්ල ජලාධර ප්‍රදේශය තුළ හා බදුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රදේශය සහ දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රදේශය තුළ ද ජලාධර ආරක්ෂා කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. කලාපය තුළ ක්‍රියාත්මක වන සියළුම ජල සම්පාදන ක්‍රමයන් තුළම මෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් ආරම්භ කරනු ලැබ ඇති අතර කලාපය තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් නවයකට අදාල ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල සම්පූර්ණ කරනු ලැබ ඇත. වැල්ලවාය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල බාහිර විගණනය 2019 සැප්තැම්බර් මාසයේදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

බදුල්ලේ පිහිටි මහියංගන හා දෙමෝදර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ කිලෝ මීටර 18 ද දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලද අතර මොනරාගල බුත්තල ජල සම්පාද යෝජනා ක්‍රමය තුළ කිලෝ මීටර 25 ක දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රති ආරෝපණය කළ හැකි අය වැය වෙන් කිරීම් යටතේ ඒ 5 මාර්ග යෙහි කිලෝ මීටර 43 ක් දිගට නල එළීම ආරම්භ කරන ලද අතර ඉන් කිලෝ මීටර 25 ක දුර ප්‍රමාණයක් දැනට නිම කරනු ලැබ ඇත. ඌව පලාත් සභා අරමුදල යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි තොටිල්ලකැටිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ගංගොඩගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම දැනට අවසන් අදියරෙහි පවතී. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග මර්දන අය වැය වෙන් කිරීම යටතේ ක්‍රියාත්මක කරන ලද අගලඔය නල මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර බලගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා රිදීමාලියද්ද දක්වා පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය දීර්ඝ කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

තවද ජල සම්පාදන යෝජනා ක්‍රමයන්, ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාසය හා සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතීන් පුනරුත්ථාපනය කිරීම හා යාන්ත්‍රික හා විද්‍යුත් වැඩි දියුණු කිරීම් ඇතුලත් කාර්යයන් සඳහා පුනරුත්ථාපන වැඩ යටතේ බණ්ඩාරවෙල කොන්ත්‍රාත්තු 71 ක සංඛ්‍යාවක් හා මොනරාගල කොන්ත්‍රාත්තු 41 ක සංඛ්‍යාවක් ප්‍රදානය කරන ලද අතර ඒවායේ මුළු වටිනාකම රුපියල් මිලියන 450 ක් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී තල්දෙන, මීගහකිවුල හා යහලඅරාව - උලුගල ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් හා බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ හා හම්බේගමුව සංශෝධනය කරන ලද යෝජනාවන් වෙනුවෙන් ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

ඌව පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුබද්ධිත ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත්තේ ගත වූ වර්ෂයෙන් ඉතිරි වී තිබුණ වැඩ කොටස් පමණක් වේ. රුපියල් මිලියන 46.39 ක පිරිවැයක් දරමින් නිම කරන ලද බොරගස් ජල සම්පාදන ව්‍යාපෘතියේ හා රුපියල් මිලියන 17.8 ක පිරිවැයක් දරමින් නිම කරන ලද රාහුප්පොල ජල සම්පාදන ව්‍යාපෘතියේ විවෘත කිරීමේ උත්සවයන් 2019 වර්ෂය තුළදී පවත්වන ලද අතර පල්ගහතැන්න හා බලගොල්ල ව්‍යාපෘතීන්ට අදාල කටයුතු දැනට අවසන් අදියර තුළ පවතී.

## උතුරු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

යාපනය, කිලිනොච්චි, මුලතිවු, වවුනියා හා මන්නාරම යන දිස්ත්‍රික්කයන් තුළ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන කොට්ඨාශ දෙක නම් යාපනය ප්‍රාදේශීය කළමනාකාර කොට්ඨාශය හා වවුනියා ප්‍රාදේශීය කළමනාකාර කොට්ඨාශයයි. පලාතේ මුළු ජන ගහණය මිලියන 1.24 ක් වේ.

2019 වර්ෂයේ අවසානය වන විට කලාපය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මුළු ජල සම්බන්ධතා සංඛ්‍යාව 28,064 ක් වන අතර නල මගින් ජලය සපයනු ලබන ජන ගහණ ප්‍රතිශතය 7.38 ක් වේ. මේ අතර ග්‍රාමීය ජල සම්පාදනය මගින් ආවරණය කරනු ලබන ජන ගහණ ප්‍රතිශතය ආසන්න වශයෙන් 0.54 ක් වේ. උතුරු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ සේවය කරනු ලබන මුළු කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 220 ක් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී කලාපය තුළ කිලෝ මීටර 56 ක දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ පියවර වශයෙන් කිලෝ මීටර 13.5 ක ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ග, වෑල්ව 16 ක සංඛ්‍යාවක් හා දෝෂ සහිත මනු 1961 ක සංඛ්‍යාවක් ප්‍රති ස්ථාපනය කිරීම ක්‍රියාත්මක කරන ලදි, තවද අළුත් වෑල්ව 27 ක සංඛ්‍යාවක් ස්ථාපනය කරන ලදි. අවශ්‍ය වෑල්ව කුටි ඉදි කිරීමට කටයුතු කරන ලද අතර ඒවා අතුරින් ඇතැම් කුටි වල ඉදි කිරීම් වැඩ කටයුතු මේ වන විට සිදු කරනු ලබමින් පවතී. ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පාදනය කර දෙන ලද නව සේවා සම්බන්ධතා සංඛ්‍යාව 3907 කි.

යාපනය හා වවුනියාවේ ක්‍රියාත්මක වන කලාපීය රසායනාග ාරයන් විසින් ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 හා අදාල කළමනාකරණ අවශ්‍යතාවයන් හා තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරනු ලැබ ඇති අතර ඒ අනුව එකී කලාපීය රසායනාගාරයන් වෙත චයල බොර භාවය, විද්‍යුත් සන්නායකතාවය, මුළු කඨින තත්ත්වය හා ක්ලෝරයිඩ් යන පරාමිතීන් 5 ක සංඛ්‍යාව වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 පිළිගැනීම ප්‍රදානය කරනු ලැබ ඇති අතර ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරීක්ෂණ කටයුතු වෙනුවෙන් එම පිළිගැනීම ලබා ගැනීමේ අවශ්‍යතාවයන් සපුරා ලීමේ කටයුතු දැනට සිදු කර ගෙන යමින් පවතී. ඒ අතර යාපනය ප්‍රදේශය තුළ විවිධ පරදු ධාරීන් වෙත රසායනාගාර සේවාවන් සපයා දීම හරහා රුපියල් මිලියන 4.0 ක මුදල් ප්‍රමාණයක් උපයා ගැනීමට හැකි විය. තවද ජනාධිපති මහ ලේකම් කාර්යාලය විසින් උතුරු පලාත තුළ පිහිටි පාසැල් තුළ ජලයේ ගුණාත්මය පරීක්ෂා කිරීමේ විශේෂ වැඩ සටහනක් දියත් කරන ලද අතර එම වැඩ සටහන සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කිරීම

මගින් රුපියල් මිලියන 2.0 ක මුදල් ප්‍රමාණයක් උපයා ගන්නා ලදි. මේ අතර කිලිනොච්චි හා මුලතිවු දිස්ත්‍රික්කයන් වෙත රසායනාගාර සේවාවන් සම්පාදනය කර දීමේ අරමුණ ඇතිව කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ කුඩා පරිමාන රසායනාගාරයක් ස්ථාපිත කරන ලදි. ගාස්තු රැස් කිරීමේ කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කරමින් යාපනය ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය විසින් ජල බිල් පත් මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදි.

කිලිනොච්චියේ ගබඩා ගොඩනැගිල්ල හා පොම්පාගාර ගොඩනැගිල්ල ඉදි කිරීමේ හා කලාපීය රසායනාගාර පරිශ්‍රය තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. යාපනය කොට්ඨාශය තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 6 ක සංඛ්‍යාවක් සඳහා වූ ජල සුරක්ෂිතතා සැලසුම් හා වවුනියාවේ භූ ගත ජල ප්‍රභවයන් ඇතුලත් පෙරාරු ජලාශය හා බෙදා හැරීමේ පද්ධතිය ද ක්‍රියාත්මක කරන ලදි. පේදුරු තුඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සම්බන්ධ ජල සුරක්ෂිතතා සැලසුම බාහිර විධිමත් විගණනයට භාජනය කරන ලද අතර එහිදී ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව 90 ක් විය (සාමාන්‍ය තත්ත්වය). රුපියල් මිලියන 125.85 ක පිරිවැයක් දරමින් පෝම්ප හා සූර්ය බල ශක්ති පනේල ස්ථාපිත කිරීම හා පෝම්ප ප්‍රති ස්ථාපනය කිරීම ද ක්‍රියාත්මක කරන ලදි.

රුපියල් මිලියන 5.92 ක පිරිවැයක් දරමින් බෙදා හැරීම් පද්ධතීන් දීර්ඝ කරමින් හා නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දෙමින් යාපනය, කිලිනොච්චි හා මන්නාරම යන දිස්ත්‍රික්කයන් තුන තුළ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් නවයක සංඛ්‍යාවක් තුළ පුනරුත්ථාපන හා යාන්ත්‍රික සහ විද්‍යුත් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

යෝජිත විසල් වවුනියාව ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා පහල මල්වතු ඔය ජලාශයෙන් දිනකට ජලය ඝණ මීටර 32000 ක පරිමාවක් බෙදා හදා ගැනීම සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වරයා විසින් ලිඛිත අනුමැතියක් නිකුත් කරනු ලැබ තිබේ. විසල් මන්නාරම ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වූ සාධ්‍යතා අධ්‍යයන කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ සඳහා වූ ව්‍යාපෘති අගැයුම් කමිටු අනුමැතිය හා මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. විසල් වවුනියාව ජල සම්පාදන ව්‍යාපෘතිය, විසල් මන්නාරම ජල සම්පාදන ව්‍යාපෘතිය හා මාන්කුලම් ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත සංකල්ප පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබ ඇත.

නල මාර්ග ජල සම්පාදන ආවරණය නංවා ලීමේ අරමුණ ඇතිව රුපියල් මිලියන 132 ක ආයෝජනයක් කරමින් ජලය බෙදා හැරීමේ පද්ධතීන් තුළ නල එලීමේ වැඩ කටයුතු හා ඊට අදාල වෙනත් සිවිල් වැඩ කටයුතු ඇතුළු ඉදි කිරීම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඊට අමතර වශයෙන් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් හා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර කිහිපයක් සම්පූර්ණයෙන් නිම කොට ප්‍රජාව වෙත භාර දෙනු ලැබ ඇත.

රුපියල් මිලියන 220 ක අගයකින් යුත් සැලසුම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඊට මඩුහි පිහිටි අප ස්වාමි දුවගේ ශුද්ධ වූ දේවස්ථානය වෙත සම්පාදනය කර දෙනු ලැබීමට නියමිත ජල සැපයුම ද ඇතුලත් වේ.

රුපියල් මිලියන 22 ක මුදලක් ආයෝජනය කරමින් ජල භූ විද්‍යාත්මක විමර්ශණයන් හැට පහක සංඛ්‍යාවක් ද, නල ළිං ඉදි කිරීම් 32 ක සංඛ්‍යාවක් හා ළිං සංවර්ධන ක්‍රියාකාරකම් 26 ක සංඛ්‍යාවක් ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

## නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා අක්කරෙයිපත්තු නමින් යුත් කොට්ඨාශ කළමනාකරුවන් සිව් දෙනෙකු විසිනි.

සාමාන්‍ය ණය කාලය 0.35 ට අඩු මට්ටමක පවත්වාගෙන යාමේ අපේක්ෂාවෙන් අබන්ඩ විසන්දි කිරීමේ වැඩ සටහන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ වාණිජ නිලධාරි වරයා යටතේ වෙන් වූ කණ්ඩායම් තුනක් පත් කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී සියළු කොට්ඨාශ හතර තුළම ආදායම් රහිත ජල පරිමාව අවර කිරීමේ ඇතැම් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් දෝෂ සහිත මනු 3445 ක සංඛ්‍යාවක් වෙනුවට අළුත් මනු සවි කිරීම ද, ජල කාන්දු වීම් 3027 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීම හා නීති විරෝධී සම්බන්ධතාවයන් 18 ක සංඛ්‍යාවක් සොයා ගැනීම ද සියළුම කොට්ඨාශයන් තුළ ක්‍රියාත්මක කරන ලදි. එසේම කොට්ඨාශයන්ට අදාල ආදායම් රහිත ජල පරිමාවන් සම්බන්ධයෙන් ගත් කල ත්‍රිකුණාමලය කොට්ඨාශය තුළ 25% ක මට්ටමින් ද, මඩකලපුව කොට්ඨාශය තුළ 14% ක මට්ටමින් ද, අක්කරෙයිපත්තු හා කල්මුනෙයි කොට්ඨාශය තුළ 12% ක මට්ටමින් හා අම්පාර කොට්ඨාශය තුළ 15% ක මට්ටමින් ද පවත්වා ගැනීමේ හැකියාව ලැබුණි.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් යටතේ පුනරුත්ථාපන වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 65 ක වෙන් කිරීමක් හා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 60 ක වෙන් කිරීමක් සිදු කරනු ලැබ තිබුණ අතර එම වෙන් කිරීම් වලින් රුපියල් මිලියන 52.91 ක මුළු මුදලක් වැය කර තිබුණ අතර 2019 දෙසැම්බර් මාසය වන විට රුපියල් මිලියන 45.44 ක් වටිනා ගෙවිය යුතු බිල් ඉතිරිය තිබිණි. ප්‍රති ආරෝපණය කළ හැකි වැඩ යටතේ ත්‍රිකුණාමලය කොට්ඨාශයේ විවිධ ආයතනයන් වෙතින් රුපියල් මිලියන 23.10 ක මුදලක් ලැබුණ අතර ඉන් රුපියල් මිලියන 9.50 ක මුදලක් වැය කරන ලදි. එසේම මඩකලපුව කොට්ඨාශයේ විවිධ ආයතනයන් වෙතින් රුපියල් මිලියන 36ග00 ක මුදලක් ලැබුණ අතර ඉන් රුපියල් මිලියන 15ග00 ක මුදලක් වැය කරන ලදි. එසේම කල්මුනෙයි කොට්ඨාශයේ විවිධ ආයතනයන් වෙතින් රුපියල් මිලියන 32ග80 ක මුදලක් ලැබුණ අතර ඉන් රුපියල් මිලියන 4.60 ක මුදලක් වැය කරන ලදි. එසේම අක්කරෙයිපත්තු කොට්ඨාශයේ විවිධ ආයතනයන් වෙතින් රුපියල් මිලියන 37ග00 ක මුදලක් ලැබුණ අතර ඉන් රුපියල් මිලියන 15.00 ක මුදලක් වැය කරන ලද අතර එසේම අම්පාර කොට්ඨාශයේ විවිධ ආයතනයන් වෙතින් රුපියල් මිලියන 196ග50 ක මුදලක් ලැබුණ අතර ඉන් රුපියල් මිලියන 43ග80 ක මුදලක් වැය කරන ලදි.

2019 වර්ෂයේ අවසානය වන විට නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන්ගේ මුළු සංඛ්‍යාව 286,003 ක් බවට පත් වී තිබේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී (අගය එකතු කළ බද්ද සමග) රුපියල් මිලියන 1,912,68 ක බිල් කිරීමකට එරෙහිව රැස් කර ගනු ලැබ ඇති මුදල් ප්‍රමාණය (අගය එකතු කළ බද්ද සමග) රුපියල් මිලියන 1,938.54 ක් බව වාර්තා වී ඇත. සමස්තයක් වශයෙන් ගත් කල 2019 වර්ෂය තුළදී ටෙන්ඩර 69 ක් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබ ඇති අතර රුපියල් මිලියන 119.03 ක අගයක් සහිත කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත.

2019 වර්ෂය තුළදී නැගෙනහිර පලාත් සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත සියළුම කොට්ඨාශයන්ට බොහෝ අභියෝගයන්ට මුහුණ පෑමට සිදු විය. නියං සමය තුළදී උන්නිච්චායි වැවේ පතුල මට්ටමේ සිට ජලය උකහා ගනිමින් ප්‍රතිකාරිත කිරීමේදී මඩකලපුව කොට්ඨාශය දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නේය. මාවඩිපල්ලි හා සයින්තමරුදු ප්‍රදේශයන්හි ගංගා හරස් මාරු දෙකක් බිඳ වැටීම සිදු වුන අතර කල්මුනෙයි කොට්ඨාශය තුළ පිහිටි ග්‍රීන් ෆීල්ඩ් තට්ටු නිවාස සංකීර්ණ නිවාස යෝජනා ක්‍රමය විශාල මුදලක් නොගෙවා හිඟ හිටවා තිබිණි. අක්කරෙයිපත්තු කොට්ඨාශය තුළ නියං සමය තුළදී පොතුවිල් ප්‍රදේශය තුළ භූ ගත ජල ප්‍රභවයන්ගේ හිඟයක් පැවැතුන අතර තිරුක්කෝවිල් ප්‍රදේශය තුළ ජල හිඟයක් පැවැතිනි. ත්‍රිකුණාමල කොට්ඨාශය තුළ නියං සමය තුළදී ත්‍රිකුණාමලය නගරය වෙත ජලය සම්පාදනය කර දීම සම්බන්ධයෙන් උග්‍ර ගැටළු ඇති කරමින් මහවැලි ගංගාවේ ජල හිඟයකට මුහුණ දෙන්නට සිදු වූ අතර කන්තලේ වාරි මාර්ග වැවෙන් ජලය උකහා ගැනීම වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් සීමා කරන ලදි. එසේම නියං සමය තුළදී ඊච්ලම්පත්තු ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ වූ වෙරුගල් තුළු මුව තුළට ලාවණ්‍ය ආක්‍රාන්තිය ද සිදු විය.

## බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් මේ වන විට අම්බතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන, කෙත්හේන හා නවගමුව යන ප්‍රදේශයන් අට තුළ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 8 ක සංඛ්‍යාවක මෙහෙයුම් කටයුතු කරමින් නඩත්තු කර ගෙන යනු ලබන අතර ඒ අතුරින් විශාලතම පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දිනකට ආසන්න වශයෙන් පානීය ජලය ඝණ මීටර 550,000 ක් පමණ නිෂ්පාදනය කරනු ලබන අම්බතලේ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වන්නේය. බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු පානීය ජල පරිමාවෙන් ආසන්න වශයෙන් 50% ක පමණ පානීය ජල පරිමාවක් නිෂ්පාදනය කරනු ලබන්නේ හුදෙක්ම අම්බතලේ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් වේ. බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු පානීය ජල පරිමාව දිනකට පානීය ජලය ඝණ මීටර මිලියන 1.1 ක් වන අතර නැවතත් බැලූ විට එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිපදවනු ලබන මුළු පානීය ජල පරිමාවෙන් 50% ක ප්‍රතිශතයක් ඉක්මවා යයි. මෙම නිෂ්පාදන ධාරිතාවය කැළණිය දකුණු ඉවුර 11 ව්‍යාපෘතිය මගින් දිනකට පානීය ජලය ඝණ මීටර 180,000 ක පරිමාවකින් තව දුරටත් ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබන අතර එකී ව්‍යාපෘතිය 2020 වර්ෂයේ මැද භාගය වන විට සේවයෙහි යෙදවීමට අපේක්ෂා කරනු ලැබේ. අම්බතලේ නිෂ්පාදන ධාරිතාවය දිනකට පානීය ජලය ඝණ මීටර 50,000 කින් වැඩි දියුණු කිරීම හා දිනකට පානීය ජලය ඝණ මීටර 1,80,000 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුත් වැලිවිට ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් බස්නාහිර පලාත තුළ වර්ධනය වෙමින් පවතින පානීය ජල ඉල්ලුම සපුරා ලීමට හැකි වන පරිදි නුදුරු අනාගතයේදී නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කොළඹ දිස්ත්‍රික්කය වෙත, ගම්පහ දිස්ත්‍රික්කය වෙත හා කළුතර දිස්ත්‍රික්කයේ කොටසක් වෙත පානීය ජලය සපයනු ලබයි. පානීය ජලය බෙදා හරිනු ලබන්නේ බටහිර මධ්‍යම, බටහිර උතුර හා බටහිර දකුණ නම් වූ කලාපීය සහාය මධ්‍යස්ථානයන් මගින් වේ. කිසිදු බාධාවකින් තොරවූ ආරක්ෂිත පානීය ජල සම්පාදනයක් සහතික කිරීම සඳහා බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් එහි මෙහෙයුම් හා නඩත්තු කටයුතු මෙහෙයුම් කළමනාකරු, කළමනාකරු කඳාන, කළමනාකරු බියගම හා නඩත්තු කළමනාකරු යන කළමනාකරුවන් සිවු දෙනා අතර බෙදා දෙනු ලැබ ඇත.

අම්බතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා බම්බුකුලිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය නම් වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ත්‍රිත්වය විසින් ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 9001 - 2015 ගුණාත්ම පද්ධති සහතිකකරණය දිනා ගනු ලැබ ඇත. අම්බතලේ රසායනාගාරය විසින් සීනක්කාරම් හා හුණු පරීක්ෂා කිරීම, ව්‍යල බොර භාවය, සන්නායකත්වය, ක්ලෝරයිඩ්, කඨිනත්වය, ක්ෂාරීය තාවය වැනි ජල ගුණාත්ම පරාමිතීන් හා කැඩ්මියම්, ඊයම්, ක්‍රෝමියම් හා මැන්ගනීස් වැනි සීනක්කාරම් වල අන්තර්ගත බැර ලෝහ සම්බන්ධ පරීක්ෂණයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 - 2005 පිළිගැනීම දිනාගනු ලැබ ඇත. දවස මුළුල්ලේම ස්ථාවර ලෙස සුරක්ෂිත පානීය ජල සම්පාදනයක් පවත්වාගෙන යාම ඉලක්ක කර ගත් ජල සුරක්ෂිතතා සැලසුම් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 7 ක හා ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් තුළ ක්‍රියාත්මක වන අතර 2019 වර්ෂය තුළදී එම ජල සුරක්ෂිතතා සැලැසුම් වල ක්‍රියාකාරිත්වය බාහිර විගණනයට භාජනය කරන ලදුව "හොඳයි" යනුවෙන් ශ්‍රේණිගත කරනු ලැබ ඇත. බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත 2018 වර්ෂය තුළදී මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතාවය පිළිබඳ 2 වැනි ස්ථානය ප්‍රදානය කරනු ලැබ ඇත. සියළුම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම් තුළ "ඵලදායිතාවය" හා "5 S" වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩ සටහන් හා වැඩමුළු මෙහෙයවන ලදි.

අම්බතලේ පද්ධතියේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව දියත් කරන ලද අම්බතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (AWSS1ESP) විසින් එහි වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. එම වැඩ පිළිවෙල මගින් පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ, බල ශක්ති සංරක්ෂණය කිරීමේ හා පද්ධතිය අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත්පත් කර ගැනීම (SCADA) මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ශ්‍රේණිගත කිරීමේත් අරමුණ සහිතව පද්ධතිය තුළ ඇති බොහෝ පැරණි පෝම්ප හා වෑල්ව වෙනුවට අළුත් පෝම්ප හා වෑල්ව ස්ථාපිත කරනු ලබනවා ඇත. පාරිසරික ආරක්ෂාව කෙරෙහි ඇති කැප වීම වැඩි දියුණු කරමින් දිනකට ඝණ මීටර 8000 ක ගොහොදු මඩ ප්‍රතිකාරිත කිරීමේ ධාරිතාවයකින් යුත් ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද ව්‍යාපෘතිය විසින් සේවයෙහි යොදවනු ලබනවා ඇත.

ජලයේ ගුණාත්මය ප්‍රවීක්ෂණය කිරීම බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් එදිනෙදා ඉටු කරනු ලබන කාර්යයකි. ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) 614:2013 ප්‍රමිතියට අනුකූල වීම සහතික කිරීම සඳහා නල මාර්ග පානීය ජලය පාරිභෝගිකයන් වෙත බෙදා හරින තැන් දක්වාම පසු විපරමට භාජනය කරනු ලැබේ.

තිබෙන භාණ්ඩ හා ද්‍රව්‍ය තොග අතර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි හා ඉල්ලුමක් නැති අයිතමයන් හඳුනා ගැනීම සඳහා වාර්ෂික තොග හරි වැරදි බැලීම ක්‍රියාත්මක කරනු ලැබේ. තොග මට්ටම් අඩු කිරීමේ හා වත්කම් කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් තොග හරි වැරදි බැලීමේ ප්‍රතිඵලය විශ්ලේෂණය කරනු ලැබේ.

## දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය / දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතී විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇති ජයග්‍රහණයන්.

2019 වර්ෂය තුළදී ඉදි කෙරෙමින් / වර්ධනය කෙරෙමින් පැවැතුන විදේශීය අරමුදල්/දේශීය බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් පෙන්නුම් කරනු ලබන සිතියම.



### විදේශීය ඒජන්සි විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති.

| | ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ඒජන්සිය |
|---|---|---|
| 1 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වැනි අදියර | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 2 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2 වැනි අදියර | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය. |
| 3 | වියලි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව |
| 4 | යාපනය - කිලිනොච්චි ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව |
| 5 | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජනය | ආසියානු සංවර්ධන බැංකුව |
| 6 | අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111 | ආසියානු සංවර්ධන බැංකුව |
| 7 | ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය | CDBC - චීනය |
| 8 | අඹතලේ ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| 9 | ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ICO - ස්පාඤ්ඤය |
| 10 | කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11 | CACIB - ප්‍රංශය |
| 11 | මාතර පියවර සඩ | ජාතික සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාව |
| 12 | අලුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ඉන්දියානු අපනයන ආනයන බැංකුව හා ලංකා බැංකුව |
| 13 | පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ඉන්දියානු අපනයන ආනයන බැංකුව |
| 14 | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය | CACIB - ප්‍රංශය |
| 15 | මහනුවර උතුර පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය | චීන අපනයන ආනයන බැංකුව |
| 16 | දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය | EDCF - කොරියාව |
| 17 | ඔරුගොඩවත්ත සිට කඩුවෙල දක්වා වූ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ගය ප්‍රතිස්ථාපනය කිරීම | යුනික්‍රෙඩිට් බැංකුව, ඕස්ට්‍රියාව හා මහජන බැංකුව |
| 18 | කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය | EDFC - කොරියාව |
| 19 | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | චීන සංවර්ධන බැංකුව |
| 20 | කිරම කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | යුනික්‍රෙඩිට් බැංකුව, ඕස්ට්‍රියාව |
| 21 | හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය | අයිඑන්ජී බැංකුව, නෙදර්ලන්තය |

### දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතීන්

| | ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ඒජන්සිය |
|---|---|---|
| A | මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය | ලංකා බැංකුව |
| B | ගලගෙදර - මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය | DFCC බැංකුව |
| C | ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය | හැටන් නැෂනල් බැංකුව |
| D | විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය | ජාතික සංවර්ධන බැංකුව |
| E | අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය | ලංකා බැංකුව, DFCC බැංකුව, ජාතික සංවර්ධන බැංකුව |
| F | උඩිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ලංකා බැංකුව |
| G | කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිරට ඇති නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - පැකේජ 1, 2, 3 | ලංකා බැංකුව |
| H | ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය | මහජන බැංකුව, ලංකා බැංකුව |
| I | ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය | මහජන බැංකුව |
| J | ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය | මහජන බැංකුව |
| K | විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | ලංකා බැංකුව |
| L | බිලියන 3.5 ව්‍යාපෘතිය (ව්‍යාපෘති 22 කි) | ලංකා බැංකුව |

## විදේශයන් විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්

### 1. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (1 වැනි අදියර)

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) විසින් (ජපන් යෙන් මිලියන 5,166) හා ශ්‍රී ලංකා රජය විසින් (රුපියල් මිලියන 2,789) අරමුදල් සපයනු ලබන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (1 වැනි අදියර) 2013 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 11,515 ක් වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ 2034 වර්ෂය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි මැදවච්චිය හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වාසය කරන 115600 ක් වූ ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ.

මෙම ව්‍යාපෘතියේ අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 39600 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 9900 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, මුළු ධාරිතාවය ඝණ මීටර 7000 ක් වූ ඔසොවි ජල කුළුණු 4 ක සංඛ්‍යාවක් හා බිම් දෙණ 3 ක සංඛ්‍යාවක් ද, කිලෝ මීටර 89 ක දිගින් යුත් සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ද, කිලෝ මීටර 520 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ නල මාර්ග පද්ධතියක් හා (ස්ථාන භාර නිලධාරි කාර්යාල, රැක බලා ගන්නන්ගේ නිල නිවාස හා ප්‍රාදේශීය ඉංජිනේරු වරයාගේ නිල නිවාසය ආදී) මෙහෙයුම් ගොඩනැගිලි ද වන්නේය.

2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 54% ක් වූ අතර 2020 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිමා කොට සේවයේ යොදවනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත.



ඇතාකඩ ඔසොවි කුළුණ

### 2. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (11 වැනි අදියර)

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 වැනි අදියරේ විෂය පථය වන්නේ (2040 වර්ෂය වන විට) ග්‍රාම නිලධාරී වසම් 119 ක් ආවරණය කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි හොරොව්පොතාන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 119 ක් තුළ වාසය කරන ආසන්න වශයෙන් 193319 ක් වූ ජන ගහණයක් වෙත ආරක්ෂාකාරී පානීය ජලය නල මාර්ගයෙන් සම්පාදනය කර දීම සහතික කිරීම වන්නේය.

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 වැනි අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් යෙන් මිලියන 23,498 ක ණය මුදලක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (ඡෂක්* සමග ණය ගිවිසුමක් අත්සන් කරනු ලැබ ඇති අතර මෙම ව්‍යාපෘතිය සඳහා වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් මිලියන 4,732 ක් වනු ඇත.

මෙම ව්‍යාපෘතියේ අංගයන් වන්නේ යාන් ඔය ජලාශය තුළ දිනකට ජලය ඝණ මීටර 34800 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ඉදි කිරීම, දිනකට ජලය ඝණ මීටර 16500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, තුළු මුව හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා යාන්ත්‍රික හා විදුලි උපකරණ හා ස්වයංක්‍රිය කරණ පද්ධතිය සකස් කිරීම, බිම් දෙණ 10 ක් ඉදි කිරීම, ඔසොවි කුළුණු 9 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, කිලෝ මීටර 147 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල ජාලය එලීම හා කිලෝ මීටර 1050 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලය එලීම ද වන්නේය. සැලසුම් කිරීම සහ ප්‍රතිසම්පාදනය කිරීම හා සම්බන්ධ උපදේශක කොන්ත්‍රාත්තුවේ කටයුතු 2018 මැයි මස 01 වැනි දින ආරම්භ කරන ලද අතර 2019 වර්ෂය අවසාන වන විට සාක්ෂාත් කර ගෙන තිබි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 66% ක් 27.3% ක් විය.

### 3. වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය

**(ආසියානු සංවර්ධන බැංකු 5 වැනි ව්‍යාපෘතිය)**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වයඹ හා උතුරු පලාත් තුළ සේවා වැඩි දියුණු කිරීම් ඇති කිරීමේ අපේක්ෂාවෙන් වන්නේය. මෙම ව්‍යාපෘතිය යටතේ වවුනියාව, මන්නාරම, හලාවත හා පුත්තලම යන නගරයන් තුළ ජීවත් වන 452500 ක ප්‍රතිලාභී ජන ගහණයක් වෙත ඉහළ නංවන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දෙනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු ගත කරනු ලැබ ඇති පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 163.33 ක් වේ. S සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99.91% ක් හා 96.83% ක් වේ. මේ වන විට ව්‍යාපෘතිය හා සම්බන්ධ කොන්ත්‍රාත්තු 56 ක සංඛ්‍යාවක් ප්‍රදානය කර දෙනු ලැබ ඇත.

වවුනියාව තුළ ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් සමන්විත වන්නේ දිනකට ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද, ජල කුළුණු 3 ක සංඛ්‍යාවකින් ද, එක් ජලාශයකින් ද, කිලෝ මීටර 32 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග යකින් හා කිලෝ මීටර 251 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීම් නල පද්ධතියකින් ද වේ. බෙදා හැරීමේ කලාප 3 ක සංඛ්‍යාවක් දැනට නියම කරනු ලැබ ඇත.

මන්නාරම තුළ මුල් විෂය පථය තුළ අන්තර්ගත සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. පේසාලෙයි දක්වා වූ ජලය බෙදා හැරීමේ පද්ධතිය දීර්ඝ කරනු ලැබ ඇත.

හලාවත හා පුත්තලම තුළ සියළුම ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර වයඹ පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් යෝජනා ක්‍රමයට අදාල මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. හලාවත බෙදා හැරීම් පද්ධතිය කිලෝ මීටර 45 ක දිග ප්‍රමාණයකින් දීර්ඝ කිරීම සඳහා අතිරේක විෂය පථයක වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබ ඇත.



පුත්තලම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

### 4. යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය
### (ආසියානු සංවර්ධන බැංකුවේ 6 වැනි ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරනු ලබන්නේ දිනකට ආසන්න වශයෙන් පානීය ජලය ඝණ මීටර 24000 ක් නිෂ්පාදනය කළ හැකි වන පරිදි සමුද්‍ර ජල විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය (SWRO) සංවර්ධනය කිරීම මගින් යාපනය නගරය, ඒ හා ආශ්‍රිත උප නගර, හා යාපනය අර්ධ ද්වීපය තුළ පිහිටි වෙනත් නාගරික ප්‍රදේශයන් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 300000 ක පමණ ජන ගහණයක් වෙත සපයනු ලබන පානීය ජල සම්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම වේ. යෝජිත ප්‍රති ව්‍යුහගත කිරීම් ද සමග සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 23,256.00 ක අතිරේක මූල්‍යකරණය ද සමග රුපියල් මිලියන 35,881.49 ක් වේ.

ඔසොව් ජල කුළුණු 15 ක සංඛ්‍යාවක හා කයිට්ස්, වේලනෙයි හා මණ්ඩතිව් දක්වා වූ ජලය බෙදා හැරීමේ පද්ධතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ප්‍රතිකාරිත ජලය සම්ප්‍රේෂණය කිරීමේ පොම්ප නල මාර්ග 1 හා 2 ට අදාල වැඩ කටයුතු පිළිවෙලින් 95% ක් හා 98% ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉතිරි ඔසොව් ජල කුළුණු 05 ක සංඛ්‍යාවට අදාල කටයුතු හා පැකේජ 2 යටතේ වූ ජලය බෙදා හැරීමේ නල ජාලයට අදාල කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී.

සමුද්‍ර ජල විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය (SWRO) පැකේජයට හා යාපනය නගරය තුළ ජලය බෙදා හැරීමේ පද්ධති පැකේජයට අදාල මූල්‍ය අගැයීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

2019 වර්ෂයේ අවසානයට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා අතිරේක මූල්‍යකරණය ද ඇතුලත් මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 43.36% ක් හා 41.95% ක් විය.



සම්පූර්ණයෙන් නිම කරන ලද ජල කුළුණු

### 5. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන- (GCWWMIIP) ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02.

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන - (GCWWMIIP) ව්‍යාපෘතිය විසින් ප්‍රධාන වශයෙන්ම කොළඹ පිහිටි කොළඹ මහ නගර සභා ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර එම ප්‍රදේශය දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් (DMAs) 78 කට බෙදා වෙන් කරනු ලැබ ඇත. එම ප්‍රදේශයන් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රධාන කොන්ත්‍රාත්තු පැකේජ සතරක් මගින් වේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රධානතම සම්පාදනයන් වන්නේ කිලෝ මීටර 720 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ගය ප්‍රති ස්ථාපනය කිරීම, පද්ධති යෙදැවුම් මනු 17 ක සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම, ජල මනු ප්‍රති ස්ථාන ගත කිරීම හා දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු යෙදීම, භූගෝලීය තොරතුරු පද්ධති ජාලය ක්‍රමාංකනය කිරීම හා යාවත්කාලීන කිරීම හා සහාය දීමේ ක්‍රියාකාරකම් සඳහා පුහුණු කිරීම් මධ්‍යස්ථානයක් ඇතුළු ගොඩනැගිලි ඉදි කිරීම ද වන්නේය.

ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02 විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය පිළිවෙලින් 75% ක් හා 46% ක් වන අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 70% ක් හා 42% ක් වේ.

ආසන්න වශයෙන් කිලෝ මීටර 510 ක දිග ප්‍රමාණයකට නල එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 53 ක සංඛ්‍යාවක් තුළ නල එලීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 16 ක සංඛ්‍යාවක් තුළ ඉදි කිරීම් කටයුතු මුළුමනින්ම මෙන් නිම කරනු ලැබ ඇත. ඒවා අතුරින් දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 11 ක සංඛ්‍යාවක් තුළ ආදායම් රහිත ජල පරිමාවන් තක්සේරුවට බඳුන් කරනු ලබමින් පවතී. වැඩ කටයුතු මුළුමනින්ම අවසන් කරනු ලැබ ඇති දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් වැඩිම සංඛ්‍යාවක් තුළ දක්නට ලැබෙන ආදායම් රහිත ජල පරිමාව 18% කට අඩු වේ.

එලි හවුස් ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලය සම්පූර්ණයෙන් නිම කොට මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදී. එලී හවුස්හි ඉදි කරනු ලැබූ හුවන පොම්පාගාරය මුළුමනින්ම නිම කරනු ලැබ ඇති අතර එය සේවයෙහි යෙදවීමට නියමිතව ඇත. මාලිගාකන්දේ ඉදි කරනු ලබන ආදායම් රහිත ජල ගොඩනැගිල්ලේ හා තෙලවල ඉදි කරනු ලබන පුහුණු කිරීම් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.



මාලිගාකන්දේ ආදායම් රහිත ජල ගොඩනැගිල්ල.

### 6. අම්පාර දිස්ත්‍රික්කයේ සේවා නොලබන ප්‍රදේශයන් වෙනුවෙන් වූ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111 ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශයන් තුළ මෙන්ම මොනරාගල හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි ඇතැම් ප්‍රදේශ තුළ වාසය කරන ආසන්න වශයෙන් 200000 ක් පමණ වූ ජනතාවක් වෙත සේවා සැපැයීම වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 20,825 ක් වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සේවා ආවරණය ඉහළ නැංවීම තුළින් ආවරණය කරනු ලබන ප්‍රදේශය වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 40000 ක සංඛ්‍යාවක් ලබා දීම වේ.

විදේශීය අරමුදල් හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්වයෙන් කොටසක් භාවිතා කරමින් ක්‍රියාත්මක කරන ලද ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, සම්ප්‍රේෂණ නල පද්ධතිය හා බෙදා හැරීම් නල පද්ධතිය ඇතුලත් ව්‍යාපෘතියේ 1 වැන අංගය විදේශීය කොන්ත්‍රාත් කරු විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත.



නාමල් ඔය කුළුණ

ඔසොවි ජල කුළුණු 6 ක සංඛ්‍යාවක් ඉදි කිරීම වෙනුවෙන් වූ ව්‍යාපෘතියේ 2 වැනි අංගය හා ඒ සඳහා ස්ථානීය නල පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වූ 3 වැනි අංගය පිළිබඳ කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්ව කොටස යටතේ දේශීය කොන්ත්‍රාත් කරුවන් වෙත ප්‍රදානය කරන ලදි. ඒ අතුරින් 2 වැනි අංගය 59.8% ක භෞතික ප්‍රගතියක් හා 76.48 ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇති අතර 3 වැනි අංගයට අදාල වැඩ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යනු ලබමින් පවතී.

## 7. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය.

ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පරමාර්ථය වන්නේ ආසන්න වශයෙන් 300000 ක පමණ ජන සංඛ්‍යාවක් වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීම හා දැනට ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි මිනුවන්ගොඩ, මීරිගම හා මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 449 ක් තුළ ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙතින් ජලය ලබා ගන්නා ආසන්න වශයෙන් 100000 ක පමණ ජන සංඛ්‍යාවක් වෙත සපයනු ලබන ජල සම්පාදන සේවාවන් වැඩි දියුණු කිරීම ද වන්නේය.

මෙම ව්‍යාපෘතිය යටතේ දිනකට ජලය ඝණ මීටර 54000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණු 5 ක සංඛ්‍යාවක් ඉදි කිරීම හා කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයක් එලීම හා කිලෝ මීටර 630 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් ඉදි කිරීම ද ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිතව ඇත. ඊට අමතර වශයෙන්, ජලය ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවය වශයෙන් ජලය ඝණ මීටර මිලියන 3.5 ක ධාරිතාවයකින් යුත් ජලාශයක් නිර්මාණය කිරීම පිණිස බස්නාගොඩ වේල්ලක් ඉදි කරනු ලබනවා ඇත.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිවිල් වැඩ කටයුතු මේ වන විට සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇති අතර යාන්ත්‍රික ස්ථාපිත කිරීම් වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. කිලෝ මීටර 500 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීමේ කටයුතු හා පස්යාල, නිල්වල, මිනුවන්ගොඩ, බැලුම්මහර හා අත්තනගල්ල යන ප්‍රදේශයන් තුළ ජලය බෙදා හැරීමේ පද්ධති ඉදි කිරීමේ කටයුතු මෙන්ම ඔසොවි ජල කුළුණු 04 ක සංඛ්‍යාවක් ඉදි කිරීමේ කටයුතු ද වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තු දැනට ප්‍රදානය කරනු ලැබ ඇති අතර, ඉදි කිරීම් වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී.

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ආසන්න වශයෙන් 50% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 26,000 ක් වේ.



කරස්නාගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

## 8. අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ (2012/2013) කොළඹ ප්‍රධාන ක්‍රම සම්පාදන ව්‍යාපෘතියේ නිර්දේශය අනුව වේ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අඹතලේ ජල සම්පාදන පද්ධතියේ නිෂ්පාදන විශ්වාසනීයත්වය නංවා ලීම, බල ශක්ති සංරක්ෂණ පියවර හඳුන්වා දීම හා බෙදා හැරීමේ පහසුකම් වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම ද වන්නේය. සම අරමුදල් සම්පාදකයින් වන ආසියානු සංවර්ධන බැංකුවේ හා ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ සහාය සහිතව ශ්‍රී ලංකා රජය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක් වන අතර ව්‍යාපෘතිය විසින් 23.08 ක භෞතික ප්‍රගතියක් හා 22.52% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. ව්‍යාපෘතියේ කාලය 2022 වර්ෂයේ මැයි මස 31 ක් වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බෙහි වූ හේතූන් ගණනාවක් කරනකොට ගෙන ඉදි කිරීම් කොන්ත්‍රාත්තු හා උපදේශක කොන්ත්‍රාත්තු ප්‍රමාද විය. උපදේශකයින් වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ (PMU & PIU) මග පෙන්වීම් අනුව ප්‍රමාදයෙන් සිදු වූ හානි යථා තත්ත්වයට පත් කරමින් ව්‍යාපෘතිය නිම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවන් විසින් ප්‍රතිකාරක පියවර ගන්නා ලදි.

## 9. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ස්පාඤ්ඤ රජය හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසිනි. ප්‍රස්තුත ව්‍යාපෘතිය විසින් ආනමඩුව, කොටවෙහෙර, නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ හා පුත්තලම, ගල්ගමුව, මුන්දලම හා මහ කුඹුක්කඩවල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් තුල බල පවත්වනු ලබන පානීය ජල ගැටළු වලට ස්ථිර විසඳුම් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 12500 ක ධාරිතාවයකින් යුත් අළුත් තුළ මුවක් ඉගිනිමිටිය ජලාශය තුළ ඉදි කරනු ලැබීමට යෝජිත අතර ඊට අමතර ලෙස කිලෝ මීටර 1 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් සහිත දිනකට ජලය ඝණ මීටර 11000 ක ධාරිතාවයකින් යුත් පූර්ණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද ඉදි කරනු ලබනවා ඇත. කිලෝ මීටර 61 ක දිගින් යුත් ප්‍රධාන පිරිසිදු ජල සම්ප්‍රේෂණ නල මාර්ග යක් මගින් ජල කුළුණු 4 ක සංඛ්‍යාවක් වෙත සේවා සපයනු ලබන අතර සියළු විද්‍යුත් යාන්ත්‍රික උපකරණ ඇතුලත් කිලෝ මීටර 328 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියකින් ද ව්‍යාපෘතිය සමන්විත වනු ඇත. ආයතන සංවර්ධන කටයුතු ද ව්‍යාපෘතියට ඇතුලත් වේ. ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 45% ක් හා 33.84% ක් වේ.

ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් මුහුණ පානු ලබන ප්‍රධාන බාධකයන් වන්නේ නල එලීම සඳහා නවගත්තේගම ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීමෙහිදී ඇති වන දුෂ්කරතා, අවශ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව නොසිටීම හා ව්‍යාපෘතිය වෙනුවෙන් කරනු ලැබ ඇති සීමිත වෙන් කිරීම් කරනකොට ගෙන මුහුණ දීමට සිදු වන මූල්‍ය අර්බුදයන් ද වේ.



කොටවෙහෙර ජල කුළුණ

## 10. කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර

කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි පියවර සිවිල් හා යාන්ත්‍රික සහ විද්‍යුත් වැඩ සඳහා වන සැලසුම් සකස් කොට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් වන අතර එහි මූලික අරමුණ වන්නේ දිනකට ජලය ඝණ මීටර 180000 ක ධාරිතාවයකින් යුත් නව පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම මගින් කොළඹට උතුරින් පිහිටි නගරයන් වෙත සම්පාදනය කරනු ලබන ජල සැපයුමෙහි ධාරිතාවය නංවා ලීමය. මුළු ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ආසන්න වශයෙන් 1750000 ක් වනු ඇති අතර නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 120000 ක් ඔවුන් වෙත ලබා දීමට අපේක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘතිය 2017 ජනවාරි 23 වැනි දින ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතියේ පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 32,700 ක් වනු ඇත. අරමුදල් සපයන නියෝජිත ආයතනයන් වන්නේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් කෝර්පරේට්, ප්‍රංශ ආයෝජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව හා ශ්‍රී ලංකා රජයද වේ.

2019 වර්ෂයේ අවසානය වන විට කිලෝ මීටර 26 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය එලීමේ වැඩ කටයුතු 95% ක ප්‍රතිශතයක් සම්පූර්ණ කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82% ක් හා 73% ක් විය. ප්‍රස්තුත ව්‍යාපෘතිය 2020 වර්ෂයේ මැද භාගයේදී සේවයේ යොදවනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.

තුළු මුව අවට ප්‍රදේශය තුළ ඇති ගංගා ජලයෙහි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව පට්ටිවිල ඇල මාර්ගය තුළු මුවෙන් යටි ගං බලා හරවා යැවීමට හා දැනට ක්‍රියාත්මක වන ප්‍රතිකාරිත අපවාහ නල මාර්ගය බියගම අපනයන ප්‍රවර්ධන කලාපයේ සිට ලවණතා බාධකයෙන් යටි ගං බලා යැවීමට ද යෝජනා කරනු ලැබ ඇත.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම

## 11. මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතිය

මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ 2017 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින වන අතර ඒ සඳහා වන මුළු ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් මිලියන 18,208 ක් වේ. එය සමන්විත වන්නේ විදේශීය අරමුදල් රුපියල් මිලියන 14,000 කින් හා දේශීය අරමුදල් රුපියල් මිලියන 4,208 කින් වන අතර මූල්‍යකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන බැංකුව විසිනි. ප්‍රස්තුත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මාතර දිස්ත්‍රික්කය තුළ හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොටසක් තුළ ජීවත් වන 285000 ක ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ.

ව්‍යාපෘතියේ ජල ප්‍රභවය වන්නේ නිල්වලා නදියයි. ව්‍යාපෘතියේ අංගයන් වන්නේ නිල්වලා නදිය හරහා ඉදි කරනු ලබන ලාවණ්‍යතා බාධකය, දිනකට ජලය ඝණ මීටර 60000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 30000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, භූමි ජලාශ 06 ක සංඛ්‍යාවක් ද, ජල කුළුණු 04 ක සංඛ්‍යාවක් ද, මීටර 300 ක දිග ප්‍රමාණයකින් යුත් අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ද, කිලෝ මීටර 78 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් හා කිලෝ මීටර 120 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියක් ද යන අංගයන්ගෙන් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.

2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 40% ක් හා 44% ක් වූ අතර 2021 වර්ෂයේ ඔක්තෝබර් මාසය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.



## 12. අළුත්ගම මතුගම අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මතුගම, දොඩංගොඩ, කළුතර, බේරුවල, අගලවත්ත හා මදුරාවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 269 ක් තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම හා දැනට බල පවත්වන ලාවණ්‍යතා ආක්‍රාන්තිය පිළිබඳ ගැටළුව අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද වන්නේය.

ප්‍රස්තුත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය රුපියල් මිලියන 32,278 ක් වන අතර ඉන් රුපියල් මිලියන 24,285 ක මුදල් ප්‍රමාණයක් ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව විසින් ද, රුපියල් මිලියන 4,286 ක මුදල් ප්‍රමාණයක් ලංකා බැංකුව විසින් හා රුපියල් මිලියන 3,707 ක මුදල් ප්‍රමාණයක් සිය දායකත්වය වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් ද සපයා දෙනු ලබනවා ඇත.

ප්‍රස්තුත ව්‍යාපෘතිය සැලසුම් කරන ලද්දේ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 32000 ක සංඛ්‍යාවක් ලබා දීමේ හා දැනට සිටින පාරිභෝගිකයින්ට සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව වේ. 300000 ක මුළු ජන සංඛ්‍යාවක් (පවුල් 60000 ක සංඛ්‍යාවක්) මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

නව තුළු මුව, කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, භූමි ජලාශය හා ජල කුළුණු යන අංගයන්ට අදාල ඉදි කිරීම් කටයුතු හා අමු ජල

හා පිරිසිදු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග එලීමේ කටයුතු හා ජලය බෙදා හැරීමේ නල පද්ධතිය එලීමේ කටයුතු ද ආරම්භ කරනු ලැබ ඇති අතර එම වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

2019. 12. 31 දිනය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 52% ක් හා 48% ක් විය.



එක් ඇලක් ඔස්සේ අමු ජල හා පිරිසිදු ජල නල මාර්ග එලීම

## 13. පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සිවිල් හා යාන්ත්‍රික සහ විද්‍යුත් වැඩ සඳහා ක්‍රම සම්පාදනය කර සැලසුම් කොට ඉදි කරනු ලබන්නා වූ ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවක් වන අතර ඒ සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව හා ලංකා බැංකුව විසිනි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 108 ක් වනු ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 167 ක් තුළ වාසය කරනු ලබන 162725 ක ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර බෙදා හැරීම වේ.

දිනකට ජලය ඝණ මීටර 31000 ක ධාරිතාවයකින් යුත් තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 29000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, මුළු ධාරිතාවය ජලය ඝණ මීටර 5175 කින් යුත් භූමි ජලාශයන් 6 ක සංඛ්‍යාවක් හා එක් ඔසොවි ජල කුළුණක්, කිලෝ මීටර 1.5 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය, කිලෝ මීටර 42 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය, කිලෝ මීටර 320 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල ජාලය හා මෙහෙයුම් ගොඩනැගිලි යන අංගයන්ගෙන් ව්‍යාපෘතිය සමන්විත වන්නේය.

2019 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය, (8.48% ක අත්තිකාරම් අය කර ගැනීම හැර) පිළිවෙලින් 56.5% ක් හා 53.99% ක් විය. ව්‍යාපෘතිය 2020 වර්ෂයේ ජුනි මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යන අතර බී 6 මාර්ගය ඔස්සේ නල එලීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවසර දීම ප්‍රතික්ෂේප කළ හෙයින් සම්ප්‍රේෂණ නල මාර්ගයන් හා ජලාශයන් පිහිටුවීමට සැලසුම් කරන ලද ස්ථානයන් වෙනස් කිරීමට සිදු විය. අපේක්ෂා නොකළ ආකාරයේ ගල් පිපිරවීම් කිරීමට සිදු වූ අතර රට තුළ බල පැවැත්වෙමින් තිබුණ ආරක්ෂක පියවර නිසා ගල් පිපිරවීම සඳහා අවසර ගැනීමේ ප්‍රමාදයන් සිදු විය.




ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

## 14. විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය (සමස්ත ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 75000 ක ධාරිතාවයක් සහිත) ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 5 කින් ද, තුළු මුව 5 කින් ද, සේවා ජලාශයන් 10 කින් හා කිලෝ මීටර 433 ක දිග ප්‍රමාණයකින් යුත් ජල නල එලීමකින් ද සමන්විත වේ. කොන්ත්‍රාත්තුව සැලසුම් කොට ඉදි කිරීම වර්ගයේ කොන්ත්‍රාත්තුවක් වන අතර එය යුරෝ 105,645,791 + රුපියල් 8,210,96 ක් සඳහා ප්‍රදානය කරනු ලැබ ඇත. කොන්ත්‍රාත්තු කාලය මාස 36 ක් වන අතර එයට අදාල වැඩ කටයුතු 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදි.

2019 වර්ෂයේ අවසානය වන විට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ඉදි කිරීම් කටයුතු 70% ක් ද, ජලාශ ඉදි කිරීම් කටයුතු 75% ක් ද, තුළු මුව ඉදි කිරීම් කටයුතු 61% ක් හා නල එලීමේ වැඩ කටයුතු 62% ක් ද නිම කරනු ලැබ තිබිණි. යාන්ත්‍රික අයිතමයන් 80% ක් සපයනු ලැබ ඇති අතර ඒවා ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. 72% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත.




මහවෙලකන්ද ටැංකිය

ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලසුම් කළ ආකාරයට සිදු නොවන්නට හේතු වූ ගැටළු කිහිපයකට මුහුණ දීමට ව්‍යාපෘතියට සිදු විය. රත්තොට ප්‍රදේශයට ජලය සම්පාදනය කර දීම සඳහා යෝජිත ජල ප්‍රභවය වූ වෙරළුගස් තැන්න අතු ගංගාවෙන් ජලය උකහා ගැනීම සම්බන්ධයෙන් ගොවි ජනතාව විසින් දක්වන ලද විරෝධය පිළිබඳ ගැටළුව මේ වන තෙක් විසඳා ගැනීමට නොහැකි විය. ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා අවශ්‍ය ඉඩම් කැබැලි 4 ක සංඛ්‍යාවක් අත් පත් කර ගැනීම මෙතෙක් ඉටු කර ගත නොහැකි විය. ඉමහත් බල පෑමක් සිදු කරනු ලැබ ඇති ගැටළුව වන්නේ බිල් පියවීමේදී සිදු වන ප්‍රමාදයයි. ගොහොදු මඩ වියලන තට්ටු, ප්‍රතිසාධන දෙණ හා වෙරළුගස් තැන්නේ විකල්ප තුළු මුව ඉදි කිරීමේ කටයුතු අවශ්‍ය මුදල් ලබා ගැනීමේ බාධකයන් නිසා ප්‍රමාද වී ඇත.

## 15. මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක සංඛ්‍යාවක් ආවරණය කරනු ලබන අතර දැනට ක්‍රියාත්මක කරනු ලබන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 100000 ක් දක්වා වැඩිකිරීම මගින් එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 තුළ ජීවත් වන 470000 ක් වූ ප්‍රතිලාභී ජන ගහණයක් වෙත පානීය ජල සම්පාදන සේවාවන් සපයා දීමට ඉලක්ක කරනු ලැබ ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයනු ලබන ප්‍රභවයන් වන්නේ චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය වන අතර අදාල කොන්ත්‍රාත්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 194.83 ක හා රුපියල් මිලියන 8,356.25 ක කොන්ත්‍රාත්තු මුදලකට ප්‍රදානය කරන ලදි. ශ්‍රී ලංකා ජන රජය විසින් සම්පාදනය කරන ලද වෙනත් මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 7,313.94 ක් වේ. කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම වර්ෂ 2019 අගෝස්තු 21 ක් වැනි දින ආරම්භ කරන ලද අතර එය වර්ෂ 2022 අගෝස්තු මස 20 වැනි දින සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතය.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන්ම සමන්විත වන්නේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු, සේවා ජලාශයන් 28 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, නව පොම්පාගාරයන් 16 ක සංඛ්‍යාවක් ඉදි කිරීම සහ කිලෝ මීටර 567 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් හා කිලෝ මීටර 86 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග සපයා එලීම යන අංගයන්ගෙනි. ග්‍රාමීය ජල සම්පාදනය සඳහා වූ විධි විධාන මෙන්ම ආදායම් රහිත ජලය වැලැක්වීමේ හා පරිමාව අඩු කිරීමේ වැඩ සටහනක් ද ඊට ඇතුලත් වේ. 2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 9.98% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 13.64 ක් වේ.



**මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණුකිරීමේ වැඩ බිම වින්‍යාස සැලැස්ම**

## 16. දදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය සැලසුම් කොට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් වන අතර එය ආරම්භ කරන ලද්දේ 2017 වර්ෂයේ ජනවාරි මාසයේදීය. එම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ කොරියානු අපනයන ආනයන බැංකුව විසින් වන අතර මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 10,227 ක් වන අතර එය සෑදී ඇත්තේ ඇමෙරිකානු ඩොලර් මිලියන 58 ක විදේශ මුදලින් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වූ රුපියල් මිලියන 1,326 ක මුදලකිනි.

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වාසය කරනු ලබන 97700 ක ජන සංඛ්‍යාවක් වෙත සැලසුම් කරන ලද වර්ෂය වූ 2032 වන විට ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ.

ප්‍රස්තුත ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 34500 ක ධාරිතාවයකින් යුත් තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ඕසොවි ජල කුළුණු තුනක සංඛ්‍යාවක් හා ජලය ඝණ මීටර 3750 ක් ගබඩා කිරීම සඳහා වූ බිම් ටැංකියක්, කිලෝ මීටර 39 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක්, කිලෝ මීටර 266 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධති ජාලයක් හා (ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාස 3 ක සංඛ්‍යාවකින් යුක්ත වූ) මෙහෙයුම් ගොඩනැගිලි ඉදි කිරීම යන අංගයන්ගෙන් සමන්විත වනු ඇත.

ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 86.4% ක් වූ අතර 2020 වර්ෂයේ මැයි මාසයේ අවසානය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කොට සේවයේ යොදවනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ඉලක්ක කරනු ලැබ ඇති දිනය 2020 වර්ෂයේ අගෝස්තු මස 31 වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.



**ජල පවිත්‍රාගාරය**

## 17. ඔරුගොඩ වත්තේ සිට කඩුවෙල දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග හා ප්‍රධාන බෙදා හැරීමේ නල මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වන්නේ ඉතාමත්ම පැරණි සම්ප්‍රේෂණ නල මාර්ගයන්ගේ නිරන්තරයෙන් සිදු වන පුපුරා යාම් නිසා ජල පාරිභෝගිකයින් හට සිදු වන අපහසුතාවයන් අවම කරමින් කඩුවෙල, කොලොන්නාව හා කොළඹ මහ නගර සභා ප්‍රදේශයන්හි වාසය කරන ජල පාරිභෝගිකයින් මිලියන 1.5 ක් වෙත සපයනු ලබන ජල සම්පාදන සේවාවන්ගේ සේවා මට්ටම ඉහළ නැංවීම වන්නේය.

මෙම ව්‍යාපෘතිය යටතේ ලබුගම හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි සිට එලනු ලැබ ඇති සම්ප්‍රේෂණ නල මාර්ගයන් වෙනුවට ඔරුගොඩවත්ත ගුවන් පාලමේ සිට කඩුවෙල අධි වේගී මාර්ග අතුරු මාරුව දක්වා පහළ මට්ටමේ මාර්ගය ඔස්සේ විෂ්කම්භය මිලි මීටර 1200 හා මිලි මීටර 1000 මෘදු යකඩ නල යොදා ගනිමින් නව නල මාර්ග එලනු ලබනවා ඇත. ඊට අමතර වශයෙන් මෙම කොටස තුළ මිලි මීටර 355 ක විෂ්කම්භයකින් යුත් හා මිලි මීටර 160 ක විෂ්කම්භයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල මාර්ගයන් ද එලනු ලබනවා ඇත.

ප්‍රස්තුත වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 37.5% ක් හා 45.0% ක් විය.



**ඔරුගොඩවත්ත නල එලීමේ කටයුතු**

## 18. කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය

කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය සැලසුම් කොට ඉදිකිරීමේ ව්‍යාපෘතියක් වන අතර මෙම ව්‍යාපෘතියට ඇතුළත් වන්නේ ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුත් ඉහළ ඔසොවි ජල කුළුණු 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීමට හා සම්ප්‍රේෂණ පොම්පාගාර 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීමට අදාල සිවිල් හා යාන්ත්‍රික සහ විද්‍යුත් වැඩ කටයුතු, කිලෝ මීටර 12 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් එලීම, කිලෝ මීටර 240 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ග එලීම, යාන්ත්‍රික හා විද්‍යුත් ස්ථාපිත කිරීම් හා අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීමේ (SCADA) පද්ධතිය හඳුන්වා දීම ද වන්නේය. මෙම ව්‍යාපෘතියේ 1 වැනි පියවර සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමත් සමග ග්‍රාම නිලධාරී වසම් 45 ක සංඛ්‍යාවකින් සමන්විත මෙම ප්‍රදේශය තුළ ජීවත් වන ජන ගහණය වෙත දිනපතා ජලය ඝණ මීටර 5300 ක ප්‍රමාණයක් සම්පාදනය කර දීම ආරම්භ කර දෙනු ලබනවා ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 9,500 ක් පමණ වනු ඇති අතර අරමුදල් ප්‍රභවයන් වන්නේ චීන සංවර්ධන බැංකුව, ලංකා බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය ද වේ.

ප්‍රස්තුත ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේ දෙසැම්බර් අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 80.71% ක් හා 77.90% ක් විය. දැනට සාක්ෂාත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය වැඩ සටහන හා අනුකූල වන අතර ව්‍යාපෘතිය වර්ෂ 2020 අප්‍රේල් මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලබනවා ඇත. ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභ කැළණිය දකුණු ඉවුර 11 ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වීම හා සමගාමී ලෙස සිදු වනු ඇති අතර කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය අවසාන වශයෙන් සේවයේ යෙදවීම කැළණිය දකුණු ඉවුර 11 ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වීම මත රඳාපවතී.



**රද්දොලුව ස්ථාන භාර නිලධාරී කාර්යාලය**

## 19. තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තඹුත්තේගම, තලාව හා ගල්නෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 42 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත හා විශ්වාසදායක නල මාර්ග ජල සම්පාදනයක් ලබා දීම වේ. ව්‍යාපෘතියේ කාල සීමාව 2018 ජුලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා වන්නේය.

දිනකට ජලය ඝණ මීටර 42000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 18000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, භූමි ජලාශයක් හා එකක් ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් ඔසොවි ජල කුළුණු 3 ක සංඛ්‍යාවක් ද, කිලෝ මීටර 40 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ ප්‍රධාන ප්‍රතිකාරිත ජල නල මාර්ගයක් හා කිලෝ මීටර 12 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගයක් ද, කිලෝ මීටර 135 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ හා පොලි විනිල් ක්ලෝරයිඩ් ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ග පද්ධතියක් හා ගොඩනැගිලි ද මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේය.

රාජාංගනය වැව හා සම්බන්ධ ඒකාබද්ධ ගොවි සංවිධානයන් විසින් ක්‍රියාත්මක කරන ලද විරෝධතාවය ව්‍යාපෘතියේ ප්‍රගතිය කෙරෙහි දැඩි ලෙස බල පෑමක් ඇති කරන ලද අතර ජල ප්‍රභවය පිළිබඳව පැන නැගී ඇති මෙම ගැටළුව විසඳීම සඳහා රජයේ මැදිහත් වීම අවශ්‍ය වේ. රාජාංගනය වැව වෙතින් ජලය උකහා ගැනීම හා තුළු මුව ව්‍යුහය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමට අදාල අනුමැතිය මෙතෙක් ලැබී නැත.

2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 19.5% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 36.34% ක් විය.

## 20. කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වලස්මුල්ල හා කටුවන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ සේවා ආවරණය වැඩි කර ලීම හා එලදායී හා තිරසාර ජල භාවිතයක් සාක්ෂාත් කර ගැනීමත් වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සමග දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගෙන් ජල සම්පාදන සේවාවන් නොලබන නව ප්‍රදේශයන් වෙත ප්‍රථම වතාවට සුරක්ෂිත හා විශ්වාසදායක ජල සම්පාදන සේවාවක් ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කරනු ලැබීම සඳහා නියමිත ප්‍රදේශය කටුවන හා වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් දෙක තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් 34 ක සංඛ්‍යාවකින් සමන්විත වනු ඇත. ව්‍යාපෘතිය මගින් සේවා සම්පාදනය කර දෙනු ලැබීමට නියමිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 36000 ක් වන අතර ඔවුන් වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතා 5200 ක සංඛ්‍යාවක් හා සේවා වැඩි දියුණු කිරීමේ සම්බන්ධතා 2000 ක සංඛ්‍යාවක් හරහා සේවා සම්පාදනය කර දෙනු ලබනවා ඇත.

මෙම ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්තුව 2014 වර්ෂයේ ජුනි 02 වැනි දින ප්‍රදානය කරන ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය යටතේ එන යුරෝ මිලියන 10.48 ක් වූ විදේශීය අරමුදල් සහභාගය ඕස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව විසින් සපයා දෙනු ලැබූ අතර දේශීය අරමුදල් සහභාගය වූ රුපියල් මිලියන 700 ක මුදල ශ්‍රී ලංකා ජන රජයෙන් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු 2019 වර්ෂයේ ජනවාරි මස ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේ මාර්තු මාසය වන විට ව්‍යාපෘති වැඩ කටයුතු මුළුමනින්ම නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.




**කැටි ගැසීම් හා සම්පිණ්ඩන ටැංකි**

## 21. හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය සැලැසුම් කොට ගොඩ නැගීමේ කොන්ත්‍රාත්තුවක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන අතර එය ක්‍රියාත්මක කරනු ලබන්නේ නෙදර්ලන්තයේ අයිඑන්ජී බැංකුවේ මූල්‍ය සහාය ඇතිව වේ. ව්‍යාපෘතිය විසින් ඉලක්ක කරනු ලබන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරි වසම් 135 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් 2042 වර්ෂය වන විට ආසන්න වශයෙන් 169200 ක ජන ගහණයක් වෙත සුරක්ෂිත නල මාර්ග පානීය ජල සම්පාදන පහසුකම් සපයා දීම කෙරෙහි වන්නේය. මුළු ව්‍යාපෘති පිරිවැය යුරෝ 81,956,626.00 ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව දින 1065 ක් වනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2018 වර්ෂයේ දෙසැම්බර් 24 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2022 වර්ෂයේ මාර්තු 23 වැනි දින සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ තිබේ.



**අරනායක ජලාශය**

ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 24000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක්, කිලෝ මීටර 0.6 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක්, දිනකට ජලය ඝණ මීටර 21000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක්, කිලෝ මීටර 37 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක්, භූමි ජලාශයන් 07 ක සංඛ්‍යාවක් හා කිලෝ මීටර 74 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් යන ප්‍රධාන අංගයන්ගෙන් සමන්විත වේ.

සැලැසුම් කිරීමේ වැඩ කටයුතු වලින් 60% ක ප්‍රතිශතයක් කොන්ත්‍රාත්කරු විසින් නිම කරනු ලැබ ඇති අතර ඉදි කිරීම් වැඩ කටයුතු 2019 දෙසැම්බර් 18 වැනි දින ආරම්භ කරන ලදි. වර්ෂ 2019 අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 16% ක් හා 26.5% ක් විය.

## දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්

940000 ක ජන ගහණ සංඛ්‍යාවක් වෙත ප්‍රතිලාභ ලබා දීමේ අරමුණ සහිතව ජල සම්පාදන පහසුකම් නංවා ලීම සඳහා ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතීන් 16 ක සංඛ්‍යාවක් ඇතුලත් බිලියන 3.5 ක දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය හා බිලියන 53 ක දේශීය බැංකු ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. මේ අතරින් බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය, රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමය, කොළඹ මහ නගර ජල සම්පාදන ව්‍යාපෘතිය, අම්පාර ජල සම්පාදන යෝජනා ක්‍රමය, අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය නම් වූ ව්‍යාපෘති හයක සංඛ්‍යාව දැනට සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර අනිකුත් ව්‍යාපෘතීන් අතුරින් ඉතා වැඩි සංඛ්‍යාවක් වර්ෂ 2020 තුළදී සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබීමට නියමිතව ඇත.

### අ. මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය II වැනි අදියර

මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි අදියර ආරම්භ කරන ලද්දේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් කොටසක් තුළ ජල සම්පාදන බෙදා හැරීමේ පද්ධතිය ආවරණය කිරීමේ අපේක්ෂාවෙන් වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් 31 ක සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ. බිම් මැනීම් කටයුතු හා සැලසුම් කිරීමේ කටයුතු, කවුඩුල්ල ඔය හරහා නල පාලම ඉදි කිරීම හා මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි අදියර කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස ගොඩනැගිලි ඉදි කිරීම සහ පොලි විනිල් ක්ලෝරයිඩ් හා මෘදු යකඩ නල සපයා එලීම ඇතුලත් වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 1,363.6 ක් හා අවිනිශ්චිත තත්ත්වයන් වෙනුවෙන් අමතර වශයෙන් 10% කට එක් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය 2016/03/01 වැනි දින ආරම්භ කරන ලද අතර 2020 වර්ෂයේ අප්‍රේල් මස 22 වැනි දින වන විට එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂිත වේ. 2019 වර්ෂයේ අවසානය වන විට නල එලීමේ සමස්ත ප්‍රගතිය 99.34% ක් වන අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය 79.68% විය.



නව නගර කුළුණු පරිශ්‍රය තුළ පිහිටි කාර්යාල ගොඩනැගිල්ල

### ආ. ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා මල්ලවපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වන අතර මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාම නිලධාරී වසම් 29 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ආසන්න වශයෙන් 33000 ක ජන සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් සපයා දෙනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇත.

ව්‍යාපෘතිය කිලෝ මීටර 27 ක දිග ප්‍රමාණයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් / මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් මාවතගම ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් පිලැස්සේ ඉදි කිරීම හා කිලෝ මීටර 113 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීම් නල ජාලය ද, රසායනික ගොඩනැගිලි 2 ක සංඛ්‍යාවක් ද, ජලය ඝණ මීටර 50 ක ධාරිතාවයකින් යුත් තුළනය කිරීමේ ජලාශයක් හා ස්ථාන භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ලක් ද යන අංගයන්ගෙන් සමන්විත වන්නේය. මධ්‍යම පලාත් සහාය සේවා මධ්‍යස්ථානයට අයත් කටුගස්තොට පිහිටි ජල පිරිපහදු යන්ත්‍රාගාරය වෙතින් ලබා ගනු ලබන ජලයෙන් දිනකට ජලය ඝණ මීටර 2000 ක පරිමාවක් ගලගෙදර ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත හා දිනකට ජලය ඝණ මීටර 3000 ක පරිමාවක් මාවතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත ලබා දීමට ව්‍යාපෘතිය අදහස් කරයි.

2019 මැයි 31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය සැලකිය යුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබ තිබුණ අතර ඉතිරි වැඩ කටයුතු වශයෙන් හඳුනාගනු ලැබ ඇති දීර්ඝ කිරීම් දෙකක් හා ස්ථාන භාර නිලධාරී කාර්යාලයේ අවසන් අදියරේ වැඩ කටයුතු ව්‍යාපෘතියේ ඉතිරි මුදල් උපයෝගී කර ගනිමින් දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී.

2019 වර්ෂයේ දෙසැම්බර් 30 වැනි දිනය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබි භෞතික ප්‍රගතිය 99.62% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 61% ක් විය.

දිනකට ජලය ඝණ මීටර 5000 ක් ලබා ගැනීමට දැනට නොහැකි වී තිබීම කරනකොට ගෙන ව්‍යාපෘතිය සේවයේ යෙදවීම කළ නොහැකි තත්ත්වයක තිබෙන අතර මහනුවර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වීමෙන් අනතුරුව එම අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.



මාවතගම පිහිටි ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණ

### ඇ. ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ මොරගහකන්ද - කළුගඟ වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුකොට ගෙන අවතැන් වී සිටින ජන ගහණය නැවත පදිංචි කරවනු ලැබ ඇති ප්‍රදේශය වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමේ අරමුණ ඉලක්ක කර ගනිමිනි.

සැලසුම් ක්ෂිතිජ වර්ෂය වන 2036 වර්ෂය වන විට ව්‍යාපෘතියේ පහසුකම් ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 24438 ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 4,496 ක් වනු ඇති අතර අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ දේශීය බැංකු අරමුදල් යටතේ හැටන් නැෂනල් බැංකුව විසිනි. 2016 ජුලි 21 වැනි දින මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය අවසන් කිරීමට අපේක්ෂිත (සංශෝධිත) දිනය 2019 දෙසැම්බර් 29 වැනි දිනය වේ.

ජල ප්‍රභවය වන්නේ කළුගඟයි. මහජන විරෝධතා හේතුකොට ගෙන තුළු මුව ඉදි කරනු ලැබීමට මුලින් සැලසුම් කරනු ලැබූ ස්ථානය

වෙනස් කරන ලද අතර ඒ හේතුව නිසා වෙනත් ව්‍යුහාත්මක ස්ථානයන් කිහිපයක හා අමු ජල හා ප්‍රතිකාර්ත ජල ප්‍රධාන නල මාර්ගයන් එලීමේ මාර්ගයන් ද වෙනස් කිරීමට සිදු විය. ව්‍යාපෘතියේ සංශෝධිත විෂය පථයට දිනකට ජලය ඝණ මීටර 4250 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, ධාරිතාවය ඝණ මීටර 150 ක, 400 ක හා 600 ක ධාරිතාවයන්ගෙන් යුත් සේවා ජලාශයන් 3 ක සංඛ්‍යාවක් ද, අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන මාර්ගයන් ද, ප්‍රතිකාර්ත ජල ප්‍රධාන මාර්ගයක් හා ආසන්න වශයෙන් පිළිවෙලින් කිලෝ මීටර 6.4 ක, කිලෝ මීටර 29 ක හා කිලෝ මීටර 190 ක දිග ප්‍රමාණයන්ගෙන් යුත් ජලය බෙදා හැරීම් පද්ධති 3 ක් හා උපබද්ධ ගොඩනැගිලි ද අන්තර්ගත වේ.



ජල පතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ පිරිසිදු ජල ජලාශය ඉදි කිරීම

ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 64.5% ක් හා 36.06% ක් විය.

අරමුදල් නොමැති වීම නිසා ගෙවීම් මුදා හැරීමේ ප්‍රමාදයක් සිදු වූ අතර ඇතැම් අතුරු හිමිකම් පෑම් මුදා හැරීම් තවමත් හැටන් නැෂනල් බැංකුව විසින් සිදු කරනු ලැබ නැත.

## ඈ. විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටුවනු ලැබ ඇති අතර ග්‍රාම නිලධාරී වසම් 39 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 35000 ක ජන සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් සම්පාදනය කර දීමට ප්‍රස්තුත ව්‍යාපෘතිය විසින් සැලසුම් කරනු ලැබ ඇත.

දිනකට ජලය ඝණ මීටර 6000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් සැලසුම් කොට ඉදි කිරීම ද, දිනකට ජලය ඝණ මීටර 5500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, මීටර 1000 ක දිග ප්‍රමාණයකින් යුත් අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග යන් ඉදි කිරීම ද, කිලෝ මීටර 26 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රතිකාර්ත ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයන් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් හා ජලය ඝණ මීටර 300 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණු 2 ක් ඉදි කිරීම ද, කිලෝ මීටර 100 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල ජාලයක් එලීම ද, ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාස 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද ප්‍රස්තුත ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වේ.

කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය ගැටළු නිසා 2019 මුල් අට මාසය තුළ කාර්ය සාධනය ඉතා දුර්වල විය. කෙසේ වුව ද 2019 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් කරු විසින් නැවතත් වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 52% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 32.6% ක් විය.

කොන්ත්‍රාත් කරු විසින් මුහුණ පානු ලැබ ඇති මූල්‍ය අර්බුදය දිගින් දිගටම පැවැතීම ව්‍යාපෘතිය කලට වේලාවට සම්පූර්ණයෙන්ම නිම කිරීම කෙරෙහි තදින්ම බල පාන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජාතික සංවර්ධන බැංකුව වෙත ණය වාරික ගෙවීම ප්‍රමාද වීම ද කොන්ත්‍රාත් කරු වෙත කලට වේලාවට බිල් ගෙවීම ප්‍රමාද වීමට හේතු විය.



තුළු මුව ළිඳ හා පොම්පාගාරය

## ඉ. අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය

අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් කිලෝ මීටර 1119 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාල පද්ධතියක් ඉදි කිරීම සඳහා ද, පිළියෙල කරන ලද පැකේජ කිහිපයක් යටතේ කිලෝ මීටර 527 ක දිග ප්‍රමාණයකින් යුත් පොලි එතිලීන් නල, අවශ්‍ය සවි කිරීම් හා විශේෂ උපකරණයන් සැපයීම සඳහා සහ නිවාසයන් වෙත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 10000 + 2000 ක සංඛ්‍යාවක් සපයා දීම සඳහා ද වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදි.

2015 වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා අම්පාර දිස්ත්‍රික්කය තුළ බල පාන ලද අහිතකර කාලගුණ තත්ත්වයන් නිම වීමෙන් අනතුරුව ව්‍යාපෘතිය නැවතත් පූර්ණ ක්‍රියාකාරී තත්ත්වයට පත් වීමෙන් පසු අතිරේක ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 2000 ක සංඛ්‍යාවක් සපයා දීමේ කටයුතු ද, බොක්කබැද්ද භූවන පොම්පාගාරය ඉදි කිරීමේ කටයුතු ද, පියන්ගල පෝම්ප ස්ථාපනය කිරීමේ කටයුතු හා ස්වයංක්‍රීය ක්ලෝරිනීකරණ පද්ධතියේ කටයුතු ද, මරුදමුනෙයි ස්ථාන භාර නිලධාරී කාර්යාලය වට කොට මායිම් තාප්පය ඉදි කිරීමේ කටයුතු හා වටුනතිවු ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිසරය තුළ අංගන නල එලීමේ කටයුතු ද ක්‍රියාත්මක කරන ලෙස විචලන ඇණවුම් මගින් උපදෙස් නිකුත් කරන ලදි. අවසාන භාර දීම හා භාර ගැනීම සිදු කරන ලද්දේ 2019 පෙබරවාරි 12 වැනි දිනදීය. තවද තීරකකරණයේ අවසන් ප්‍රදානය 2019 වර්ෂයේ මැයි මස 10 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදි.



පරගහකැලේ ස්ථාන භාර නිලධාරි කාර්යාලය

### ඊ. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අවිස්සාවේල්ල හා කොස්ගම යන ප්‍රදේශයන් තුළ නල ජල බෙදා හැරීම් පද්ධතිය නංවා ලීම වන්නේය. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා සම්බන්ධ පීවීසී හා මෘදු යකඩ නල සපයා එලීම හා සවි කිරීම් හා උපාංගයන් සපයා සවි කිරීම හා අදාල වෙනත් වැඩ කටයුතු සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 1,382.4 ක මුදලකට ප්‍රදානය කරනු ලැබ ඇත. අරමුදල් සම්පාදනය කරනු ලබන ප්‍රභවය වන්නේ දේශීය බැංකු වන අතර ව්‍යාපෘතිය සැබැවින්ම ආරම්භ කරන ලද දිනය 2016.06.01 වූයේය. 2019 නොවැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු කරනු ලැබ ඇති වැඩ කටයුතු වලට කොස්ගම හා අවිස්සාවේල්ල යන ප්‍රදේශයන් තුළ පිළිවෙලින් කිලෝ මීටර 36.1 ක හා කිලෝ මීටර 11.2 ක දිග ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ බෙදා හැරීමේ නල පද්ධතිය සපයා එලීම, කොස්ගම තුළ මුව වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු හා අවිස්සාවේල්ල වැඩ බිම තුළ ගොඩනැගිලි ඉදි කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු ද ඇතුලත් වේ. අවිස්සාවේල්ල තුළ ඇති උස් බිම් ප්‍රදේශයන් වෙත ද මෙම ව්‍යාපෘතිය මගින් සේවා සපය දෙන ලදි.



අවිස්සාවේල්ල අංක 53/3 පාලම හරහා නල එලීම

### උ. කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - පැකේජ 1, 2 හා 3

කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ හෝමාගම, කඩුවෙල, පාදුක්ක, සීතාවක හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජීවත් වන 373000 ක ඇස්තමේන්තුගත ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය නල ජලය සම්පාදනය කර දීමේ අරමුණ ඉලක්ක කර ගනිමිනි.

ප්‍රස්තුත ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තු පැකේජ 03 ක සංඛ්‍යාවකින් සමන්විත වන අතර එම පැකේජයන් නම් පැකේජ අංක 01. (කිලෝ මීටර 4 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර 229 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය), පැකේජ අංක 02. (කිලෝ මීටර 8 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර 10 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය සහ ජලය ඝණ මීටර 18000 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශය සහ ගොඩනැගිලි ඉදි කිරීම) හා පැකේජ අංක 03. (කිලෝ මීටර 400 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ගය හා ගෘහස්ත ජල සම්පාදන සම්බන්ධතාවයන් 10000 ක් සම්පාදනය කර දීම) ද වේ. එම කොන්ත්‍රාත්තු පැකේජ තුන සඳහා වැය වෙතැයි අපේක්ෂා කරනු ලබන පිරිවැය පිළිවෙලින් රුපියල් මිලියන 5,170 ක්, රුපියල් මිලියන 4,823 ක් හා රුපියල් මිලියන 10,049 ක් වේ.

සියළු පැකේජයන් තුනෙහිම වැඩ කටයුතු සිදු කරනු ලබමින් පැවැති අතර 2018 වර්ෂයේ අවසානය වන විට 01 වැනි කොන්ත්‍රාත්තු පැකේජයෙහි භෞතික ප්‍රගතිය 99.7% ක් හා මූල්‍ය ප්‍රගතිය 68.2% ක් ද, 02 වැනි කොන්ත්‍රාත්තු පැකේජයෙහි භෞතික ප්‍රගතිය 68.1% ක් හා මූල්‍ය ප්‍රගතිය 47.7% ක් හා 03 වැනි කොන්ත්‍රාත්තු පැකේජයෙහි භෞතික ප්‍රගතිය 85.3% ක් හා මූල්‍ය ප්‍රගතිය 68.5% ක් ද විය.

2019 වර්ෂයෙහි අවසානය වන විට මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග පුළුල් කිරීමේ වැඩ සටහන හා සමගාමී ලෙස කරනු ලබන නල එලීමේ වැඩ කටයුතු හා වැඩ බිම විතැන් කිරීම හා අත්තිවාරම් සැලසුම සංශෝධනය කිරීම නිසාත් ප්‍රමාද වූ භූමි ජලාශයේ ඉදි කිරීම් වැඩ කටයුතු හා නිවාස වෙත ජල සම්පාදන සේවාවන් සැපයීමේ වැඩ කටයුතු හැර අනිකුත් වැඩ කටයුතු සියල්ල සැලකිය යුතු මට්ටමකට අවසන් කරනු ලැබ තිබිණි,

කොන්ත්‍රාත්තු පැකේජ 01 හි හා කොන්ත්‍රාත්තු පැකේජ 03 හි කොන්ත්‍රාත් කරුවන් විසින් පැන නැගී තිබුණ ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය වෙත යොමු කරනු ලැබ තිබුණ අතර ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය විසින් එහි ප්‍රදානයන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලයේ ප්‍රදානයන් පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත් කරුවන් සමග සාකච්ඡා පවත්වන ලද නමුත් මෙතෙක් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි වී ඇත.



රසායනික ගල් පිපිරවීම

### ඌ. ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය

ප්‍රස්තුත ව්‍යාපෘතිය වැලිගම, ඌරගස්මන්හන්දිය, ගෝනාපීනුවල හා දික්කුඹුර යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අනුබද්ධිත ජලය බෙදා හැරීමේ නල ජාලයන් වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වලින් සමන්විත වේ. ඇස්තමේන්තු කරනු ලැබ ඇති ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 1,755 ක් වන අතර අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ මහජන බැංකුව හා ලංකා බැංකුව විසිනි. කිලෝ මීටර 86.5 ක දිග ප්‍රමාණයකින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මෘදු යකඩ නල සැපැයීම, මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව හා උපාංගයන්

සැපැයීම, යෝජනා ක්‍රමයන් 4 ක සංඛ්‍යාවක් තුළ කිලෝ මීටර 117.5 ක දිග ප්‍රමාණයකට පොලි විනිල් ක්ලෝරයිඩ් නල, මෘදු යකඩ නල හා උපාංගයන් එලීම, ඌරගස්මන්හන්දිය, හික්කඩුව, කොවුල්හේන, වක්වැල්ල හා වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ පෝම්ප ස්ථාපිත කිරීම, ඌරගස්මන්හන්දියේ ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා ඉහළ ඔසොව් පොම්පාගාරයක් ඉදි කිරීම හා වැලිගම ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් ඉදි කිරීම ද ව්‍යාපෘතියේ සෙසු අංගයන් වේ. මෙම ව්‍යාපෘතිය මගින් මුළු වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 55 ක සංඛ්‍යාවක් ආවරණය කරනු ලැබීමට නියමිතව ඇත. සපයා දෙනු ලැබීමට අපේක්ෂා කරනු ලබන ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 20000 ක් වන අතර අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 82000 ක් වේ. මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේ මාර්තු මාසයේ ආරම්භ කරන ලද අතර එය 2020 වර්ෂයේ ජූලි මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ. 2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 34.96% ක් හා 40.84% ක් විය.



දික්කුඹුර ජල සම්පාදන ව්‍යාපෘතියෙහි "B" වර්ගයේ බෝක්කු පැන්නුමක් නිම කරමින් සිටියදී

## එ. ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය දේශීය බැංකු විසින් සපයනු ලබන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘති පිරිවැය රුපියල් බිලියන 2.2 ක් වේ. මෙම ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් අටක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 15000 ක ජන සංඛ්‍යාවක් වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 3000 ක සංඛ්‍යාවක් ලබා දෙමින් ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියා කරනු ලබනවා ඇත. ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව 2014. 12. 08 වැනි දින ප්‍රදානය කරන ලද අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2017 මැයි මස ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ වැඩ කටයුතු දින 1095 ක් ඇතුළත සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතව ඇත.

2019 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 75% (ඉලක්කය 80% ) ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 58% (ඉලක්කය 69% ) ක් විය

ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අදාල එකඟතාවයන් ලැබී ඇත. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, භූවන පොම්පාගාරය 1 හා භූවන පොම්පාගාරය 11 හා සම්ප්‍රේෂණ ජාලය සහිත ප්‍රධාන ටැංකිය ඉදි කිරීමේ ක්‍රියාවලිය නිම වෙමින් පවතින පියවර තුළ ඇත. සියළුම ඉදි කිරීම් වැඩ කටයුතු වලට පෙරාතුව ගත යුතු අදාල පූර්ව අනුමැතීන් මාර්ග සංවර්ධන අධිකාරිය හා පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඇතුළු අදාල පාර්ශවයන් වෙතින් ලබා ගන්නා ලදී.

මුල් වැඩ සටහනට අනුව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් වැඩ කටයුතු 2020 පෙබරවාරි මාසයට පෙර ආරම්භ කළ හැකි වන අතර නිවාසයන් වෙත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සැපැයීමේ වැඩ කටයුතු 2020 මාර්තු මාසයේ සිට ඉදිරියට කරගෙන යනු ලබනවා ඇත.



වායු ගන්වනය

## ඒ. ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය

ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය යනු දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 18 ක සංඛ්‍යාවක් වෙත ජලය සම්පාදනය කර දීමට සැලසුම් කරනු ලැබ ඇති රුපියල් මිලියන 513.28 ක පිරිවැයක් ඇස්තමේන්තු කරනු ලැබ ඇති දේශීය බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර, ඒ සඳහා අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ මහජන බැංකුව විසිනි. ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර දින 365 ක කාල සීමාවක් තුළ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2019 පෙබරවාරි මස 15 වැනි දින ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩ කටයුතු සමන්විත වන්නේ විෂ්කම්භය මිලි මීටර 63 ක පොලි විනිල් ක්ලෝරයිඩ් නල වල සිට විෂ්කම්භය මිලි මීටර 350 ක් දක්වා වූ මෘදු යකඩ නල සපයා යොදා ගනිමින් කිලෝ මීටර 100 ක දිග ප්‍රමාණයකින් යුත් නල ජාලයක් ඉදි කිරීම ඇතුළු හ 30 සංක්‍රාන්ති නල මාර්ගයේ සිට ජලය ලබා ගැනීම සඳහා හංවැල්ල පාලම හරහා නල එලීමේ කටයුතු වලිනි.

කොන්ත්‍රාත් කරු විසින් මුහුණ පානු ලැබ ඇති මූල්‍ය හා කළමනාකරණ ගැටළු හේතුකොට ගෙන ව්‍යාපෘතියේ වැඩ කටයුතු වැඩ සටහන අනුව බලන විට ප්‍රමාද වී ඇති අතර දැනට සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 23% කි. කොන්ත්‍රාත් කාලයෙන් මාස 2 ක කාලයක් පමණක් ඉතිරිව තිබියදී කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් නල මාර්ගයෙන් එලනු ලැබ ඇත්තේ කිලෝ මීටර 16 ක් පමණක් වන අතර කිලෝ මීටර 10 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ නල මාර්ගය එලීමේ කටයුතු මේ වන තෙක් ආරම්භ කරනු ලැබ නැත. වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා 6 මසක කාලය දීර්ඝ කිරීමක් කොන්ත්‍රාත් කරු විසින් ඉල්ලනු ලැබ ඇති අතර එම ඉල්ලීමට අනුමැතිය දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එකී ඉල්ලීම විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී.



නල එලීම

## ඹ. විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය

විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටවනු ලැබ ඇත්තේ සබරගමුව පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේය. මෙම ව්‍යාපෘතිය සැලසුම් කරනු ලැබ ඇත්තේ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 15000 ක සංඛ්‍යාවක් ලබා දෙමින් ඒ මගින් ප්‍රතිලාභීන් 80000 ක සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් ලබා දීම අරමුණු කරගෙන වන්නේය.

කිලෝ මීටර 178 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලයක් එලීම සඳහා අවශ්‍ය ඉහළ ඝණත්වයේ පොලි එතිලින් නල ද, මෘදු යකඩ නල ද, මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල ද, සවි කිරීම් හා විශේෂ සවි කිරීම් ද, මෘදු යකඩ වෑල්ව හා උපාංගයන් ද සපයා නල පද්ධතිය එලීම යන අංගයන්ගෙන් මෙම ව්‍යාපෘතියේ විෂය පථය සමන්විත වේ.

මෙම ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්තුව 2017.09.01 වැනි දින ප්‍රදානය කරන ලද අතර ව්‍යාපෘති කාල සීමාව දින 539 කි. කෙසේ වුව ද ණය ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දිනය ප්‍රමාද වීම හේතුකොට ගෙන කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වුනේ 2018 දෙසැම්බර් 14 වැනි දින සිට වේ. කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 1,528.98 ක් වන අතර 2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 25% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 21% ක් විය.



නල එලීම

## ඕ. දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන බිලියන 3.5 ක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජලය බෙදා හැරීමේ පද්ධතීන් තුළ නල මාර්ග දීර්ඝ කිරීමේ කටයුතු හා හිඩැස් පිරවීමේ කටයුතු සිදු කිරීම මගින් ඌව, දකුණු, උතුරු, බටහිර මධ්‍යම, බටහිර උතුරු, බටහිර දකුණු, නැගෙනහිර, උතුරු මැද, වයඹ, මධ්‍යම හා සබරගමුව යන පලාත් තුළ ක්‍රියාත්මක වන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 11 තුළ ඇති ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව වැඩි දියුණු කිරීමේ අරමුණ ඉලක්ක කර ගනිමින් වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් බිලියන 3.5 ක් වන අතර ව්‍යාපෘතිය අවසාන වන විට ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව 33250 ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එය 2020 වර්ෂය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. 2019 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 97.6% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 69.7% ක් විය.



සේරු නුවර ජල කුළුණ

## ශ්‍රී ලංකා රජයේ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්

### මාතර කෙටි කාලීන වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය

මාතර කෙටි කාලීන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 300 ක් වේ. මාතර කණ්ඩායමේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සම්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 6000 කින් වැඩි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබ ඇති අතර එම කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශය තුළ ජල සම්පාදනයේ වැඩි දියුණුවක් හා ජල සම්පාදනය කිරීම අඩු කරන කාල සීමාවන් අඩු වීමද අපේක්ෂා කළ හැකිය. එසේම, තිහගොඩ ප්‍රදේශය තුළ ඇති ආන්තික ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ජීවත් වන පවුල් 100 ක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට අපේක්ෂිත වේ.

දෙවිනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ තලල්ල සිට බෙලිවත්ත දක්වා නල මාර්ග එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ නයිගල සිට දික්වැල්ල දක්වා නල මාර්ග එලීමේ කටයුතු ද 18% ක ප්‍රතිශතයක් සම්පූර්ණ කරනු ලැබ ඇත.

### අන්දරගස්යාය භූගත ටැංකියේ සිට ගොන්නොරුව දක්වා නල එලීමේ වැඩ කටයුතු

අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ අරමුණ අන්දරගස්යාය හා බන්දගිරිය ප්‍රදේශයන් වෙත සේවය සැපැයීම වන අතර අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 12000 ක් වේ. ජල සම්පාදන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඇතැම් කොන්ත්‍රාත්තු මෙම යෝජනා ක්‍රමය යටතේ ආරම්භ කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 93% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 62% ක් විය.

### තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම වැඩ සටහනේ විෂය පථය තුළට ඇතුලත් වන්නේ ජලයේ ගුණාත්මය නංවා ලීමේ අරමුණින් තිස්සමහාරාම ජල සම්පාදන ව්‍යාපෘතිය වර්ධනය කිරීම වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 393 ක් වන අතර අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ආසන්න වශයෙන් 10000 ක් පමණ වේ. වායු ගන්වනය ඉදි කිරීම, අවසාදන ටැංකිය ඉදි කිරීම, රසායනික කුටිය ඉදි කිරීම හා මෙහෙයුම් ගොඩනැගිල්ල ඉදි කිරීම හා සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර 2019 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 53% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 41% ක් විය.

### රුපියල් මිලියන 600 ක අරමුදල් වෙන් කිරීම යටතේ වූ ත්‍රිකුණාමලය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ත්‍රිකුණාමලය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය කලාපය වෙනුවෙන් රුපියල් මිලියන 600 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබ ඇති අතර එයින් රුපියල් මිලියන 150 ක මුදලක් 2019 වර්ෂය වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇති අතර එම වර්ෂය තුළදී රුපියල් මිලියන 61.81 ක මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබ ඇත. මේ අතර 2019 වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 34.86 ක් වටිනා බිල් පත් අතෙහි ඉතිරිව තිබිණි. 2019 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 65% ක් විය.

### කෑගල්ල නැවත පදිංචි කරවීම්

2016 වර්ෂය තුළදී නාය යාමේ සිද්ධීන්ගේ බල පෑමට භාජනය වූ ආසන්න වශයෙන් පවුල් 2000 ක පමණ සංඛ්‍යාවක් වෙත පානීය ජලය සපයා දීමේ විශාල අභියෝගයට මුහුණ දීමට කෑගල්ල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සිදු විය. 2016 වර්ෂයේ මැද භාගය තුළ එකී පවුල් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 11 කට වැඩි සංඛ්‍යාවක් තුළ නැවත පදිංචි කරවීමට පියවර ගනු ලැබ තිබිණි. එම කඩිනම් නැවත පදිංචි කරවීමේ වැඩ සටහන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් සපයන ලද මූල්‍ය සහාය යටතේ සම්පූර්ණයෙන් නිම කරන ලදී. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නාය යාමේ උවදුරට භාජනය වූ වින්දිතයින් නැවත පදිංචි කරවන ලද ගම්මානයන් වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම සඳහා කැබිනට් අනුමැතිය අනුව රුපියල් මිලියන 455 ක මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කරන ලදී. 2019 වර්ෂය වෙනුවෙන් වූ ක්‍රියාකාරී සැලසුමට අනුව ව්‍යාපෘතිය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 ක සංඛ්‍යාවක් තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 15 ක සංඛ්‍යාවක් ඉදි කරන ලද අතර ඒ වෙනුවෙන් වූ වෙන් කිරීම රුපියල් මිලියන 99.6 ක් විය.

### දන්කොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය

දන්කොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය යනු ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 6000 ක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දිනකට ප්‍රතිකාරිත ජලය ඝණ මීටර 4000 ක පරිමාවක් නිෂ්පාදනය කරනු ලබන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයක් වේ. නව ව්‍යාපෘතිය විසින් ගොහොදු මඩ ප්‍රතිකාරිත කිරීමේ පහසුකම් ද සහිතව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ධාරිතාව වැඩි දියුණු කිරීමට යෝජිත අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් ජනනය වනු ඇත. දැනට ක්‍රියාත්මක වන මා ඔය තුළ මුව මෙම ව්‍යාපෘතිය විසින් ජල ප්‍රභවය වශයෙන් භාවිතා කරනු ලබනවා ඇත. ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් බිම් දෙණක්, බාදිය ප්‍රතිසාධන ටැංකියක්, ගොහොදු මඩ රඳවා ගැනීමේ ටැංකියක් හා ගොහොදු මඩ කලපුවක් ද ඉදි කරනු ලැබීමට නියමිත වේ. ජලය බෙදා හැරීම ව්‍යාප්ත කිරීමේ කටයුතු පහසුකරණය කිරීම සඳහා නල මාර්ග එලීම හා පෝම්ප ස්ථාපිත කිරීම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ මුළු පිරිවැය රුපියල් මිලියන 200 ක් වනු ඇත. 2019 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබ් භෞතික ප්‍රගතිය 30% ක් වූ අතර මූල්‍ය ප්‍රගතියක් නොවීය.

### බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා වත්කම් කළමනාකරණය කිරීමේ හැකියාව නංවා ලීම

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ වේ. මෙය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) විසින් දෙන ලද රුපියල් මිලියන 527 ක ප්‍රදානයක් හා දේශීය වශයෙන් ලැබුන රුපියල් මිලියන 40 ක දායකත්වයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාල සීමාව 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 2020 වර්ෂයේ අගෝස්තු මාසය දක්වා වන්නේය.

ප්‍රස්තුත ව්‍යාපෘතිය ප්‍රධාන කොටස් 3 කින් සමන්විත වේ. ඒ අතුරින් 1 වැනි කොටස වූ නල මාර්ග වත්කම් කළමනාකරණය හඳුන්වා දීම (සම්පාදන අංක 01) අවසන් කරනු ලැබ ඇති අතර සෙසු කොටස් වන්නේ ජල කාන්දු පාලනය නංවා ලීම (සම්පාදන අංක 02) 2 වැනි කොටස හා ජල කාන්දු පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දෙන පුහුණු කරුවන් සඳහා වූ පුහුණු කරුවන් පුහුණු කිරීම (සම්පාදන අංක 03) 3 වැනි කොටස ද වේ.

සම්පාදන අංක 02 න් බලාපොරොත්තු වන ප්‍රතිඵලයන් වන්නේ නියමු කලාපය තුළ ජල කාන්දු පාලනය කිරීමේ හැකියාව නංවා ලීම ද, නව තාක්ෂණ වේදයන් හා උපකරණ පිළිබඳ දැනුම අවශෝෂණය කර ගැනීම ඇතුළු දැනුම බෙදා හදා ගැනීම හා අවශ්‍ය මග පෙන්වීම් ඇතුලත් ජල හානි කළමනාකරණය කිරීම සම්බන්ධ අත් පොතක් පිළියෙල කිරීම මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නිවැරදි ආදායම් රහිත ජල පරිමාව කළමනාකරණය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම ද වන්නේය.

සම්පාදන අංක 03 න් අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵලයන් වන්නේ නල මාර්ග ස්ථාපනය කිරීම හා ජල කාන්දු සොයා ගැනීම සම්බන්ධ පුහුණුව ලබා දෙන පුහුණු අංගනයක් ඉදි කිරීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ජල කාන්දු සොයා ගැනීම පිළිබඳ පුහුණුව ලබා දීම ද වේ. (සම්පාදන අංක 03 සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත).

ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් 37% ක් හා 45% ක් විය.

## බණ්ඩාරවෙල ජල සම්පාදනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උමං මාර්ග ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කර ගෙන යන අතරතුර ප්‍රධාන උමං මාර්ගය ඉදි කිරීමේ වැඩ බිම තුළ ජල ආයානය ඇති වූ අතර ඒ හේතුකොට ගෙන බණ්ඩාරවෙල හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක තුළ පිහිටි බොහෝ ගම්මානයන් තුළ පිහිටි සෑරූ ළිං වල ජල මට්ටම අඩු වූ අතර ඇතැම් ළිං සම්පූර්ණයෙන්ම වියලී යන ලදි. පානීය ජලය හිඟවීමේ බල පෑමට ගොදුරු වී ඇති පවුල් ආසන්න වශයෙන් 2000 ක පමණ සංඛ්‍යාවක් මෙම ගම්මානයන් තුළ ජීවත් වෙති. මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලද්දේ එම බල පෑමට ගොදුරු වී ඇති පවුල් වෙත ලබා ගත හැකි ජල සම්පාදන පහසුකම් වැඩි කිරීමේ පරමාර්ථයෙන් වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වූයේ දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අතිරේක තුළු මුව පෝම්ප හා හුවන පෝම්ප සපයා දීම හා බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පැවැති සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ පද්ධතීන් වැඩි දියුණු කිරීම ද වන්නේය. 2019 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබ් භෞතික ප්‍රගතිය 97% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 95.51 ක් විය.

## බැතිමතුන් වෙත පානීය ජලය සම්පාදනය කර දීම සඳහා වූ මඩු දේවස්ථානයේ ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ මඩු දේවස්ථානය වෙත හා යාබද ගම්මානයන් වෙත ජලය සම්පාදනය කර දීමේ පරමාර්ථය ඇතිව වේ. ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 790.62 ක් වන අතර අරමුදල් සපයා දෙනු ලබන්නේ ශ්‍රී ලංකා ජන රජය විසිනි. තක්සේරු කරනු ලැබ ඇති ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 12600 ක් වේ. ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය සපයා එලීමේ කටයුතු හා හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සැලසුම පිළියෙල කිරීම 2019 මැයි මාසයේදී ආරම්භ කරන ලදි.

## පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන සැලැසුම මේ දින වල ලෝක බැංකු අරමුදල් සම්පාදනය යටතේ ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය (WASSIP) හරහා පිළියෙල කරනු ලබමින් පවති. ඊට අදාල වැඩ කටයුතු 2019 ජනවාරි 08 වැනි දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි මාසය වන විට එම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතව ඇත. මෙම අධ්‍යයනය විසින් ශ්‍රී ලංකාවේ සපයනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන් තුළ ඇති තීරණාත්මක හිඩැස් හඳුනාග නු ලබන අතර රට තුළ අපේක්ෂා කරනු ලබන සංවර්ධන සැලැසුම් සැලැකිල්ලට ගනිමින් ඒ අනුව එකී අංශය තුළ ක්‍රමෝපායික ලෙස අන්තර්ගත කිරීම සඳහා සුදුසු තොරතුරු, මෙවලම් හා දැනුම් හැකියාව ලබා දෙනු ඇත.

ජල සම්පාදන හා සනිපාරක්ෂණ අංශය තුළ ඇති හිඩැස් පිරවීම සඳහා හඳුනාගනු ලබන ව්‍යාපෘතීන් වර්ගයන් පහක් පදනම් කර ගනිමින් ප්‍රමුඛතාගත කරනු ලබනවා ඇති අතර එකී වර්ගයන් වන්නේ : (1) අනතුරට භාජනය විය හැකි කොටස් වෙත විශේෂ අවධානය යොමු කරමින් දැනට සේවාවන් ලබන පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ ප්‍රමාණාත්මක භාවය හා ගුණාත්මක භාවය සහතික කිරීම මගින් දැනට සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීම, (ii) නිෂ්පාදන ධාරිතාවය පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව නංවා ලීම සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ව්‍යාපෘතීන්ගේ හා සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්ගේ හිඩැස් පිරවීම හා බෙදා හැරීම් ප්‍රසාරණය කිරීම, (iii) දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා යෝජනා ක්‍රමයන් තුළ ක්‍රියාත්මක වන ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ

හා බල ශක්ති සංරක්ෂණ වැනි ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් (iv) ආදායම් ජනනය කරනු ලබන (රාජ්‍ය හා සංස්ථා) පාරිභෝගික කොටස් වෙත සේවා සම්බන්ධතාවයන් ලබා දීම හරහා ආදායම් තත්ත්වය නංවා ලීම හා (v) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආයෝජන සංවර්ධන වැඩ සටහන් /න්‍යාය පත්‍ර වලට රුකුල් දීම සඳහා නව ව්‍යාපෘතීන් දියත් කිරීම ද වන්නේය.

ඉහත සඳහන් කරුණු සියල්ල සැලැකිල්ලට ගනිමින් මෙම ප්‍රධාන සැලැසුම් අධ්‍යයනයේ ප්‍රතිඵලය වශයෙන් ක්‍රියාත්මක කිරීමේ සැලැසුම් සමග නව ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතීන්ගේ ලැයිස්තුවක් 2020 ජුනි මාසයේ අවසානය වන විට ලැබෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

## ක්‍රම සම්පාදනය හා සැලසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘති)

2019 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් වැලිවිට ජල සම්පාදන යෝජනා ක්‍රමය, (බටහිර කලාපයේ මහා නගර සැලසුම ඇතුළු) බටහිර කලාපයේ තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය, අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ඝණ මීටර 50000 කින් විස්තාරණය කිරීම, කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම, කළුතර ජල සම්පාදන විස්තාරණ ව්‍යාපෘතිය හා සම්බන්ධ පූර්ව සාධ්‍යතා අධ්‍යයනය, ප්‍රධාන කාර්යාලයයීය ගොඩනැගිලි නවීකරණය කිරීම හා වැඩි දියුණු කිරීම, සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපය තුළ ජල පෙරණයන් පුනරුත්ථාපනය කිරීම, කැළණිය දකුණු ඉවුර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ජලය සම්ප්‍රේෂණය කිරීම සඳහා වූ ප්‍රධාන සම්ප්‍රේෂණ නලය ස්ථාපිත කිරීම, සංශෝධනය කරන ලද විෂය පථය අනුව මුලන්කවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය (ලෝක බැංකු අරමුදල් සම්පාදනය යටතේ) ක්‍රියාත්මක කිරීම, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් නව කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය (ලෝක බැංකු අරමුදල් සම්පාදනය යටතේ) ක්‍රියාත්මක කිරීම, පුනරුත්ථාපනය කරන ලද කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම, දෙහිඅත්තකණ්ඩිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම, මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අනුබද්ධිත ගොහොදු මඩ ප්‍රතිකාරක පහසුකම වැඩි දියුණු කිරීම, ගවරම්මන - බෝගහකුඹුර ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සම්බන්ධ මූලික විමර්ශණ සිදු කිරීම හා බද්දේගම ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අගැයීම් කමිටුවේ හා මණ්ඩලයේ අනුමැතිය ලබා දීම යන වැඩ කටයුතු හා සම්බන්ධ ක්‍රම සම්පාදන හා සැලසුම් කටයුතු වල නිරත වන ලදි.

ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී ජුබිලි පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (සිවිල් හා යාන්ත්‍රික සහ විදුලිත්), ප්‍රධාන කාර්යාලයයීය ගොඩනැගිලි නවීකරණය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ කටයුතු, සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානය වෙනුවෙන් ප්‍රධාන ප්‍රතිකාර්ත ජල සම්ප්‍රේෂණ නල මාර්ග යක් ඉදි කිරීම පිළිබඳ සවිස්තරාත්මක සැලසුම, මුලන්කවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය (ලෝක බැංකු අරමුදල් සම්පාදනය යටතේ) වෙනුවෙන් සංශෝධිත සැලසුම් පිළියෙල කිරීම, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් නව කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු, කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම, ලුනුගම්වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 12000 ක ධාරිතාවයකින් යුත් සම්මුතිගත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, දිනකට ජලය ඝණ මීටර 36000 ක ධාරිතාවයකින් යුත් තුළු මුව හා ගබඩා කිරීමේ ජලාශයන් ඉදි කිරීම (සිවිල් හා යාන්ත්‍රික සහ විදුලිත්), කොලොන්නාව උහන පෝම්ප කිරීමේ ස්ථානය, ආයෝජන මණ්ඩල කලාපය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 5500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, සභාපති / සාමාන්‍යාධිකාරී / විගණන අංශය / මළ අපවහන අංශය හා තොරතුරු අංශයන් වෙනුවෙන් යෝජිත කාර්යාල පරිශ්‍රයන්, මානව සම්පත් හා විගණන අංශයන් වෙනුවෙන් බල ශක්තිය හා ආලෝකය ලබා දීම, තෙලවල පිහිටි නව ජපන් ව්‍යාපෘති ඒකකය වෙනුවෙන් වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය වෙත බල ශක්තිය හා ආලෝකය ලබා දීම, ඇහැලියගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය, මන්නාරම් දිස්ත්‍රික්කයේ එරුකලම්පිඩ්ඩි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම, කතරගම පූර්ව සාධ්‍යතා අධ්‍යයන වාර්තාව වෙනුවෙන් වූ ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තු හා තලවකැලේ හා රුවන්වැල්ල ප්‍රාදේශීය අධිකාරීන් වෙනුවෙන් පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාර වෙනුවෙන් පූර්ව සාධ්‍යතා වාර්තා හා යාන්ත්‍රික හා විදුත් සැලසුම් පිළියෙල කිරීම යනාදී වැඩ කටයුතු වෙනුවෙන් විස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම ද ක්‍රියාත්මක කරන ලදි.

2019 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් පහතින් සඳහන් කරනු ලැබ ඇති වැඩ කටයුතු හා සම්බන්ධ සැලසුම් සමාලෝචන කටයුතු වල ද නිරත වන ලදි : ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි පියවර, කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය, දේශගුණ විශ්වාසය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (CRIP) යටතේ යටිමහන ජලාශය, වී ඔය ජලාශය හා කැළණි ගඟ ලවණතා බාධකය, අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීම් හා බල ශක්තිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය, ඔරුගොඩවත්ත සිට කඩුවෙල දක්වා සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ප්‍රධාන නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම, කොළඹ දිස්ත්‍රික්කයට උතුරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය (පැකේජ 1, 2 හා 3), මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය, අලුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, පොතුහැර, පොල්ගහවෙල හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතිය, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය, හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය, හම්බේගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමය, හා කිරම කටුවන ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මුළු පිරිවැය ඇස්තමේන්තු හා ව්‍යාපෘති අගැයීම් කමිටුවේ වාර්තා සමාලෝචනයට බඳුන් කිරීම.

ප්‍රසම්පාදන වැඩ කටයුතු වශයෙන් ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය - 01 වැනි පියවර - පැකේජ අංක 1 හා 11 සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු වලට අංශය සම්බන්ධ විය. ප්‍රලේඛන වැඩ කටයුතු යටතේ එක් නව සම්මත ලංසු තැබීමේ ලේඛනයක් පිළියෙල කරන ලද අතර සම්මත ලංසු තැබීමේ ලේඛනයන් 62 ක සංඛ්‍යාවක් සංශෝධනය කරන ලදි. නිෂ්පාදකයින්ගේ පූර්ව සුදුසුකම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය තුළ මෘදු යකඩ නල නිෂ්පාදකයින්ගේ ද්වි වාර්ෂික විගණන වාර්තා අගැයීමට භාජනය කිරීම හා මෘදු යකඩ නල නිෂ්පාදකයින් දෙදෙනෙකු අගැයීමට භාජනය කිරීම මෙන්ම මෘදු යකඩ මනු බිල් ආවරණ නිෂ්පාදකයන් 3 දෙනෙකු ද අගැයීමට බඳුන් කිරීමේ කටයුතු 2019 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ප්‍රලේඛන අනු කමිටුව විසින් ද ලංසු තැබීමේ ලේඛනය සමාලෝචනයට භාජනය කොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ පවතිනු ලබන ප්‍රසම්පාදන ගැටළු නිරාකරණය කිරීම සඳහා පවත්වන ලද සම්මත ලංසු ලේඛන සමාලෝචන කමිටුවේ ලේකම් මණ්ඩලය ලෙස ද වැඩ කටයුතු කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ප්‍රමාණ පත්‍රයන් 175 ක සංඛ්‍යාවක් ද, ඉංජිනේරු ඇස්තමේන්තු 22 ක සංඛ්‍යාවක් හා 2019 වර්ෂය වෙනුවෙන් වූ ජල සම්පාදනය හා මළ අපවහනය සඳහා වූ වාර්ෂික ගාස්තු ප්‍රමාණ පොත ද පිළියෙල කරන ලදි. ඊට අමතර ලෙස විචලනයන් 04 ක සංඛ්‍යාවක් ද, එක් පිරිවැය යෝජනාවක් හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අදාල පිරිවැය පැහැදිලි කිරීම් 05 ක සංඛ්‍යාවක් ද වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරන ලදි. තවද ඇස්තමේන්තු පිළියෙල කිරීම හා CESMM 3 වෙනුවෙන් වූ පුහුණු වැඩ සටහන් 08 ක සංඛ්‍යාවක් මෙහෙයවන ලද අතර ප්‍රමාණ සමීක්ෂණ අංශය විසින් පවත්වන ලද මිළ ගණන් ප්‍රමන්ත්‍රණයන්ටද සහභාගී වන ලදි.

# ක්‍රියාත්මක වන මලාපවහන යෝජනා ක්‍රම.

| පලාත | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 01 |
| නැගෙනහිර | 00 |
| උතුරු මැද | 00 |
| වයඹ | 01 |
| උතුරු | 00 |
| සබරගමුව | 00 |
| දකුණු | 01 |
| ඌව | 01 |
| බටහිර මධ්‍යම | 07 |
| බටහිර උතුර | 03 |
| බටහිර දකුණ | 01 |
| **එකතුව** | **15***|

* කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපවහන යෝජනා ක්‍රමය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම ද මීට ඇතුලත්ව ඇත.



## ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මලාපවහන ව්‍යාපෘතීන්.

**නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන මලාපවහන ව්‍යාපෘතීන් විසින් අත් කර ගනු ලැබ ඇති සාර්ථකත්වයන්.**

**2019 වර්ෂය තුළදී විදේශීය අරමුදලින් ඉදි කෙරෙමින් පැවැති / වැඩි වර්ධනය කෙරෙමින් පැවැති ස්ථානයන් දැක්වෙන සිතියම.**

| | ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ඒජන්සිය |
|---|---|---|
| 01. | රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2 | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| 02. | මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපාරය | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| 03. | මහ කොළඹ ප්‍රදේශය තුළ මලාපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම සඳහා වූ සම්පාදනය පදනම් වූ ආධාර මත වූ ගෝලීය සහයෝගිතා ව්‍යාපෘතිය | ලෝක බැංකුව |
| 04. | නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |



## විදේශීය අරමුදල් යටතේ වූ මලාපවහන ව්‍යාපෘතීන්.

### 1) රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2

රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2 සැලසුම් කරනු ලැබ ඇත්තේ රත්මලාන හා මොරටුව ප්‍රදේශය තුළ දැනට ක්‍රියාත්මක වන ආවරණය වැඩි කිරීම සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා රැස් කිරීමේ ජාලය විස්තීර්ණ කිරීමේ පරමාර්ථය ඇතිව වේ. නව පොම්ප කිරීමේ ස්ථානයන් හා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා පොම්ප කිරීමේ ස්ථානයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ කටයුතු ද ඇතුලත් නව රැස් කිරීමේ ජාලයක් ඉදි කිරීම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වේ. ව්‍යාපෘතිය දැනට සැලසුම් කරනු ලබන අවස්ථාවේ පවතී. ව්‍යාපෘතිය වෙනුවෙන් වූ යාවත්කාල පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 16,073 ක් වන අතර 2050 වර්ෂය වන විට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 170890 ක් වේ. 2019 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 2.29% ක් හා 1.40% ක් වේ. ශ්‍රී ලංකා ජන රජය හා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය අතර ණය පහසුකම් ගිවිසුම 2019 පෙබරවාරි 18 වැනි දින අත්සන් තබන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉංජිනේරුවන් විසින් සැලසුම් කරන ලද ප්‍රථම මහා පරිමාණ මළ අපවහන ව්‍යාපෘතිය මෙය වන අතර ඒ මගින් අනාගතයේදී විදේශීය උපදේශක වරුන් බඳවා ගැනීමෙන් තොරව මෙවැනි සැලසුම් අභ්‍යන්තරික වශයෙන් සම්පාදනය කිරීමේ සමත් කම් ඇති තරුණ ඉංජිනේරු කණ්ඩායමක් බිහි කර ගැනීමේ හැකියාව අප සතු වනු ඇත.

මහජනතාව හා ඉඩම් හිමියන් කෙරෙන් පැන නැගුන විරෝධතාවයන් හේතුකොට ගෙන ඉඩම් අත් පත් කර ගැනීමේදී ඇති වූ ප්‍රමාදයන් පාංශු විමර්ෂණ වැඩ කටයුතු කෙරෙහි බල පා තිබේ.

### 2). මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.



අවසාදන ටැංකිය

මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සතුව හෙක්ටෙයාර 733 ක මුළු ආවරණයක් ඇති අතර 2030 වර්ෂය වන විට ඒ මගින් සේවා ලබන ජන ගහණයේ සංඛ්‍යාව 55,000 ක් වනු ඇත. මහනුවර වැව තුළ ද, මහවැලි නදිය තුළ හා මහනුවර නගරය තුළ ගලා බස්නා ඇල දොළ තුළ ද ඇති ජලයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වන අතර ඉන් පසුව ඒ මගින් අධික ජන ගහණයකින් යුත් ප්‍රදේශයන් තුළ සනීපාරක්ෂණ තත්ත්වයන් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව ව්‍යාපෘතිය විසින් අපජලය රැස් කිරීමේ පද්ධතියක් ද, දිනකට ජලය ඝණ මීටර 14000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා අපවාහ බැහැර කිරීමේ පද්ධතියක් ද ඉදි කිරීමට නියමිතව ඇති අතර ඊට අමතර වශයෙන් නිවෙස් වෙත සම්බන්ධතාවයන් ලබා දීමට හා ඉන් අනතුරුව අඩු ආදායම් ප්‍රදේශයන් තුළ සනීපාරක්ෂණ පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමට ද සැලසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන ප්‍රධාන ඒජන්සිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) වන අතර මුළු ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් රුපියල් බිලියන 22.6 ක් වේ. 2019 වර්ෂයේ දෙසැම්බර මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය 54% ක් වන අතර භෞතික ප්‍රගතිය 73% ක් විය. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සේවයෙහි යෙදවීමේ පරීක්ෂණ 2019 නොවැම්බර් මස අවසාන භාගය තුළ ආරම්භ කරන ලදි.

අහිතකර කාල ගුණය හා කඳු සහිත භූමිය වැනි සාමාන්‍ය ගැටළු කිහිපයක් හේතුකොට ගෙන වැඩ කටයුතු වල ප්‍රමාදයක් සිදු විය. කෙසේ වුව ද ප්‍රමුඛතා කලාපය තුළ ව්‍යාපෘතිය සේවයේ යෙදවීම 2020 අප්‍රේල් ආරම්භයේදී සිදු කිරීමට නියමිතව ඇති අතර 2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘති වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.

### 3) මහ කොළඹ ප්‍රදේශය තුළ මලාපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම සඳහා වූ ප්‍රතිදානයන් මත පදනම් වූ ආධාර සම්බන්ධ ගෝලීය හවුල (GPOBA) ලෝක බැංකුව විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘතිය.

ප්‍රතිදානයන් මත පදනම් වූ ආධාර සම්බන්ධ ගෝලීය හවුල (GPOBA) ව්‍යාපෘතිය ලෝක බැංකුව, ශ්‍රී ලංකා ජන රජය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ප්‍රතිලාභීන් විසින් අරමුදල් සපයනු ලබන නියමු ව්‍යාපෘතියක් වේ. මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වන්නේ වර්ග 5 ක ප්‍රතිදානයන් යටතේ නියමු ප්‍රතිදාන මත පදනම් වූ ප්‍රවේශය ඵල දායක යාන්ත්‍රනයක් සේ යොදා ගනිමින් මලාපවහන සම්බන්ධතාවයන් / සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් දිළිඳු ගෘහස්තයන් වෙත සැපයීම මගින් ප්‍රතිදානයන් මත පදනම් වූ ප්‍රවේශයක් හරහා වැඩි දියුණු වූ සනීපාරක්ෂණ පද්ධතීන් හා සේවාවන් ලබන අඩු ආදායම් ගෘහස්තයන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම වන්නේය. ගෘහස්තයන් 8345 ක සංඛ්‍යාවක් (41725 ක ජන ගහණයක්) වෙත ප්‍රතිලාභ ලබා දෙමින් මෙම ව්‍යාපෘතියේ භෞතික වැඩ කටයුතු 2019.03.31 වැනි දින සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ වෙනුවෙන් වැය කරන ලද මුදල ඇමෙරිකානු ඩොලර් 4,894,840.00 ක් විය. එම මුදල් ප්‍රමාණය විදේශීය ප්‍රදානයන්ගෙන් 96% කට වඩා වැඩි වේ. සැලසුම් කටයුතු හා ඉදි කිරීම් අධීක්ෂණ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ ප්‍රධාන කොන්ත්‍රාත්තු 7 ක සංඛ්‍යාවක් මගිනි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුකොට ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ප්‍රදේශය තුළ සැලකිය යුතු පාරිසරික වැඩි දියුණු තත්ත්වයක් සාක්ෂාත් කර ගත හැකි විය. ප්‍රදේශය තුළ තිබෙන්නා වූ ජලාශයන්හි ජලයේ ගුණාත්ම භාවය වැඩි දියුණු වූ අතර අපජල කළමනාකරණයට හා සනීපාරක්ෂණයට අදාල සමාජ ගැටළු වලට විසඳුම් ලැබිණි. මදුරුවන් බෝ වන ස්ථාන සංඛ්‍යාත්මක වශයෙන් අඩු වූ අතර සාමාන්‍යයෙන් ගත් කළ ව්‍යාපෘති ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය තත්ත්වයෙහි වැඩි දියුණුවක් දක්නට ලැබිණි.



**ලුනාව සමුද්‍ර ශක්ති නිවාස යෝජනා ක්‍රමය තුළ ක්‍රියාත්මක වන විමධ්‍යගත අපජල ප්‍රතිකාර කිරීම් හා බැහැර කිරීම් ක්‍රමය (DEWTS)**

### 4. නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන (SHIFT) ව්‍යාපෘතිය

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන (SHIFT) ව්‍යාපෘතිය විසින් මීගමුව, ගාල්ල - උනවටුන හා කැළණිය - පෑලියගොඩ නම් වූ දකුණු හා බටහිර වෙරළ කලාපයන් තුළ ජීවත් වන 200000 ක් වූ ජන සංඛ්‍යාවක් වෙත අපජල බැහැර කිරීම සඳහා වූ යටිතල පහසුකම් සම්පාදනය කර දීම ඉලක්ක කරනු ලබයි. නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන (SHIFT) ව්‍යාපෘතියේ පළමු වැනි අදියර තුළට ඇතුලත් වන්නේ මීගමුව නගරය වෙත අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම ද, ගාල්ල - උනවටුන කැළණිය - පෑලියගොඩ කලාපයන් වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයන් කිරීම හා සවිස්තරාත්මක සැලැසුම් සකස් කිරීම හා ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන අඩු ආදායම් ලාභී පුද්ගලයින් වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම සඳහා දිළිඳු අරමුදලක් පිහිටුවීම ද වේ. ඊට අමතර වශයෙන් ජල හා සනීපාරක්ෂණ අංශයේ ආයතනික රාමුව නංවා ලීම සඳහා ද, එහි තිරසාර මූල්‍යකරණය සහතික කිරීම සඳහා සහ මළ අපවහන කළමනාකරණ කුසලතාවයන් සංවර්ධනය කිරීම් සැලැසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ද අවශ්‍ය නිර්දේශයන් ලබා දීම සඳහා ව්‍යාපෘතිය විසින් තාක්ෂණික සහාය වැඩ සටහනක් දියත් කරනු ලබනවා ඇත. නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන (SHIFT) ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රංශ සංවර්ධන ඒජන්සිය මගින් ලබාගෙන ඇති අතර තාක්ෂණික සහාය සහභාගය සඳහා අරමුදල් සපයනු ලබන්නේ ප්‍රංශ සංවර්ධන ඒජන්සිය හරහා යුරෝපීය සංගමය විසිනි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 21,540 ක් වනු ඇත. සැලැසුම් හා අධීක්ෂණ උපදේශක සේවාව (DSC) විසින් කලාපයන් තුනම වෙනුවෙන් වූ සාධ්‍යතා අධ්‍යයන වාර්තාව හා මීගමුව වෙනුවෙන් වූ මූලික සැලැසුම් කෙටුම් පත ඉදිරිපත් කරනු ලැබ ඇත. මීගමුව වෙනුවෙන් වූ සවිස්තරාත්මක සැලැසුම පිළියෙල කරනු ලබමින් පවතී. 2019 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් 4.1 භෞතික ප්‍රගතියක් හා 2.8% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත.




විවෘත කිරීමේ උත්සවය

## ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය - (මළ අපවහන)

කල්මුනෙයි, එරාවූර් හා පොලොන්නරුව නම් වූ නාගරික ප්‍රදේශයන් සඳහා නල මාර්ග අපජල යටිතල පහසුකම් සම්පාදනය කර දීම වෙනුවෙන් ඒ වන විටත් ගත වූ වසර තුළදී පිළියෙල කිරීම ආරම්භ කරනු ලැබ තිබි සාධ්‍යතා අධ්‍යයනයන් 2019 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම පිළියෙල කොට නිම කරන ලදි. ව්‍යාපෘති අගැයීම් අංශයේ හා මණ්ඩලයේ අනුමැතීන් ලබා ගන්නා ලද අතර ව්‍යාපෘති යෝජනාවන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යංශය මගින් එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. වෙරළ තීරය තුළ පිහිටා ඇති කළුතර සහ අළුත්ගම / බේරුවල නාගරික ප්‍රදේශයන් වෙත නල මාර්ග අපජල යටිතල පහසුකම් සම්පාදනය කර දීම හා සම්බන්ධ නව සාධ්‍යතා අධ්‍යයනයන් සිදු කරනු ලබමින් පවතී. තවද ව්‍යාපෘති ප්‍රදේශය තුළ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමත් සමග වත්තල, කඩුවෙල හා ත්‍රිකුණාමලය වෙනුවෙන් වූ සාධ්‍යතා අධ්‍යයනයන් පැවැත්වීම සඳහා වූ පූර්ව සාධ්‍යතා අධ්‍යයනයන් මේ වන විට ආරම්භ කරනු ලැබ ඇත. ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය (මළ අපවහන) විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී මහා නගර අමාත්‍යාංශයේ ක්‍රමෝපායික නගර සංවර්ධන වැඩ සටහන යටතේ ආරම්භ කරන ලද අනුරාධපුර නගරය තුළ අපජල කළමනාකරණය පිළිබඳව ප්‍රංශ සංවර්ධන ඒජන්සිය විසින් සපයන ලද අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද සාධ්‍යතා අධ්‍යයනයේ අධීක්ෂණ කටයුතු ද සිදු කරන ලදි. ලෝක බැංකුව විසින් මූල්‍යකරණය කරනු ලබන බදුල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් වූ සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය (SEP) සඳහා වූ ක්‍රම සම්පාදන හා සැලැසුම් කටයුතු මෙම වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) යටතේ වූ සාධ්‍යතා අධ්‍යයනය සිදු කරනු ලැබීම සඳහා අවශ්‍ය යොමු නියමයන් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති (STP) ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වෙනුවෙන් වූ ක්‍රම සම්පාදන හා සැලැසුම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබමින් තිබුණ අතර ඒ යටතේ මොනරාගල, මොණරාගල හා ගොඩකවෙල් ප්‍රාදේශීය සභාවන් සඳහා යාන්ත්‍රිකකරණය කරන ලද පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් (STP) සැලැසුම් කරන ලදි. තවද, (නුවරඑලිය දිස්ත්‍රික්කයේ) තලවකැලේ, බදුල්ල, බණ්ඩාරවෙල, ඇල්ල හා හැටන් යන ප්‍රාදේශීය සභාවන් වෙනුවෙන් ද යාන්ත්‍රිකකරණය කරන ලද පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් (STP) සැලැසුම් කිරීම ආරම්භ කරන ලදි.

දැනට ක්‍රියාත්මක වන ගල්කිස්ස මළ අපවහන පොම්ප කිරීමේ ස්ථානය තුළ පිහිටි පූතික බාන ස්ථානය සඳහා රළු වැලි කැට ඉවත් කිරීමේ ක්‍රමයක් සැලැසුම් කිරීම හා සොයිසාපුර අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනුවෙන් දුර්ගන්ධය පාලනය කිරීමේ ක්‍රමයක් ද, සියුම් තිර සඳහා ඔසොවි වැඩ පිළිවෙලක් හා සියුම් හා රළු තිර සඳහා ආවරණයක් ද සැලැසුම් කිරීමේ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරන ලදි. මහරගම අපේක්ෂා ආරෝග්‍ය ශාලාවේ අයඩින් චිකිත්සා වාට්ටු හා සම්බන්ධ අපජලය ප්‍රමාද වීමේ ක්‍රියාවලියේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය හා පරමාණුක බල ශක්ති නියාමක කොමිසම හා සම්බන්ධීකරණයෙන් යුක්තව ප්‍රමාද ටැංකි සැලැසුම් කිරීම හා වින්‍යාස රූප සටහන් පිළියෙල කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

පෙළ ගස්වනු ලැබ ඇති ප්‍රධාන මළ අපවහන ව්‍යාපෘතීන් සඳහා වූ ප්‍රලේඛන පිළියෙල කිරීමේ කටයුතු, ටෙන්ඩර් කැඳවීමේ ලිය කියවිලි පිළියෙල කිරීමේ කටයුතු හා පාරිසරික බල පෑම් තක්සේරු හා මූලික පාරිසරික පරීක්ෂණයන්ට අදාල අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීම ක්‍රම සම්පාදන හා සැලැසුම් කිරීමේ මළ (අපවහන) අංශය විසින් සිදු කරනු ලැබ ඇති අතර මෙම ක්‍රියාකාරකම් යටතේ මෙම අංශය විසින් දෙහිවල - ගල්කිස්ස, හලාවත - පුත්තලම හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල බැහැර කිරීම් ව්‍යාපෘතීන් හා අදාල පාරිසරික බල පෑම් තක්සේරු අධ්‍යයනයන් 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබිණි.

පෙළ ගස්වනු ලැබ ඇති අපජල කළමනාකරන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු යටතේ දෙහිවල - ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාතර, හලාවත - පුත්තලම, බදුල්ල, ගම්පහ, අළුත්ගම / බේරුවල, කළුතර, පොලොන්නරුව, කාත්තන්කුඩි, මඩකලපුව, කල්මුනෙයි හා එරාවූර් යන ප්‍රදේශයන් තුළ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා පොම්ප කිරීමේ ස්ථානයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමේ හා අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

## අපේක්ෂා කරනු ලබන ප්‍රධාන කාර්ය සාධනය

### 2019 හා 2020 කාල සීමාව සඳහා ප්‍රධාන කාර්ය සාධනය

#### ජල සම්පාදන හා මලාපවහන ආවරණය

| | සැබෑ කාර්ය සාධනය 2018 | 2019 | ප්‍රක්ෂේපිත කාර්ය සාධනය 2020 |
|---|---|---|---|
| ජන ගහණය (තක්සේරු කරන ලද) | 21,670,000 | 21,886,700 | 2,2105,567 |
| නල මාර්ග ජල සම්පාදන ආවරණය (ජන ගහණය) | 10,943,950 | 11,337,311 | 12,162,465 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන සම්බන්ධතා මගින් කරනු ලබන නල මාර්ග ජල සම්පාදන ආවරණය (%) | 40.1 | 41.5 | 44.8 |
| ජල සම්පාදන සම්බන්ධතා මගින් කරනු ලබන සමස්ත නල මාර්ග ජල සම්පාදන ආවරණය (%) | 50.5 | 51.8 | 55.0 |
| නල මාර්ග මලාපවහන ආවරණය (ජන ගහණය) | 447,503 | 453,055 | 496,669 |
| නල මාර්ග මලාපවහන ආවරණය (%) | 2.06 | 2.07 | 2.25 |

#### ආරක්ෂිත ජල ආවරණය වෙත අපේක්ෂිත ප්‍රවේශනය (%)

| | සැබෑ 2018 | 2019 | ප්‍රක්ෂේපිත % 2020 |
|---|---|---|---|
| මුළු නල මාර්ග ජල සම්පාදනය | 50.5 | 51.8 | 55.0 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කරනු ලබන නල මාර්ග ජල සම්පාදනය | 40.1 | 41.5 | 44.8 |
| සාරන ලද ආරක්ෂිත ළිං | 36.4 | 36.4 | 36.4 |
| නල ළිං / අත් පොම්ප | 3.2 | 3.2 | 3.2 |
| වැසි ජලය රැස් කිරීම හා වෙනත් | 0.5 | 0.5 | 0.5 |
| ආරක්ෂිත ජලය ලබා ගැනීමේ සමස්ත හැකියාව | 90.6 | 91.9 | 95.1 |

## තිරසාර භාවය හා හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එදිනෙදා ක්‍රියාකාරකම් සියල්ලක්ම ස්වභාවයෙන්ම "සියළු දෙනාම වෙනුවෙන් ජලය සුලභව තිබෙන බව හා එය තිරසාර ලෙස කළමනාකරණය කරන බව සහතික කිරීම" නම් වූ අංක 6 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි දිශානත වී ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සමග ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්හි සිට තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙත පරිනාමණය වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එවකට ක්‍රියාත්මක වූ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ මග පෙන්වීම යටතේ ඉලක්ක අංක 6.1, එනම් සියළු දෙනා වෙනුවෙන්ම දැරිය හැකි මිළකට ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ සර්ව සාධාරණ හැකියාව ලබා දීම සාක්ෂාත් කර ගැනීම හා ඉලක්ක අංක 6.2, එනම් 2030 වර්ෂය වන විට කාන්තාවන්, ගැහැණු දරුවන් හා අවදානම් තත්ත්වයන්හි සිටින අයවළුන් වෙත විශේෂ අවධානය යොමු කරමින් විවෘත මල පහ කිරීම අවසන් කරමින් සියළු දෙනා විසින්ම සාධාරණ පරිදි සනීපාරක්ෂණය හා ස්වස්ථතාව ලබා ගැනීමේ හැකියාව ලබා දීම සාක්ෂාත් කර ගැනීම යන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම නම් වූ ඉලක්කයන්ට අදාලව දිනාගනු ලබන ජයග්‍රහණයන් පසු විපරම් කිරීම හා වාර්තා කිරීම පිණිස අවශ්‍ය ජාතික මට්ටමේ දර්ශකයන් හා ඉලක්කයන් සංවර්ධනය කිරීමෙහි යෙදී සිටින ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිලියෙල කරනු ලැබ ඇති සංස්ථාපිත ක්‍රියාත්මක සැලැසුම් සියල්ලක්ම අදාල තිරසාර සංවර්ධන ඉලක්කය කෙරෙහි දිශානත වී ඇත. එසේම එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් වරයා විසින් පත් කරන ලද කමිටුවක් විසින් පාද රේඛාව හා ඉලක්කයන් පිහිටුවීමේ වැඩ කටයුතු වල නිරත වන ලදි. මෙම විශේෂ කමිටුව විසින් නිර්දේශ කරන ලද අභිමතාර්ථයන් හා ඉලක්කයන් 2019 ජුනි මාසය තුළදී පරදු ධාරීන් විසින් සම්පූර්ණයෙන් අවසන් කොට වලංගු බවට පත් කරන ලදි. අදාල ක්‍රියාකාරකම් අනාගතය තුළදී පිළියෙල කරනු ලබන මෙහෙයුම් හා සංවර්ධන සැලැසුම් තුළට අන්තර්ගත කිරීමට හා එම සැලැසුම් තුළ පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය අය වැය වෙන් කිරීම් කිරීමට ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඛන්ඩ ලෙස අවශ්‍ය කටයුතු කරනු ලබමින් පවතී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළදී මෙම පරමාර්ථය වෙනුවෙන් දත්ත රැස්කිරීම සඳහා අවශ්‍ය ප්‍රශ්නාවලිය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යංශයේ නායකත්වය හා මග පෙන්වීම යටතේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා වට කිහිපයක් ද පවත්වන්නට යෙදුනි.

2019 වර්ෂය තුළදී ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අදාල රාජ්‍ය ආයතන සමග එක් වී තිරසාර භාවය හා හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම හා සම්බන්ධ වැඩ කටයුතු වල දිගින් දිගටම නිරත වන ලද අතර රාජ්‍ය ආයතන විසින් මෙහෙයවන්නට යෙදුන වැඩ මුළු කිහිපයකට ද සිය දායකත්වය ලබා දෙන ලද අතර එම වැඩ මුළු වල විස්තර මෙහි පහත සඳහන් වේ :

i. ශ්‍රී ලංකා ජාතික ස්වේච්ඡා සමාලෝචනය වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ශ්‍රවනාගාරයේදී 2018.04.24 වැනි දින පවත්වන ලද ජාතික බහු පරදු ධාරී උපදේශක වැඩමුළුව

ii. නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවනාගාරය තුළදී පවත්වන්නට යෙදුන නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් 2018.04.26 වැනි දින මෙහෙයවන ලද අංක 6 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය පසු විපරම් කිරීම පිළිබඳ වැඩ මුළුව.

iii. නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවනාගාරය තුළදී 2018. 10. 23 වැනි දින පවත්වන්නට යෙදුන තිරසාර සංවර්ධන ඉලක්ක 6, ඉලක්කය 6.1 - ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබීමට නියමිත ගෘහස්ත සමීක්ෂණය සඳහා අවශ්‍ය ජල ගුණාත්ම පරීක්ෂණ

iv. 2018.08.17 වැනි දින නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේදී පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 දර්ශක කමිටු රැස්වීම.

v. 2018.03.28 වැනි දින එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේදී ප්‍රධාන පරදු ධාරීන් සමග පවත්වන්නට යෙදුන ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය ශක්තිමත් කිරීම - තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට සඳහා ඇති සූදානම පිළිබඳ රැස්වීම

vi. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6.1 හා අංක 6.2 සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ සුරක්ෂිත ලෙස කළමනාකරණය කරන ලද ජලය හා සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වන ගෝලීය පසු විපරම් ක්‍රමය පිළිබඳව එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවණාගාරයේදී 2019.05.28 වැනි දින පවත්වන ලද ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ඒකාබද්ධ පසු විපරම් වැඩ සටහන විසින් මෙහෙයවන ලද අන්තර්ජාල සම්මන්ත්‍රණය (webinar)

vii. එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවණාගාරයේදී 2019.06.26 වැනි දින පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 ඉලක්කයන් - ජල හා සනීපාරක්ෂණ අංශයන් තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ඉලක්කයන් සම්පාදනය කිරීම සම්බන්ධයෙන් වූ වැඩ මුළුව

viii. 2019.07.23 වැනි දින වෝටර්ස් එජ් හෝටලයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ඒකාබද්ධ පසු විපරම් වැඩ සටහන සහාය කර ගනිමින් පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 හා අදාල දර්ශකයන් පිළිබඳ වැඩ මුළුව

ix. 2019.09.20 වැනි දින මොවන්පික් හෝටලයේදී පවත්වන ලද අමාත්‍යංශයන්, රාජ්‍ය දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත සංවිධානයන් වෙනුවෙන් තිරසාර සංවර්ධන ඉලක්ක මුඛ්‍ය ධාරාව කර ගත් මහජන සේවාවක් ලබා දීම සූදානම් කිරීම පිළිබඳව හා තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සම්බන්ධයෙන් වූ උපදෙස් දීමේ වැඩ මුළුව

ශ්‍රී ලංකා ජන රජයේ මානව හිමිකම් මෙහෙයුම් සැලැසුම හා අනුගත වෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2018 වර්ෂය තුළදී "හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුමක්" ද සංවර්ධනය කරන ලද අතර හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම සැලැසුම් කරනු ලැබ ඇත්තේ ජල සම්පාදන පද්ධතීන් තුළ පැන නැගිය හැකි විවිධ හදිසි අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස මෙන්ම සිය ගණුදෙනු කරුවන් වෙත හා සාමාන්‍ය මහ ජනතාව වෙත සපයනු ලබන ප්‍රාමාණික ජල සම්පාදන සේවාවන් හදිසි අවස්ථා තත්වයක් තුළදී අඩාල වීම අවම කිරීම හා එවැනි තත්ත්වයක් යටතේ පොදු ජන සෞඛ්‍ය ආරක්ෂාව හා සුරක්ෂිත භාවය ලබා දීම සම්බන්ධයෙන් මෙහෙයුම් කරුවන් වෙත හා පරිපාලනය වෙත දෙනු ලබන අත් වැලක් වශයෙන් ද වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළදී ද මෙම හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම වරින් වර යාවත්කාලීන කිරීමට ද පියවර ගන්නා ලද්දේය. අළුතින් ඇති වන අදාල තත්ත්වයන් සැලැකිල්ලට භාජනය කරමින් පානීය ජල ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම ද 2019 වර්ෂය තුළදී ද දිගින් දිගටම සිදු කරන ලදි.

# වාර්ෂික වාර්තාව - 2019

## විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

**"විගණන හා කළමනාකරණ කමිටුවේ සෑම නිර්දේශයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඇතැම් කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළදී වැඩි දුරටත් සාකච්ඡාවට භාජනය කරන ලදී."**



අංක 590 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ අංක 2965 (බී) දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය ලබා ගනිමින් අංක PF/PE/3 හා 1999 නොවැම්බර් 19 වැනි දින දරන චක්‍ර ලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලදි.

විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ගැනීමේ පරමාර්ථය වන්නේ 2010/12/14 දාතම දරණ PED 55 හි අන්තර්ගත මග පෙන්වීම් අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දීම වේ.

කමිටුව සඳහා නියම කරනු ලැබ ඇති භූමිකාවන් හා වග කීම් පහත සඳහන් පරිදි ගෙන හැර දක්වනු ලැබ ඇත:

- අභ්‍යන්තර විගණක වරුන්ගේ අඛන්ඩ අපක්ෂපාතී භාවය හා කාර්ය සාධකත්වය සමාලෝචනයට භාජනය කිරීම විගණන හා කළමනාකරණ කමිටුව වෙතින් අපේක්ෂා කරනු ලැබේ.
- මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතීන්ට හා වෙනත් අදාල කර ගත හැකි නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස සිදු කරනු ලබන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය අභිප්‍රේක්ෂණ කර්තව්‍යයන් කිරීම පිණිස විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දිය යුතු වේ.
- රජය විසින් පණවනු ලැබ ඇති හා නිකුත් කරනු ලැබ ඇති සියළුම අදාල රීති, රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල ලෙස කටයුතු සිදු කරනු ලබන බවට වග බලා ගැනීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව විසින් අඛන්ඩ ලෙස සමාලෝචනයෙහි හා පසු විපරමෙහි යෙදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු අතර ඊට අමතරව අනනුකූලතාවයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.
- විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තාවන්, කළමනාකරණ පත්‍රිකා හා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යවසායයන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන් සමාලෝචනයට භාජනය කොට ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු වන්නේය.
- විගණන හා කළමනාකරණ කමිටුව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම පිණිස සිය සහාය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතු වන්නේය.

### 2019 වර්ෂය තුළදී කමිටුව පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය :

| | | | |
|---|---|---|---|
| 1. | ජේ. එම්. යූ. පී. ජයමහ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කමිටුවේ සභාපති |
| | පී.කේ.ඒ.ඩී ද සිල්වා මහත්මිය | | |
| 2. | ශාන්ත රත්නායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 3. | කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | ඩී. යූ. සුමනසේකර මහතා | - | සාමාන්‍යාධිකාරී |
| | ආර්.එච්. රුවිනිස් මහතා | | |
| 5. | ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා | - | අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| 6. | ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා | - | අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ) |
| 7. | කේ.ජේ.වී.ඒ. පෙරේරා මහතා | - | අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා) |
| | සී.සී.එච්.එස්. ප්‍රනාන්දු මහතා | - | වැඩබලන අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා) |
| 8. | ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |
| | ඒ. ශ්‍රියාලතා මහත්මිය | - | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |
| 9. | එම්. එච්. එම්.සල්මන් මහතා | - | උප සභාපති |
| 10. | ඩී. එන්. පීරිස් මෙනෙවිය | - | විගණන අධිකාරී - රජයේ විගණන ඒකකය |
| 11. | එස්. ඩබ්ලිව්. ගුණවර්ධන මෙනෙවිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>නාගරික සංවර්ධන, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 12. | ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් |

විගණන හා කළමනාකරණ කමිටුව මෙම ප්‍රස්තුත වර්ෂය තුළදී තුන් වතාවක් රැස් වූ අතර න්‍යාය පත්‍ර මාතෘකාවන් යටතේ සාකච්ඡාවට බඳුන් කරන ලද වැදගත් කරුණු මෙහි පහත පෙළ ගස්වනු ලැබ ඇත.

i. 2018.12.31 දිනයෙන් අවසන් වූ වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා 2019 වර්ෂයේ ජූනි මස 30 වැනි දිනට පිළියෙල කරන ලද අර්ධ වාර්ෂික මූල්‍ය ප්‍රකාශණයන් ද කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරන ලදි.

ii. 2019 වර්ෂයේ සමාලෝචනය යටතේ KPI වල කාර්යක්‍ෂම තත්ත්වයේ කිසියම් වැඩි දියුණු තත්ත්වයක් නිරීක්‍ෂණය කරන ලදි.

iii. 2009 ජූනි මාසයේ කළමනාකරණ විගණන චක්‍ර ලේඛය අනුව අනුමත කරන ලද 2019 අභ්‍යන්තර විගණන සැලැස්ම විධි නියෝගයක් වශයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පරීක්‍ෂාකාරී ලෙස කියවා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබීම නිර්දේශ කරන ලදි.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු අතුරින් කමිටු රැස්වීම් කිහිපයක් තුළදී ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම හා ව්‍යාපෘතීන් වෙනුවෙන් වූ කාර්ය සාධනය පසු විපරම් කිරීමේ සැලැසුම නිතර නිතර සාකච්ඡාවට භාජනය කරන ලද අතර එම සාකච්ඡා වටයන්හිදී මතු වූ කරුණු අනුව වඩාත් හොඳ පසු විපරම් ක්‍රමයක් ස්ථාපිත කිරීමේ පරමාර්ථයෙන් ව්‍යාපෘති හා සම්බන්ධ තොරතුරු සැබෑ කාලය තුළ යාවත්කාලීන ලෙස ලබා ගැනීමේ ක්‍රමයක් වශයෙන් "උපකරණ පුවරුවක්" (dash board) නිර්මාණය කිරීම යෝජනා කරන ලදි.

iv. 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධිත මූල්‍ය අධිකාරී බලයක් ක්‍රියාත්මක කළ යුතු බවට කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

v. 2018 වර්ෂයේ 3 වැනි හා 4 වැනි කාර්තු වලට අදාල විගණන සාරාංශයන් හා 2017 වර්ෂයේ සිව් වැනි කාර්තුවට හා 2018 වර්ෂයේ පළමු වැනි කාර්තුවට අදාල විගණන සාරාංශයන් සම්බන්ධයෙන් වූ අනුගාමී වැඩ කටයුතු සාකච්ඡාවට භාජනය කරන ලදි.

vi. රජයේ විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීමේ තත්ත්වය තක්සේරු කරන ලද අතර එම ප්‍රතිචාර්යතාව ප්‍රශස්ත මට්ටමට ඔසවා තැබීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි.

vii. පාර්ලිමේන්තුවේ පොදු ව්‍යවසායයන් පිළිබඳ කමිටුවේ (COPE) විධි නියමයන් පිළිබඳව හා 2019 අගෝස්තු 22 වැනි දින පවත්වන ලද පාර්ලිමේන්තුවේ පොදු ව්‍යවසායයන් පිළිබඳ කමිටුවේ (COPE) රැ ස්වීම් වාර්තාව පිළිබඳව ද සාකච්ඡාවට භාජනය කරන ලද අතර පාර්ලිමේන්තුවේ පොදු ව්‍යවසායයන් පිළිබඳ කමිටුව (COPE) විසින් පෙන්වා දෙනු ලැබ ඇති අඩු පාඩු අඩු කිරීම අරමුණු කර ගනිමින් ගත යුතු පිළියම් ක්‍රියා මාර්ගයන් යෝජනා කරන ලදි.

viii. 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිනි.

ix. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස ක්‍රියා කරනු ලැබ ඇත.

කමිටුවේ සියළුම නිර්දේශයන් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතියට හා සම්මත කර ගනු ලැබීමට යටත් විය.

# මූල්‍ය ප්‍රකාශය


77 - 78 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

79 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

80 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

81 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

82 - 101 මූල්‍ය ප්‍රකාශනයන්ට අදාල සටහන්

102 - 119 2019 දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව





Rs

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

මූල්‍ය තත්ව ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**2019 දෙසැම්බර් 31**

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

### අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | අයවැය 2019 රු. | සත්‍ය 2019 රු. | යලිප්‍රකාශිත 2018 රු. |
|---|---|---|---|---|
| අයභාරය (එ.අ.බදු හැර) | 7 | 25,954,703,400 | **26,079,488,608** | 24,806,457,684 |
| විකුණුම් පිරිවැය | 8 | (17,303,602,703) | **(16,614,378,349)** | (15,821,034,600) |
| **දළ ලාභය** | | 8,651,100,697 | **9,465,110,259** | 8,985,423,084 |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ලාභ | 9 | 1,496,778,600 | **1,258,512,779** | 1,061,966,069 |
| පරිපාලන වියදම් | 10 | (12,109,926,297) | **(12,059,061,307)** | (10,969,381,641) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 11 | (671,000,000) | **(764,590,969)** | (906,753,982) |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | | (2,633,047,000) | **(2,100,029,238)** | (1,828,746,471) |
| මූල්‍ය ආදායම් | 12 | 375,600,000 | **1,454,249,803** | 1,574,439,901 |
| මූල්‍ය පිරිවැය | 13 | (4,941,000) | **(465,671,785)** | (262,731,394) |
| **බදු පෙර ලාභය / ( අලාභය)** | | (2,262,388,000) | **(1,111,451,220)** | (517,037,963) |
| **ආදායම් බද්ද (ආර්ථික සේවා ගාස්තු)** | 14 | (166,575,000) | **(65,383,426)** | (63,287,387) |
| **වර්ෂය සඳහා ලාභය/ අලාභය** | | (2,428,963,000) | **(1,176,834,646)** | (580,325,351) |

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

### වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | අයවැය<br>2019<br>රු. | සත්‍ය<br>**2019**<br>රු. | යළිප්‍රකාශිත<br>2018<br>රු. |
|---|---|---|---|
| මාර්ගස්ථ තොග | 1,345,932,727 | (1,345,932,727) | - | - | - |
| වෙනත් අයිතම | 567,238,346 | - | 5,836,777 | - | 573,075,124 |
| PVC වානේ පයිප්ප | 3,995,347,403 | - | 39,266,667 | - | 4,034,614,070 |
| ජලමනු හා පිත්තල අයිතම | 897,566,903 | - | 126,517 | - | 897,693,420 |
| **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන් 20)** | | | | | |
| වෙනත් ණයගැතියෝ | 4,779,721,487 | (5,390,596) | - | - | 4,774,330,891 |
| ණය ගැති එකතු කිරීමේ පාලන ගිණුම | 524,428,698 | - | - | (24,401,183) | 500,027,515 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 259,238,207 | - | - | 83,482,299 | 342,720,505 |
| සේවක අත්තිකාරම් | 13,309,832 | - | - | 18,526,510 | 31,836,342 |
| **තැන්පතු සහ අත්තිකාරම් (සටහන් 21)** | | | | | |
| අත්තිකාරම් | 42,194,242,006 | 1,339,071,727 | (6,346,320) | 41,508,810 | 43,568,476,223 |
| තැන්පතු | 227,368,810 | - | - | 25,706,281 | 253,075,091 |
| **ආයෝජන (සටහන් 22)** | | | | | |
| පරිණතිය තෙක් තබාගන්නා | 12,421,212,748 | 3,715,258 | (804,000) | - | 12,424,124,006 |
| **මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 23)** | | | | | |
| මාර්ගස්ථ මුදල් | 336,043,725 | - | - | 3,398,809 | 339,442,534 |
| **රජයේ ප්‍රදාන (සටහන් 27)** | | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 98,257,467,850 | - | (8,152,221) | 54,522,804 | 98,303,838,433 |
| **ප්‍රාග්ධන ප්‍රදාන (සටහන් 28)** | | | | | |
| විදේශීය ප්‍රදාන | 217,065,024,840 | - | (49,713,078) | 308,894,847 | 217,324,206,609 |
| දේශීය ප්‍රදාන | 1,103,226,173 | - | - | 32,865,627 | 1,136,091,800 |
| **ගෙවිය යුතු ණය (සටහන් 29)** | | | | | |
| දේශීය ණය | 25,004,314,014 | - | - | 20,713,132 | 25,025,027,146 |
| **වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (සටහන් 31)** | | | | | |
| ණයහිමි පාලන ගිණුම | 1,918,128,500 | (2,116,860) | - | 2,551,952 | 1,918,563,592 |
| කොන්ත්‍රාත්තු රඳවාගැනීම් | 7,529,652,312 | - | - | 3,191,309 | 7,532,843,621 |
| වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ | 186,153,298 | - | - | 1,721,237 | 187,874,535 |
| **වෙනත්** | | | | | |
| මෙහෙයුම් නොවන වත්කම් | - | - | - | 149,681,812 | 149,681,812 |
| මෙහෙයුම් නොවන වගකීම් | - | - | - | 72,141,419 | 72,141,419 |

ඩබ්එස්ඩ්/ඒ/එන්ඩබ්එස්ඩීබී/එෆ්ඒ/01/2019 2020 ඔක්තෝම්බර් 09

සභාපති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන ඡේදය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජා.ජ.ස.ජ.ම) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

I. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස ජංගම වත්කම් නියෝජනය කරනු ලබන වෙළඳ ලැබිය යුතු දැ සහ ණයගැති එකතු කිරීම් පාලන ගිණුමෙහි වූ රු.9,772,912 ක බැර ශේෂයක් ගෙවිය යුතු දැට එරෙහිව හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට සමානව ජංගම වගකීම් නියෝජනය කරනු ලබන රඳවාගැනීම් හර ශේෂය වූ රු.1,078,112 ක් ලැබිය යුතු දැට එරෙහිව හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද ප්‍රදාන ලෙස ලැබී තිබුණු පරිගණක මෘදුකාංගවලට අදාළ රු.1,043,784 ක ක්ෂය වීම් සහ විලම්භිත ආදායම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ වෙනම දැක්වීමකින් තොරව එකිනෙකට හිලව් කොට තිබුණි.

II. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) 07 වන ඡේදයට පටහැනිව, ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු .1,361,683 ක් ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර තිබුණි.

III. දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) 51 වන ඡේදයට අනුව, වත්කම්වල ඵලදායී ජීව කාලය අවම වශයෙන් ඒ ඒ ගිණුම් වර්ෂය තුළදී සමාලෝචනය කොට අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තු සමඟ වෙනස් වේ නම් එම වෙනස්කම් ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 අනුව ගිණුම් ගත කළ යුතු ය. කෙසේ වෙතත් මේ වන විටත් භාවිතයට ගැනෙන වටිනාකම රු.1,813,275,339 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොතිබුණි.

IV. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 19) ඡේද අංක 66 හා 144 ට අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් හි වර්තමාන අගය හා අදාල වර්තමාන සේවක පිරිවැය මැනීම සඳහා සත්‍ය උපකල්පන භාවිතා කර ඒවා අනාවරණය කර නොමැති බව විගණනයේදී අනාවරණය විය. තවද, ප්‍රමිතයෙහි 58 වන ඡේදයේ අවශ්‍යතා අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුල විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (පාරිතෝෂික ප්‍රතිපාදන) සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික දීමනා (ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හැර) වශයෙන් ගෙවන ලද රු.578,942,828 කට සමාන වටිනාකමක් වර්ෂයේ වෙන් කිරීම ලෙස හඳුනා ගෙන තිබුණි.

V. රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 8 සිට 12 දක්වා කාලයක් තුළ නොවෙනස්ව පැවති ව්‍යාපෘති 34 කට අදාළව එකතුව රු.මිලියන 14,697.25 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි වූයේ එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති බැවිනි.

VI. විදේශ විනිමය අනුපාතයන් වෙනස්වීමේ බලපෑම පිළිබඳව වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 21) ඡේද අංක 23 (අ) ට පටහැනිව එකතු වටිනාකම එ.ජ.ඩො.84,176,147 ක් වන එ.ජ.ඩො. ස්ථාවර තැන්පතු (පහක) 05 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට වන අනුපාතයන් යොදා ගෙන මණ්ඩලය විසින් පරිවර්තනය කොට නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර තැන්පත් වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 159.09 කින් අවප්‍රමාණය වී තිබුණි. තවද, මූල්‍යමය අයිතමයන් පරිවර්තනය කිරීමෙන් වන අනුපාත වෙනස්වීම් ප්‍රමිතයේ ඡේද අංක 28 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන නොතිබුණි.

VII. ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය රු.337,781,741 ක් වූ අයෝජන දේපළ 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර, ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාල හෝ ක්ෂය කිරීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව්කිරීම් සිදු කර නොතිබුණි.

VIII. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 16 කට අදාළ එකතු වටිනාකම රු.65,852,393 ක් වූ භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින ස්ථාවර වත්කම් දිගු කාලයක් තිස්සේ ස්ථාවර වත්කම් ලෙස පවතින බව 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය කොට තිබුණි. කෙසේ වෙතත්, ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

IX. සමාලෝචිත වර්ෂයේ සඳහා සත්‍ය ආදායම් බදු වියදම හඳුනාගැනීමට සවිස්තර අදායම් බදු ගණනය කිරීමක් සිදු කිරීමකින් තොරව 2017 වර්ෂය තුළ ගෙවන ලද රු.65.383,426 ක ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි.

X. වටිනාකම රු.106,835,381 ක්වූ පිරිපහදු මධ්‍යස්ථානයට, ජලාශයට හා තුළුමුවට විදුලිබලය සැපයීමට සවිකර තිබූ ට්‍රාන්ස්ෆෝමර් තුනක් ජේ.ඩී.බී. (IV) ව්‍යාපෘතිය නිම කිරීම සමඟ මණ්ඩලයට පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම වත්කම් වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානයට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ලෙස දැක්වීමකින් තොරව සංචලන හා අනෙකුත් අත්තිකාරම් ලෙස දක්වා තිබූ අතර ඉහත වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය සඳහා වෙන්කිරීම් ද සිදු කර නොතිබුණි.

XI. අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව මහඔය, සමන්තුරෙ, උහන සහ කොන්ඩුවට්ටුවාන පිරිවැය මධ්‍යස්ථානයන්හි අදාළ එකතු වටිනාකම රු.3,596,600 ක් වන ගොඩනැගිලි ආකෘතීන් සහ පිරියත උපකරණ භාවිතයෙන් ඉවත් කර තිබූ අතර රු.7,088,478 ක් වටිනා ව්‍යුහයන් කඩා දමා තිබුණි. කෙසේ වෙතත් එම වත්කම් අපහරණය සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.212,914 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබුණි.

XII. අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවට අනුව, එකතු වටිනාකම රු.46,361,081 ක වත්කම් භෞතිකව දැක ගත නොහැකි විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රු.946,602 ක ක්ෂය වෙන්කිරීම් සිදු කර තිබුණි.

XIII. ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.1,133,341,195 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති පනස් පහක (55) පිරිවැය ප්‍රාග්ධනීකරණය නොකර 2019 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි. තවද, නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අතරින් කළුතර ප්‍රාදේශිකයට සහ බටහිර මධ්‍යම ප්‍රාදේශිකයට අයත් වටිනාකම රු.12,617,859 ක ව්‍යාපෘති 05 ක් මේ වන විටත් නිම කර තිබුණි. කෙසේ වෙතත් 2020 ජුනි 30 වන විටත් එය අදාල ආදායම් ගිණුමට ගෙන නොතිබුණි.

XIV. 2016, 2017 සහ 2018 වර්ෂවලට අදාළව 2018 සහ 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 117.96 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැක. සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල සිදු කරන ලද එවැනි පෙර වර්ෂයන්ට අදාළ ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | හර කළ වටිනාකම | බැර කළ වටිනාකම | සමුච්චිත ලාභයට අදාළ බලපෑම |
| --- | --- | --- | --- |
| | රු. | රු. | රු. |
| --------- | ------------ | -------------------- | ----------------- |
| 2018 | 8,086,792 | 108,922,950 | 100,836,158 |
| 2017 | 18,821,712 | 140,160,044 | 121,338,332 |
| 2016 | 243,896,877 | 139,680,704 | (104,216,173) |

XV. ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන වටිනාකම රු.198,729,791 ක් වන ශේෂයන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපුම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර දහයකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

XVI. නියැදි විගණන පරීක්ෂාවට අනුව ස්ථාවර තැන්පත් තුනකට (03) අදාළ පොලී ආදායම් ලැබීම් සහ ඊට අදාළව අඩුකරන ලද රඳවා ගැනීම් බදු වටිනාකම් වූ පිළිවෙලින් රු.15,302,077 ක් සහ රු.1,125,718 ක් ගිණුම් ගත කර නොතිබුණි. තවද, වටිනාකම එ.ජ.ඩො. 91,395.37 ක් වන එ.ජ.ඩො. තැන්පත් තුනකට (03) ලැබී තිබූ පොලිය රුපියල් අගයකට පරිවර්තනය කිරීමකින් තොරව ඩොලර් වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. එබැවින් පොලී ආදායම, ලැබිය යුතු රඳවා ගැනීම් බදු සහ බැංකු ශේෂයන් පිළිවෙලින් රු.15,619,025 ක්, රු.780,502 ක් සහ රු.14,838,523 කින් අවප්‍රමාණය වී තිබුණි. තවද, එ.ජ.ඩො. තැන්පතු හතරකට (04) අදාළ රු. මිලියන 137 ක උපචිත පොලී ආදායම් ගිණුම් පොත්වල වාර්තා කොට නොතිබුණි. ඊට අමතරව 2019 නොවැම්බර් 08 සිට 2019 දෙසැම්බර් 08 දක්වා කාලපරිච්ඡේදයට අදාළව වෙනත් තැන්පතුවක් සඳහා ලද පොලී ආදායම වන රු.3,457,862 ක් ගිණුම්ගත කර නොතිබුණි.

XVII. වෙනත් ස්ථාවර තැන්පතුවකට අදාළ උපචිත පොලී ආදායම වන රු.1,130,959 ක් දෙවරක් ගිණුම්ගත කොට තිබුණු අතර තවත් ස්ථාවර තැන්පතුවකට අදාළ රු.352,247 ක උපචිත පොලිය ගිණුම් ගත කොට නොතිබුණි.

XVIII. රු.71,040,247 ක් වන ලංකා බැංකු ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලී ආදායමේ ආරම්භක ශේෂයෙන් රු.49,702,919 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුණි. ඒ හේතුවෙන් ඉතිරිව පවතින ශේෂය වූ රු.21,337,328 ක් සමාලෝචිත වර්ෂයේදී නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

XIX. දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,681,812 ක් හා රු.72,141,419 ක වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වේතන යනාදී පසුගිය වර්ෂයන්හි අවිනිශ්චිත ගිණුමට අයකරන ලද වත්කම් හා වගකීම් ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගිණුම්වලට අයකර තිබූ අතර එම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද රු.95,796,513 ක හඳුනා නොගත් ශේෂයක්ද, රු.5,906,882 ක හඳුනා නොගත් බැංකු ශේෂයක් ද, ඉහත සඳහන් ක්‍රියාකාරී නොවන වත්කම් තුළ විමර්ශනය කිරීමට හා නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව පැවතුණි.

XX. මීට වසර හතරකට පෙර කැලණිය ප්‍රාදේශිකයේ සොරකම් කරන ලද රු. 2,549,787 ක තොග ශේෂයක් 2019 දෙසැම්බර් 31 දිනට වූ තොගයට ඇතුළත් කර තිබුණි. එම අලාභය අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

XXI. වව්නියාව, මඩකලපුව, කළුතර, පානදුර ප්‍රාදේශීය කාර්යාල හා සබරගමුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් ලේඛන හා විගණනයට ඉදිරිපත් කරන ලද අනුරූප උපලේඛන අතර එකතුව රු.105,427,971 ක නිරපේක්ෂ වෙනසක් පැවතීම හේතුවෙන් සින්නක්කර ඉඩම්, සින්නක්කර ගොඩනැගිලි සහ විබෙදුම් යනාදී ස්ථාවර වත්කම් අයිතම තුනක (03) නිරවද්‍යතාවය හා සම්පූර්ණතාවය විගණනයට නිශ්චය කර ගත නොහැකි විය.

XXII. මූල්‍ය ප්‍රකශන වල දක්වා ඇති ශේෂයන් හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණ උපලේඛනයේ සඳහන් ශේෂයන් අතර වෙළඳ ණය ගැතියන්ගේ රු.139,689,087 ක වෙනසක් හා නව සම්බන්ධතා ණයගැතියන්ගේ රු.95,689,900 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් කැලණිය සහ ඌව ප්‍රාදේශිකයේ පිළිවෙලින් රු.264,575,461 ක සහ රු.121,051,407 ක වෙළඳ ණයගැතියන් හැර ඉහත වෙනස්කම් සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

XXIII. වාණිජ අංශ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ අතර මනුගත විකුණුම් සහ තොග විකුණුම් වටිනාකමෙහි සැසඳුම් නොකළ රු. මිලියන 149.49 ක වෙනසක් නිරීක්ෂණය විය.

XXIV. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අදාළ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමේදී මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ සහ වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකම රු.මිලියන 12,243.47 ක වෙනසක් නිරීක්ෂණය විය. මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ ඉහත රු. මිලියන 8,482.62 ක වෙනස අතරින් රු.මිලියන 8,425.68 ක වෙනස සඳහා පමණක් හේතූන් විගණනයට ඉදිරිපත් කෙරුණි. තවද, වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ ගිණුම්ගත කිරීමේ වැරදි හේතුවෙන් සිදුවූ රු. මිලියන

3.760.86 ක වෙනස මණ්ඩලයේ ගිණුම් පොත් තුළ 2020 මාර්තු 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

XXV. සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යාන ව්‍යාපෘති හතරක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂයන් අතර එකතු වටිනාකම රු. මිලියන 431.5 ක වෙනසක් නිරීක්ෂණය විය.

XXVI. බැංකු ගිණුම් හතරක් (04) සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල දක්වා ඇති පිළිවෙලින් රු.20,139,121 ක සහ රු.19,487,118 ක හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

XXVII. පහත දක්වා ඇති එක් එක් අයිතමයන් සඳහා වන සාක්ෂීන් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

| | අයිතමය | වටිනාකම රු. | නොසැපයූ විගණන සාක්ෂි |
|---|---|---|---|
| අ) | නව සම්බන්ධතා ණය ගැතියන් | 156,043,490 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය |
| ආ) | විශේෂ ප්‍රසාද දීමනා සහ උත්සව අත්තිකාරම් | 1,211,506 | විස්තරාත්මක උපලේඛන |
| ඇ) | ආපදා ණය, වාහන ණය හා වෙනත් සේවක ණය | 16,446,209 | විස්තරාත්මක උපලේඛන |
| ඈ) | වෙනත් ණය ගැතියන් | 78,817,838 | විස්තරාත්මක උපලේඛන |
| ඉ) | චලනය නොවන හා සෙමින් චලනය වන තොග | 1,039,566,195 | වයස් විශ්ලේෂණය |
| ඊ) | දේපළ, පිරියත සහ උපකරණ | 53,226,240,081 | ස්ථාවර වත්කම් ලේඛන සහ සත්‍යාපන වාර්තා |
| උ) | වෙළඳ ණය හිමියන් | 68,854,475 | විස්තරාත්මක උපලේඛන |
| ඌ) | වෙනත් ණය හිමියන් | 332,650,903 | විස්තරාත්මක උපලේඛන |
| එ) | බදු වියදම | 65,383,426 | වර්ෂයේ විස්තරාත්මක ආදායම් බදු ගණනය කිරීම. |

ඒ) කල්බදු ණය හිමියෝ 3,190,775 බැංකු සනාථ කිරීම

ඔ) වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත් 13,211,058 විස්තරාත්මක උපලේඛන

XXVIII. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයාගේ අංක පීඊ/ ඩබ්ලිව්එස්/ එන්ඩබ්ලිව්එස්ඩීබී/ පීඊඑන්/ 2015 දරන හා 2015 ජූලි 08 දිනැතිව නිකුත් කළ නියමයන් ප්‍රකාරව හා 2016 පෙබරවාරි 04 දින ගන්නා ලද කැබිනට් තීරණය ප්‍රකාරව, 2014 වර්ෂයෙන් පසුව ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලබාගෙන තිබූ රු.85,106,439,687 ක හිඟ ණය ශේෂය 2015 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ගෙවිය යුතු ණය වශයෙන් රු.59,348,887,214 කට සමාන මුදලක් ප්‍රාග්ධනීත ගත කර තිබුණි. එබැවින් විදේශ ණය ලෙස මණ්ඩලය විසින් ගෙවිය යුතු රු.25,757,552,473 කට සමාන වටිනාකමක් කිසිදු අනුමැතියකින් තොරව රජයේ ස්කන්ධයට මාරු කර තිබුණි.

XXIX. විදේශ මූල්‍යන ව්‍යාපෘති දෙකකට (02) හා දේශීය බැංකු ණය ව්‍යාපෘති තුනකට (03) අදාළව බැංකුවෙන් ලද ශේෂ සනාථ කිරීම් මූල්‍ය ප්‍රකාශ තුළ ඇති ශේෂය සමග සංසන්දනය කිරීමේදී, මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ණය ශේෂය රු.292,455,446 කින් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, බැංකුවෙන් ලද ශේෂ සනාථ කිරීම් සමඟ සන්සන්දනය කිරීමේදී දේශීය මූල්‍යන ව්‍යාපෘති නවයකට (09) අදාළ උපචිත බැංකු ණය පොලිය රු.7,558,250 ක් අධි ප්‍රතිපාදනය කර තිබූ බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම

ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා ඇතුලත්ව හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය හා ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

- තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගණනයට අවශ්‍ය සියලූ තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබා ගෙන

ඇති අතර, මගේ විනිශ්චය මත පෙනී යන පරිදි 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මණ්ඩලය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද වාර්තා පෙර වර්ෂයට අනුකූල වේ.

- 1.2 (II), 1.2 (III), 1.2(IV), 1.2 (V), 1.2 (VI), 1.2 (XII), 1.2 (XVI), 1.2(XX), 1.2(XXV) ඡේදයන් හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවය අනුව පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවය අනුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලින් බැහැරව මණ්ඩලය විසින් එළඹ ඇති ඕනෑම කොන්ත්‍රාත්තුවක් පිළිබඳව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව සඳහන් කිරීමට

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ නියමයට අනුව පහත අවස්ථාවලදී හැර මණ්ඩලය, මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ වන ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට අනුකූල නොවන බව සඳහන් කිරීමට

ප්‍රමාණවත් කරුණුවලට පමණක් සීමා වූ සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් කරුණු මත පදනම්ව කිසිවක් මගේ අවධානයට යොමු වූයේ නැත;

| | නීති/මගපෙන්වීම් ආදියට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ | |
| i. | 2015 අගෝස්තු 12 දිනැති අංක පා/ 12/2015 | විසන්ධි කිරීමෙන් මාස 03 ක් ඇතුළත හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතු වේ. කෙසේ වෙතත්, බිල්පත් වටිනාකම රු.50,000 ඉක්මවන එකතු වටිනාකම රු.481,739,086 ක් වන විසන්ධි කරන ලද ණය ගැතියන් 2089 කට අදාළව හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. | 2018 සැප්තැම්බර් 26 දිනැති අංක පා/09/2018 දරන චක්‍රලේඛයේ ඡේද අංක (02) | වසර පහකට වඩා නිල නිවාසවල පදිංචි සේවකයින්ගේ වැටුපෙන් ආර්ථික කුලිය සහ සියයට 12.5 ක අධිභාරයකට සමාන මාසික කුලියක් අය කළ යුතු වේ. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ (දකුණ) සේවකයින් 17 දෙනෙකුගෙන් ගෙන් රු.2,326,566 ක් සහ 2018 සැප්තැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා මොනරාගල කළමනාකරණ කාර්යාලයේ සේවකයින් 04 දෙනෙකුගෙන් රු.656,732 ක් ඔවුන් වසර පහකට වඩා වැඩි කාලයක් නිල නිවාසවල පදිංචි වී සිටියද දඩ කුලිය (අධිභාරය ඇතුළු කුලිය) 2020 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | යාපනයේ පොදු ජල කණු සම්බන්ධතාවලට අදාළ රු.5,390,596 ක ලැබිය යුතු ශේෂය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | i. ඡේද අංක 02 | මණ්ඩලයේ සභාපති, උපසභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයාට වාහන දෙක බැගින් වෙන්කර තිබුණි. |
| | ii. ඡේද අංක 3.1 | සභාපති, උපසභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙනුවෙන් වෙන් කර ඇති වාහන සඳහා ඉන්ධන වියදම් ලෙස අනුමත සීමාවන් ඉක්මවා රු.1,590,251 ක් 2019 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා වැය කොට තිබුණි. තවද, දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ හා සහකාර සාමාන්‍යාධිකාරීගේ ඉන්ධන වියදම් සඳහා |

| | | |
|---|---|---|
| | | රු.463,427 ක් 2019 ජනවාරි සිට 2019 ඔක්තෝම්බර් දක්වා වැය කර තිබුණි. |
| (ඉ) | ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ණය ගිවිසුමෙහි දෙවන කොටසෙහි ඡේද අංක 3.1,18.15 (c) | ලබාදෙන ලද ණයවලින් රු.මිලියන 15,273.76 ක් එක්සත් ජනපද ඩොලර් තැන්පත් ගිණුම් පහක (05). 2019 ඔක්තෝම්බර් 08 වන දින තැන්පත් කර තිබුණි. |
| (ඊ) | 2017 පෙබරවාරි 15 දිනැති අංක 1/2017 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | විදේශ මූල්‍යන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සඳහා එක් අභ්‍යන්තර විගණකවරයෙකු පමණක් පත්කර තිබුණි. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 31 දිනවන විට රේඛීය අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින් දහඅට දෙනෙකුගේ (18) වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 22.03 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2019 දෙසැම්බර් 31 දක්වා නිදහස් කරන ලද සේවකයින් වෙනුවෙන් රු. මිලියන 168.45 ක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් මණ්ඩලයට ප්‍රතිපූර්ණය කළ යුතුය. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව මණ්ඩලය විසින් එහි බලතල, කාර්යයන් හා රාජකාරී වලට අනුව කටයුතු කර නොතිබූ බව සඳහන් කිරීමට

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව පහත අවස්ථාවලදී හැර මණ්ඩලයේ සම්පත් අදාළ කාල රාමුව ඇතුළත හා අදාළ වන නීතිවලට අනුකූලව අර්ථිකමය, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොතිබූ බව සඳහන් කිරීමට

    I. කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතියේ අසම්භාව්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් භූගත ජලාශයක් හා ධාරිතාවය ඝන මීටර් 1000 ක පොම්පාගාරයක් ඉදිකිරීමට රු.67,368,370 ක කොන්ත්‍රාත් වටිනාකමකට උප කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, උපකොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව සක්‍රීය ලෙස දායකවීමකින් තොරව මණ්ඩලයට ඉදිරිපත් කළ අන්තර් ගෙවීම් සහතික හරහා උපකොන්ත්‍රාත්කරුට අරමුදල් ප්‍රේෂණය කිරීම වෙනුවෙන් ප්‍රධාන

කොන්ත්‍රාත්කරු විසින් රු.8,084,204 ක් ලාභාන්තිකයක් ලෙස අයකරගෙන තිබුණි.

II. එකතු වටිනාකම රු.8,692,053 ක් වන පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින ජල මීටර අමතර කොටස් තුන්දහස් එකසිය අනූ දෙකක් (3192) සහ තොග ජල මීටර අමතර කොටස් එකසිය හතලිස් හතරක් (144) වසර දෙකකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර රත්මලාන වැඩ අංගනය තුළ සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි.

III. වටිනාකම රු.54,253,067 ක් වන විවිධ පරිමාණයන් දහයකට අයත් ජල මීටර් හයදහස් හාරසිය තිස් හතරක් (6,434) වසරකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු කරා යොදා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ගබඩාව තුළ පැවතුණි. තවද, ඇතැම් ජල මීටරයන්හි වගකීම් කාලය දැනටමත් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය.

IV. කටුගස්තොට පිරිපහදු මධ්‍යස්ථානයේ 2007 වර්ෂයේදී සවිකරන ලද ධාරිතාවය කිලෝ වොට් ඇම්පියර් 2000 ක් වන ජෙනරේටරයක් රු. මිලියන 15 ක් වැය කොට 2016 මාර්තු 28 වන දින අලුත්වැඩියා කර තිබුණි. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් 01 දිනට වගකීම් පැය 1500 න් සහ වසර පහක වගකීම් කාලයෙන් අලුත්වැඩියාවෙන් වසර දෙකක් ඉකුත් වීමෙන් පසු සහ පැය 189 ක් සම්පූර්ණය කිරීමෙන් පසුව ක්‍රියා විරහිත වූ අතර, 2020 මාර්තු 30 දින වන විටත් එය නැවත අලුත්වැඩියා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

V. කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කරගැනීමේ ප්‍රමාදය, පාරිසරික සහ නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානයේ දුර්වලතා, කොන්ත්‍රාත්කරුවන් විසින් බාල ගුණත්වයෙන් යුතු පීර් පයිප්ප සැපයුම් කිරීම යනාදී හේතුවෙන් විදේශ මූල්‍යාන ව්‍යාපෘති අටකට (08) අදාළව දින 184 සිට දින 1825 ක් දක්වා ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය.

VI. ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් සියයට 29.71 කට වඩා අඩුවූ රු. මිලියන 513.28 ක කොන්ත්‍රාත් වටිනාකමකට තෝරාගත් ලංසුකරුට පිරිනමා තිබුණි. කෙසේ වෙතත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) ඡේදයේ ප්‍රකාරව ලංසුකරු විසින් එම අයිතමයන් දක්වා ඇති රේටයන්ට අනුව වැඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමට අදහස් කරන්නේ කෙසේද යන්න සනාථ

කිරීමට අනුපාත විශ්ලේෂණයක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි.

VII. මාතලේ ජල පිරිපහදු මධ්‍යස්ථානය සඳහා 2016 අප්‍රේල් මාසයේදී පිරිවැය රු.3,895,000 ක් වන (ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 47 ක් වැඩි) ධාරිතාවය කියුබික් මීටර 1 ක් වන ඇලම් පොම්ප 2 ක් ප්‍රසම්පාදනය කොට තිබුණි. කෙසේ වෙතත්, 2020 මාර්තු 30 වන විටත් ඉහත එකදු පොම්පයක්වත් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

VIII. එෆ්අයිඩීඅයිසී (ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත්තුවත්හි කොන්දේසි) මාර්ගෝපදේශයේ 14.6 ඡේදයට පටහැනිව මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතියේ අන්තර් ගෙවීම් සහතික පත් අංක 1 සහ 2 සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.5 කට වඩා අඩු බිල්පත් මත ගෙවීම් සිදු කර තිබුණි.

IX. කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතියේ (අදියර I සහ III) ප්‍රමාණ පත්‍රයට පටහැනිව පසුපිරවුම් සඳහා භාරන ලද පස්ම යොදා ගැනීම හේතුවෙන් මීටර 267,188 ක තාවකාලික මාර්ග පුනස්ථාපනයන් සඳහා රු. මිලියන 732.07 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. එමෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2018 වර්ෂයේ පැවති අනුපාතයන් හා සන්සන්දනය කිරීමේදී, අදියර III සඳහා ආනයනික ජල මීටර 10,000 ක් වෙනුවෙන් රු. මිලියන 79.79 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. පිත්තල කොපුව ජල මනුවෙහිම කොටසක් වන අතර එය ජල මනුව සමඟ සැපයුම් කරන නමුදු එය ප්‍රමාණ පත්‍රය තුළ වෙනමම ඇතුළත් කර තිබුණි. එබැවින් අදියර I සහ III වෙනුවෙන් පිත්තල කොපු සැපයීම සඳහා රු. මිලියන 25.32 ක වෙනම ගෙවීමක් සිදු කර තිබුණි.

**3. වෙනත් විගණන ගැටළු**

I. එකතුව රු. මිලියන 1,392 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලපවාහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. එයින් සියයට 54 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ සහ දෙහිවල ප්‍රාදේශිකයන් නියෝජනය කරනු ලබයි.

II. අමාත්‍ය නිල නිවාස ජල සම්බන්ධතා 17 කට අදාලව රු.3,637,204 ක් අයකර නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. එයින් රු.2,268,899 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක් අයකර නොගෙන පැවතුණි.

III. 2019 දෙසැම්බර් 31 දිනට විසන්දි කල ණයගැති ශේෂය රු.1,328,616,496 ක් විය. එම ණයගැතියන්ගෙන් රු.1,049,623,385 ක් වන සියයට 79 කට සමාන ප්‍රමාණයක් අයකර ගැනීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි.

IV. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙන් රු.7,712,773 ක් අයකර ගත යුතුව පැවතුණි. කෙසේ වෙතත්, ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.2,201,854 ක් ලෙස දක්වා තිබුණි.

V. ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (මධ්‍යම) මගින් 2003 වර්ෂයේ සිට 2008 දක්වා කොන්ත්‍රාත්කරුවන්ට දුන් එකතු වටිනාකම රු.8,177,506 ක් වන අත්තිකාරම් සහ ප්‍රධාන කාර්යාලය විසින් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා දෙනු ලැබූ රු.26,103,612 ක අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

VI. මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය සහ නගර සභා ඇතුළු බාහිර ආයතනවල තබා ඇති රු.47,430,495 ක කෙටිකාලීන තැන්පතු ආපසු අයකර නොගෙන වසර තුනක් තිස්සේ හිඟව පැවතුනි. තවද, රේඩියෝ අමාත්‍යාංශයේ තබා තිබූ රු.4,378,828 ක් වන අත්තිකාරම් වසර 07 කට වඩා වැඩි කාලයක් අයකර නොගෙන හිඟව පැවති අතර විස්තරාත්මක තොරතුරු නොමැති වීම හේතුවෙන් විගණනයට ඒ පිළිබඳව සත්‍යාපනය කරගත නොහැකි විය.

VII. වටිනාකම පිළිවෙලින් රු.මිලියන 1,839.2 ක් හා රු. මිලියන 3.19 ක් වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු අදාළ පාර්ශවයන්ට නිදහස් කිරීමකින් හෝ ආදායම් ලෙස සැලකිල්ලට ගැනීමකින් තොරව වසර තුනකට වඩා වැඩි කාලයක් පැවතුනි. තවද, එම රඳවා තබා ගැනීම් සහ තැන්පතුවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා විගණනයට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවීය.

VIII. ගාලු ප්‍රදේශයේ අපජල අපහරණ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් ඉඩමක් මිලදී ගෙන තිබූ අතර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු. මිලියන 71.5 කට තක්සේරු කර තිබුණි. මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරීගේ නිර්දේශයන් මත ඉඩමෙහි වටිනාකමින් සියයට 30 ක ප්‍රතිශතයකට සමාන රු.මිලියන 21.25 ක් අත්තිකාරම් ලෙස 2014 අප්‍රේල් මාසයේ ඉඩම් අයිතිකරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පසුව ඇතිවූ මතභේදයක් හේතුවෙන් ගෙවන ලද අත්තිකාරම් නැවත අයකර ගැනීමට අධිකරණ නඩුවක් ගොනුකර තිබුණි. කෙසේ වෙතත් දැනටමත් පවුල් කිහිපයක් විසින් ඉඩම අත්පත් කර ගෙන ඇති බවත්, අත්තිකාරම් ලබා ගැනීමෙන් පසුව අයිතිකරු විසින් ඉඩමෙන් පස් ඉවත් කරගෙන ඇති බවත් විගණනයට නිරීක්ෂණය විය. ගෙවන ලද අත්තිකාරම සහ ඒ මත වන දඩ මුදල් ඉඩමේ අයිතිකරුගෙන්

හෝ මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ගෙන් 2020 ජූලි 31 දිනටත් අයකර ගෙන නොතිබුණි.

IX. 2008 සිට 2017 දක්වා කාලය තුළ කළුතර ප්‍රාදේශිකයේ මනුසටහන්කරුවෙකු විසින් සිදු කරන ලද රු.1,145,235 ක වංචාවක් 2020 ජූලි 31 වන දින වන විටත් වගකිවයුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි.

X. 1999 සිට 2006 දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු.මිලියන 248.44 ක මුදල් වංචාව 2019 දෙසැම්බර් 31 දින වන විටත් වගකිවයුත්තන්ගෙන් අය කර ගෙන නොතිබුණි. තවද, බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ 2001 වර්ෂයේදී සිදුවී ඇති රු.272,735 ක තවත් මුදල් වංචාවක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

XI. 2017 සිට 2019 වර්ෂය දක්වා මනුසටහන්කරුවන් විසින් සිදු කරන ලද අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවට අනුව මොනරාගල ප්‍රාදේශිකයේ අක්‍රමිකතා දෙකක්ද, කළුතර හා මධ්‍යම ප්‍රාදේශිකයේ අක්‍රමිකතා දෙකක්ද සිදු කර තිබුණි. තවද, මොනරාගල ප්‍රාදේශිකයේ වැල්ලවායේදී සිදු කළ අක්‍රමිකතා අතරින් පාරිභෝගියකයන් විසින් බිල්පත් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඇති වූ අලාභය 2020 ජනවාරි 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

XII. මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආනයනික මාර්ගස්ථ තොග වටිනාකම රු.මිලියන 876.23 ක් විය. එයින් රු.මිලියන 162.92 ක් වූ තොග වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ විමර්ශනයකින් කිරීමකින් තොරව මාර්ගස්ථ තොග ලෙස පැවතුණි.

XIII. කියුබික් මීටර මිලියන 746.2 ක් වූ මුළු පිරිපහදු කල ජල නිෂ්පාදනයෙන් , කියුබික් මීටර මිලියන 186.1 ක් හෙවත් සියයට 25 කට සමාන ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂයේදී ආදායම් නොලබන ජලය ලෙස සලකනු ලබයි. කාන්දු වීම්, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලේ සැපයීම සහ පරිපාලන දුර්වලතා යනාදිය හේතුවෙන් මණ්ඩලයට සැලකිය යුතු අලාභයක් ඇති කරන ආදායම් නොලබන ජලයේ වටිනාකම වෙනම ගිණුම් ගත කරනු වෙනුවට එය සාමාන්‍ය පිරිවැයක් ලෙස සලකා ගිණුම් වලට ගෙන තිබුණි. තවද කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 41 ප්‍රතිශතයක් වාර්තා කර තිබු අතර ගාල්ල, කෑගල්ල, රත්නපුර, හම්බන්තොට, බණ්ඩාරවෙල, මහනුවර සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශිකයන්හි සියයට 25 කට වඩා ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂයේදී වාර්තා කර තිබුණි.

XIV. දේශීය බැංකු යටතේ මූල්‍යනය වන ව්‍යාපෘති දෙකකට (02) අදාළව ණය වාරික ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු.1,561,573 කට සමාන වටිනාකමක් ප්‍රමාද පොලී ලෙස වැය දරා තිබුණි.

XV. අමුද්‍රව්‍ය බහාලුම් වරායෙන් නිදහස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය, ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කැලණි දකුණු ඉවුරු ජල සම්පාදන ව්‍යාපෘතියට (අදියර II) අදාළව එකතු වටිනාකම රු. මිලියන 376.52 ක දඩ මුදල් ගෙවා තිබුණි.

XVI. නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ජල සම්බන්ධතා 28 ක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික පරිභෝජනය බිල්පත් අදායම රු. මිලියන 44.52 කට සමාන කියුබික් මීටර 1,246,157 ක් විය. කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එය බිල් කර නොතිබුණි.

XVII. පැවති වෙළඳ පොළ අනුපාත සමඟ සන්සන්දනය කිරීමේදී දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. මිලියන 21 ක අමතර මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

XVIII. උතුරුමැද භූගත ජල අංශයේ යළි අයකර ගත හැකි වැඩ සඳහා වන රු.6,005,215 ක අසාමාන්‍ය හර ශේෂයක් ද,මාර්ගස්ථ මුදල්හි රු.665,580 ක අසාමාන්‍ය බැර ශේෂයක්ද 2020 ජූනි 30 දිනටත් නිරවුල් කර නොතිබුණි.

XIX. රු.29,180,175 ක් වටිනා යල්පැන ගිය තොග ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර එය 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කර තිබුණි.

XX. 2019 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2020 ජූලි 31 දිනටත් සම්පූර්ණය කර නොතිබුණි.

XXI. රු.24,081,457 ක් වටිනා මාස හයකට වැඩි කාලයක් ඉදිරිපත් නොකර පැවතුණු චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

XXII. 2018 වර්ෂයේ තොග සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද මාතර ගබඩාවෙහි අපහරණය කළ අයිතම 461 ක් සහ මොනරාගල දිස්ත්‍රික්කයේ අයිතම 43 ක් 2020 මාර්තු 31 දින වන විටත් අපහරණය කර නොතිබුණි.

ඩබ්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AC | ඇස්බෙස්ටෝ සිමෙන්ති |
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| ADRA | ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන හා සහන ඒජන්සිය |
| AE | ප්‍රාදේශීය ඉංජිනේරු |
| AFD | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| AGM | සහකාර සාමාන්‍යාධිකාරී |
| AIWSP | ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය |
| AWSSIP | අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය |
| BMICH | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| BOC | ලංකා බැංකුව |
| BOQ | ප්‍රමාණ පත්‍රය |
| BOI | ආයෝජන මණ්ඩලය |
| CBO | ප්‍රජා මූල සංවිධානය |
| CCN | කොළඹ නගරය උතුර |
| CCS | කොළඹ නගරය දකුණ |
| CCTV | සංවෘත පරිපථ රූපවාහිනිය |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CETRAC | ඉදි කිරීම් උපකරණ පුහුණු කිරීම් මධ්‍යස්ථානය |
| CH PB | නිවාස සැලැසුම් කිරීම හා ඉදි කිරීම වෙනුවෙන් වූ මධ්‍යස්ථානය |
| CI | වාත්තු යකඩ |
| CIPM | පුද්ගල කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය |
| CKDu | හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය |
| CMC | කොළඹ මහනගර සභාව |
| CP | සාමූහික සැලසුම් |
| CRIP | දේශගුණය මත යැපීම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| CRIWMP | දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය |
| CS | සාමුහික සේවා |
| Cu. m | ඝණ මීටර |
| DAB | ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය |
| DEWATS | විමධ්‍යගත අපජල ප්‍රතිකාරක හා බැහැර කිරීමේ ක්‍රමය |
| DGM | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DGM (WC) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) |
| DI | මෘදු යකඩ |
| DMA | දිස්ත්‍රික් මානන ප්‍රදේශයන් |
| DoNCWS | ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| DSC | සැලැසුම් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ උපදේශකත්වය |
| DSD | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| DZUWSP | වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය |
| EIA | පාරිසරික බලපෑම් තක්සේරුව |
| EPZ | නිර්යාත සැකැසුම් කලාපය |
| EWSP | ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය |
| GCWWMIIP | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන |
| GIS | භූගෝලීය තොරතුරු පද්ධතිය |
| GM | සාමාන්‍යාධිකාරී |
| GMWSP | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය |
| GN | ග්‍රාම නිලධාරී |
| GND | ග්‍රාම නිලධාරී වසම |
| GoSL | ශ්‍රී ලංකා ජන රජය |
| GPOBA | නිමැවුම පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල |
| GR | භූමි ජලාශය |
| GVWSP | වීසල් වවුනියාව ජල සම්පාදන ව්‍යාපෘතිය |
| HDPE | ඉහල ඝණත්වයේ පොලි එතිලින් |
| HRM | මානව සම්පත් කළමනාකරණය |
| IEC | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිසම |
| ICT | තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය |
| ICTAD | ඉදි කිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය |
| IWA | අන්තර්ජාතික ජල සංගමය |
| IWSP | ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය |
| IEE | මූලික පාරිසරික පරීක්ෂණය |
| IESL | ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවන්ගේ ආයතනය |
| IMS | ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමය |
| IoT | දේවල් වල අන්තර්ජාලය |
| ISO | ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය |
| IT | තොරතුරු තාක්ෂණය |
| ITEC | ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය |
| IPVPN | අන්තර්ජාල නිල පටිපාටි අතථ්‍ය පෞද්ගලික ජාලය |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| JPY | ජපන් යෙන් |
| KCWMP | ඔහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය |
| km | කිලෝ මීටර |
| KRB | කැළණි දකුණු ඉවුර |
| LBF | දේශීය බැංකු අරමුදල |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| M&E | යාන්ත්‍රික හා විද්‍යුත් |
| MD&T | මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් |

| | |
|---|---|
| MIS | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| MoU | අවබෝධතා ගිවිසුම |
| MSc | විද්‍යාපති |
| MUDWSHF | නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය |
| NAITA | ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීමේ අධිකාරිය |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| NC | උතුරු මැද |
| NCP | උතුරු මැද පලාත |
| NDB | ජාතික සංවර්ධන බැංකුව |
| NDT | ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව |
| NGOs | රාජ්‍ය නොවන සංවිධාන |
| NHDA | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| NIBM | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය |
| NPD | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව |
| NRW | ආදායම් රහිත ජලය |
| NWSDB | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| O & M | මෙහෙයුම් හා නඩත්තු |
| OKP | ඔරේන්ජ් දැනුම වැඩ සටහන |
| PAM | පොලිඇක්‍රිලමයිඩ් |
| PE | පොලි එත්ලින් |
| PVC | පොලිවිනිල් ක්ලෝරයිඩ් |
| OIC | ස්ථානය භාර නිලධාරි |
| P&D | ක්‍රම සම්පාදන හා සැලැසුම් |
| PAC | ව්‍යාපෘති අගැයීම් කමිටුව |
| PDMRC | ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුව |
| PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| PRDA | පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| PTB | Physikalisch Technische Bundesansdalt |
| PWD | පොදු වැඩ දෙපාර්තමේන්තුව |
| R&D | පර්යේෂණ හා සංවර්ධන |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| RDB | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| RFP | යෝජනා ඉල්ලා සිටීම |
| RIDEP | ග්‍රාමීය යටිතල පහසු කම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය |
| RM | කලාපීය කළමනාකරු |
| RO | විලෝම ආශ්‍රැති |
| RSC | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය |
| RSC (WN) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර උතුර) |
| RSC (WS) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර දකුණ) |
| RSC (N) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුර) |
| RSC (NW) | කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (වයඹ) |
| RWS | ග්‍රාමීය ජල සම්පාදනය |
| SBD | සම්මත ලංසු තැබීමේ ලිපි ලේඛන |
| SCADA | අධීක්ෂණාත්මක පාලනය හා දත්ත ප්‍රතිග්‍රහණය |
| SCAPC | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව |
| SDG | තිරසාර සංවර්ධන ඉලක්ක |
| SEP | සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය |
| SHIFT | නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය |
| SIDA | ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය |
| SLIDA | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| SLSI | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| SMS | කෙටි පණිවුඩ සේවාව |
| ST | කුඩා නගරය |
| STPs | පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාර |
| TA | තාක්ෂණික සහාය |
| TCE | මුළු පිරිවැය ඇස්තමේන්තුව |
| THM | ට්‍රිහාලෝමීතේන් |
| ToR | යොමු නියමයන් |
| ToT | පුහුණු කරන්නන් පුහුණු කිරීම |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |
| UNICEF | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| UPVC | මොළොක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ් |
| USD | එක්සත් ජනපද ඩොලර |
| VPN | අතථ්‍ය පෞද්ගලික ජාලය |
| VPP | වවුනියා සහභාගිත්ව ක්‍රම සම්පාදනය |
| VAT | අගය එකතු කළ බද්ද |
| WASSIP | ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය |
| WDCE | ජලය හා සංවර්ධනය පිළිබඳ සමුළුව හා ප්‍රදර්ශනය |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය |
| WSP | ජල සම්පාදන ව්‍යාපෘතිය / ජල සුරක්ෂිතතා සැලැසුම |
| WSS | ජල සම්පාදන යෝජනා ක්‍රමය |
| WTP | ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය |
| WWDS | අපජලය බැහැර කිරීමේ පද්ධතිය / ක්‍රමය |
| WWTP | අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය |

# සංස්ථානික තොරතුරු.

**සංවිධානයේ නාමය :**
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**නෛතික ආකෘතිය:**
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලය

**ස්ථාපිත කළ දිනය:**
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය නම් පාර්ලිමේන්තු පණත මගින් 1974. 03. 01 වැනි දින ස්ථාපිත කරන ලදි. 1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන (සංශෝධිත) පණත මගින් 1992. 03. 11 වැනි දින පණත සංශෝධනය කරන ලදි.

**බදු හඳුනාගැනීමේ අංකය:**
4090 31820

**අගය එකතු කළ බදු ලියාපදිංචි අංකය:**
4090 31820 7000

**සම්බන්ධතා - ප්‍රධාන කාර්යාලය:**
ගාලු පාර, රත්මලාන, ශ්‍රී ලංකාව
දුර කථන අංක : +94 11 2638999 (හිසැරුම්)
+94 11 2637194, +94 11 2611589
ෆැක්ස් : + 94 11 2636449
විද්යුත් තැපෑල : gm@waterboard.lk
වෙබ් අඩවිය : www.waterboard.lk

**රේඛීය අමාත්‍යංශය**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශය

**ඇමතුම් මධ්‍යස්ථානය**
1939 (පැය 24 පුරා)

**ගණුදෙනුකාර සේවා ඒකකය - ප්‍රධාන කාර්යාලය**
+94 11 2623623 (කාර්යාල වේලාවන් තුළ)

**බැංකු කරු**
ලංකා බැංකුව

**විගණක වරුන්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
රජයේ විගණන ඒකකය.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
ඉංජිනේරු කේ. ඒ. අන්සාර් - සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015. 02. 05 දින සිට)

එම්. එච්. එම්. සල්මන් මහතා - උප සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2018. 01. 24 දින සිට)

ජී. අයි. ටී. මහිලාල් සිල්වා මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 05 සිට)

ශාන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 12 සිට)

කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 13 සිට)

ආචාර්ය ටී. ඩී. ආනන්ද ජයලාල් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2017 .01. 20 සිට)

ආචාර්ය එල්. ටී. ගම්ලත්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2019. 06. 04 සිට)

ජේ. එම්. යූ. පී. ජයමහ මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .04. 02 සිට)

පී. කේ. ඒ. ඩී ද සිල්වා මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2019. 06. 13 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය.

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය :**
ඉංජිනේරු ඩී. යූ. සුමනසේකර, සාමාන්‍යාධිකාරී (2019. 09. 01 දක්වා)
ඉංජිනේරු ආර්. එච්. රුවිනිස්, සාමාන්‍යාධිකාරී (2019. 09.05 සිට)
ඉංජිනේරු එස්. ජී. ජේ. රාජ්කුමාර් - අතිරේක සාමාන්‍යාධිකාරී (උතුර / මධ්‍යම)
ඉංජිනේරු එන්. එච්. ආර්. කුලනාථ - අතිරේක සාමාන්‍යාධිකාරී (මළ අපවහන)
ඉංජිනේරු ටී. එස්. විජේතුංග - අතිරේක සාමාන්‍යාධිකාරී (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
ඉංජිනේරු ජේ. කේ. එස්. පතිරණ - අතිරේක සාමාන්‍යාධිකාරී (දකුණු / නැගෙනහිර)
ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා - අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන ව්‍යාපෘති)
ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු - අතිරේක සාමාන්‍යාධිකාරී (බටහිර)
ඉංජිනේරු ආචාර්ය වසන්තා ඉලංගසිංහ මහත්මිය - අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා)
ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණය)
ආර්. ඒ. එම්. එස්. වීරසේන මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
ඩබ්ලිව්. ඒ. එස්. සුමනසූරිය මහතා (මානව සම්පත්)
ආර්. එම්. ඩී. බණ්ඩාර මහතා (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය)
එම්. එම්. එස් පීරිස් මහත්මිය (මූල්‍ය)
ඒ. ජී. එස්. කුමාර මහතා (පිරිවැය කරණය)
ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් (වාණිජ)
ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (සාමූහික සැලසුම්)
ඉංජිනේරු අයි. වී. ඩබ්ලිව්. එදිරිවීර (කුඩා නගර / ග්‍රාමීය ජල සම්පාදන සේවා)
ඉංජිනේරු ඩී. එම්. එල්. සී. පිටවල (මිය) (සංවර්ධන)
ඉංජිනේරු ජේ. එල්. සීක්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
ඉංජිනේරු ටී. එම්. ඩබ්ලිව්. සුනිල් බණ්ඩාර (යාන්ත්‍රික හා විදුලි) (වැ.බ)
ඉංජිනේරු ඩබ්ලිව්. ජී. සී. එල්. වීරසේකර (ක්‍රම සම්පාදන හා සැලසුම් කරණය)
ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණය)
වැඩ බලන
ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (මල අපවහන)
ඉංජිනේරු එස්. එස්. එස්. විපුලානන්දන් (ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු)
ඒ. ශ්‍රියාලතා මහත්මිය (අභ්‍යන්තර විගණන) වැඩ ආවරණය කිරීම

**පළාත්/කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (බටහිර මධ්‍යම)
ඉංජිනේරු එම්. ටී. එම්. රසිල් (බටහිර දකුණ)
ඉංජිනේරු පී. රාමචිකුම (බටහිර උතුර)
ඉංජිනේරු ඩබ්ලිව්. එන්. ප්‍රේමසිරි (නිෂ්පාදන)
ඉංජිනේරු ආචාර්ය වසන්තා ඉලංගසිංහ මහත්මිය (වයඹ)
ඉංජිනේරු ජී වී විජේරත්න (උතුරු මැද)
ඉංජිනේරු එම් කේ ඩී ජේ එච් මීගොඩ (මධ්‍යම)
ඉංජිනේරු ටී. බරතිදාසන් (උතුර)
ඉංජිනේරු ආර් එස් ලියනගේ (ඌව)
ඉංජිනේරු එස්. එස්. දේවරාජා (සබරගමුව)
ඉංජිනේරු එම්. කේ. ඒ. ජේ. එම්. විජේසිංහ මහත්මිය (දකුණු)
ඉංජිනේරු එන්. සුදේසන් (නැගෙනහිර)

**ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරන අතිරේක සාමාන්‍යාධිකාරී වරුන් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්**
ඉංජිනේරු එස්. ඒ. රෂීඩ්
(කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය)
ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක
(නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු එම්. එම්. උමාර් ලෙබ්බේ (අනුරාධපුර උතුර 11 වැනි අදියර)
ඉංජිනේරු එන්. එච්. ඩී. පී. ධර්මපාල - (ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)